# විෂය නිර්දේශ

සහ

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## තුන්වන ශ්‍රේණිය




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

අනුග්‍රහය
යුනිසෙෆ් ආයතනය

2008

# විෂය නිර්දේශ

සහ

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

මව්බස (සිංහල)
පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
දෙවන ජාතික භාෂාව (දෙමළ)
සිසු තක්සේරු කිරීම

## තුන්වන ශ්‍රේණිය

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2008

| | |
|---|---|
| පළමුවන මුද්‍රණය | 2000 |
| දෙවන මුද්‍රණය | 2001 |
| පළමුවන සංශෝධිත මුද්‍රණය | 2008 |

හිමිකම් ඇවිරිණි

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ප්‍රාථමික පාසල් අවධිය ළමා සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියකි. අනාගතයේ සාර්ථක පුරවැසියකු වශයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය ශක්තීන් රාශියක් ගොඩ නැගෙන්නේත් හැඩ ගැසෙන්නේත් මේ කාල පරිච්ඡේදය තුළ දී ය. ඒ සඳහා ළමුන්ගේ වර්ධනයට හිතකර එසේ ම ඒවාට අනුබල දෙන්නා වූ පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. මෙහි දී ළමුන්ට තමා අවට පරිසරය සමඟ නිරන්තරයෙන් ගැටී අත්දැකීම් ලබා ගැනීමටත් ක්‍රියාකාරී ලෙස පරිසරය සමඟ සම්බන්ධ වීමටත් ප්‍රීතිය හා සතුට අත්විඳීමටත් තමා කරන වැඩ තුළින් සාර්ථකත්වය භුක්ති විඳීමටත් දෙමව්පියන්ගේ හා ගුරුවරුන්ගේ ආදරය හා පිළිගැනීම ලැබීමටත් ඉඩ ප්‍රස්ථා සැලසිය යුතු ය. එවැනි අවස්ථා ළමයාගේ සංවර්ධනය උපරිම මට්ටමකින් සිදු කිරීමට අනුබල දෙන්නක් වෙයි.

ප්‍රාථමික ශ්‍රේණි සඳහා විෂයමාලා සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන් පිළියෙල කිරීමේ දී ඉහත දක්වන ලද කරුණු දැඩි ලෙස සැලකිල්ලට ගෙන ඇත. එම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන් පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ද එම කරුණු ඉස්මතු වන ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමට ගුරුවරුන් විසින් අවධානය යොමු කළ යුතු ය. එසේ ම මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන් ගුරු මහත්ම මහත්මීන්ට තම පන්ති කාමරවල ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා කරන මග පෙන්වීමක් පමණක් බව ද අවධාරණය කරනු කැමැත්තෙමි. එහි ඇතුළත් කරුණු සැලකිල්ලට ගෙන තමාගේ ප්‍රදේශයට ගැළපෙන ආකාරයට තමාගේ ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ගොඩ නගා ගැනීමට ගුරුවරුන් උනන්දු විය යුතු ය. නිර්මාණාත්මක ලෙස පන්ති කාමර කටයුතු ගොඩ නගා ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රයෝජනයට ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින ඉතාමත් විශාල පිරිසකගේ දායකත්වයෙන් සම්පාදනය කරන ලද්දකි. ඔවුන් සියලු ම දෙනාටත් මෙම කාර්යය වෙනුවෙන් මූලිකත්වය ගෙන ක්‍රියා කළ ප්‍රාථමික අධ්‍යාපන ඒකකයේ සියලු ම නිලධාරි මහත්ම මහත්මීටත් මාගේ කෘතඥතාවය හිමි වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මුද්‍රණය කිරීම උදෙසා මුලා අනුග්‍රහය දැක්වීම වෙනුවෙන් යුනිසෙෆ් ආයතනයට අපගේ විශේෂ ස්තුතිය හිමිවේ.

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2007 ජුනි 20 දින දී ය.

සංඥාපනය

2008 වසරේ දී තුන්වන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 1998 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ තුන්වන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන ලද ගුරු අත්පොතේ නව සංස්කරණයකි. 2000 සිට පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ලද අත්දැකීම් සැලකිල්ලට ගෙන මෙම සංස්කරණ සිදු කර ඇත. එසේ ම 2003 වර්ෂයේ දී පළ කළ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව, ජාතික අධ්‍යාපන ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද විෂයමාලා පසුපෙවුම් වැඩසටහන මඟින් ලබා ගත් තොරතුරු, විවිධ ආයතන මඟින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව පවත්වන ලද පර්යේෂණවලින් ලබා ගත් තොරතුරු සහ ගුරු මහත්ම මහත්මීන් හා ගුරු උපදේශක මහත්ම මහත්මීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ද මෙම සංස්කරණය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී. විශේෂයෙන් ම තුන්වන හතරවන ශ්‍රේණිවල විෂයමාලා අතර තිබූ පරතරය නැති කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මඟින් උත්සාහ දරා ඇත.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය යනු ගුරු මහත්ම මහත්මීන් හට තමන්ගේ පන්තිවල ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කර ගැනීමට මඟ පෙන්වනු ලබන උපදෙස් සංග්‍රහයකි. එම මඟ පෙන්වීම්වලට අනුව තමන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සකස් කර ගැනීම ගුරු මහත්ම මහත්මීන්ගේ වගකීම වෙයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිටින සිසුන්, සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියක පසු වන්නන් ය. සිසුන්ගේ නිර්මාණාත්මක චින්තනය, සමාජ කුසලතා සහ පෞරුෂ ලක්ෂණ ගොඩ නැඟෙන්නේත්, හැඩ ගැසෙන්නේත් මේ අවධියේ දී ය. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී, මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු මෙන් ම ඉහත සඳහන් කළ ළමා සංවර්ධනය හා සම්බන්ධ කරුණු ද සැලකිල්ලට ගත යුතු ය. මෙම වයස් සීමාවේ පසුවන සිසුන්ගේ ඉගෙනීම සම්පූර්ණයෙන් ම සිදු වන්නේ ආසන්න පරිසරයත් සමඟ අන්තර් ක්‍රියා කිරීමෙනි. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී සිසුන්ගේ ආසන්න පරිසරය අර්ථාන්විත ලෙස යොදා ගැනීමට ගුරු මහත්ම මහත්මීන් උත්සාහ කළ යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇති ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී, විනෝදජනක වැඩ සහ ක්‍රියාකාරකම්වලට වැදගත් තැනක් දී තිබේ. සිසුන්ට තම ළමා කාලයේ දී ප්‍රීතිය භුක්ති විඳීමට හා සාර්ථකත්වය අත්දැකීමට අවස්ථාවන් තිබීම ඔවුන්ගේ පූර්ණ සංවර්ධනය සඳහා අතිශයින් වැදගත් වේ. එමෙන් ම ඔවුන්ගේ අනාගත ජීවිතයට අදාළ නිපුණතා සංවර්ධනය කිරීමේ පදනම ද ඇති කළ යුතු ය. පුද්ගලයකුගේ ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය ජීවන නිපුණතා රාශියක් විෂයමාලාව තුළ අන්තර්ගත කර ඇත. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි දක්වා ඇති අයුරු ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමෙන් සිසුන්ට එම නිපුණතා අත් කර දීම ගුරුවරුන්ගේ වගවීමක් වේ. ඒ සඳහා පන්ති කාමරය තුළ හැකිතාක් අවස්ථා සම්පාදනය කිරීම වැදගත් ය. තමාගේ පන්තියේ ඉගෙන ගන්නා සිසුන් ඉගෙනුම් ක්‍රියාවලිය සමඟ කොතරම් හොඳින් සම්බන්ධ වන්නේද යන්න පිළිබඳ ව නිරන්තරයෙන් සැලකිලිමත්ව සිට අවශ්‍ය පිළියම් යොදමින් කටයුතු කිරීම ගුරු මහත්ම මහත්මීන්ගේ අවධානයට ලක් විය යුතු තවත් කරුණකි. තක්සේරු කිරීම යනුවෙන් අදහස් කරන මෙම ක්‍රියාවලියෙහි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ සෑම සිසුවකුගේ ම ඉගෙනීම වැඩි දියුණු කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සඳහා ගුරුවරුන්ගේ ගුරු උපදේශකවරුන්ගේ විදුහල්පතිවරුන්ගේ ගුරුවිද්‍යාල, අධ්‍යාපන විද්‍යා පීඨ, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ගෙන් හා අධ්‍යාපන නිලධාරීන් විශාල පිරිසකගේ ද සහාය ලබා ගන්නා ලදී. ඒ සියලු ම දෙනා ම දැක් වූ දායකත්වය වෙනුවෙන් අපගේ කෘතඥතාවය පළ කරමු. එසේ ම ප්‍රාථමික අධ්‍යාපන අංශයේ කටයුතුවලට නිරන්තරයෙන් සහාය දක්වන හිටපු ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වන කමලා පීරිස් මෙනවිය, චිත්‍රාංගනී මල්වැන්න මිය, ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර යන මහත්ම මහත්මීන් ලබා දී ඇති සේවය බෙහෙවින් අගය කරමු. එසේ ම නිරන්තරයෙන් අපට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙන අප ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ජගත් වික්‍රමසිංහ මහතා කෘතඥතා පූර්වක ව සිහිපත් කරමු. මෙම කෘතිය සකස් කිරීම වෙනුවෙන් ඇප කැපවී ක්‍රියා කළ අපගේ අංශයේ සියලු ම නිලධාරී මහත්ම මහත්මීන්ගේ සේවය ඉතා ඉහළින් අගය කරමු.

ආචාර්ය සූරනිමල ලේකම්ගේ
අධ්‍යක්ෂ - ප්‍රාථමික අධ්‍යාපන

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

2007 ජුනි 20 දින දී ය.

## ජාතික අරමුණු

(i) මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම.

(ii) වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

(iii) මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

(iv) පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

(v) සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

(vi) පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථීක සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

(vii) ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

(viii) ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලි ව කතා කිරීම තේරුම් ගැනීම සඳහා කියවීම නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(iii) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

(iv) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා
ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පළමුවන මුද්‍රණය - 2000

උපදේශනය :
මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක
(අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)
ආචාර්ය ලයනල් අමරගුණසේකර
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්-ජාතික අධ්‍යාපන ආයතනය)
ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර
(සහකාර අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)

අධීක්ෂණය :
විමල් සියඹලාගොඩ මයා
(අධ්‍යක්ෂ - ප්‍රාථමික අධ්‍යාපනය)

විෂයමාලා කමිටුව :
ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර
විමල් සියඹලාගොඩ මයා
පී. සුබ්‍රමනියම් මයා
ඊ. එල්. සුරනිමල මයා
කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මයා
කේ. එච්. පරණවිතාන මයා
ජේ. එච්. චන්ද්‍රසේන මයා
ටී. කේ. වීරතුංග මිය
අයිරින් ගජනායක මිය
කේ. ඩී. ආර්. දයාවංශ මයා
කේ. ඩබ්ලිව්. ලියනගේ මිය
ඒ. අතුකෝරළ මිය
නන්දා බෙන්තරගේ මිය
එස්. අයි. එම්. එච්. කරීම් මයා
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ මිය
විජායි ලක්ෂ්මි දම්මුල්ල මිය
එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා
පී. ජී. ප්‍රේමලතා ජයසිංහ මිය
එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා
කේ. ආර්. පත්මසිරි මයා
එම්. එන්. චන්දන ප්‍රනාන්දු මයා
ආර්. එම්. කේ ද සිල්වා මිය
ටී. මුහුන්දන් මයා

සහභාගිත්වය - ඉංග්‍රීසි අධ්‍යාපනය
වී. එස්. එම්. යටවත්ත මිය
ජයසිංහ හේරත් මයා
සිරිල් එදිරිසිංහ මයා
ස්ටැන්ලි ප්‍රනාන්දු මයා

පරිගණක වචන යෙදුම :
මොනිකා විජේකෝන් මිය

සංශෝධිත මුද්‍රණය 2007

උපදේශනය :
මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
(අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)
විමල් සියඹලාගොඩ මයා
(සහකාර අධ්‍යක්ෂ ජනරාල් - භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

අධ්‍යක්ෂණය :
ආචාර්ය සුරනිමල ලේකම්ගේ
(ප්‍රාථමික අධ්‍යාපන ඒකකය)

සංස්කරණය හා සම්බන්ධීකරණය :
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ මිය

ලේඛක මණ්ඩලය
අභ්‍යන්තර
ආචාර්ය සුරනිමල ලේකම්ගේ
කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මයා
එම්. පී. එස්. ද සිල්වා මෙනවිය
එස්. එම්. ආර්. සුදීන් මයා
එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ මිය
පී. ජී. ප්‍රේමලතා ජයසිංහ මිය
එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා
කේ. ආර්. පත්මසිරි මයා
එම්. එන්. චන්දන ප්‍රනාන්දු මයා
ආර්. එම්. කේ. ද සිල්වා මිය
එස්. උදයචන්ද්‍රන් මයා
එච්.ඩබ්.ඩබ්.එම්.සජීවා රුවනි රඹුක්වැල්ල මිය

බාහිර
කේ. ඩී. ආර්. දයාවංශ මයා
සරත් කුමාරසිංහ මයා

සහභාගිත්වය - ඉංග්‍රීසි අධ්‍යාපනය
එච්. ආර්. එස්. කේ. අටුගොඩ මයා
ඊ. වී. ඩී. සී. පී. පෙරේරා මිය


චිත්‍ර
කේ. ඩී. ආර්. දයාවංශ මයා

පිටකවරය
අමරා අමරසිංහ මෙනවිය

පරිගණක වචන යෙදුම :
මොනිකා විජේකෝන් මිය
මුද්‍රණ සහාය
එස්. පී. ඒ. සරත් කුමාර මයා

1 වන රූප සටහන

ප්‍රාථමික විෂයමාලා සැලැස්ම - 2007




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

### අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ප්‍රතිව්‍යුහකරණ යටතේ 1999 වර්ෂයේ සිට ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවේ විශේෂ ලක්ෂණ

* ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති අවුරුදු පහක කාල සීමාව විෂයමාලා සංවර්ධන හා අනෙකුත් කටයුතුවල පහසුව තකා ප්‍රධාන අවධි තුනකට බෙදීම.
  1 ප්‍රධාන අවධිය : 1 වන සහ 2 වන ශ්‍රේණි
  2 ප්‍රධාන අවධිය : 3 වන සහ 4 වන ශ්‍රේණි
  3 ප්‍රධාන අවධිය : 5 වන ශ්‍රේණිය

* පළමුවන ශ්‍රේණියට ඇතුළු වන දරුවන් ආරම්භයේ දී ම පහසුවෙන් හඳුනා ගැනීමට ගුරුවරයාට භාවිත කළ හැකි සැලසුම්ගත සෙල්ලම් හා ක්‍රියාකාරකම් සමූහයක් හඳුන්වා දීම.

* සාමාන්‍ය අධ්‍යාපන අවධිය අවසානයේ දී සිසුන් විසින් වර්ධනය කර ගත යුතු යැ යි නිර්දේශිත නිපුණතා ප්‍රකාශයට පත් කර ඇත. ඒවා ගොඩනැගීමට සුදුසු පදනමක් සැපයෙන පරිදි සැකසුණු නිපුණතා පාදක විෂයමාලාවක් වීම.

* විෂය ක්ෂේත්‍ර හතරක් යටතේ සංවිධානය කර තිබීම.
  - භාෂාව
  - ආගම
  - ගණිතය
  - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

* දරුවකුගේ පූර්ණ වර්ධනයට භාෂාව හා ගණිත නිපුණතාවලට අමතර ව සෞන්දර්ය, නිර්මාණ, විද්‍යාව, සෞඛ්‍යය හා පෝෂණය වැනි තවත් අංශ කිහිපයකට අයත් නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. මෙම නිපුණතා වෙන් වෙන් ව විෂයයන් වශයෙන් ඉදිරිපත් කිරීමට වඩා සිසුනට ගැළපෙන තේමා තුළින් අවස්ථානුකූල ව මතු කර ඉගෙනීමට සැලැස්වීම වඩා යෝග්‍ය ලෙස පිළිගැනේ. මෙවැනි අංශ මතු කර ගැනීමට සමත් තේමා සමූහයකින් සමන්විත පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි පෙරට වඩා සමෝධානිත ලක්ෂණ පෙන්නුම් කිරීම.

* පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාෂාව, ගණිතය සහ ආගම යන විෂය ක්ෂේත්‍රවලට සම්බන්ධ නිපුණතා වර්ධනයට ද අවස්ථාවන් සැලසෙන හෙයින් එහි විෂය සම්බන්ධීකරණ ලක්ෂණ පෙන්නුම් කිරීම.

* පළමුවන ශ්‍රේණියේ සිට ම පන්තියේ ගුරුවරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි නම් නව අංගයක් හඳුන්වා දීම.

* දෙවන ප්‍රධාන අවධියේ සිට විධිමත් ව ඉංග්‍රීසි විෂය හඳුන්වා දීම.

* පළමුවන ශ්‍රේණියේ සිට දිගට ම විෂය සමගාමී ක්‍රියාකාරකම්වලටත්, පස්වන ශ්‍රේණියේ දී සිසු ළැදියා හා අවශ්‍යතාවලට ගැළපෙන වෛකල්පිත ක්‍රියාකාරකම්වලටත් කාල සටහන තුළින් ඉඩ ප්‍රස්තා සැපයීම.

* ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවෙන් සිසුන් තුළ ජීවන නිපුණතා සංවර්ධනය කිරීමට ඉඩ සලසා තිබීම.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

*  සමස්ත ප්‍රාථමික අධ්‍යාපන අවධිය තුළ ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාලියේ දී ප්‍රධාන තැනක් හිමි වනුයේ ශිෂ්‍ය කේන්ද්‍රීය දිශාවට නැඹුරු වූ ක්‍රමවේදවලට ය. එම ක්‍රමවේද ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් වේ.

- සැලසුම්ගත සෙල්ලම් හා විනෝදජනක වැඩ
- ක්‍රියාකාරකම්
- අසුන්ගත වැඩ

*  පළමුවන ප්‍රධාන අවධියේ දී සැලසුම්ගත සෙල්ලම් සහ ක්‍රියාකාරකම්වලට වැඩි අවධානයක් ද අසුන්ගත වැඩවලට අඩු අවධානයක් ද ලැබේ. දෙවන ප්‍රධාන අවධියේ දී මෙම ක්‍රමවේද තුනට ම ආසන්න වශයෙන් සමාන ව අවධානය හිමි වේ. තෙවන ප්‍රධාන අවධියේ දී ක්‍රියාකාරකම් සහ අසුන්ගත වැඩවලට වැඩි අවධානයක් ද සෙල්ලම්වලට අඩු අවධානයක් ද ලැබේ. මේ අන්දමට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද සංකලන ප්‍රධාන අවධි තුන තුළ ක්‍රම ක්‍රමයෙන් වෙනස් වීම.

*  සිසු ඉගෙනුම් ප්‍රගතිය හා ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ ව හඳුනා ගැනීම පිණිස නිරීක්ෂණය, වාචික ප්‍රශ්න කිරීම,සිසුන්ට සවන් දීම වැනි අවිධිමත් ක්‍රමවලට ප්‍රමුඛතාවය දෙන අඛණ්ඩ ව කර ගෙන යා යුතු පන්ති කාමර පාදක තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් පවත්වා ගෙන යාම.

*  එක් සිසුවකුගේ ලකුණු හෝ සාධන මට්ටම් හෝ තවත් සිසුවකුගේ ලකුණු හෝ සාධන මට්ටම් හෝ සමඟ සසඳා තීරණ ගැනීමේ ක්‍රමයෙන් මිදී නිශ්චිත අරමුණක් හෝ සිසු පූර්ව සාධන මට්ටමක් සමඟ සිසු සාධනය සසඳා තීරණ ගැනීමට සමත් පිළිවෙළින් නිර්ණායක මූලික සහ පූර්ව සාධන මූලික තක්සේරු කිරීමේ ක්‍රම යොදා ගැනීමට අනුබල දීම.

*  සැමට අධ්‍යාපනය තහවුරු කර ගැනීම ඉලක්ක කර ගනිමින්, ඒ සඳහා ප්‍රමිතියක් වශයෙන්, එක් එක් ප්‍රධාන අවධිය අවසානයේ දී සිසුන් විසින් අනිවාර්යයෙන් ම ප්‍රවීණතා මට්ටමට ළඟා විය යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හඳුන්වා දීමට පියවර ගැනීම.

*  එක් එක් ප්‍රධාන අවධිය අවසානයේ දී ළඟා කර ගත යුතු යැ යි අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ව ප්‍රවීණතාවක් ලබා ඇත්දැ යි තක්සේරු කිරීමට පියවර ගැනීම.

*  එක් එක් ප්‍රධාන අවධියක් අවසානයේ අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ප්‍රවීණතාවක් සියලු ම සිසුන්ට ලබා දීම ඉලක්ක කර ගෙන එම එක් ප්‍රධාන අවධියක් එකම ගුරුවරයකුගේ යටතට පත් කිරීමට අනුබල දීම.

*  පළමුවන ප්‍රධාන අවධියේ සිසුන් පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී සිටින විට ගුරු අධීක්ෂණය යටතේ, සංවිධානාත්මක ව හයවන ශ්‍රේණියේ සිසුන් සමඟ කණ්ඩායම් වැඩවල යෙදීමට ඉඩ ප්‍රස්තා සැපයීම.

*  පළමුවන ප්‍රධාන අවධියේ දී පමණක් මව්බස විෂයයට ගණිතය විෂයයට වඩා වැඩිකාලයක් ද, දෙවන හා තෙවන ප්‍රධාන අවධිවල දී විවේක කාලය සඳහා දිනකට මිනිත්තු 20ක කාලයක් ද වෙන් කිරීම.

*  2007 වර්ෂයේ සිට පළමුවන ප්‍රධාන අවධියට දෙවන ජාතික භාෂාව හඳුන්වා දීම. එය සවන් දීමට හා කථනයට පමණක් සීමා කර තිබුණ ද තුන්වන ශ්‍රේණියේ සිට කියවීම හා ලිවීම ක්ෂේත්‍ර සම්බන්ධ කරමින් විධිමත් ව සිසුන්ට ඉගෙනීමට අවස්ථා සලසා තිබීම.

*  2007 වර්ෂයේ සිට ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගණිත විෂයය සඳහා ද භාවිත කිරීම.

*  2007 වර්ෂයේ සිට සිසුන්ගේ කායික හා මානසික සංවර්ධනය සඳහා උපකාරී වන ශරීර සුවතා වැඩසටහන් පළමුවන ප්‍රධාන අවධිය සඳහා ක්‍රියාත්මක කිරීම.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# තුන්වන ශ්‍රේණිය-විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## පටුන


| | පිටු අංකය |
|---|---|
| 1.0 මව්බස (සිංහල) - විෂය නිර්දේශය | 01 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 02 |
| හැඳින්වීම | 03-05 |
| 1.1 සවන් දීම | 06-11 |
| 1.2 කතා කිරීම | 12-15 |
| 1.3 කියවීම | 16-24 |
| 1.4 ලිවීම | 25-38 |
| මව්බස තක්සේරු පත්‍රිකාව | 39 |
| 2.0 පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - විෂය නිර්දේශය | 40-47 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 47 |
| හැඳින්වීම | 48-50 |
| 2.1 පැළැටි හා ගස්වැල් | 51-55 |
| 2.2 අප අවට සිටින සත්තු | 56-59 |
| 2.3 අප පරිහරණය කරන දේ | 60-63 |
| 2.4 අපේ ආහාර | 64-68 |
| 2.5 අපි ලක්වැසියෝ | 69-71 |
| 2.6 ආරක්ෂාව හා පරිස්සම | 72-75 |
| 2.7 ජලය | 76-79 |
| 2.8 ගමනාගමනය | 80-83 |
| 2.9 ගෙවත්ත | 84-87 |
| 2.10 වැඩ පහසු කිරීමේ මං | 88-91 |
| 2.11 මිනිස් හැසිරීම් | 92-96 |
| 2.12 පොළොව හා අහස | 97-102 |
| 2.13 අපට කළ හැකි වෙනස්කම් | 103-105 |
| 2.14 මිනිසා හා තොරතුරු | 106-109 |
| 2.15 අපේ අතීත විත්ති | 110-112 |
| 2.16 අපේ යහපැවැත්ම | 113-117 |
| පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තක්සේරු පත්‍රිකාව | 118 |
| 3.0 ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි | 119-133 |
| 4.0 දෙවන ජාතික භාෂාව - විෂය නිර්දේශය | 134-136 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 136 |
| හැඳින්වීම | 137-138 |
| ආදර්ශ ක්‍රියාකාරකම් සන්තතිය | 139-151 |
| පොදු තක්සේරු පත්‍රිකාව | 152 |
| 5.0 සිසු ප්‍රගතිය තක්සේරු කිරීම | 153-156 |
| 6.0 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | 157-158 |


ගණිතය විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය,
ආගම් සඳහා විෂය නිර්දේශ හා ගුරු අත්පොත්
වෙන වෙන ම ඉදිරිපත් කර ඇත.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

කාලය බෙදා ගැනීම - දෙවන ප්‍රධාන අවධිය (තුන්වන හා හතරවන ශ්‍රේණි)

| විෂයය | සතියකට කාලය |
|---|---|
| 1. මව්බස | පැය 5.00 |
| 2. ගණිතය | පැය 5.00 |
| 3. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 6.00 |
| 4. ඉංග්‍රීසි | පැය 3.00 |
| 5. දෙවන ජාතික භාෂාව | පැය 1.00 |
| 6. ආගම | පැය 2.00 |
| 7. උදය රැස්වීම හා ආගමික වතාවත් | පැය 1.15 |
| 8. විවේක කාලය | පැය 1.40 |
| 9. ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 2.05 |
| 10. විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු 30 (සතියේ එක් දිනක) |
| සතියකට මුළු කාලය | පැය 27.30 |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## දෙවන ප්‍රධාන අවධියට පිවිසෙන සිසුන් හඳුනා ගැනීම

වර්ෂය ආරම්භයේ දී තමන් වෙත පැමිණෙන සිසුන්ගේ හැකියා නොහැකියා රුචි අරුචිකම් හා ලැදියාවන් පිළිබඳ අවබෝධයක් ලබා තිබීම ගුරුවරයාට ඉතා වැදගත් වේ. දෙවන ප්‍රධාන අවධිය පුරාවට වසර දෙකක පමණ කාලයක් ගුරුවරයා හා සිසුන් අතර මනා අන්තර් සම්බන්ධතාවක් පවත්වා ගැනීම සඳහා මෙමඟින් පහසු ආරම්භයක් සලසා ගත හැකි ය. එසේ ම ඵලදායී ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීම සඳහා ද එය බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.
දෙවන ප්‍රධාන අවධියට පිවිසෙන සිසුන් හඳුනා ගැනීමේ දි සැලකිල්ලට ගත හැකි මූලාශ්‍ර කිහිපයකි.

1. පළමුවන ප්‍රධාන අවධියෙහි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සම්බන්ධ වාර්තා
   පළමුවන ප්‍රධාන අවධියෙහි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සකස් කිරීමේ දී දෙවන ප්‍රධාන අවධිය තුළ පහසුවෙන් කටයුතු කිරීම සඳහා සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම ප්‍රවීණ කළ යුතු නිපුණතා කෙරෙහි ද අවධානය යොමු කර ඇත. එබැවින් පළමු ප්‍රධාන අවධියෙහි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා, දෙවන ප්‍රධාන අවධියෙහි පදනම් නිපුණතා ලෙස සැලකීම වටී.
   සිසුන් එක් එක් නිපුණතාවන්හි ප්‍රවීණතාව කරා ගෙන ඒමේ දී පළමු ප්‍රධාන අවධියෙහි ගුරුවරයා විසින් භාවිත කරන ලද අනාවරණ උපකරණ, ඒවා ක්‍රියාවට නංවා ඇති අයුරු, ඒ ඔස්සේ රැස් කර ගෙන ඇති තොරතුරු සැලකිල්ලට ගෙන සිසුන් එක් එක් විෂය ක්ෂේත්‍ර ඔස්සේ අත්කර ගෙන ඇති විෂය සාධනය මෙන් ම ඔවුන් සතු සමාජීය කුසලතා පිළිබඳ ව ද තක්සේරු කළ හැකි ය. ඒ පිළිබඳ ව යළි මුල සිට ම තොරතුරු රැස් කිරීමට කටයුතු කරනවා වෙනුවට පළමු ප්‍රධාන අවධියෙහි වාර්තා ද ප්‍රයෝජනයට ගැනීම මඟින් ගුරුවරයාගේ කාර්යයන් වඩා කාර්යක්ෂම කර ගැනීමට හැකි වනු ඇත.

2. පළමුවන ප්‍රධාන අවධියෙහි ගුරුවරයා සමඟ සාකච්ඡා කිරීම.
   වසර දෙකක කාලයක් සිසුන් සමඟ ගත කිරීම තුළින් එක් එක් සිසුවා පිළිබඳ ව අත්කර ගත් අත්දැකීම් සම්භාරයක් පළමුවන ප්‍රධාන අවධියෙහි ගුරුවරයා සතුව තිබේ. එම ගුරුවරයා සමඟ සාකච්ඡා කිරීම මඟින් සිසුන් පිළිබඳ ව අදහසක් ඇති කර ගැනීමට උත්සාහ දැරිය හැකි ය. කෙසේ වුව ද සිසුන් පිළිබඳ පූර්ව නිගමනවලට එළැඹීමෙන් වැළකී සිටීම අවශ්‍ය ය.
3. දෙමව්පියන්/භාරකරුවන් සමඟ සාකච්ඡා කිරීම.
   සිසුන්ගේ සමාජ ආර්ථික පරිසරය පිළිබඳ ව මෙන් ම ඔවුන් පාසල් යාම කෙරෙහි දක්වන ආකල්ප පිළිබඳ ව ද තොරතුරු දැන ගැනීම ප්‍රයෝජනවත් වේ. මේ සඳහා ඔවුන්ගේ දෙමව්පියන් හෝ වෙනත් භාරකරුවන් හෝ සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාවක් සලසා ගත හැකි නම් වඩා ප්‍රයෝජනවත් විය හැකි ය.
4. සිසුන් සමඟ සාකච්ඡා කිරීම.
   දෙවන ප්‍රධාන අවධියෙහි ඉගෙනුම් කටයුතු ආරම්භ කර පළමු සති කිහිපය තුළ දී සිසුන් සමඟ සාකච්ඡා කිරීම සහ ඔවුන් නිරීක්ෂණය කිරීම මඟින් ඔබ විසින් රැස් කර ගෙන ඇති තොරතුරු තව දුරටත් තහවුරු කර ගැනීමට හෝ සංශෝධනය කර ගැනීමට පුළුවන.
   මෙහි දී සිසුන්ගේ ආකල්ප හා රුචිකත්ව පිළිබඳ ව තව දුරටත් අවබෝධ කර ගැනීමට ද අවස්ථාව සැලසේ.

සිසුන් හඳුනා ගැනීම සඳහා තවත් බොහෝ ක්‍රමවේද භාවිත කළ හැකි ය. දෙවන ප්‍රධාන අවධිය ආරම්භයේ දී සිසු හැකියා ප්‍රදර්ශනය කිරීම සඳහා පළමු ප්‍රධාන අවධිය භාර ගුරුවරයාගේ ද සහාය ඇති ව වැඩසටහනක් සංවිධානය කර ගැනීම අර්ථවත් අවස්ථාවක් විය හැකි ය. මේ සඳහා විදුහල්පතිවරයාගේ සහාය ලබා ගත හැකි වන අතර දෙමාපිය සහභාගිත්වය ද ලබා ගත හැකි ය.

මෙසේ විවිධ ක්‍රමවේද භාවිත කර සිසුන් පිළිබඳ ව ලබා ගන්නා තොරතුරු භාවිතයට ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 1.0 මව්බස

## 1.1 සවන් දීම

1.1.1 සවන් දී අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
- ස්ථාන, සත්ත්ව, පුද්ගල හා ද්‍රව්‍ය නාමවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- වචනවල තේරුම අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
- මුලින් ම, ඊළඟට, අන්තිමට යන අනුපිළිවෙළ අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

1.1.2 සවන් දෙමින් වින්දනය ලබයි.
- රසවත් කවි/ගීවලට සවන් දෙමින් වින්දනය ලබයි.
- කතන්දරවලට සවන් දෙමින් වින්දනය ලබයි.
- ළමා නාට්‍යවලට සවන් දෙමින් වින්දනය ලබයි.

1.1.3 ඉගෙනීම සඳහා සවන් දී කරුණු අවබෝධ කර ගනියි.
- ගුරුවරයාට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.
- වැඩිහිටියන්ට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.
- පූජ්‍ය පූජක උතුමන්ට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.
- විශේෂ ආරාධිතයන්ට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.
- විද්‍යුත් මාධ්‍ය අධ්‍යාපනික වැඩ සටහන්වලට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.

1.1.4 සවන් දෙමින් චින්තනයට යොමු වී ප්‍රතිචාර දක්වයි.
- තේරවිලි හා පද පෙරළි විසඳයි.
- කතන්දර, චරිත කතා, සිදුවීම් ඇසුරෙන් තම අදහස් පවසයි.

## 1.2 කතා කිරීම

1.2.1 කතා බහට එක් වී සුහදතාව වර්ධනය කර ගනියි.
- තොරතුරු විමසයි.
- කතන්දර කියයි.
- තේරවිලි කියයි.

1.2.2 නිවැරදි උච්චාරණය සහිත ව කතා කරයි.
- හඬ නඟා කෙරෙන ගායන ක්‍රීඩාවල යෙදෙයි.
- රබන් පද කියයි.
- තාලානුකූල ව කවි, ගී, සින්දු කියයි.
- අසන්නාගේ අවධානය ලබා ගනිමින් කතා කරයි.

1.2.3 සන්නිවේදන අවශ්‍යතා සඳහා කතා කරයි.
- නිවැරදි ව පණිවිඩ ගෙන යයි.
- දුටු දෙයක් පැහැදිලි ව පවසයි.

## 1.3 කියවීම

1.3.1 නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.
- ස - ශ - ෂ - යන අකුරු නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.
- නැවතීම හා ප්‍රශ්නාර්ථය යන විරාම ලක්ෂණවලට අවනත ව කියවයි.
- කියවීමේ වේගය වර්ධනය කර ගනියි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ඉස්පිලි, පාපිලි, හල් කිරීම, ඇලපිලි, ඇදපිලි, රකාරාංශය, යංශය හා ගයනුකිත්ත යෙදුණු වචන නිවැරදි ව උසුරුවමින් කියවයි.

1.3.2 කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
- ශබ්ද නගා කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
- නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
- කියවා, තර්කානුකූල ව සිතා ප්‍රතිචාර දක්වයි.

1.3.3 කියවීමෙන් වාග්මාලාව පෝෂණය කර ගනියි.
- මව්බස පෙළ පොතෙන් හමු වන අලුත් වචන කියවයි.
- සමානාර්ථ පද කියවයි.
- විරුද්ධාර්ථ පද කියවයි.

1.3.4 රසාස්වාදය සඳහා කියවයි.
- ළමා කවි කියවා රස විඳියි.
- කතන්දර කියවා රස විඳියි.

## 1.4 ලිවීම

1.4.1 ලිවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.
- සිංහල හෝඩියේ අකුරුවල අංග, ප්‍රමාණය, හැඩය අනුව රූල මත ලියයි.
- අකුරු හා වචන අතර නිසි පරතරය ඇති ව ලියයි.
- නැවතීමේ ලකුණ නිවැරදි ව යොදා ලියයි.
- අර්ථය සඳහා අවශ්‍ය අකුරු හා පිලි නිවැරදි ව යොදා ලියයි.
- රූල මත නිවැරදි ව පිටපත් කරයි.
- පවසන දෙයට සවන් දී නිවැරදි ව රූල මත ලියයි.

1.4.2 අවශ්‍යතා සඳහා ලියයි.
- තම නම, ලිපිනය නිවැරදි ව ලියයි.
- පන්තියේ කාල සටහන ලියයි.
- හමු වන අලුත් වචන ලියයි.

1.4.3 නිර්මාණාත්මක ව ලියයි.
- කාටූන් චිත්‍ර සඳහා හෝ චිත්‍ර සඳහා හෝ කුඩා දෙබස් ලියයි.
- මාතෘකාවකට අනුව වැකි කිහිපයක් නිර්මාණය කර ලියයි.

1.4.4 නිවැරදි ලේඛන වහරට යොමු වෙයි.
- අකුරු නිවැරදි ව යොදා වචන ලියයි.
- අර්ථය සඳහා අවශ්‍ය අකුරු හා පිලි නිවැරදි ව ලියයි.
- ලේඛන බසේ සරල රීති කිහිපයක් අනුව ලියයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

තුන්වන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සෙල්ලම් හා විනෝදජනක වැඩ, ක්‍රියාකාරකම්, අසුන් ගත වැඩ යන ක්‍රමවේද තුනට ම සමාන ව අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

මව්බස විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී පෙළ පොත යොදා ගත යුතු අතර ඒ සඳහා මග පෙන්වීම් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අන්තර්ගත වේ. පෙළ පොත භාවිතයේ දී නිර්මාණශීලී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම යොදා ගනිමින් සිසුන් තුළ නිර්මාණශීලී භාවය ඇති කිරීම ද අපේක්ෂා කෙරේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## හැඳින්වීම

මව්බස විෂයය සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම වශයෙන් ක්ෂේත්‍ර හතරක් යටතේ ඉදිරිපත් කර ඇත. ගුරුවරයාට විෂය අන්තර්ගත කරුණු පැහැදිලි කර ගැනීමට පහසු වනු පිණිස එසේ ඉදිරිපත් කර ඇතත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී මෙම ක්ෂේත්‍ර අදාළ පරිදි සමෝධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නිපුණතා පාදක ප්‍රවේශයේ දී, මූලික නිපුණතාවක් ලෙස සැලකෙන සන්නිවේදන නිපුණතාව යටතේ සාක්ෂරතාව සඳහන් කෙරේ. එහි දී, සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව හා නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම යන නිපුණතා කරා සිසුන් ළඟා කරවීම අපේක්ෂිත ය. මෙහි දී පන්ති කාමරයට හා අදාළ පරිසරයට අනුව ක්‍රියාත්මක කළ හැකි වෙනත් සුදුසු ක්‍රියාකාරකම් නිර්මාණය කර ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය.

මෙම සන්නිවේදන නිපුණතාවලට අමතර ව පරිසරයට අදාළ නිපුණතාව, වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතාව, ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතාව, ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ නිපුණතාව, පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතාව සහ ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතාව යන අනෙක් නිපුණතා වර්ධනය වන ලෙසින් විෂයයට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

### නිපුණතා

(අ) ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

* එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දීමේ, කතා කිරීමේ කියවීමේ හා ලිවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* කවි, ගී, කතන්දර අසා සහ කියවා රස විඳියි.
* නිවැරදි උච්චාරණය සහිත ව ශබ්ද නගා කියවයි.
* ක්‍රමවත් ව පැහැදිලි ව හා නිවැරදි ව ලියයි.
* සවන්දීම, කතා කිරීම, කියවීම හා ලිවීම සම්බන්ධ හොඳ පුරුදු ප්‍රදර්ශනය කරයි.
* පොත් පත් කියවා තේරුම් ගනියි. රස විඳියි.
* තම අත්දැකීම් වාර්තා කිරීමට හා අදහස් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* සමූහයක් ඉදිරිපිට තම අදහස් සුහද ව, නිරවුල් ව හා ආචාරශීලී ව ඉදිරිපත් කරයි.

(ආ) දෙවන ප්‍රධාන අවධියේ අපේක්ෂිත නිපුණතා

* ආචාරශීලී බව ප්‍රදර්ශනය කරමින් සවන් දෙයි
* සවන් දුන් දෙයක ප්‍රධාන අදහස වෙනස් නොකර නැවත පවසයි
* සුහද බව රැක ගනිමින් කතා බහේ යෙදෙයි
* නිසි උච්චාරණය සහිත ව කතා කරයි
* නිසි උච්චාරණය සහිත ව විරාම ලක්ෂණවලට අනුකූල ව කියවයි
* කියවා අවබෝධ කරගෙන වැදගත් කරුණු ඉදිරිපත් කරයි
* සරල ව්‍යාකරණ රීති රැක ගනිමින් වැකි ලියයි
* සුවිශේෂී යොමු කිරීමකට අනුව නිර්මාණාත්මක ව ලියයි

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

(ඇ) තුන්වන ශ්‍රේණිය සඳහා අපේක්ෂිත නිපුණතා

* වින්දනාත්මක ව හා අවබෝධයෙන් යුතු ව සවන් දෙයි.
* වින්දනාත්මක ව සවන් දී ගායන කරයි.
* වාචික ව තම අදහස් නිරවුල් ව ප්‍රකාශ කරයි.
* නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.
* කියවා අවබෝධ කර ගනියි.
* ලිවීමේ ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි.
* වචන නිවැරදි ව ලියයි.
* අදහස් නිවැරදි ව ලියා ප්‍රකාශ කරයි.
* නිර්මාණාත්මක ලේඛනයට යොමු වෙයි.

පෙළ පොත භාවිතය සඳහා උපදෙස්

1. ඉගැන්වීමේ කාර්යයට පෙර ගුරුවරයා පෙළ පොත හොඳින් අධ්‍යයනය කළ යුතු වේ.

2. පෙළ පොතේ පාඩම් ඉදිරිපත් කිරීමේ දී අපේ රට හා අප සතු සාරධර්ම, සත්ත්ව හා ශාක ලෝකය, විද්‍යාත්මක සොයා ගැනීම්, පරිසර සුන්දරත්වය හා සංරක්ෂණය, ආරක්ෂාව හා පරිස්සම, කෘෂි කර්මාන්තය, සාහිත්‍ය හා රස වින්දනය, විශ්ව සාහිත්‍ය යන විවිධ ක්ෂේත්‍ර පදනම් කර ගත් දර්ශනයක් සහිත ව වන බැවින් ඒවා වඩා අර්ථවත් ලෙස ශිෂ්‍යයා සතු කිරීම ඔබට පැවරේ.


3. වසරින් වසර ශිෂ්‍යයා තුළ ක්‍රමික භාෂා නිපුණතාවක් ඇති වන සේ පෙළ පොත සැලසුම් කර ඇති බව සැලකිල්ලට ගන්න.

4. සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම යන භාෂා ක්ෂේත්‍ර හතර ම ශිෂ්‍යයන් විසින් ප්‍රගුණ කළ යුතු බැවින් පෙළ පොත කියවීම් ක්ෂේත්‍රය සඳහා පමණක් භාවිත කිරීම අපේක්ෂා නොකරන අතර එය සෙසු භාෂා ක්ෂේත්‍ර සමඟ ද සමෝධානය කර ගත යුතු වේ.

5. පෙළ පොතේ පාඩම් ඉදිරිපත් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කර ඇති මව්බස 04 ආධාරක හඬ පටය භාවිත කරන්න.

6. හතරවන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති භාෂා නිපුණතා ඉටු කර ගැනීම සඳහා යෝජනා කර ඇති ඇතැම් ක්‍රියාකාරකම්වලට සමාන ක්‍රියාකාරකම් පෙළ පොතෙන් ද සොයා ගත හැකි ය. එසේ ම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතැම් ක්‍රියාකාරකම් සඳහා පෙළ පොත සහාය කර ගත හැකි ය. එවැනි අවස්ථා මොනවා දැයි පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශ හොඳින් අධ්‍යයනය කර හඳුනා ගන්න.

7.




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

මව්බස විෂය හා බැඳුණු වැඩසටහන් රාශියක් පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි ය. ඉන් සමහරක් පහත දැක්වේ.

* උදෑසන රැස්වීම්
* පන්ති රැස්වීම්
* විවිධ ප්‍රසංග
* ප්‍රදර්ශන
* සිහිති පොළ
* ආගමික වැඩසටහන්
* ගුරු දෙගුරු දින

ඉහත දැක්වෙන පාසල් වැඩසටහන්වල දී සිසුන්ගේ භාෂා කුසලතා වර්ධනය සඳහා පහත දැක්වෙන ආකාරයේ ක්‍රියාකාරකම් නිර්මාණශීලී ව යොදා ගත හැකි වේ.
එනම් ,

* කථන ක්‍රියාකාරකම්
* සාමූහික හා තනි තනි ව කෙරෙන ගායනා
* ර ංගන හා රූපණ ආශ්‍රිත ක්‍රියාකාරකම්
  ඊට උදාහරණ ලෙස දැක්විය හැකි ය.

## සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

මෙම ශ්‍රේණියේ දී මව්බස විෂය තුළ ලිඛිත පරීක්ෂණවලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ සිසුන් සමඟ වැඩ කරමින් හා සිසුන්ගේ වැඩ නිරීක්ෂණය මගින් සිදු කරන තක්සේරු කිරීම්වලට ය. සෙල්ලම් හා විනෝදජනක වැඩ, ක්‍රියාකාරකම්, පෙළ පොත භාවිතය වැනි අවස්ථාවල දී නිරීක්ෂණය, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි තක්සේරු ක්‍රම මගින් තුන්වන ශ්‍රේණියට අදාළ නිපුණතා වර්ධනය වීම සිදු වන්නේ දැයි නිරතුරු තොරතුරු රැස් කරමින් සිසු ප්‍රගතිය සොයා බැලීම අපේක්ෂා කෙරේ.

## ගෙදර වැඩ පැවරීම

* පන්ති කාමරය තුළ දිනපතා කළ වැඩ කොටස් තහවුරු වීම සඳහා කළ යුතු ක්‍රියාකාරකම් ගෙදර වැඩ ලෙස ඉදිරිපත් කරන විට කතන්දර, කවි, තේරවිලි ආදිය දෙමව්පිය වැඩහිටියන්ගෙන් අසා ගෙන ඒමට පවරන්න.
* කළ යුතු දේ හා කරන ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයාට වැටහෙන සේ උපදෙස් දෙන්න.
* දෙමව්පියන්/භාරකරුවන් ඔබට හමු වේ නම් ඒ පිළිබඳ ව ඔවුන්ට ද උපදෙස් දෙන්න.
* කියවීම හා ලිවීම සම්බන්ධව ඉගැන්වීම සඳහා වගකීම ඔබ ම භාර ගන්න. ඒ පිළිබඳ ව වැඩ පවරන්නේ නම් අකුරක් ලියන රටාව උච්චාරණය කිරීම වැනි දෑ නිවැරදි ව ඔබ කියා දුන් ආකාරයට ම කිරීමට උපදෙස් දෙන්න.
* පවරා ඇති ගෙදර වැඩ ඉටු කරන ආකාරය ද සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිත කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 1.1සවන් දීම

නිපුණතාව
1.1.1 සවන් දී අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

## නිපුණතා මට්ටම
ස්ථාන, සත්ත්ව, පුද්ගල හා ද්‍රව්‍ය නාමවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම

රෝහල, පාසල, වෙළෙඳ පොළ, හාවා, අලියා, කුරුල්ලා, වෙළෙන්දා, රියදුරා, ලියුම් බෙදන්නා, පුටුව, මේසය, බාල්දිය ආදී වශයෙන් ස්ථාන නාම, සත්ත්ව නාම, පුද්ගල නාම, ද්‍රව්‍ය නාම කාඩ්පත්වල ලියා ගන්න. (පන්තියේ සිසු සංඛ්‍යාවට ප්‍රමාණවත් වන පරිදි නාමපත් ලියා ගැනීම අවශ්‍ය වේ.) ඉන්පසු ව සිසුන් එළිමහනට රැගෙන යන්න. එළිමහනේ ස්ථාන හතරක් සත්ත්ව නාම, පුද්ගල නාම, ද්‍රව්‍ය නාම, ස්ථාන නාම ලෙස නම් කරන්න. සකස් කර ගත් කාඩ්පත් එක් අයකුට එක බැගින් සිසුන් අතර බෙදා හරින්න.

ගුරුවරයා නාමයක් කියන විට එම නාම පත හිමි සිසුවා එළිමහනේ නම් කරන ලද ස්ථාන හතරෙන් නිවැරදි ස්ථානයට දිව යා යුතු බව පැහැදිලි කර දෙන්න. ඉන්පසු ව ද්‍රව්‍ය, පුද්ගල, සත්ත්ව, ස්ථාන නාම එකින් එක කියවන්න. ඔවුන් නිවැරදි ස්ථානයට යොමු වන්නේ දැයි බලමින් සිසුන්ගේ ප්‍රතිචාර ලබා ගන්න. ඒ අනුව පුද්ගල, ස්ථාන, සත්ත්ව හා ද්‍රව්‍ය නාම පිළිබඳ සිසුන්ට පැහැදිලි කර දෙන්න.
(නාමපත් සකස් කරන විට පැහැදිලි ව පෙනෙන සේ ලොකු අකුරින් ලියන්න. එසේ ම ඒවා සිසුන්ගේ ඇඳුමේ රැඳවිය හැකි සේ සකස් කර ගන්න)
මෙවැනි වෙනත් ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කරවන්න.

## නිපුණතා මට්ටම
සවන් දී වචනවල තේරුම අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම

ප්‍රතිචාර දැක්වීමට හැකි වචන සහිත වගන්ති කිහිපයක් සවන් දීමට සලස්වන්න. ඒවා ප්‍රතිචාර දැක්වීමට උපදෙස් දෙන්න.

උදාහරණ : අත් ඔසවන්න.
උඩ පනින්න.
දකුණට හැරෙන්න.
තනි කකුලෙන් සිට ගන්න.
පියවර දෙකක් පස්සට යන්න.
තුන්වරක් අත්පුඩි ගසන්න.

මෙවැනි වෙනත් ක්‍රියාකාරකම් මේ සඳහා යොදා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
මුලින් ම, ඊළඟට, අන්තිමට යන අනුපිළිවෙළ අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම

1. තේ කෝප්පයක් සකස් කර ගැනීම.
2. ඉදුණු අන්නාසි ගෙඩියක් ආහාරයට ගැනීමට සකස් කිරීම.
3. පන්ති කාමරයේ දී සිසුන් ආහාර ගැනීම.

ඉහත සඳහන් එක් ක්‍රියාකාරකමක් පියවර 3ක් යටතේ සකස් කර ගෙන එම පියවර අනුපිළිවෙළ වෙනස් කර සවන් දීම සඳහා සිසුන් වෙත ඉදිරිපත් කරන්න. ඉන්පසු පහත සඳහන් ප්‍රශ්න ද සිසුන් වෙත ඉදිරිපත් කරන්න.

මුලින් ම කළේ කුමක් ද?
ඊළඟට කළේ කුමක් ද?
අන්තිමට කළේ කුමක් ද?

ක්‍රියාකාරකමේ පියවර අනුපිළිවෙළ සිසුන් අවබෝධ කර ගෙන ඇති දැයි විමසිලිමත් වන්න.

නිපුණතාව
1.1.2 සවන් දෙමින් වින්දනය ලබයි.

නිපුණතා මට්ටම
රසවත් කවි/ගී සවන් දෙමින් වින්දනය ලබයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම

සවන් දෙමින් වින්දනය ලැබිය හැකි අර්ථවත් කවි ගී තෝරා ගන්න.

උදාහරණ :- (1) මුතුපබළු කැසට් පටය (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව)
(2) සුරතල් නංගී කැසට් පටය (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව)
(3) සූරිය අරණ කැසට් පටය (හර්ෂන දිසානායක)
(4) ළමා ගී 1, 2/වින්දන/හඬ (ජාතික අධ්‍යාපන ආයතනය)
(5) හඳහාමි (නන්දා මාලනී)

මෙවැනි කැසට් පටවල ගීතවලට සවන් දීමට සලස්වන්න.

- නිල් අහසේ අඳුර මකා සඳ පායන්නේ
පුංචි පුංචි රන්වන් තරු මල් දිලිසෙන්නේ
රංචු රංචු ගහෙන් ගහට ඉගිලෙති වවුලෝ
හිමිදිරියේ එළිය කියා රාවටෙති කුකුළෝ

- වත්ත පහළ ජම්බු ගසේ
අත්තෙන් අත්තට පැන පැන
කිචි බිචි ගා සින්දු කියන
චූටි මලින්නෝ
චූටි හොටෙන් කෝටු කැළි
එහෙට තබා මෙහෙට තබා
රටා අනුව කූඩු හදන
චූටි මලින්නෝ

මෙවැනි ගීත ද යොදා ගත හැකි ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
කතන්දරවලට සවන් දෙමින් වින්දනය ලබයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
සවන් දෙමින් වින්දනය ලැබිය හැකි සරල රසවත් කතන්දර තෝරා ගන්න. ඒවා රස විඳිය හැකි අයුරින් ඉදිරිපත් කරමින් රස විඳීමට අවස්ථාව සලසන්න. සිසුන්ට කතන්දර ඉදිරිපත් කරන විට වෙස් මුහුණු, රූකඩ ආදිය යොදා ගන්න.
උදාහරණ :- අන්දරේ හා සම්බන්ධ කතා
ඊසොප්ගේ උපමා කතා
මහදැන මුත්තාගේ කතා
සාම කතන්දර/මව්බස/කතන්දර යන කැසට් පට ද යොදා ගන්න. (ජාතික අධ්‍යාපන ආයතනය)

නිපුණතා මට්ටම
ළමා නාට්‍යවලට සවන් දෙමින් වින්දනය ලබයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
සවන් දෙමින් වින්දනය ලැබිය හැකි ළමා නාට්‍ය තෝරා ගන්න. සිසුන්ට රස විඳීම සඳහා සවන් දීමට අවස්ථාව සලසන්න. සිත් ගත් කොටස් රඟ දැක්වීමට යොමු කරවන්න.
උදාහරණ :-
සිංහල පෙළ පොතේ ඇතුළත් නාට්‍ය
වෙනත් ළමා නාට්‍ය

නිපුණතාව
1.1.3 ඉගෙනීම සඳහා සවන් දී කරුණු අවබෝධ කර ගනියි.

නිපුණතා මට්ටම
ගුරුවරයාට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
සවන් දෙමින් කරුණු අවබෝධ කර ගත හැකි ඉගෙනීම සඳහා වැදගත් වන සිද්ධි, දැන්වීම්, පණිවිඩ, උපුටා ගැනීම්, නිවේදන ගද්‍ය, පද්‍ය, ලිපි, පෙළ පොතේ පාඩම් මේ සඳහා යොදා ගන්න. ඒ සඳහා යොදා ගන්නා කොටස් ගුරුවරයා විසින් කියවිය යුතු අතර ඒවා ඇසුරින් වාචික හා ලිඛිත ප්‍රතිචාර ලබා ගත යුතු ය.
උදාහරණ :- පවුලේ බාලයා වූයේ සිරිමල් ය. දිළිඳුකම නිසා ඉතා දුක සේ ජීවත් වන්නට මේ කුඩා පවුලට සිදු විය. මලු පැදුරු වියා විකිණීමත් උදයට කඩයප්පන් සාදා ඒවා අලෙවි කිරීමත් නිසා මේ පවුල යන්තම් එදිනෙදා ජීවිකාව කර ගත් හ. (කුමාරෝදය 5)
උදාහරණ :- ඉද්ද මලයි රෝස මලයි තරගෙට වාගේ
මිදුල මැද්දෙ හිනාවෙනව හිමිදිරි උදයේ
ඉද්ද මලේ සුදට සුදේ ඇයි හිනැහෙන්නේ
රෝස මලේ රෝස පැහැය නැහැ අඩුවන්නේ
සමන් පිච්ච පොකුරු පොකුරු පිපිල තියෙනවා
සමගි වෙලා ඉන්න අයුරු අපට කියනවා
ඉහත උදාහරණ ඇසුරින් ප්‍රශ්න කීපයක් සකස් කර සිසුන් වෙත ඉදිරිපත් කර ප්‍රතිචාර ලබා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
වැඩිහිටියන්ට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
වැඩිහිටි පුද්ගලයන් කීප දෙනෙක් අවස්ථා කීපයක දී පන්ති කාමරයට කැඳවන්න. සිසුන්ට ගැළපෙන සේ අත්දැකීම් ඉදිරිපත් කළ යුතු බවට වැඩිහිටියා දැනුවත් කරන්න. පැමිණි වැඩිහිටියාගේ අත්දැකීම්වලට සවන් දීමට සිසුන් යොමු කරවන්න. අවබෝධ වී ඇත්දැයි බැලීමට වාචික හා ලිඛිත ප්‍රතිචාර ලබා ගන්න.

නිපුණතා මට්ටම
පූජ්‍ය හා ගිහි උතුමන්ට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
සියලු ආගම්වලට අදාළ පූජ්‍ය පක්ෂය වරින් වර පන්තියට කැඳවා දේශනවලට සවන් දීමට යොමු කර අවබෝධ කර ගත් කරුණු ප්‍රායෝගික ව අනුගමනය කරන්නේ දැ යි නිතර සොයා බලන්න.

නිපුණතා මට්ටම
විශේෂ ආරාධිතයන්ට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
පන්ති කාමරයට විශේෂ ආරාධිත අමුත්තකු කැඳවන්න.
තුනවන ශ්‍රේණියේ සිසුන්ට ගැළපෙන මාතෘකාවක්, වචන, අදහස්, අත්දැකීම්, සිද්ධි ඉදිරිපත් කළ යුතු බවට ආරාධිතයා දැනුවත් කරන්න.
සවන් දීමට සිසුන් යොමු කරවන්න.
අවබෝධ වී ඇත්දැයි බැලීමට ඔබ සිසුන් සමඟ සංවාද සාකච්ඡාවක් පවත්වන්න.

නිපුණතා මට්ටම
විද්‍යුත් මාධ්‍ය අධ්‍යාපනික වැඩසටහන්වලට සවන් දී කරුණු අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
ගුවන් විදුලි හා රූපවාහිනිය හෝ කැසට් පට මඟින් ඉගෙනීමට සම්බන්ධ අලුත් අත්දැකීම් ලබා දෙන වැඩසටහන්වලට සවන් දීමට යොමු කරන්න.
විදුලි ළමා ගුවන් විදුලිය/ජාතික හා ස්වාධීන රූපවාහිනී ළමා වැඩසටහන්වලට සවන් දීමට/නැරඹීමට සිසුන් යොමු කරන්න. පහසුකම් තිබේ නම් ළමා වැඩසටහන් පටිගත කර සිසුන් වෙත ඉදිරිපත් කරන්න. කරුණු අවබෝධ කර ගත්තා දැයි තක්සේරු කර ගැනීමට වාචික හා ලිඛිත ප්‍රතිචාර ලබා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව

1.1.4 සවන් දෙමින් චින්තනයට යොමු වී ප්‍රතිචාර දක්වයි.

නිපුණතා මට්ටම

තේරවිලි හා පද පෙරළිවලට සවන් දී විසඳයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

චින්තනයට හා වින්දනයට යොමු වන පද පෙරළි හා තේරවිලි ඉදිරිපත් කරන්න.

පද පෙරළි

මච්ච පිල - පිච්ච මල
ගීසිරිය - සීගිරිය
නෙත්මීරිය - මින්නේරිය
පේච්චි කොට්ටිය - කෝච්චි පෙට්ටිය

තුන් තේරවිලි

කතා බැරි අන්ධයා
(කතා බැරි නම් - ගොළු)
අන්ධයා නම් - කනා)
ගොළු කනා
කළු ගොනා

ගෙඩි කැලේ
(ගෙඩි - පල
කැලේ - වනේ)
පල වනේ
වලපනේ

තේරවිලි

උදාහරණ :-

1. ගේ අරගෙන ඇවිදින්නේ
දවල්ට මම හැංගෙන්නේ
එළවළු දළු කොළ කන්නේ
ගොවියගෙ සතුරෙක් වන්නේ (ගොළුබෙල්ලා)

2. දිග් දිගට කොළ ඇතේ
ඇඟ පුරුක් මෙන් ඇතේ
හපන විට පැණි ඇතේ
තෝරන්න පොඩි පුතේ (උක්)

3. පොතු සමඟයි ඇට කුඹුරෙන් එන්නේ
පොත්ත ඉවත දා මෝලෙන් යන්නේ
මුට්ටියෙ තැම්බී සුවඳ හමන්නේ
පිඟාන පිරිලා කුස පුරවන්නේ (හාල්)

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

4. සුරතින් කඩුව ගනී
අභිමානයක් පෙනේ
උළෙලෙදි අහසේ ළෙලදී
සැමගෙන් පිදුම් ලබයි (ජාතික කොඩිය)

5. ඉරටු ඇගේ කොළ අලවා
රැළි දමලා හැඩ කරලා
දිග නූලක ගැට ගසලා
යවයි අහසෙ පා කරලා - මා කවුද? (සරුංගලය)

නිපුණතා මට්ටම
කතන්දර, චරිත කතා, සිදුවීම්වලට සවන් දී ඒවා ඇසුරෙන් තම අදහස් පවසයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම

(1) නරිහාමි හා සම්බන්ධ කතා, මොනරා හා අච්චියාගේ ඇඳුම පිළිබඳ කතාව, කොකා සහ ඉබ්බා අහසින් ගිය කතාව සිසුන්ට ඉදිරිපත් කරන්න.
(2) මද්දුම බණ්ඩාර, වීර කැප්පෙටිපොළ, ඩන්කන් වයිට්, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්.කන්නන්ගර, මුනිදාස කුමාරතුංග, පණ්ඩිත් අමරදේව වැනි ප්‍රකට පුද්ගලයන්ගේ චරිත කතා සිසුන්ට ඉදිරිපත් කරන්න.
(3) සුනාමි ඛේදවාචකය, නායයෑම්, වන විනාශ, ශ්‍රී ලංකාව යටත් විජිතයෙන් නිදහස් වීම වැනි සිදුවීම් සහ පාසලට සිසුන්ට සමීප වැදගත් සිදුවීම් ද ඉදිරිපත් කරන්න.

ඉහත ක්‍රියාකාරකම් අවසානයේ දී සිසුන් ඒ පිළිබඳ ව දක්වන අදහස් විමසන්න. මෙහි දී විවිධ උපමා කතා ද උපයෝගී කර ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 1.2 කතා කිරීම

නිපුණතාව

1.2.1 කතා බහට එක් වී සුහදත්වය වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම

තොරතුරු විමසයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

පන්තියේ සිසුන් එළිමහනට රැගෙන යන්න. දෙදෙනා බැගින් වෙන් වීමට සිසුන්ට උපදෙස් දෙන්න. ඉන්පසු ව එම දෙදෙනා අතරින් එක් සිසුවකු පළමුවැන්නා ලෙස නම් කරන්න. අනෙක් සිසුවා දෙවැන්නා ලෙස නම් කරන්න. ගුරුවරයා පළමුවැන්නා කී විට පළමුවැන්නා දෙවැන්නාගෙන් තොරතුරු විමසිය යුතු බවත්, ගුරුවරයා දෙවැන්නා කී විට දෙවැන්නා පළමුවැන්නාගෙන් තොරතුරු විමසිය යුතු බවත් සිසුන්ට පැහැදිලි කර දෙන්න. ඒ අනුව විටින් විට පළමුවැන්නා හා දෙවැන්නා වෙනස් කරමින් තොරතුරු විමසීමටත් තොරතුරු පැවසීමටත් සිසුන් යොමු කරමින් විනෝදජනක වැඩක් ලෙස මෙම කාර්යයෙහි සිසුන් කීපවරක් නිරත කරවන්න. විටින් විට සිසු යුගලයන් වෙනස් කරන්න. සිසුන්ගේ නිවැරදි තොරතුරු පැවසීම සිදුවන්නේ දැයි විමසිලිමත් වන්න.

නිපුණතා මට්ටම

කතන්දර කියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

සිසුන් වැඩිහිටියන්ගෙන් අසා දැන ගත් හා කියවා දැන ගත් කතන්දර පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. මෙහි දී සිසුන් කතන්දර ඉදිරිපත් කරන විට වචන උච්චාරණය, හැඟීම් ප්‍රකාශනය ආදිය අසන්නන්ට ඉතා ප්‍රියජනක වන ලෙස ඉදිරිපත් කිරීමට පොළඹවන්න. පහසුකම් තිබේ නම් සිසුන් ඉදිරිපත් කරන කතන්දර පටිගත කර නැවත ඔවුනට අසන්නට සලස්වන්න. සෑම සිසුවකුට ම අවස්ථාව දෙන්න.

තොරතුරු විමසීම සඳහා මෙවැනි වෙනත් ක්‍රියාකාරකම් යොදා ගන්න.

නිපුණතා මට්ටම

තේරවිලි කියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. පළමුව එක කණ්ඩායමකට තේරවිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. එවිට අනෙක් කණ්ඩායම තේරවිලිවලට පිළිතුරු ලබා දිය යුතු ය. සුහදත්වය වර්ධනය වන අයුරින් පන්තියේ සිසුන් කණ්ඩායම්වලට මාරු කරන්න. අවශ්‍ය නම් ලකුණු ප්‍රදානය කර තරගයක් ආකාරයට පවත්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.2.2 නිවැරදි උච්චාරණය සහිත ව කතා කරයි.

නිපුණතා මට්ටම
හඬ නගා කෙරෙන ගායන ක්‍රීඩාවල යෙදෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
ජන ක්‍රීඩාවලට ප්‍රමුඛත්වය දෙන්න.

1. එළුවන් කැමේ ක්‍රීඩාව
2. කොපර කොපර පිපිඤ්ඤා
3. ඔළිඳ කෙළිය
4. ජල්ලි
5. කුන්දු කෙළිය

(ජන ක්‍රීඩා සමඟ ඉදිරිපත් කෙරෙන ගායනා ඇතුළත් කැසට් පට සොයා ගෙන සිසුන්ට ඒවා සවන් දීමට සලස්වා ගායනා කිරීමට යොමු කරන්න.)

නිපුණතා මට්ටම
රබන් පද කියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
රබන් පද කියමින් රබන් වාදනය කිරීමට අවස්ථා ලබා දෙන්න. මේ සඳහා ආදේශ වාදන භාණ්ඩද යොදා ගන්න.

උදාහරණ :-

| | |
|---|---|
| තුන්තුඹ ගෙඩි තුනයි | තුනයි |
| තිත්ත කැකිරි දෙකයි | දෙකයි |
| තුන්තුඹ ගෙඩි තුනට | කපන් |
| තිත්ත කැකිරි දෙකට | කපන් |

උස් උස් ගස්වල - දික් දික් පත් කොළ
කන්ඩ කැපූ කොළ -කඳ මැද පත් කොළ
පත් විස්සයි බොල - පත් විස්සයි

මෙවැනි තවත් රබන් පද එකතු කරගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
තාලානුකූල ව කවි/ගී සින්දු කියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
සිංහල 3 පෙළ පොත
කුඹී කුඹී යාළු
මල් උයනක්
හොඳ ළමයා
හරි සිරියාවයි සිරිලංකා

මෙම ගායන තනි තනි ව හා සාමූහික ව සිසුන්ට ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
ගීත :- 1. මගෙ පොඩි යාළු
2. පාන තියා බුදු සාදුට හිමිදිරියේ
3. කටු අකුලේ (අඹයාළුවෝ) ටෙලි නාට්‍යයේ ගීතයක්
ඉහත ක්‍රියාකාරකම් සඳහා පහත සඳහන් කැසට් පට භාවිත කළ හැකි ය.
(1) හඬ/ තුන්වන ශ්‍රේණිය සිංහල (ජාතික අධ්‍යාපන ආයතනය)
(2) සුරතල් නංගී, මුතු පබලු (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව)
(3) හඳහාමී (නන්දා මාලනී)
(4) ඉරෙන් හඳෙන්/පිච්ච කැකුළු (හර්ෂන දිසානායක)
(5) ළමා ගී 1, 2, (ජාතික අධ්‍යාපන ආයතනය)
(6) පුංචි අපට ගී (ඇස්. මහින්ද හිමි)

නිපුණතා මට්ටම
අසන්නාගේ අවධානය ලබා ගනිමින් කතා කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
දුටු හෝ ඇසූ සිද්ධියක්, නිර්මාණයක් සකස් කර ගන්නා පිළිවෙළ ඉදිරිපත් කිරීමක්, පා පැදි හෝ මැරතන් ධාවන තරගයක විස්තරයක්, ක්‍රිකට් තරගයක විස්තරයක්, දුම්රිය ස්ථානයක නිවේදනයක් වැනි අවස්ථා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථා ලබා දෙන්න.

නිපුණතාව
1.2.3 සන්නිවේදන අවස්ථා සඳහා කථනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම
නිවැරදි ව පණිවිඩ ගෙන යයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
මව්බස අභ්‍යාස පොතේ අවසාන පිටුවේ පවුලේ වැඩිහිටි සාමාජිකයන් දෙදෙනකුගේ සම්පූර්ණ නාමයන් ලියවා ගෙන එන ලෙස සිසුන්ට දැනුම් දෙන්න.
මෙම ක්‍රියාකාරකම සෑම සිසුවෙකුම කර ගෙන පැමිණියේද යන්න පෞද්ගලිකව ම සොයා බලන්න.
(මෙම ක්‍රියාකාරකම ඉදිරිපත් කරනු ලැබුවේ සිසුන් නිවැරදි ව පණිවිඩ ගෙන යාමේ නිපුණතාව මැන බැලීමට ය.)

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
දුටු දෙයක් පැහැදිලි ව පවසයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම

- ගෙදර දී දුටු සිදුවීමක්
- අතර මඟ දී දුටු සිදුවීමක්
- පාසලේ දී දුටු සිදුවීමක්
- සිසුවාට සමීප මෑතක දී සිදු වූ සත්‍ය සිදුවීමක් අනෙක් අය ඉදිරියේ පැවසීමට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා සෑම සිසුවකුට ම අවස්ථාව ලබා දෙන්න.

පන්ති කාමරයේ දී හා පාසල් පරිශ්‍රය තුළ දී සිසුන් අදහස් ප්‍රකාශ කරන විට හා කතා බහේ යෙදෙන විට නිවැරදි උච්චාරණය සහිත ව කතා කරන්නේ දැයි විමසිලිමත් වන්න. සිසුන්ගේ වැරදි උච්චාරණ ඒ මොහොතේ ම නිවැරදි කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 1.3 කියවීම

නිපුණතාව

1.3.1 නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.

## නිපුණතා මට්ටම

ස, ශ, ෂ යන අකුරු නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

ස, ශ, ෂ යන අකුරු නිවැරදි ව උච්චාරණය කරමින් කියවීමට සුදුසු ගද්‍ය හෝ පද්‍ය තෝරා ගන්න. ඒවා නිසි අයුරින් නිවැරදි ව උච්චාරණය කරමින් කියවීමට සිසුන් යොමු කරන්න.

උදාහරණ (1) :-

"විෂ දේවල් ඇසුරූ භාජන හිස් වූ විට ඒවා ජලාශවලට හෝ තැන් තැන්වලට විසි කිරීම නුසුදුසු ය. පරිසරයේ ශාකවල යුෂ උරා බී ජීවත් වන කුඩා සතුන් ද මේ නිසා විනාශ වීමට හැකි ය."

උදාහරණ (2) :-

"සරත්, කරුණු අවබෝධ කර ගැනීම සඳහා නොයෙක් පරීක්ෂණ කිරීමට පුරුදු ව සිටි කෙනෙකි. ඇතැම් විට විස්මය ජනක අත්දැකීම්වලට ද ඔහු මුහුණ පා ඇත."

උදාහරණ (3) :-

"සහන්, විෂ සහිත සතුන් ගැන පර්යේෂණ කරන විෂ වෛද්‍ය ශානිකා මහත්මියට උදවු කළේ ය."

## නිපුණතා මට්ටම

නැවතීම හා ප්‍රශ්නාර්ථය යන විරාම ලක්ෂණවලට අවනත ව කියවයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

නැවතීමේ ලකුණ යෙදෙන අවස්ථා මතු කරන ඡේද කියවීමට දෙන්න.

පෙළ පොතේ පාඩම්වලට මෙම නිපුණතාව වර්ධනය කිරීම සඳහා තෝරා ගත හැකි කොටස් කියවීමට යොමු කරන්න.

උදාහරණ :- "දවසක් අමරට මුද්දරයක් ලැබුණා."
"ඉත්තෑවා මේ සියල්ල දුටුවේ ය."

උදාහරණ :-

"මොකද මේ ...? මොකද්ද මේ සද්දෙ?
ඇයි රණ්ඩු කර ගන්නේ . . . ?
අනේ වලස් හාමි මේ කැලේ ඉන්න ලොකු ම නුවණක්කාරයා ඔයා."

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
කියවීමේ වේගය වර්ධනය කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
අර්ථයක් සහිත හා රහිත වැකි එක් වර්ගයකින් 15ක් පමණ කාඩ්පත්වල ලියා ගන්න. එම කාඩ්පත් හොඳින් කළවම් කර පෙට්ටියක් තුළට දමන්න. වරකට පන්තියේ එක් සිසුවකු බැගින් ඉදිරියට කැඳවන්න. ගුරුවරයා සංඥාවක් නිකුත් කළ විට සිසුවා කාඩ්පත් බහා ලූ පෙට්ටියෙන් අර්ථවත් වැකි සහිත කාඩ්පත් කියවා හැකි තරම් එකතු කර ගත යුතුයි. නැවත ගුරුවරයා සංඥාවක් කළ විට සිසුවා කාඩ්පත් එකතු කිරීම නැවැත්විය යුතු ය. මේ අන්දමට පන්තියේ සෑම සිසුවකුට ම අවස්ථාව දෙන්න. කාඩ්පත් එකතු කිරීමට ලබා දෙන කාලය සියලු දෙනාට ම සමාන විය යුතු ය. වැඩියෙන් ම අර්ථවත් වැකි සහිත කාඩ්පත් එකතු කළ සිසුවා හෝ සිසුන් ජයග්‍රාහකයන් වේ. අර්ථවත් වැකි සහිත කාඩ්පත් සඳහා ලකුණු ලබා දෙමින් තරගයක් ලෙස මෙය පැවැත්විය හැකි ය.

කාඩ්පත් සැකසීම සඳහා වැකි කීපයක්
උදාහරණ :

| අර්ථය සහිත වැකි | අර්ථය රහිත වැකි |
|---|---|
| 1. සමනලයා මල් පැණි බොයි. | 1. බල්ලා මේසය යට උයයි. |
| 2. අම්මා නංගී නලවයි. | 2. මාළුවා ජලයේ ඇවිදියි. |
| 3. පලතුරු පෝෂ්‍යදායකයි. | 3. බළලා කූඩුවක් තැනුවේ ය. |
| 4. කියවීම හොඳ පුරුද්දකි. | 4. සීනි තිත්ත රසයි. |
| 5. වන සතුන් ආරක්ෂා කරමු. | 5. බෑගය පුටුව උඩ කෑ ගැසුවේ ය |

නිපුණතා මට්ටම
ඉස්පිලි, පාපිලි, හල් කිරීම, ඇලපිලි, ඇදපිලි, රකාරාංශය, යංශය හා ගයනු කිත්ත යෙදුණු වචන නිවැරදි ව උසුරුවමින් කියවයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
ඉහත පිල්ලම් යෙදුණ වගන්ති පෙළ පොතින් සොයා ගෙන ඉදිරිපත් කරන්න.
එක් එක් සිසුවා ලවා වගන්ති කියවීමට අවස්ථාව ලබා දෙන්න.
එක් එක් සිසුවා වෙත අවධානය යොමු කරන්න.
මේ සඳහා ගුරු ආදර්ශන සකස් කිරීමේ දී හඳුන්වා දෙන පිල්ලම වර්ණ කර දක්වන්න.
මීට අමතර ව බාහිර පොත පත ද භාවිතයට ගන්න.
පහත දී ඇති උදාහරණයේ ආකාරයට පිල්ලම් රහිත ව ලියූ ගද්‍ය පද්‍ය කොටස් සිසුන් වෙත යොමු කර පිල්ලම් යොදා කියවීමට සලස්වන්න.
උදාහරණ :-

එගඩ ගඩත රත්තරං
මගඩ ගඩත රත්තරං
එගඩ ගඩත
මගඩ ගඩත
අතක බරට රත්තරං

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.3.2. කියවා අවබෝධ කර ගනියි.

නිපුණතා මට්ටම
ශබ්ද නගා කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
5cm x 8cm ප්‍රමාණයේ කාඩ්පත් පන්තියේ සිසුන් ගණනට සමාන ව සකස් කර ගන්න. එම කාඩ්පත්වල එක් පැත්තක පමණක් ක්‍රියාකාරකමක් ලියන්න.

උදාහරණ : (සමනලයෙක් වගේ පියාඹන්න/බල්ලෙක් වගේ බුරන්න/ගීතයක් කියමින් නටන්න) සිසුන් එළිමහනට රැගෙන ගොස් සකස් කර ගත් කාඩ්පත්වලින් එකක් එක් සිසුවකුට ලබා දෙන්න. කාඩ්පත ලබා ගත් සිසුවා එහි ඇති ක්‍රියාකාරකම අනෙක් සිසුන්ට ඇසෙන සේ ශබ්ද නගා කියවා නිවැරදි ප්‍රතිචාරය දැක්විය යුතු ය. මේ අවස්ථාව සෑම සිසුවෙකුට ම ලබා දෙන්න. මෙය විනෝදජනක වැඩක් ලෙස සැලසුම් කර ගන්න. කාඩ්පතේ වගන්ති ලියන විට පිල්ලම් රහිත හා සහිත වචන යොදා ගැනීමට සැලකිලිමත් වන්න.

නිපුණතා මට්ටම
නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1

1. ක්‍රියාකාරකම් මගින් ඉදිරිපත් කළ හැකි වගන්ති කාඩ්පත්වල ලියන්න.
2. එක ළමයකු බැගින් ඉදිරියට ගෙන ඔහුට කාඩ්පතක් තෝරා ගැනීමට දී කියවා බලා එහි සඳහන් දේ ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

උදාහරණ :-

1. බැලූමක් පුම්බන්න.
2. මුහුණ සෝදා ඇඳුම් අඳින්න.
3. රස කෑමක් කන්න.
4. කාරයක් වංගුවෙන් හරවන්න.
5. සරුංගලයක් යවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## ක්‍රියාකාරකම 2

1. වචන තුනකින් සරල වගන්තියක් සෑදෙන ලෙසට කාඩ්පත් ගොනුවක් සාදා ගන්න.
2. සිසුන් තිදෙන බැගින් කණ්ඩායම් කර වගන්ති සෑදිය හැකි කට්ටල බෙදා දෙන්න.
3. වචන එකතු කර සරල වගන්ති සෑදීමට උපදෙස් දෙන්න.

උදාහරණ :-

| | | |
|---|---|---|
| අම්මා | නංගී | නළවයි |
| තාත්තා | විදුහල්පති | හමුවෙයි |
| කොකා | මසුන් | අල්ලයි |
| සුළඟට | ගස | පෙරළෙයි |
| වැස්සෙන් | ගඟ | පිරෙයි |
| පරිසරය | ලස්සන | කරමු |
| හැමට | කරුණාව | දක්වමු |

## ක්‍රියාකාරකම 3

උක්ත පද කීපයක් කාඩ්පතක පහළට ලියන්න. එම පදවලට ගැළපෙන වාක්‍යාංශ එම කාඩ්පතෙහිම ඉදිරිපසින් පහළට ලියන්න. නිශ්ශබ්ද ව කියවා හැකි තරම් අර්ථවත් වගන්ති සාදා ඉදිරිපත් කරන ලෙස සිසුන් මෙහෙය වන්න.

| | |
|---|---|
| ගුරුතුමා | අකුරු උගන්වයි. |
| අම්මා | හොඳ නරක පෙන්වා දෙයි. |
| ගොවියා | අපට ආදරෙයි. |
| පූසා | බත සපයයි. |
| සමනලයා | අහසේ ඉගිලෙයි. |
| මල්ලී | අනාගතයට ජය පතයි. |
| තාත්තා | කිරි බොයි. |
| | දඟ කරයි. |
| | රෙදි සෝදයි. |
| | කුඹුරට යයි. |

නිශ්ශබ්දව කියවා අවබෝධ කර ගෙන ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකි ඡේද පෙළ පොතින් උපුටා ගෙන සිසුන් වෙත ඉදිරිපත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
කියවා තර්කානුකූල ව සිතා ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1
පහත සඳහන් වාක්‍ය කියවා ක්‍රියාව ඉබේ සිදු වන්නේ නම් වගන්තිය ඉදිරියේ ඇති හිස් කොටුව තුළ හරි (√) ලකුණ යොදන්න. කරන දෙයක් නම් වගන්තිය ඉදිරියේ ඇති හිස් කොටුව තුළ කතිර (x) ලකුණ යොදන්න.

උදාහරණ :-

1. නංගී මල් නෙළයි ☐
2. ඉර පායයි ☐
3. කුරුල්ලා කෑ ගසයි ☐
4. මල් පිපෙයි ☐
5. සුළඟ තදින් හමයි ☐
6. මී මැස්සා මලක වසයි ☐
7. හිඟන්නා කෑම ඉල්ලයි ☐
8. ඉදුණු අඹ ගෙඩියක් බිමට වැටෙයි ☐
9. මහ රජතුමා මාලිගාවට පැමිණෙයි ☐
10. මල් පෙති මත වැටුණු පිනි කැට මුතු මෙන් බබළයි ☐

ක්‍රියාකාරකම 2

ගුරු උපදෙස් :
1. පහත සඳහන් වගන්ති කාඩ්පත්වල ලොකුවට ලියා ගන්න.
2. සිසුන් එළිමහනට කැඳවා ගෙන යන්න.
3. සකස් කර ගත් කාඩ්පත් සිසුන්ට පෙන්වන්න.
4. ලොකු අකුරින් ලියා ඇති වචනවල අර්ථය ගළපා වැකියක් සාදා ගැනීමට උපදෙස් දෙන්න.
5. ඉන් කියවෙන දේ සිසුන් කර පෙන්විය යුතු යැයි පවසන්න.
6. සිසුන්ගේ නිවැරදි ප්‍රතිචාර ලබා ගැනීමට සැලකිලිමත් වන්න.
7. මෙවැනි ක්‍රියාකාරකම් තව දුරටත් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

(1) 1. අපේ **පන්තිය** පිරිසිදුයි, ලස්සනයි.
2. ගුරුතුමිය පන්තිය **ඉදිරියට** ආවා.
3. **එන්න** හැමෝම පොත් කියවන්න.

(2) 1. මිහිරි **ගීතයක්** ඇහිින් ඇසේ.
2. එය **ගායනා** කරන්න, මටත් ආසයි.
3. එන්න ඒ ගීතය ගායනා **කරන්න.**

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

(3) 1. දකුණු පැත්ත බලන්න.


2. කෑමට පෙර අත සෝදන්න.

3. සියලු දෙනා ම අත් ඔසවන්න.

ක්‍රියාකාරකම 3

> ගුරු උපදෙස්
> පහත සඳහන් ප්‍රහේළිකා සිසුන් වෙත ඉදිරිපත් කර ඒවා නිවැරදි ව සම්පූර්ණ කිරීමට යොමු කරවන්න. මේ සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සිරිත් මල් දම (2001 මුද්‍රණය) ග්‍රන්ථයේ 19 හා 36 යන කවි දෙක ඇසුරු කර ගන්න.


ප්‍රහේළිකා අංක 01




1. පහළට
   කොඩි පැළඳවීමට භාවිත කරයි.

2. හරහට
   බුලත් විටට එක්කර ගනී.

ප්‍රහේළිකා අංක 02




1. පහළට
   අකුරු ලිවීමට යොදා ගනී

2. හරහට
   අතීතයේ දී අකුරු ලිවීමේ මේවා මතය

මෙවැනි තවත් ප්‍රහේළිකා සිසුන් වෙත ඉදිරිපත් කරන්න.

## නිපුණතාව :

1.3.3 කියවීමෙන් වාග්මාලාව පෝෂණය කර ගනියි.

## නිපුණතා මට්ටම :

මව්බස පෙළ පොතෙන් හමුවන අලුත් වචන කියවයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

## ක්‍රියාකාරකම

පෙළ පොතේ නියමිත පාඩම ගුරුවරයා විසින් කියවා එහි ඇති අලුත් වචන ලැයිස්තුවක් සකසා ගන්න. එම වචන ලැයිස්තුව කාඩ්පත්වල ලියන්න. ඒවා කණ්ඩායම්වලට ලබා දී නියමිත පාඩමේ පිටු අංක නම් කර ලබා දුන් කාඩ්පතේ ඇති වචන පිටුවලින් සොයා එම වගන්තියම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම :
සමානාර්ථවත් පද කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

සමානාර්ථ පද ලියූ කාඩ්පත් කට්ටලයක් සකස් කර ගන්න.
පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.

A කණ්ඩායමට වචන කාඩ්පත් බෙදා දෙන්න.
B කණ්ඩායමට එම වචනවලට සමානාර්ථ දෙන වෙනත් වචන කාඩ්පත් බෙදා දෙන්න.
A කණ්ඩායමේ ළමයා ගුරුවරයා විසින් නම් කරන විට ඔහු තම අත ඇති වචනය කියවයි.
B කණ්ඩායම එයට සමාන වචනය ඉදිරිපත් කරයි.

කුහර පුවරුවක ආධාරයෙන් මෙම ක්‍රියාකාරකම ප්‍රදර්ශනය කරන්න.

ක්‍රියාකාරකම 2

පන්තිය අට දෙනා බැගින් කණ්ඩායම් කර ඉහත සඳහන් ක්‍රියාකාරකමට භාවිත කළ කාඩ්පත් දෙවර්ගය සම සම ව දී තරගකාරී ආකාරයට එම ක්‍රියාකාරකම කරවන්න. ජය ගන්නෝ අගයන්න.

ක්‍රියාකාරකම 3

සමානාර්ථවත් පද යොදා ඩොමිනෝ කාඩ්පත් කට්ටලයක් ඇසුරෙන් තව දුරටත් ක්‍රියාකාරකම් කරවන්න.
පෙළ පොතේ පාඩම්වලින් තෝරා ගත් පදවලට සමානාර්ථ පද සොයා ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.

නිපුණතා මට්ටම :
විරුද්ධාර්ථවත් පද කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

පහත සඳහන් වචන ලැයිස්තු දෙක කළුලෑල්ලේ ලියා විරුද්ධාර්ථ පද හඳුනා ගෙන සිසුන්ට කියවීමට යොමු කරන්න.
උදාහරණ :

| | |
|---|---|
| ලස්සන | අවලස්සන |
| සතුට | අසතුට/නොසතුට |
| ආලෝකය | අඳුර |
| පිපෙන | පරවෙන/නොපිපෙන |
| දුක | සැප |
| මිහිරි | අමිහිරි |

ක්‍රියාකාරකම 2

පෙළ පොතේ පාඩම්වලින් හඳුනාගත් වචන ලැයිස්තු ගත කර විරුද්ධ අර්ථ පද සොයා ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න. සිසුන්ට නොතේරෙන වචන ගුරුවරයා හඳුන්වා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 3

පහත සඳහන් එක් එක් වගන්තිය වෙන වෙන ම කාඩ්පත්වල ලියන්න.

ඉරි ඇඳි පදවලට විරුද්ධාර්ථ පදය යොදා වගන්තිය නැවත කියවීමට සිසුන් යොමු කරන්න.

උදාහරණ : 1. අම්මා කියූ ආරංචිය අසා මම සතුටට පත් වූයෙමි.
2. මේ රඹුටන් සුලබ කාලයයි.
3. එගොඩ ගොඩෙත් රත්තරං.
4. පිච්ච මල් පිපී තිබුණි.
5. ඒ රටේ මිනිස්සු දුප්පත් ය.
6. වලාකුළට ඉහළින් ගුවන්යානය ගමන් කරයි.
7. සරුංගලය අවලස්සන වූයේ එහි හැඩය නිසයි.
8. ළමයි ප්‍රවේශමෙන් පඩි පෙළ බසිති.
9. වෙළෙඳපොළේ අමු කෙසෙල් ගෙඩි විකිණීමට තිබුණි.
10. කෑමට පෙර බෙහෙත් බොන්න.

නිපුණතාව

1.3.4 රසාස්වාදය සඳහා කියවයි.

නිපුණතා මට්ටම :

ළමා කවි කියවා රස විඳියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

1. රසවත් සරල කවි තෝරා ගන්න.
2. ඉන් මැවෙන චිත්ත රූප පිළිබඳ අදහස් හුවමාරු කර ගන්න.
3. පෙළ පොතට අමතර ව වෙනත් කවි තෝරා ගන්න.

උදාහරණ :-

ගත සිත පුබුදන
ආසිරි ගෙන එන
පිනිකැට දිදුලන
උයනක ලස්සන

ළාහිරු කිරණින්
ගස්වැල් බැබළෙයි
පුංචි පැටව් ටික
සතුටින් පිබිදෙත්

කුමර කුමරියෝ
මල් මෙන් සැරසී
අකුරු කරන්නට
සිප්හල වෙත යති

ගීතිකාවෝ රසයි හා කුරුල්ලන්ගෙ දෝ
මේ කතා බස් ඇසෙන්නෙත් කුරුල්ලන්ගෙදෝ
මල් උයන් ලෝකයෙන් ආ කුරුල්ලන්ගෙ දෝ
තාරකාවන් වැනි රන් කුරුල්ලන්ගෙ දෝ
(ආනන්ද රාජකරුණා)
(නන්දා මාලනී - හඳහාමී කැසට්පටය)

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ඈත පෙනෙන කඳු පාමුල
පිට්ටනියක හරක් කවන
පුංචි පුංචි ළමෝ පෙළක්
සෙල්ලම් කරතී

ගන නිල් කොළ පිරුණු ගසක්
කිරි වතුරින් නාවන ලෙස
කඳු හිස් දවටා මීදුම්
පහළට බසතී

හීන් හඬින් ගලා බසින
කඳු අතරේ දොළක ඈත
ගෑනු පිරිමි රංචු රංචු
බැස දිය නාතී

වත්ත පහළ ගහේ බැඳපු
බඹර පෙත්තෙ සුළං වැදී
රුං ගා කර කැවෙන හඬින්
කුරුල්ලෝ යතී

කෝපි කොකෝ තේ වතු සහ
කඳු හිස් ඇළ දොළ පීරා
හමන සීත සුළං රැල්ල
ගත සිත පිනවයි.

වලාකුළේ හැංගී හිඳ
වැහි දෙවියන් විසින් එවන
හිරි පොද වැස්සෙන් නිතරම
කඳු හිස් තෙමෙති
(ඇස් මහින්ද හිමි)

## නිපුණතා මට්ටම :

කතන්දර කියවා රස විඳියි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම

සිසුන්ගේ වයසට, පරිසරයට හා අත්දැකීම්වලට ගැළපෙන කතා තෝරා ගන්න. යහපත් පුරුදු, යහපත් ආකල්ප, රට ජාතිය හා තමා පිළිබඳ ව වටිනාකමක් ඇති වන ආකාරයේ රසවත් කතන්දර තෝරා ගන්න. පන්ති පුස්තකාලයක් සකස් කර ගන්න. කියවීමට පෙළඹවීම සඳහා කාඩ්පතක් සකසා දෙන්න. පොතක් කියවන විට තිබිය යුතු නිවැරදි ඉරියව් කියා දෙන්න.

පොත් මල්ල ද මේ සඳහා උපයෝගී කර ගන්න.

| දිනය | කිය වූ පොතේ නම | කතුවරයාගේ නම | ජීවිතයට ගත් ආදර්ශ | පොත කියවා අවසන් කළ දිනය |
|---|---|---|---|---|
| | | | | |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.


# 1.4 ලිවීම

සාර්ථක ලිවීමක් සඳහා

1. ලිවීමේ ඉරියව් අනුගමනය කරන්න.



නිවැරදි ව අසුන්ගත වීම



පැන්සල නිවැරදි ව අල්ලා ගැනීම

2. පැන්සලේ දිග ප්‍රමාණය හා තුඩ පිළිබඳ සැලකිලිමත් වන්න.

3. අභ්‍යාස පොත නිවැරදි ව තබා ගැනීමට හුරු කරවන්න.

4. සාමාන්‍ය තනි රූල් සහිත අභ්‍යාස පොතක් භාවිත කරන්න.

5. අකුරක ප්‍රමාණය රූල් දෙක අතර ප්‍රමාණයෙන් ¾ වන සේ, ලිවීමට හුරු කරවන්න.

6. අකුරක ආරම්භය, ලියන නිවැරදි දිශාව හා අවසානය පිළිබඳ සැලකිලිමත් වන්න.

7. අකුරු අතර පරතරය හා වචන අතර පරතරය ගැන වඩාත් අවධානය යොමු කරන්න.


8. නිවැරදි අත් අකුරු ආදර්ශනයක් සකස් කර පන්ති කාමරය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.

9. පන්ති කළුලෑල්ලේ එක් කොටසක් රූල් ගසා අකුරු ආදර්ශන ඉදිරිපත් කරන්න.

10. නිවැරදි ව ලිවීම ප්‍රගුණ කිරීම සඳහා නිරන්තර අභ්‍යාසවල යොදවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මාධ්‍ය අක්ෂර, අවරෝහණ අක්ෂර, ආරෝහණ අක්ෂර පිළිබඳ ව නිදසුන් සඳහා මෙම අකුරු ලියා ඇති ආකාරය අධ්‍යයනය කරන්න.





Copyright © 2007 National Institute of Education - Sri Lanka.


පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා අකුරු ලිවීම විකාශය වන ආකාරය

පළමුවන ශ්‍රේණිය

රූල් නොමැති කඩදාසියක ලිවීම




රූලක් මත ලිවීම





සැ. යු,

අකුරක ආරම්භය, ලියන නිවැරදි දිශාව හා අවසානය පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් ය. මේ සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සකසා ඔබ වෙත සපයා ඇති අකුරු ලිවීම සඳහා මාර්ගෝපදේශ පොත භාවිතයට ගන්න.


Copyright © 2007 National Institute of Education - Sri Lanka.

දෙවන ශ්‍රේණිය





තුන්වන ශ්‍රේණිය

අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණයෙන් ¾ කි.





හතරවන ශ්‍රේණිය

අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණයෙන් 2/3 කි.




පස්වන ශ්‍රේණිය

අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණයෙන් 1/2කි.





Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.4.1 ලිවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම :
සිංහල හෝඩියේ අකුරුවල අංග ප්‍රමාණය හැඩය අනුව රූල මත ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
දෙවන ශ්‍රේණියේ දී ලබා දුන් හුරුකම් නොමැති සිසුන් ඇත්නම් එම හුරුකම ලබා දීම සඳහා පුද්ගලික ව උදවු කරන්න. තුන්වන ශ්‍රේණියේ අකුරු ලිවීමේ දී අකුරුවල ප්‍රමාණය කුඩා කිරීම සිසුන්ගේ හැකියාවන් අනුව සිදු කරන්න. (සිංහල අකුරු ලිවීම සඳහා මාර්ගෝපදේශ - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2006 - භාවිත කරන්න)

තුන්වන ශ්‍රේණියේ සිසුවකුගේ අත් අකුරු ආදර්ශනයකි.
මෙම අකුරු ආදර්ශනය තුන්වන ශ්‍රේණියේ තුන්වන වාරයේ තිබිය යුතු මට්ටම බව සලකන්න.



මෙම නිපුණතාවට සිසුන් ළඟා කරවීම සඳහා දෛනික ව ලිවීමේ විවිධ අභ්‍යාසවල නිරත කරවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම :
අකුරු හා වචන අතර නිසි පරතරය ඇති ව ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
1. ගුරු ආදර්ශන නිවැරදි ව ඉදිරිපත් කරන්න.
2. මූලිකව ම දබරඟිල්ලේ අග තුඩ තබා වචන අතර පරතරය ගැනීමට පොළඹවන්න.
3. අකුරු එකට ගාවමින් ලිවීම පුද්ගලික ව සොයා බලා නිවැරදි කිරීමට පියවර ගන්න.
4. ඉ, ද, අ, උ, ළ, ල වැනි අක්ෂර ලියන විට රූලෙන් පහළට එන අංග පිළිබඳ ව නිසි හුරුකමක් දෙන්න.

නිපුණතා මට්ටම :
නැවතීමේ ලකුණ නිවැරදි ව යොදා ලියයි.


ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
සම්පූර්ණ අදහසක් ප්‍රකාශ වන පරිදි ලියූ වගන්තියකින් පසු නැවතීමේ ලකුණ යෙදිය යුතු බවට උපදෙස් දෙන්න.

උදාහරණ : එවිට ම කිරි හාමිට සහ නම කී මැරෙන දවස සිහි විය. (හත්පණ)
හිවල් හාමි මහත් පුදුමයෙන් ගොවි හාමි දෙස බැලී ය. (හීන්සැරය)
(මෙවැනි වෙනත් උදාහරණ යොදා ගන්න)


නිපුණතා මට්ටම :
අර්ථය සඳහා අවශ්‍ය අකුරු හා පිලි නිවැරදි ව යොදා ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
1. නිවැරදි ව පිල්ලම ලියන ආකාරය කියා දෙන්න.
2. පිල්ලම ස්ථාන ගත කරන විට එහි හැඩය හා ප්‍රමාණය වෙනස් නොවන බව කියා දෙන්න.
3. දෙවන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ලිවීම ක්ෂේත්‍රයේ 4.2.1 හා 4.2.2 යන නිපුණතා මට්ටම්වලට අදාළ ව සිසුන් හඳුනා ගෙන ඇති පිල්ලම් හොඳින් තහවුරු වී ඇති දැයි සොයා බලා නව පිල්ලම් හඳුන්වා දීම ආරම්භ කරන්න.
4. සෑම පිල්ලමකට ම ඇති ශබ්දය හඳුන්වා දෙන්න.

උදාහරණ :




Copyright © 2007 National Institute of Education - Sri Lanka.




නිපුණතා මට්ටම :
රූල මත නිවැරදි ව පිටපත් කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම

1. කළුලෑල්ල භාවිතයෙන් නිවැරදි ආදර්ශන පිටපත් කිරීමට අවස්ථාව දෙන්න.
2. ක්‍රමානුකූල ව නිවැරදි ව ලියූ කාඩ්පත් පිටපත් කිරීමට යොමු කරවන්න.

නිපුණතා මට්ටම :
පවසන දෙයට සවන් දී නිවැරදි ව රූල මත ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම

1. පන්ති මට්ටමට හා සිසුන්ගේ මට්ටමට ගැළපෙන සේ සකස් කළ වචන, වාක්‍ය හා ඡේද සරල බවේ සිට සංකීර්ණ බවට පෙළ ගස්වා ප්‍රමාණවත් කාලයක් තුළ අසා ලිවීමට අවස්ථාව උදා කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.4.2 අවශ්‍යතා සඳහා ලියයි.

නිපුණතා මට්ටම :
තම නම ලිපිනය නිවැරදි ව ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
1. තම නම හා ලිපිනය නිවැරදි ව ලිවීම සඳහා ආකෘති පත්‍රයක් සකසා ලිවීමට දෙන්න.
උදාහරණ :-

ළමා මිතුරු සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අයදුම් පත්‍රය

නම :- ..........................................................................................

ලිපිනය :- ..........................................................................................

පන්තිය :- ..........................................................................................

පාසල :- ..........................................................................................

වයස :- ..........................................................................................

මෙවැනි වෙනත් ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරවන්න.

නිපුණතා මට්ටම :
පන්තියේ කාල සටහන ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
1. නිවැරදි ව කොටු ගසා සකස් කළ පන්ති කාල සටහන ප්‍රදර්ශනය කරන්න.
2. සිසුන්ට පිටපත් කිරීමට දෙන්න.

නිපුණතා මට්ටම :
හමු වන අලුත් වචන ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
1. පෙළ පොතේ පාඩම්වල ඇති අලුත් වචන සොයා ලිවීමට යොමු කරන්න.
2. ගුරු භවතා ඉදිරිපත් කරන ඡේද (හීන්සැරය, මඟුල් කෑම, හත්පණ වැනි පොත් මේ සඳහා භාවිත කරන්න) ආශ්‍රිතව ද අලුත් වචන සෙවීමට යොමු කරවන්න.
3. පරිසරය, ගණිතය, ආගම වැනි විෂයන්වල දී හමු වන අලුත් වචන ලැයිස්තු ගත කර ලිවීමට දෙන්න. අර්ථය ද පහදා දෙන්න.
4. අලුත් වචන හා එහි අර්ථය ද ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කරවන්න. ස්ථාවර වැඩක් ලෙස පවත්වාගෙන යන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව

1.4.3 නිර්මාණාත්මක ව ලියයි.

නිපුණතා මට්ටම :


කාටූන් චිත්‍ර සඳහා හෝ චිත්‍ර සඳහා හෝ කුඩා දෙබස් ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

මේ සඳහා දරුවාගේ අත්දැකීම්වලට සමීප තම පරිසරයට යෝග්‍ය දෙබස් නිර්මාණය කර ලිවීමට යොමු කරවන්න.

උදාහරණ : 1. මල සහ ගෙඩිය



| | |
|---|---|
| මල :- | පිච්චෙන්න අව්ව සැරයි. |
| ගෙඩිය :- | ඔබේ ලස්සන අඩුවෙයි ද? |
| මල :- | මගේ ලස්සන අඩුවෙන කොට ඔබටයි අවාසි. |
| ගෙඩිය :- | ඇයි ඒ? |
| මල :- | මම නිසානෙ ඔබ හැදෙන්නේ. |

දරුවන් මෙම දෙබස දිගට ගෙන යාමට යොමු කරන්න.

මෙවැනි තවත් නිර්මාණ කරවන්න.

නිපුණතා මට්ටම :

මාතෘකාවකට අනුව වැකි කීපයක් නිර්මාණය කර ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

1. දරුවන් නිර්මාණකරණයට පෙළඹවීම සඳහා සමීප අත්දැකීම් ඔස්සේ සිතන්නට අවකාශ ලබා දෙන්න.
2. දරුවන් සමඟ සාකච්ඡා කරන්න.
3. නිර්මාණකරණයේ දී කට වහර හෝ ලේඛන වහර භාවිත කිරීමට අවකාශ ඇත.
4. සෑම දරුවකුගේම නිර්මාණ කුසලතාව ගැන තක්සේරු කරන්න.
5. ලියන ලද නිර්මාණය අගයන්න. සිසුන් අතර හුවමාරු කර ගනිමින් කියවීමට දෙන්න.
6. උසස් නිර්මාණ පන්ති මට්ටමේ බිත්ති පුවත් පතට යොමු කරන්න.
7. ජාතික පුවත්පත්වල ළමා විශේෂාංග සඳහා ද ඉදිරිපත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.4.4 නිවැරදි ලේඛන වහරට යොමු වෙයි.

නිපුණතා මට්ටම :
අකුරු නිවැරදි ව යොදා වචන ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
න, ණ, ළ, ල අක්ෂර නිවැරදි ව යොදා වචන ලිවීමට හුරු කරන්න.
උදාහරණ :-

| න/ණ | | ල/ළ | |
|---|---|---|---|
| පහන | දල්වන පහන | ඇල | ඇලවීම |
| පහණ | පාෂාණ | ඇළ | ජලය රැගෙන යන මාර්ගයකි |
| නුවන | ඇස | මල | පුෂ්පය |
| නුවණ | ඥානය | මළ | මැරුණු |
| කන | ඉන්ද්‍රිය/කනවා | නල | බට |
| කණ | අන්ධ | නළ | සුළඟ |
| තන | ඉන්ද්‍රියකි | වල | කැලෑව |
| තණ | පැළෑටි විශේෂයකි | වළ | බිමහාරන ලද වළ |
| වන | කැලෑව/වෙනවා | කුල | ගෝත්‍රය |
| වණ | තුවාලය | කුළ | මුදුන |

ඉහත පරිදි අකුරට අනුව අර්ථය වෙනස් වන අවස්ථාවන් තව තවත් පෙන්වා දෙන්න.
ජාතික අධ්‍යාපන ආයතනය - සිංහල ලේඛන රීතිය භාවිත කරන්න.

නිපුණතා මට්ටම :
අර්ථය සඳහා අවශ්‍ය අකුරු හා පිලි නිවැරදි ව ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
සිසුන් තුළ මෙම නිපුණතාව තහවුරු කිරීම සඳහා වචන ලිවීමට හුරු කිරීමේ දී ඒකවචන බහුවචන වශයෙන් ලිවීමට උපදෙස් දෙන්න.
මෙම පිල්ලම් හා අකුරු පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු අවස්ථාවල දී පමණක් එම කොටස් වර්ණ ගැන්වීම, චලන කර පෙන්වීම, විශාල කර පෙන්වීම අනුගමනය කරන්න.

⅄ හල් යෙදීමෙන්

| ඒක වචන | බහු වචන |
|---|---|
| ගල | ගල් |
| ගස | ගස් |
| පැල | පැල් |
| මල | මල් |
| පාසල | පාසල් |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

⅄ පාපිල්ල යෙදීමෙන්

| ඒක වචන | බහු වචන |
|---|---|
| කොල්ලා | කොලු |
| උදැල්ල | උදලු |
| දල්ල | දලු |
| මල්ල | මලු |
| කුරුල්ලා | කුරුලු |

⅄ ඕ ශබ්දය එක්වීමෙන්

| ඒක වචන | බහු වචන |
|---|---|
| ළදරුවා | ළදරුවෝ |
| යහළුවා | යහළුවෝ |
| මාළුවා | මාළුවෝ |
| ගොවියා | ගොවියෝ |
| කම්කරුවා | කම්කරුවෝ |

⅄ එක් අකුරක් අඩුවීමෙන්

| ඒක වචන | බහු වචන |
|---|---|
| මාලය | මාල |
| කළය | කළ |
| කොළය | කොළ |
| පැළය | පැළ |
| මාර්ගය | මාර්ග |

තවත් මෙවැනි වචන සොයා සිසුන්ට ඉදිරිපත් කරන්න.

⅄ දන්තජ ස තාලුජ ශ මූර්ධජ ෂ

යන අක්ෂර වචනවල යෙදෙන ආකාරය ගැන මූලික අවබෝධයක් ලබා දෙන්න.

| දන්තජ | තාලුජ | මූර්ධජ |
|---|---|---|
| ස | ශ | ෂ |
| සමනලයා | ශක්තිය | පාෂාණ |
| සරුංගලය | ශරීරය | පරීක්ෂණ |
| සරම | ශබ්දය | යක්ෂයා |
| සයුර | ප්‍රශ්නය | වර්ෂාව |
| සමන් | ආකාශය | දුරේක්ෂය |
| විස්මය | රශ්මිය | විෂ |
| අහස | දර්ශනය | දක්ෂ |
| සසර | රාශියක් | දුර්භික්ෂ |
| සමස්ත | විශාල | අන්වීක්ෂය |
| අවසානය | උපදේශය | විෂය |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

➤ යංශය (්‍ය) යොදා නිවැරදි ව වචන ලියයි.

1. රම්‍ය
2. ධාන්‍ය
3. තුල්‍ය
4. නාට්‍ය
5. පද්‍ය
6. ගද්‍ය
7. ශිෂ්‍යත්ව
8. විද්‍යාව
9. විද්‍යාලය
10. වාක්‍ය
11. කාව්‍ය
12. සන්ධ්‍යාව

➤ රකාරාංශය (්‍ර) යෙදෙන වචන නිවැරදි ව ලියයි.

1. ක්‍රමය
2. ප්‍රමාණය
3. මුද්‍රණය
4. චිත්‍ර
5. පත්‍ර
6. මිත්‍රයා
7. ග්‍රැහැම්බෙල්
8. ග්‍රහණය
9. ආග්‍රහණය
10. ශ්‍රී ලංකා
11. උපක්‍රම
12. ක්‍රමෝපාය
13. ප්‍රවේශම
14. වක්‍ර

➤ ගයනුකිත්ත යෙදුණු (ෟ) වචන නිවැරදි ව ලියයි.

1. ඖෂධ
2. ගෞරව
3. යෞවන
4. පෞරාණික
5. නෞකාව
6. කෞතුකාගාරය
7. බෞද්ධ
8. රෞද්‍ර
9. සෞන්දර්ය
10. සෞඛ්‍යය

සිසුන්ට සමීප මෙවැනි වචන තව දුරටත් සෙවීමට සිසුන්ව යොමු කරන්න.

## ක්‍රියාකාරකම 3

පහත සඳහන් වගන්ති බලා ලිවීමට යොමු කරන්න. වචන ලිවීමේ දී මූර්ධජ ණ, ළ දන්තජ ල, න මූර්ධජ ළු දන්තජ ලු සඤ්ඤක ඳ, ඟ, ඬ, ඹ රකාරාංශය (්‍ර) යංශය (්‍ය) ගයනුකිත්ත (ෟ) යන අකුරු හා පිලි පිළිබඳ සැලකිල්ලක් දක්වන්න.

බලා ලිවීමට යොමු කරන වගන්ති සිසුන් ලවා කියවීමට ද යොමු කරන්න.

උදාහරණ :

1. ගවයා තණකොළ කයි
2. තන කිරි දරුවාට අංග සම්පූර්ණ ආහාරයකි
3. අම්මා පොළට ගියාය.
4. ගොවියා පලතුරු කැඩුවේ ය.
5. රම්‍යා අඬමින් ගුරුතුමී ළඟට ගියා ය.
6. දඹුල වැල් වර්ගයකි.
7. ළමයි ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයති.
8. අපි හොඳ සෞඛ්‍ය පුරුදු ඇති කර ගනිමු.
9. බෙර හඬ ඇතින් ඇසේ.
10. අලුත් එළවළු ආහාරයට ගන්න.

## ක්‍රියාකාරකම 4

ස, ශ, ෂ, න, ණ, ල, ළ, ්‍ය, ්‍ර, ෟ යන අකුරු සහ පිලි නිවැරදි ව භාවිත කර ලියන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා සුදුසු වචන අසා ලිවීමට යොමු කරවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 5

පහත සඳහන් ක්‍රියාකාරකම් සිසුන් වෙත ඉදිරිපත් කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න. මෙවැනි වෙනත් අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.

1. අම්මා ............................ (පහණ - පහන) දල්වා සඳකඩ .................. (පහන - පහණ) මත තැබුවා ය.
2. ...................... (පැළ - පැල) තවාන බැලීමට ගිය ගොවියා .............. (පැල - පැළ) ඇතුළට ගියේ ය.
3. ................... (වනය - වණය) තුළ තිබූ ගසක කිරි ගෑවී සංජයගේ කකුල ................ (වණයක් - වනයක්) විය.
4. .................. (කන - කණ) වැල අල්ලාගෙන පැමිණි සිගන්නා බත් ........... (කණ - කන) ගමන් සිනාසුණේ ය.
5. .............. (වල - වළ) තුළට ගිය මාමා මාළුන් පිරි ........... (වළ - වල) දෙස බලා සිටියේ ය.

නිපුණතා මට්ටම

ලේඛන බසින් සරල රීති කිහිපයක් අනුව ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

මෙහි දී කථිත බස (කතා කරන භාෂාව) හා ලිඛිත බස (ලියන භාෂාව) අතර වෙනස පැහැදිලි කර දෙන්න.

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| කුරුල්ලා පියාඹනවා. | කුරුල්ලා පියාඹයි. |
| උදාර සෙල්ලම් කරනවා. | උදාර සෙල්ලම් කරයි. |
| ගොවියෝ කුඹුර කොටනවා. | ගොවියෝ කුඹුර කොටති. |
| ධීවරයෝ මාළු අල්ලනවා. | ධීවරයෝ මාළු අල්ලති. |
| ගස සුළඟට වැනෙනවා. | ගස සුළඟට වැනෙයි. |
| කරත්තය වැස්සට තෙමෙනවා. | කරත්තය වැස්සට තෙමෙයි. |
| පිනට දීම හොඳ ක්‍රියාවක්. | පිනට දීම හොඳ ක්‍රියාවකි. |
| අනුරාධපුරය පූජා භූමියක්. | අනුරාධපුරය පූජා භූමියකි. |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

සචේතනික, අචේතනික (ප්‍රාණවාචී, අප්‍රාණවාචී) පද වගන්තිවල යෙදෙන ආකාරය පිළිබඳ දරුවන්ට උපදෙස් දෙන්න.

⮝ නාම පද

තැනක්, කෙනෙක්, දෙයක් හඟවන පද නාම පද ලෙස හඳුන්වා දෙන්න.

උදාහරණ :

| තැනක් | කෙනෙක් | දෙයක් |
|---|---|---|
| මහරගම | නිමල් | පෑන |
| පාසල | ගුරුවරයා | බසය |
| ඉන්දියාව | කුරුල්ලා | ගස |

ක්‍රියාකාරකම 2

සිසුන් කණ්ඩායම් කරන්න. පාසල් වත්තට රැගෙන යන්න. පාසල් වත්තේ ඇති ස්ථාන, සිටින අය, තිබෙන දේවල්, ලැයිස්තු ගත කරවන්න.
ලියා ගත් ලැයිස්තුව පහත වගුව තුළ යෙදීමට උපදෙස් දෙන්න.

| තැනක් | කෙනෙක් | දෙයක් |
|---|---|---|
| | | |

මෙවැනි තවත් ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කරවන්න.

➤ ක්‍රියා පද

කිරීමක් හෝ සිදුවීමක් හඟවන පද ක්‍රියා පද වේ

| කිරීමක් | සිදුවීමක් |
|---|---|
| පියාඹයි | සෙලවෙයි |
| දුවයි | බබළයි |
| උයයි | පායයි |
| | පිපෙයි |

ක්‍රියාකාරකම 3

සිසුන් කණ්ඩායම් කර සෙල්ලම් මිදුලට රැගෙන යන්න. සිසුන් විවිධ ක්‍රියාකාරකම්වල යොදවන්න. තව ද ඉබේ සිදු වන දේවල් කෙරෙහි ද අවධානය යොමු කරවන්න.
ඒ ඇසුරෙන් ක්‍රියා පද ලැයිස්තු ගත කරවන්න.
ලියා ගත් ලැයිස්තුව පහත වගුව තුළ යෙදීමට උපදෙස් දෙන්න.

| කිරීමක් | සිදුවීමක් |
|---|---|
| | |

ක්‍රියාකාරකම 4

පෙළ පොතින් තෝරා ගත් ඡේද තුළ ඇති නාම පද හා ක්‍රියා පද වෙන් කර ලිවීමට සිසුන් යොමු කරවන්න.

ක්‍රියාකාරකම 4

ඉහත සඳහන් ක්‍රියාකාරකම් 2 සහ 3 ඇසුරෙන් ලිඛිත බසින් සරල වැකි නිර්මාණයට සිසුන් යොමු කරන්න.

උදාහරණ :- නිමල් වේගයෙන් දුවයි.

මම, අපි උක්ත ලෙස යෙදෙන විට ලේඛන වහරේ දී නිවැරදි ව ලියන ආකාරය හුරු කරවන්න.

උදාහරණ :

මම පොත් කියවනවා
මම පොත් කියවමි
මම පැළ සිටුවනවා
මම පැළ සිටුවමි
අපි සෙල්ලම් කරනවා
අපි සෙල්ලම් කරමු
අපි පාඩම් කරනවා
අපි පාඩම් කරමු

සිසුන්ගේ සාධන මට්ටම් අනුව වැකි නිර්මාණය සඳහා තව දුරටත් අවස්ථා සලසා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තක්සේරු කිරීමේ පරිමාණය
සාර්ථකව කරයි ✓
දුෂ්කරතා පෙන්නුම් කරයි/
තව දුරටත් උදවු අවශ්‍යයි •

| සිසුන්ගේ නම් | | |
|---|---|---|
| 1. පන්ති කාමරය තුළ ගුරුතුමා දෙන උපදෙසකට සවන් දී එහි අදහස අවබෝධ කර ගනියි. | | |
| 2. චරිතාරෝපිත ව කරනු ලබන දෙබසකට හෝ කතන්දරයකට සවන් දී ඉන් ප්‍රකාශ වූ අදහස් අවබෝධ කර ගනියි. | | |
| 3. දෙබසකට සවන් දී එහි ඇති ස්ථාන නාම, සත්ත්ව නාම හා පුද්ගල නාම කීපයක් ප්‍රකාශ කරයි. | | |
| 4. භාවිතයේ පවතින තේරවිලි කීපයකට සවන් දී ඒවා විසඳයි. | | |
| 5. ළමා කතන්දරවලට, ගීවලට, නාට්‍යවලට වින්දනයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි. | | |
| 6. එදිනෙදා සිදුවීම් හා සම්බන්ධ තොරතුරු දැන ගැනීමට ගුවන් විදුලියට, රූපවාහිනියට, අමුත්තන්ට සවන් දී කරුණු ඉදිරිපත් කරයි. | | |
| 7. සිද්ධියකට, කතන්දරයකට සවන් දී එහි ප්‍රධාන අවස්ථා සිදු වූ අනුපිළිවෙළ අවබෝධ කර ගෙන පන්තියට ඉදිරිපත් කරයි. | | |
| 8. ළමා කතන්දරයක් අසන්නාට පැහැදිලි වන ලෙසට මතකයෙන් කියයි. | | |
| 9. තමාගේ ආසන්න ම යහළුවන් සමඟ සුහද ව කතා බහේ යෙදෙයි. | | |
| 10. ළමා කවි, ගී හෝ සින්දුවක් තාලයට මතකයෙන් ගයයි. | | |
| 11. රබන් පද නිවැරදි උච්චාරණය සහිත ව ශබ්ද නඟා ගයයි. | | |
| 12. දෙනු ලබන පණිවිඩයක් අදහස වෙනස් නොවන ලෙසට ගෙන ගොස් ප්‍රකාශ කරයි. | | |
| 13. පෙළ පොතේ ඕනෑ ම කොටසක් නැවතීම සහ ප්‍රශ්නාර්ථය යන විරාම ලක්ෂණ ගැන සැලකිලිමත් ව වචන පැකිලීමකින් තොරව ශබ්ද නගා කියවයි. | | |
| 14. ස, ශ, ෂ යන අකුරු සහිත වචන නිවැරදි ව ශබ්ද නඟා කියවයි. | | |
| 15. පෙළ පොතෙන් ඉදිරිපත් කරනු ලබන සරල ඡේදයක් නිශ්ශබ්ද ව කියවා අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | | |
| 16. ළමා කවි හා කතන්දර කියවීමට කැමැත්තක් දක්වයි. | | |
| 17. පෙළ පොතෙන් ඉදිරිපත් කරනු ලබන වචනවලට සමානාර්ථ සහ විරුද්ධාර්ථ පද ප්‍රකාශ කරයි. | | |
| 18. දෙනු ලබන ඡේදයක් නිවැරදි අංග සහිත ව, ප්‍රමාණයෙන්, හැඩයෙන් යුතු අකුරු සහිත ව බලා ලියයි. | | |
| 19. ලිවීමේ දී නැවතීමේ තිත නිවැරදි ව භාවිත කරයි. | | |
| 20. පෙළ පොතෙන් උපුටා ගත් වාක්‍ය කීපයක් අසා ලියයි. | | |
| 21. තමාගේ නම, ලිපිනය, ලියයි. | | |
| 22. දෙනු ලබන මාතෘකාවකට අනුව වැකි කීපයක් ලියයි. | | |
| 23. පෙළ පොතේ තෝරා ගත් ඡේදයකින් නාම පද, ක්‍රියා පද වෙන් කර ලියයි. | | |
| 24. චිත්‍රයක් හෝ කාටූන් චිත්‍රයක් බලා එයට අනුව දෙබසක් ගොඩ නගා ලියයි. | | |
| 25. ස, ශ, ෂ, න, ණ, ල, ළ, ්‍ය, ෟ යන අකුරු සහ පිළි නිවැරදි ව භාවිත කරමින් වචන අසා ලියයි. | | |

## 2.0 පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තේමා

### 2.1 පැළෑටි හා ගස්වැල්

නිපුණතා

★ ආසන්න පරිසරයේ වැඩෙන ශාක විමර්ශනය කර වාර්තා කරයි.
★ ශාකයක ප්‍රධාන කොටස් හඳුනාගෙන වාර්තා කරයි.
★ ශාකපත්‍රවල ඇති සුවිශේෂී ලක්ෂණ ගවේෂණය කර වාර්තා කරයි.
★ පැළෑටි හා ගස්වැල් ආශ්‍රිත ව ගායන සහ රංගනවල නිරත වෙයි.
★ විවිධ ශාක කොටස් භාවිත කරමින් නිර්මාණ කරයි.
★ ගස්වැල්වල පැවැත්මෙහි ඇති වැදගත්කම අගය කරයි.
★ ගස්වැල් ආශ්‍රිත ව සකස් කෙරෙන නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ ආසන්න පරිසරයේ වැඩෙන ශාක
✓ ශාක පත්‍රවල සුවිශේෂී ලක්ෂණ
✓ පැළෑටි හා ගස්වැල්වල චලන, ගායන, රංගන හා නිරූපණ
✓ ශාකයක ප්‍රධාන කොටස්
✓ ශාකයක කොටස් ආශ්‍රිත නිර්මාණ
✓ ගස්වැල්වල පැවැත්මෙහි ඇති වැදගත්කම
✓ ගස්වැල් ආශ්‍රිත ව නිර්මාණාත්මක ක්‍රීඩා

### 2.2 අප අවට සත්තු

නිපුණතා

★ නිවස හා නිවෙස් ආශ්‍රිත ව ඇති කරන සතුන් පිළිබඳ මූලික තොරතුරු විමර්ශනය කර වාර්තා කරයි.
★ සතුන්ගේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් නිරීක්ෂණය කර වාර්තා කරයි.
★ සතුන්ගෙන් මිනිසා ලබන ප්‍රයෝජන පිළිබඳ විමර්ශනය කර තොරතුරු වාර්තා කරයි.
★ ගෘහ ආශ්‍රිත සතුන්ගෙන් වන හානි හා අනතුරු පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
★ ගෘහ ආශ්‍රිත සතුන් රැක ගැනීම සහ ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම අගය කරයි.
★ විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් සත්ත්ව ආකෘති නිර්මාණය කරයි.
★ සත්ත්ව චර්යා විදහා දැක්වෙන රංගන හා ගායනවල නිරත වෙයි.
★ සත්ත්ව චර්යා නිරූපණය වන විනෝදාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ නිවස හා නිවෙස් ආශ්‍රිත ව ඇති කරන සතුන් පිළිබඳ තොරතුරු
✓ සතුන්ට සුවිශේෂී ලක්ෂණ සහ හැසිරීම් රටා
✓ සතුන්ගෙන් මිනිසා ලබන ප්‍රයෝජන
✓ විවිධ මාධ්‍ය භාවිතයෙන් සත්ත්ව ආකෘති නිර්මාණය
✓ සත්ත්ව චර්යා විදහා දැක්වෙන කෙටි නාට්‍ය, රංගන, ගායන
✓ සත්ත්ව චරිත ආශ්‍රිත නිර්මාණාත්මක ක්‍රීඩා
✓ ගෘහ ආශ්‍රිත සතුන්ගෙන් වන හානි, අනතුරු සහ ඒවායින් වැළකී සිටීමට කළ හැකි දේ

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.3 අප පරිහරණය කරන දේ

නිපුණතා

★ නිවසේ දී හා පන්ති කාමරයේ දී එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ නිවැරදි ව හා ක්‍රමානුකූල ව පරිහරණය කරයි.
★ යම් කාර්යයක් ඉටු කර ගැනීමේ දී ඊට සුවිශේෂී වූ භාණ්ඩ හා උපකරණ හඳුනා ගෙන භාවිත කරයි.
★ භාණ්ඩ හා උපකරණ පරිහරණයේ දී ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
★ එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ හා උපකරණවල පිරිසිදුකම පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
★ එදිනෙදා ඉවත ලන දේ ඇසුරින් විවිධ නිර්මාණ කරයි.
★ අදාළ කාර්යයට උචිත සරල මැහුම් හා ගෙතීම් කරයි.
★ නිර්මාණය කර ගන්නා ලද උපකරණයක්/භාණ්ඩයක් භාවිත කරමින් ක්‍රීඩාවන්හි නියැළෙයි.
★ එදිනෙදා පරිහරණය කරන දේ භාවිත කරමින් සාමූහික ව ගායන, රංගනවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ එක් එක් කාර්යයන් සඳහා සුවිශේෂී භාණ්ඩ හා උපකරණ
✓ භාණ්ඩ හා උපකරණ නිවැරදි ව හා ක්‍රමානුකූල ව භාවිතය
✓ භාණ්ඩ හා උපකරණ පරිහරණයේ දී ආරක්ෂාකාරී බව
✓ පරිහරණය කරන භාණ්ඩ හා උපකරණවල පිරිසිදුකම පිළිබඳ සැලකිලිමත් බව
✓ ඉවතලන ද්‍රව්‍ය ඇසුරින් කරනු ලබන නිර්මාණ හා සරල මැහුම් ක්‍රම
✓ සරල නිර්මාණ ඇසුරින් වින්දනාත්මක ක්‍රීඩා
✓ එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ ආශ්‍රයෙන් කරන ගායන, රංගන

## 2.4 අපේ ආහාර

නිපුණතා

★ ආහාර ගැනීමේ දී සිරිත් විරිත් හා යහපුරුදු පිළිපදියි.
★ ආහාර ගැනීමේ වැදගත්කම අගය කරමින් මිශ්‍ර ආහාර වේලක් ගනියි.
★ ආහාර ගැනීම කෙරෙහි සැලකිලිමත් වෙමින් ප්‍රධාන ආහාර වේල් නියමිත වේලාවට ගනියි.
★ පරිසරයෙන් සපයා ගත හැකි ගුණාත්මක බවින් උසස් ආහාර වර්ග තෝරා ගනියි.
★ ලෙඩ රෝගවලින් ආරක්ෂාවීම සඳහා පිරිසිදු හා නරක් නොවූ ආහාර තෝරා ගනියි.
★ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් ආහාර පුරුදු සහ සිරිත් විරිත් හා බැඳුණු විවිධ නිර්මාණ කරයි.
★ මිශ්‍ර ආහාරවල වැදගත්කම මතු වන ආකාරයෙන් කෙටි නාට්‍ය, රංගන හා ගායනවල නිරත වෙයි.
★ ආහාර ගැනීමේ වැදගත්කම මතු වෙන විනෝදාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ ආහාර ගැනීමේ දී පිළිපැදිය යුතු සිරිත් විරිත් හා යහපුරුදු
✓ මිශ්‍ර ආහාර වේලක ඇති වැදගත්කම
✓ නියමිත වේලාවට, නියමිත ප්‍රමාණයෙන් ආහාර ගැනීමේ වැදගත්කම
✓ අපිරිසිදු හා නරක් වූ ආහාර ගැනීමෙන් ඇති විය හැකි ලෙඩ රෝග හා ඒවා වළක්වා ගැනීමට කළ හැකි දේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

✓ ගුණාත්මක බවින් උසස් හා නිරෝගී බව පවත්වා ගැනීම සඳහා සුදුසු ආහාර වර්ග තෝරා ගැනීම කෙරෙහි සැලකිලිමත් බව
✓ ආහාර වර්ගවල ආකෘති නිර්මාණ
✓ ආහාර/ආහාර ගැනීමේ වැදගත්කම පිළිබිඹු කෙරෙන කෙටි නාට්‍ය, රංගන සහ ගායන
✓ ආහාර පාන වර්ග හා බැඳුණු නිර්මාණාත්මක ක්‍රීඩා

## 2.5 අපි ලක්වැසියෝ

### නිපුණතා

★ ජාතික කොඩියට ගරු කරමින් ජාතික ගීය අභිමානයෙන් යුතුව ගායනය කරයි.
★ ශ්‍රී ලංකාවේ වාසය කරන විවිධ ජන කොටස්වල සංස්කෘතින් අගය කරමින් සහ ඒවාට ගරුකරමින් කටයුතු කරයි.
★ ජාතික හෝ ආගමික හෝ වැදගත්කම පිළිබිඹු වන විවිධ නිර්මාණ කරයි.
★ ජාතික අභිමානය දැක්වෙන කවි, ගී, ගායන හා රංගනවල යෙදෙයි.
★ ශ්‍රී ලාංකිකයන්ට අනන්‍ය වූ ක්‍රීඩාවල වින්දනාත්මක ව නියැළෙයි.

### අන්තර්ගතය

✓ ශ්‍රී ලාංකිකයකු ලෙස අභිමානයක් ඇති වීමට හේතු වන කරුණු
✓ ශ්‍රී ලාංකික විවිධ ජන කොටස්වල තොරතුරු හා සංස්කෘතිය
✓ ජාතික කොඩිය හා ජාතික ගීය
✓ විවිධ ජන කොටස්වලට සුවිශේෂී උත්සව
✓ ජාතික හා ආගමික වශයෙන් වැදගත්කම විදහා දැක්වෙන නිර්මාණ
✓ ජාතික අභිමානය දැක්වෙන කවි, ගී ගායන හා රංගන
✓ ජන ක්‍රීඩා

## 2.6 ආරක්ෂාව හා පරිස්සම

### නිපුණතා

★ තමාගේ හා අන් අයගේ ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ සැලකිලිමත් වෙමින් කටයුතු කරයි.
★ අනතුරු සිදුවිය හැකි අවස්ථා හා එවැනි අවස්ථාවක දී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.
★ අනතුරු හා ලෙඩ රෝගවලින් ආරක්ෂාවීම කෙරෙහි සැලකිලිමත් ව කටයුතු කරයි.
★ අනතුරු සිදුවන අවස්ථා සහ එවැනි අවස්ථාවල දී කටයුතු කළ යුතු ආකාරය නිරූපණය කෙරෙන ගායනා හා රංගනවලට දායක වෙයි.
★ අනතුරු පිළිබඳ ව අන් අය දැනුවත් කිරීම සඳහා විවිධ නිර්මාණ කරයි.
★ තමාගේ මෙන් ම අන් අයගේ ආරක්ෂාව පිළිබඳ අවධානයෙන් යුතු ව ක්‍රීඩාවල නිරත වෙයි.

### අන්තර්ගතය

✓ තමාගේ හා අන් අයගේ ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ සැලකිලිමත් බව
✓ මාර්ගයේ දී හා නිවසේ දී අනතුරු සිදු විය හැකි අවස්ථා
✓ අනතුරක් සිදු වූ අවස්ථාවක දී ක්‍රියා කළ යුතු ආකාරය
✓ කාලීන වශයෙන් වැළඳිය හැකි රෝග
✓ අනතුරු සිදුවන අවස්ථා හා සම්බන්ධ සිද්ධි නිරූපණය
✓ අනතුරු පිළිබඳ දැනුවත් කිරීම සඳහා විවිධ නිර්මාණ
✓ අනතුරු හා අනතුරුවලින් වැළකීම පිළිබඳ කියවෙන කවි, ගී, කතන්දර



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.7 ජලය

නිපුණතා

★ විවිධ දේ ජලය සමඟ ප්‍රතික්‍රියා කරන ආකාරය පිළිබඳ ව විමර්ශනය කර වාර්තා කරයි.
★ ජලය ස්වභාවික සම්පතක් ලෙස අගය කරමින් සුරක්ෂිත ලෙස පරිහරණය කරයි.
★ පාසලට හා නිවසට ජලය සැපයෙන ක්‍රම හා ජලය රැස් කර තබා ගන්නා අවස්ථා පිළිබඳ ව තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ ජලය තේමා කොට ගත් රංගන, ගායන, වාදන තනි ව හා සාමූහික ව ඉදිරිපත් කරයි.
★ ජලය සැපයෙන ක්‍රමවල ආකෘති සහ ජලය රැස් කර තබා ගන්නා උපකරණවල ආකෘති නිර්මාණය කරයි.
★ ජලය ආශ්‍රයෙන් කෙරෙන ක්‍රීඩාවල යෙදෙමින් ආශ්වාදයක් ලබයි.
★ ජලය උපයෝගි කර ගෙන විවිධ දේ නිර්මාණය කරමින් වින්දනයක් ලබයි.

අන්තර්ගතය

✓ ජලයෙන් ලැබෙන විවිධ ප්‍රයෝජන
✓ ජලය සුරක්ෂිත ලෙස පරිහරණය
✓ විවිධ ද්‍රව්‍ය ජලය සමඟ ක්‍රියා කරන ආකාරය
✓ ජලය රැස් කර තබා ගන්නා ආකාර හා ජලය සපයා ගන්නා අවස්ථා ආකෘති මඟින් නිර්මාණය හා ඒ පිළිබඳ තොරතුරු
✓ ජලය තේමා කොටගත් රංගන, ගායන, වාදන
✓ ජලය ආශ්‍රයෙන් කරනු ලබන ක්‍රීඩා
✓ ජලය ආශ්‍රයෙන් ක්‍රියා කරවිය හැකි විවිධ නිර්මාණ

## 2.8 ගමනාගමනය

නිපුණතා

★ නිවසේ සිට පාසලට යන එන මං පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ තමා අවට ප්‍රදේශයේ ජනතාව ගමනාගමනය සඳහා භාවිත කරන ක්‍රම පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ පාරේ ගමන් කරන්නන් විසින් අනුගමනය කළ යුතු නීති රීති දැන ගෙන ඒවාට අනුව කටයුතුකරයි.
★ වාහනවලින් ඉටු කර ගන්නා විවිධ කාර්යයන්/සේවාවන් අගය කරමින් ඒවා සුරැකෙන ආකාරයෙන් කටයුතු කරයි.
★ වාහන නිසා පරිසරයට වන අහිතකර බලපෑම් පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ වාහනවලින් සිදු වන අහිතකර බලපෑම් අවම කර ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කරයි.
★ ගමනාගමන අවස්ථා ගායන/වාදන/රංගන/අභිරූපණ/නාට්‍ය මඟින් ඉදිරිපත් කරයි.
★ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් වාහනවල ආකෘති නිර්මාණය කරයි.
★ ගමනාගමනය ආශ්‍රිත ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ පාසල අවට පරිසරයේ මං මාවත් පිළිබඳ තොරතුරු
✓ පාරේ ගමන් කරන්නන් විසින් අනුගමනය කළ යුතු මාර්ග නීති රීති හා සංඥා
✓ වාහනවලින් ඉටු කර ගන්නා විවිධ කාර්යයන්/සේවාවන් හා ඒවායෙහි සුරක්ෂිතභාවය
✓ වාහන නිසා පරිසරයට වන අහිතකර බලපෑම් පිළිබඳ තොරතුරු
✓ එම අහිතකර බලපෑම් අවම කර ගැනීමට කළ හැකි යෝජනා



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ✓ ගායන, වාදන, රංගන මගින් ගමනාගමනය පිළිබඳ අවස්ථා නිරූපණය
- ✓ විවිධ මාධ්‍ය භාවිතයෙන් වාහනවල ආකෘති නිර්මාණය
- ✓ පොදු සම්පත් නිවැරදි ව පරිහරණය
- ✓ වාහන, ගමනාගමනය ආශ්‍රිත ක්‍රීඩා

## 2.9 ගෙවත්ත

### නිපුණතා

- ★ ගෙවතු වගාවට දායක වීම තුළින් වින්දනයක් ලබයි.
- ★ බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම භාවිත කරයි.
- ★ විවිධ නිර්මාණ මගින් ගෙවත්තක සුන්දරත්වය මතු කර දක්වයි.
- ★ ගෙවතු වගාවේ වැදගත්කම අගය කරයි.
- ★ ගෙවත්තක සුන්දරත්වය මතු වන කවි, ගී, දෙබස් හා රංගනවල නිරත වෙයි.

### අන්තර්ගතය

- ✓ ගෙවත්තක ලක්ෂණ
- ✓ ගෙවත්තක ගස්වැල් පැළෑටි ව්‍යාප්ත වී ඇති ආකාරය
- ✓ බෝගයක් පැළවෙන ආකාර පිළිබඳ නිරීක්ෂණ
- ✓ ගෙවත්තක් ක්‍රමවත් ව පවත්වා ගැනීමට හා රැක බලා ගැනීමට ලබා දෙන දායකත්වය හා එහි වැදගත්කම
- ✓ යම් මාධ්‍යයක් භාවිත කර ගෙවත්තක ආකෘතියක් නිර්මාණය
- ✓ ගෙවත්තක වැදගත්කම කියවෙන කවි, ගී, ගායන හා රංගන

## 2.10 වැඩ පහසු කිරීමේ මං

### නිපුණතා

- ★ පිළිවෙළට හා ක්‍රමවත් ව වැඩ කරමින් එදිනෙදා කරන වැඩ කටයුතු පහසුවෙන් හා ඉක්මනින් කර ගැනීම සඳහා අවබෝධයෙන් යුතු ව ක්‍රියා කරයි.
- ★ එක්ව කටයුතු කිරීමෙන් වැඩ පහසු වන බව අවබෝධ කරගෙන ක්‍රියා කරයි.
- ★ විවිධ සරල යන්ත්‍ර හා ක්‍රම ශිල්ප භාවිත කරමින් එදිනෙදා වැඩ පහසු කර ගනියි.
- ★ වැඩ පහසු කර ගැනීමට වර්තමානයේ මෙන් ම අතීතයේ ද යොදා ගත් ක්‍රම ශිල්ප ගවේෂණය කර වාර්තා කරයි.
- ★ වැඩ පහසු කර ගැනීමට යොදා ගන්නා සරල උපකරණවල ආකෘති විවිධ මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කරයි.
- ★ වැඩ පහසු කිරීම සඳහා යොදා ගන්නා උපකරණවලින් කෙරෙන කාර්යයන් නිරූපණය කෙරෙන ගායනා/රංගනවල නිරත වෙයි.
- ★ සහයෝගී ක්‍රීඩාවල වින්දනාත්මක ව නිරත වෙයි.

### අන්තර්ගතය

- ✓ එදිනෙදා වැඩ පහසු කර ගැනීම සඳහා විවිධ උපකරණ, ක්‍රමශිල්ප හා සතුන් යොදා ගත් ආකාර
- ✓ කිහිප දෙනෙක් එක් ව කටයුතු කිරීමෙන් වැඩ පහසු වන බව
- ✓ වර්තමානයේ සහ අතීතයේ වැඩ පහසු කර ගැනීමට යොදා ගත් ක්‍රමශිල්ප පිළිබඳ ගවේෂණය
- ✓ සරල උපකරණවලින් කෙරෙන කාර්යයන් තේමා කොට ගත් ගායන, රංගන



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

✓ වැඩ කිරීමේ දී ඒවා ක්‍රමවත් ව හා පිළිවෙළට සිදු කිරීම තුළින් පහසුවෙන් හා ඉක්මනින් එම කාර්යය කළ හැකි බව
✓ වැඩ පහසු කර ගැනීමට භාවිත කරන සරල උපකරණ උපයෝගී කර ගනිමින් කරනු ලබන නිර්මාණ
✓ සහයෝගයෙන් හා වින්දනාත්මක ව කළ හැකි විනෝද ක්‍රීඩා

## 2.11 මිනිස් හැසිරීම්

නිපුණතා
★ තමා පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.
★ අන් අය පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.
★ අන් අය සමඟ ප්‍රියජනක ලෙස කතා බහ කරයි.
★ කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් ක්‍රීඩාවල නිරත වෙයි.
★ ගුණ යහපත්කම ගැන කියවෙන කවි, ගී ගායන කරමින් එවැනි ගුණ යහපත්කම් තමා තුළ තිබේ දැයි විමසා බලයි.
★ ගුණ යහපත්කම් ප්‍රදර්ශනය කෙරෙන රංගනවල නිරත වෙයි.
★ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් යහපත් පැවතුම් ඇතුළත් විවිධ නිර්මාණ කරයි.

අන්තර්ගතය
✓ තමා මෙන් ම අන් අය පිළිබඳ ව සංවේදී බව
✓ අන් අය සමඟ ප්‍රියජනක ලෙස කතා බහ
✓ කණ්ඩායම් වශයෙන් කළ හැකි ක්‍රීඩා
✓ ගුණ යහපත්කම ගැන කියැවෙන කවි, ගී සහ ඒවා තාලානුකූල ව ගායනා
✓ ගුණ යහපත්කම ප්‍රදර්ශනය කෙරෙන රංගන
✓ විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් යහපත් ප්‍රාර්ථනා ඇතුළත් විවිධ නිර්මාණ

## 2.12 පොළොව හා අහස

නිපුණතා
★ භූමියේ මතු පිට විවිධත්වය විමර්ශනය කර වාර්තා කරයි.
★ සුළඟින් පරිසරයේ සිදු වන වෙනස්කම් හඳුනා ගෙන වාර්තා කරයි.
★ සුළඟින් ක්‍රියාත්මක කළ හැකි නිර්මාණ කරයි.
★ සුළඟේ හා වැස්සේ විවිධ අවස්ථා විවිධ මාධ්‍ය භාවිත කරමින් ඉදිරිපත් කරයි.
★ වැස්සට පෙර, වැස්ස හා වැස්සට පසු අවස්ථාවල දී පරිසරයේ ස්වභාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
★ වැස්ස හා සුළං ආශ්‍රිත ගායන හා රංගනවල යෙදේ.
★ ශරීරය පොළෙවෙන් ඉහළට නික්මීමේ හා පොළොවට පතිත වීමේ වින්දනාත්මක ක්‍රීඩාවල නියැළෙයි.

අන්තර්ගතය
✓ භූමියේ මතු පිට විවිධත්වය
✓ සුළඟින් පරිසරයේ සිදු වන වෙනස්කම්
✓ විවිධ කාලගුණික අවස්ථාවල දී පරිසරයේ ස්වභාවය
✓ සුළඟින් ක්‍රියාත්මක කළ හැකි නිර්මාණ
✓ වැස්ස හා සුළං ආශ්‍රිත ගායන හා රංගන
✓ අවකාශ භාවිත කරමින් කළ හැකි ක්‍රීඩා

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.13 අපට කළ හැකි වෙනස්කම්

නිපුණතා

★ තම පන්තියේ හා පන්තියට සමීප පරිසරයේ සිදු කළ හැකි යහපත් වෙනස්කම් අධ්‍යයනය කරයි.
★ යහපත් වෙනස්කම් සඳහා පන්තියේ මිතුරු මිතුරියන් සමඟ එක් ව කටයුතු කරයි.
★ සිදු කරන ලද යහපත් ක්‍රියාවලියේ අත්දැකීම් බෙදා හදා ගනියි
★ එකිනෙකාගේ දායකත්වය අගය කිරීම හා සාමූහික ව කටයුතු කිරීමේ වටිනාකම අගය කරයි.
★ වෙනස්කම්වලට පෙර තත්ත්වය හා පසු තත්ත්වය සංසන්දනාත්මක ව අගය කරයි.
★ යහපත් වෙනස්කම් පිළිබඳ ව නිර්මාණාත්මක කවි, ගී, ගායනා කරයි. රංගනය කරයි. විවිධ නිර්මාණවල යෙදෙයි.
★ යහපත් ස්ථානයක් ලෙස ක්‍රීඩා පිටිය හඳුනා ගනිමින්, නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ තම පන්තියේ හා පන්තියට සමීප පරිසරයේ සිදු කළ හැකි යහපත් වෙනස්කම්
✓ වෙනස්කම් සිදු කිරීමේ දී තම දායකත්වය
✓ සිදු කරන ලද වෙනස්කම් සඳහා වූ ක්‍රියාවලියේ අත්දැකීම්
✓ එකිනෙකාගේ දායකත්වය අගය කිරීම හා සාමූහිකත්වයෙන් කටයුතු කිරීමේ වැදගත්කම
✓ වෙනස්කම්වල පෙර හා පසු තත්ත්වය සැසඳීම
✓ යහපත් ස්ථානයක් ලෙස ක්‍රීඩා පිටිය හඳුනා ගනිමින්, කළ හැකි නිර්මාණාත්මක ක්‍රීඩා

## 2.14 මිනිසා හා තොරතුරු

නිපුණතා

★ තම අවශ්‍යතා සඳහා විවිධ ක්‍රම භාවිත කරමින් තොරතුරු හුවමාරු කර ගනියි.
★ යම් දෙයක් හෝ තැනක් හෝ පුද්ගලයෙක් හෝ පිළිබඳ තොරතුරු දැන ගත හැකි මාර්ග විමසා බලා වාර්තා කරයි.
★ තොරතුරු ලබා ගැනීමේ දී අන් අයට හිරිහැර නොවන චර්යා පවත්වා ගනියි.
★ විවිධ ක්‍රම ශිල්ප භාවිත කරමින් තොරතුරු ලබා ගනියි.
★ විවිධ ක්‍රම අනුගමනය කරමින් තොරතුරු වාර්තා කරයි.

අන්තර්ගතය

✓ විවිධ ක්‍රම භාවිත කරමින් තොරතුරු හුවමාරුව
✓ තොරතුරු දැන ගත හැකි මාර්ග
✓ තොරතුරු හුවමාරුවේ දී අන් අයට හිරිහැර නොවන චර්යා
✓ තොරතුරු ලබා ගැනීමේ විවිධ ක්‍රම ශිල්ප
✓ තොරතුරු වාර්තා කිරීමේ විවිධ ක්‍රම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.15 අපේ අතීත විත්ති

නිපුණතා

★ පාසලේ මෑත අතීතයේ සිදු වූ වැදගත් සිදුවීම් පිළිබඳ තොරතුරු විමර්ශනය කර වාර්තා කරයි.
★ අතීතයේ තම පාසල පැවති තත්ත්වය පිළිබඳ තොරතුරු වාර්තා කරයි.
★ පාසලේ අද පවතින තත්ත්වය හා එදා පැවති තත්ත්වය අතර වෙනස්කම් සංසන්දනාත්මක ව ප්‍රකාශ කරයි.
★ තම ප්‍රදේශයේ පවතින ජන කලා ඇසුරෙන් විවිධ නිර්මාණවල යෙදෙයි.
★ ප්‍රදේශයේ අතීත පුවත් හා සම්බන්ධ කවි, ගී, ගායන, රංගන, කතන්දර ඉදිරිපත් කරයි.
★ අතීතයේ සිට පැවත එන ජන ක්‍රීඩාවක සාමූහික ව නියැළෙයි.

අන්තර්ගතය

✓ පාසලේ මෑත අතීතයේ සිදු වූ වැදගත් සිදුවීමක් පිළිබඳ තොරතුරු
✓ අතීතයේ තම පාසලේ පැවති තත්ත්වය පිළිබඳ තොරතුරු
✓ පාසලේ අද පවතින තත්ත්වය හා එදා පැවති තත්ත්වය පිළිබඳ වෙනස්කම්
✓ තම ප්‍රදේශයේ පවතින ජන කලා ඇසුරෙන් කෙරෙන විවිධ නිර්මාණ
✓ අතීත පුවත් හා සම්බන්ධ කවි, ගී, ගායන, රංගන හා කතන්දර
✓ අතීතයේ සිට පැවත එන ජන ක්‍රීඩා

## 2.16 අපේ යහපැවැත්ම

නිපුණතා

★ තමාගේ හා පන්තියේ අනෙක් අයගේ යහ පැවැත්ම කෙරෙහි සංවේදී ව කටයුතු කරයි.
★ පාසලට සම්බන්ධ පොදු කාර්යයන්හි දී නිවැරදි චර්යා ප්‍රදර්ශනය කරයි.
★ තමාගේ හා අනෙක් අයගේ යහපැවැත්මට අදාළ පුරුදු අනුගමනය කරයි.
★ තමාගේ හා අන් අයගේ යහපැවැත්මට තුඩු දෙන නිර්මාණවල යෙදෙයි.
★ යහපැවැත්මෙහි අගය අවධාරණය කෙරෙන කවි, ගී ගායන හා රංගනවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ තමා පිළිබඳ සංවේදී බව
✓ පන්තියේ අන් අය කෙරෙහි සංවේදී බව
✓ පන්තියේ හා පාසලේ පොදු කටයුතුවල දී පවත්වා ගත යුතු නිවැරදි චර්යා
✓ තමන් හා අන් අයගේ යහපැවැත්ම සඳහා පවත්වා ගත යුතු පුරුදු
✓ යහපැවැත්මෙන් කටයුතු කිරීම සඳහා උපයෝගී කර ගත හැකි නිර්මාණ

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉගැන්වීමට වඩා, ඉගෙනුමට මුල් තැනක් දෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකි. කණ්ඩායම් හා තනි තනි ව ද වරෙක මුළු පන්තිය ම ද ඉගෙනුම් කාර්යවල යෙදවිය හැකි ය.

ගුරුවරයා මේ සඳහා කල් ඇති ව සැලසුම් කර ගැනීම අවශ්‍ය ය. එක ම මොහොතක විවිධ කණ්ඩායම් එකිනෙකට වෙනස් වැඩවලට යෑමට හැකි ය. ඒ මගින් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කර ගැනීමට හැකි ය.

සිසුන් සඳහා සැලසුම් කරන වැඩ අතර නිරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, අත්හදා බැලීම්, කෙටි කාලීන ව්‍යාපෘති, රැස් කිරීම්, භූමිකා රංගන වැනි විවිධ ඉගෙනුම් ක්‍රම ද, පුද්ගලයන්ගෙන්, පොත්පත් වැනි මුද්‍රිත මාධ්‍යවලින් ද විද්‍යුත් මාධ්‍යවලින් ද තොරතුරු රැස් කිරීම් අඩංගු විය හැකි ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# හැඳින්වීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නමින් හැඳින්වෙන මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය මිනිසා සහ මිනිස් ප්‍රජාව කෙරෙහි විවිධ අයුරින් බලපෑම් කළා වූ හෝ කරන්නා වූ භෞතික, සමාජයීය සහ ජෛව පද්ධතීන් පිළිබඳ ව හා ඒවා පදනම් කර ගෙන සිදු විය යුතු ඉගෙනුම් ක්‍රියාවලියකට යොමු කරන්නකි.

ළදරු වියේ සිට ම ස්වභාවයෙන් ම මිනිසා සිය වටාපිටාව කෙරෙහි කුතුහලයකින් පසු වන අතර ක්‍රම ක්‍රමයෙන් එම වටාපිටාව සමග සාර්ථක ව අන්තර්ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කර ගැනීමට උත්සාහ දරයි. මෙම ක්‍රියාවලියේ දී සිය සංවේදී ඉන්ද්‍රියයන් ප්‍රයෝජනයට ගන්නා අතර ම ඒවායේ සංවේදී බවත්, වර්ගීකරණය හා තර්කණය වැනි බුද්ධිමය හැකියාවනුත් වර්ධනය කර ගනියි. එසේ ම ඒ ඔස්සේ සිය වාග්මාලාව සහ සන්නිවේදන කුසලතා ද වර්ධනය කර ගනියි. තමා ජීවත් වන වටාපිටාව පිළිබඳ ව තොරතුරු සොයා බැලීම රැස් කිරීම හා නැවත ප්‍රකාශ කිරීම දරුවාගේ ජීවිත ක්‍රියාවලියේ ම අංගයකි. මෙය නිරායාසයෙන් ම ඕනෑ ම ජීවියකු තුළ සිදු වන්නකි. දරුවාගේ එම නැඹුරුව පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගොඩනැගීමේ පදනම් විය.

එදිනෙදා ජීවිතයේ දී හමු වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි හා රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයකුට විවිධ නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් මෙම කාර්යයට බෙහෙවින් දායක වේ. මීට පෙර ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවන්හි සෞන්දර්ය අධ්‍යාපනය, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ශාරීරික අධ්‍යාපනය හා ආරම්භක විද්‍යාව වැනි විෂයයන් එම කාර්යයට දායක විය. නව විෂයමාලාවේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නම් වූ පුළුල් විෂය ක්ෂේත්‍රය යටතේ එම විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා අවස්ථානුකූල ව මතු කර ගැනීමට ඉඩ සලසා ඇත. එබැවින් මෙය සමෝධානිත විෂයයකි.

තුන්වන, හතරවන ශ්‍රේණි (ප්‍රාථමික අධ්‍යාපනයේ දෙවන ප්‍රධාන අවධිය) සඳහා තේමා 16ක් මත විෂය නිර්දේශය ගොඩ නගා ඇත. සෞන්දර්ය, නිර්මාණ හා ශාරීරික අධ්‍යාපන ක්ෂේත්‍රවලට අදාළ නිපුණතා මතු කර ගැනීම මෙන් ම ආගම, මව්බස හා ගණිතය යන ප්‍රධාන විෂයයන් පෝෂණය සඳහා ද පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යොදා ගත හැකි ය. දරුවන්ගේ කතා බහට ගැළපෙන සරල ඉංග්‍රීසි වදන් මෙම ක්‍රියාකාරකම් මගින් මතු කර ගත යුතු ය.

විෂය නිර්දේශයේ ඇතුළත් සියලු කොටස් ඒ ආකාරයෙන් ම ශ්‍රී ලංකාවේ සෑම පාසලක ම කළ යුතු යැයි අදහස් නො කෙරේ. මෙම අවධියේ දී දරුවන්ගේ පරිසරය සීමිත ය. එම සීමා ව තුළ ඇති දේ සහ සිදු වන දේ සියල්ල සෑම පාසලකට ම පොදු නො වේ. එහෙයින් දරුවන් සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේ දී සිය පාරිසරික සම්පත්වලට සරිලන සේ ඒවා තෝරා ගැනීමේ නිදහස හා වගකීම ගුරුවරයා සතු ය.

## ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය තෙක් මෙම ඉගෙනුම් ක්‍රියාකාරකම් සාර්ථක ව නිම කිරීම මගින් සිසුන් තුළ පහත දැක්වෙන දැනුම, දක්ෂතා සහ ආකල්ප සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

- ✓ සිය වටාපිටාවේ චමත්කාරය හඳුනා ගෙන ඒ තුළින් වින්දනයක් ලබයි.
- ✓ ක්‍රීඩාව, විවේකය, විනෝදය සිය ජීවිතයට අවශ්‍ය අංග ලෙස සලකා උචිත අයුරින් ඒවා සිය දින චර්යාවට මුසු කර ක්‍රියා කරයි.
- ✓ සෞන්දර්යාත්මක දේ අගය කරමින් ඒවා සිය ප්‍රකාශන කාර්යයන්හි දී භාවිත කරයි.
- ✓ නිරෝගිමත් දිවි පැවැත්මකට අවශ්‍ය මූලික හුරුකම් ප්‍රදර්ශනය කරයි.
- ✓ මිනිස් නිර්මාණ අගය කරයි.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ✓ සිය වටාපිටාවේ සිටින ජීවීන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- ✓ මිනිස් සමාජය, මිනිස් හැසිරීම් හා මිනිසා කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- ✓ පෘථිවිය, එහි සම්පත් හා අවකාශය මිනිසා කෙරෙහි බලපාන අයුරු ගවේෂණය කරයි.
- ✓ පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලියේ සිය වගකීම අවබෝධ කර ගෙන ඒ අනුව කටයුතු කරයි.
- ✓ සිය වටාපිටාවේ ශක්තිය සහ බලය යෙදීම ප්‍රජාවේ ඉදිරි ගමනට බලපාන අයුරු විමර්ශනාත්මක ව අගය කරයි.
- ✓ අනාගත වැඩ ලෝකයට අවශ්‍ය හුරුව ලබා ගනිමින් තම එදිනෙදා පරිහරණයේ ඇති භාණ්ඩ හා උපකරණ අවශ්‍ය පරිදි හසුරුවයි.

දෙවන ප්‍රධාන අවධියේ අපේක්ෂිත නිපුණතා

- ✓ අවට පරිසරයේ වැඩෙන ශාක පිළිබඳ ව විමර්ශනය කර වාර්තා කරයි.
- ✓ ශාකවල පැවැත්මෙහි ඇති වැදගත්කම අගය කරයි.
- ✓ තොරතුරු රැස් කිරීම සඳහා ගවේෂණය කරයි.
- ✓ සතුන්ගෙන් ලබන ප්‍රයෝජන අගයමින් සතුන් ද පරිසරයේ කොටසක් ලෙස පිළිගනියි.
- ✓ සතුන්ගෙන් සිදුවන හානි හා අනතුරු පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
- ✓ එදිනෙදා භාවිත කරන භාණ්ඩ හා උපකරණ නිවැරදි ව ආරක්ෂාකාරී ව සහ නිසි නඩත්තුවකින් යුතු ව පරිහරණය කරයි.
- ✓ නිරෝගිමත් දිවිපෙවෙතක් සඳහා යහපත් පුරුදු අනුගමනය කරයි.
- ✓ නීරෝගී දිවිපෙවෙතක් සඳහා උචිත ආහාර පාන තෝරා ගනියි.
- ✓ එදිනෙදා කටයුතුවල දී තම නිවැරදි ඉරියව් පවත්වා ගනියි.
- ✓ පොදු ස්ථානවල දී මෙන් ම පොදු කටයුතුවල දී තම චර්යා නිවැරදි ව හසුරුවයි.
- ✓ තම දෛනික කටයුතු ක්‍රමවත් ව පවත්වා ගනියි.
- ✓ ජාතික කොඩිය කෙරෙහි ගෞරවයෙන් යුතු ව හැසිරෙයි.
- ✓ ජාතික ගීය අභිමානයෙන් යුතු ව ගායනා කරයි.
- ✓ තමාගේ හා අන් අයගේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කටයුතු කරයි.
- ✓ විවිධ ජන කොටස්වල සංස්කෘතීන් අගයමින් කටයුතු කරයි.
- ✓ ජලය ස්වභාවික සම්පතක් ලෙස අගය කරමින් අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කරයි.
- ✓ පාරේ ගමන් කිරීමේ දී අනුගමනය කළ යුතු නීති රීතිවලට අනුව කටයුතු කරයි.
- ✓ වාහනවලින් සිදුවන අහිතකර බලපෑම් අව ම කර ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කරයි.
- ✓ ගෙවත්තක ඇති වැදගත්කම අගය කරමින් ගෙවත්තක් ක්‍රමවත් ව පවත්වා ගැනීමට දායක වෙයි.
- ✓ එදිනෙදා වැඩ පහසුවෙන් කර ගැනීම සඳහා කරන වැඩ ක්‍රමවත් ව හා පිළිවෙළට අනුව සිදු කරයි.
- ✓ සරල උපකරණ නිවැරදි ව උචිත පරිදි යොදා ගනිමින් එදිනෙදා වැඩ පහසු කර ගනියි.
- ✓ අන් අයට ක්‍රියාශීලී ව සවන් දෙමින් ප්‍රියජනක ලෙස අදහස් ඉදිරිපත් කරයි.
- ✓ තම හැකියා අගය කරන්නාක් මෙන් ම අන් අයගේ හැකියා ද අගයයි.
- ✓ භූමියේ මතු පිට විවිධත්වය පිළිබඳ විමර්ශනය කරමින් තොරතුරු රැස් කර වාර්තා කරයි.
- ✓ වැස්ස, සුළඟ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව විමසිලිමත් වීම හා විය හැකි අනතුරුවලින් ආරක්ෂා වීමට පියවර ගනියි.
- ✓ ශරීරය මනාව පවත්වා ගැනීමට අවශ්‍ය ව්‍යායාම්වල නිරත වෙයි
- ✓ තම ආසන්න පරිසරයේ යහපත් වෙනසක් ඇති කිරීමෙහි ලා සාමූහික එකඟතාවයකින් යුතු ව උචිත කාර්යයන් සැලසුම් කර ක්‍රියාත්මක කරයි.
- ✓ සැලසුම් සකස් කිරීමේ දී මෙන් ම ක්‍රියාත්මක වීමේ දී තම දායකත්වය පිළිබඳ ව ස්වයං ඇගයීමක යෙදෙයි.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ✓ තමාගේ මෙන් ම අන් අයගේ හැකියා අගය කරයි.
- ✓ තොරතුරු හුවමාරුවේ දී විවිධ ක්‍රම භාවිත කරයි.
- ✓ තොරතුරු හුවමාරුවේ දී අන් අයට හිරිහැර නොවන පරිදි චර්යා පවත්වා ගනියි.
- ✓ පාසලේ මෑත අතීතයේ සිදු වූ සංවර්ධනාත්මක වෙනස්කම් අගයයි.
- ✓ අතීතයේ විවිධ අවස්ථාවන්හි දී යොදා ගත් ජන කථා රසවිඳියි.
- ✓ ජන ගායනා, හා ජන ක්‍රීඩා සඳහා වින්දනාත්මක ව සහභාගී වෙයි.
- ✓ විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් අතීතයේ විවිධ අවස්ථාවන්හි දී යොදා ගත් සැරසිලි නිර්මාණ කරයි.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

නිර්මාණාත්මක, සෞන්දර්යාත්මක හා ශාරීරික නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා වූ පුළුල් පරාසයක ඉගෙනුම්-ඉගැන්වීම් අත්දැකීම් සපුරාලීමේ අවශ්‍යතාව නව විෂය නිර්දේශයෙහි දක්නට ලැබෙන පැහැදිලි වෙනසකි. එවැනි වෙනසක් සඳහා පන්ති කාමරය පමණක් නොව සම්පූර්ණ පාසල් පරිසරය ද, සිසුන් දෙස බලන දෘෂ්ටි කෝණය ද වෙනස් විය යුතු ය. පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් යටතේ තොරතුරු රැස් කිරීම, තොරතුරු විවිධ අයුරින් වාර්තා කිරීම සඳහා ද ඉඩකඩ සැලසීම වැදගත් ය.

එ බැවින් පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය විය යුත්තේ දවස පුරා මේසය අසල පුටුවක වාඩි වී සිටීම වෙනුවට විවිධ ඉරියව්වලින් හා සතුටෙන් නොයෙකුත් ක්‍රියාකාරකම්වල නිරත වන දරුවන් දැකිය හැකි වන පරිදි ය.

මේ සඳහා සැලසුම් කරනු ලබන පන්තියක තිබිය යුතු ලක්ෂණ මෙසේ ය.

- ✓ පාසල් කාලය තුළ දී මෙම සිසුනට ප්‍රධාන වශයෙන් ක්‍රියාකාරකම්වල නිරත වීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම.
- ✓ එළිමහනේ ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සැපයීම.
- ✓ පාසලේ ක්‍රීඩා, සෞන්දර්යාත්මක නිර්මාණාත්මක කටයුතු හා වෙනත් විෂය සමගාමී කටයුතු කෙරෙහි ද අවධානය යොමු කිරීම.

## සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා සම්බන්ධ තක්සේරු කිරීමේ දී එම ඉගෙනුම් ක්‍රියාවලිය තුළින් සිසුනට ලබා දීමට බලාපොරොත්තු වන දැනුම, කුසලතා ආකල්ප හා අගයයන් පිළිබඳ සැලකිල්ලට ගත යුතු ය. එසේ ම සමාජයීය දක්ෂතා කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

ඒ ඒ සිසු කණ්ඩායම් හෝ තනි තනි සිසුන් තුළ හෝ ඇති ඌනතා, මතු ඉගෙනුම් කටයුතුවල දී මග හරවා ගනිමින් හා ඉක්මනින් ඉගෙනුම් හැකියා පෙන්නුම් කරන සිසුන් සඳහා තව දුරටත් පෙළඹීමක් ඇති වන අරමුණෙන් මෙම තක්සේරු කිරීම් කළ යුතු ය.

මෙහි දී බොහෝ විට විධිමත් ඇගයීම් ක්‍රමවලට පරිබාහිර ක්‍රම අනුගමනය කිරීමට සිදු වේ. සිසුන් වැඩෙහි යෙදී සිටින අවස්ථාවල ඔවුන් නිරීක්ෂණයෙන්, සවන් දීමෙන් සහ ඔවුන් සමඟ සාකච්ඡා කිරීමෙන් මෙම අවස්ථා මතු කර ගත හැකි වනු ඇත. ඒවා ක්‍රමවත් ව වාර්තා කර ගැනීමට ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇතුළත් තක්සේරු වාර්තා සටහන් භාවිත කළ හැකි ය.

## ගෙදර වැඩ පැවරීම

- ✶ පන්ති කාමරය තුළ දී ඉගෙන ගන්නා වූ විෂය කරුණු තව දුරටත් සංවර්ධනය කිරීම සඳහා සිසුවාට දැරිය හැකි ප්‍රමාණයට ගෙදර වැඩ පවරන්න.
- ✶ ගෙදර වැඩවල දී කළ යුතු දේ හා වැඩ කරන ආකාරය පිළිබඳ ව සිසුන්ට වැටහෙන සේ පැහැදිලි උපදෙස් දෙන්න.
- ✶ පන්ති ක්‍රියාකාරකම් සඳහා නිවසින් ගෙන ආ යුතු දෑ පිළිබඳ ව කල්වේලා ඇති ව සිසුන් හා දෙමාපියන් දැනුවත් කරන්න.
- ✶ දෙමාපියන් දැනුවත් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරේ අවධානය යොමු කරන්න.
    - ✦ පවරන සීමිත ගෙදර වැඩ කොටස් සිසුන් විසින් ම කළ යුතු බව
    - ✦ ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් තෝරා ගැනීමට උදවු කළ යුතු බව
    - ✦ නිවසේ දී කළ යුතු වැඩ සඳහා උදවු දීම

      උදාහරණ : රාත්‍රි අහස නිරීක්ෂණ, කවි, ගී, කතන්දර අසා දැන ගැනීම, ගෙවත්තේ තොරතුරු රැස් කිරීම



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 2.1 පැළෑටි හා ගස්වැල්

පාසල් වත්තේ ඇති ගස්වැල් පැළෑටි පිළිබඳ ව වඩාත් හොඳින් විමර්ශනයක යෙදීමට මෙම තේමාව තුළින් අවස්ථාව සලසා ඇත. මෙහි දී ශාක, නිරීක්ෂණ හා ගවේෂණ ඇසුරින් හඳුනා ගැනීමටත් ඒවා විවිධ අයුරින් වාර්තා කිරීමටත් ඉඩ සලසා ඇත. ඊට සුදුසු පරිසරයක් ඇති කිරීමටත් පරිසරය කෙරෙහි ආදරය කිරීම මෙන් ම පරිසරය සංරක්ෂණයට දායක වීම කෙරෙහි වඩාත් යහපත් වූ ආකල්ප සිසුන් තුළ වර්ධනය කිරීමටත් මෙම තේමාවෙන් අපේක්ෂා කෙරේ.

නිපුණතා

★ ආසන්න පරිසරයේ වැඩෙන ශාක විමර්ශනය කර වාර්තා කරයි.
★ ශාකයක ප්‍රධාන කොටස් හඳුනාගෙන වාර්තා කරයි.
★ ශාකපත්‍රවල ඇති සුවිශේෂී ලක්ෂණ ගවේෂණය කර වාර්තා කරයි.
★ පැළෑටි හා ගස්වැල් ආශ්‍රිත ව ගායන සහ රංගනවල නිරත වෙයි.
★ විවිධ ශාක කොටස් භාවිත කරමින් නිර්මාණ කරයි.
★ ගස්වැල්වල පැවැත්මෙහි ඇති වැදගත්කම අගය කරයි.
★ ගස්වැල් ආශ්‍රිත ව සකස් කෙරෙන නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ ආසන්න පරිසරයේ වැඩෙන ශාක මොනවා දැ යි හඳුනා ගැනීමට සිසුනට අවස්ථාව සලසන්න. ඊට ප්‍රවේශයක් ලෙස පාසල් වත්තේ වැඩී ඇති ගස්, වැල්, පැළෑටි හා පඳුරුවලින් එක් වර්ගයක් හෝ වර්ග කිහිපයක හෝ ශාක කොටස් (බිම වැටී ඇති හෝ කඩා ගන්නා ලද ශාක පත්‍ර, කිහිපයක් හෝ මල්, ගෙඩි ... වැනි) පාඩමට පෙර පන්තියට ගෙනවිත් තබා ගන්න.


- එම ශාක කොටස් නිරීක්ෂණය සඳහා සිසුන් කණ්ඩායම් කරන්න. ගුරුවරයා විසින් රැගෙන ආ ශාක කොටස් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- ඒවා නිරීක්ෂණයට යොමු කරන්න. ශාක පත්‍රයක් නම් ඒවායේ හැඩය, වර්ණය හා ශාක පත්‍රයක් ඇඟිලි තුඩුවලින් පොඩි කර එයට සුවිශේෂ වූ ගඳ සුවඳ හඳුනා ගැනීමට සලස්වන්න. පසුව තම අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු ශාක කොටස්වලට අනුව පාසල් වත්තේ එම (ශාක/ශාකය) පිහිටි ස්ථානයට යොමු කරන්න. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
    - ශාකයේ නම
    - ශාක කොටස ලබා ගන්නේ - ගසකින් ද? වැලකින් ද? පඳුරකින් ද? පැළෑටියකින් ද?
    - වැවී ඇති ස්ථානය - ජලය සහිත ස්ථානයක, මඩ සහිත ස්ථානයක
    - ශාකයේ දක්නට ඇති දේ - දළු, මල්, ගෙඩි, ඒවා පිහිටා ඇති ආකාර
    - ශාකයේ ස්වභාවය උදාහරණ : අතු විහිදී ඇති ආකාරය
    - ශාකයේ දක්නට ලැබෙන වෙනත් සුවිශේෂී ලක්ෂණ
- තොරතුරු රැස් කළ පසු එම ස්ථානවල බිම වැටී වියළී ගොස් ඇති ශාක පත්‍ර හා මල් කිහිපයක් ද රැගෙන ඒමට උපදෙස් දෙන්න.
- රැස් කර ගත් තොරතුරු කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කර අවශ්‍ය තොරතුරු වාර්තා කර ගැනීමටත්, ඒවා ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දෙන්න. ගුරුවරයාගේ මැදිහත් වීමෙන් අවශ්‍ය මග පෙන්වීම් කරන්න.
- ඉදිරිපත් කිරීම්වල දී, ශාකවල විවිධත්වයක් ඇති බව ද එකිනෙකට සුවිශේෂ වූ ලක්ෂණ හඳුනා ගත හැකි බව ද මතු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

✠ ශාක පත්‍රවල හැඩය අනුව පරිසරයේ ඇති ගස් වර්ග කිරීමට යොමු කරන්න.

උදාහරණ:- මේ සඳහා ඔබේ පරිසරයෙහි වැඩෙන ශාක යොදා ගන්න.

1 වර්ගය :- කොස්, කොට්ටම්බා
2 වර්ගය :- තණ වර්ග, උක්, උණ,
3 වර්ගය :- සියඹලා, කතුරුමුරුංගා
4 වර්ගය :- බණ්ඩක්කා, දෙල්, ගස්ලබු, එඬරු ආදී වශයෙන්




- හඳුනා ගත් ශාකවල නම් ලේබල් කිරීමට සුදුසු ඝන කඩදාසි කැබලි කිහිපයක් හා නූල් කැබලි කිහිපයක් සූදානම් කර ගන්න. ශාකවල නම් සහ ආදර්ශ පාඨ කිහිපයක් ලියා අදාළ ශාකවල සුදුසු ස්ථානවල ගැට ගැසීමට/රැඳවීමට සිසුනට අවස්ථාව දෙන්න.


✠ සිසුන් රැගෙන ආ ශාක පත්‍ර, මල් බ්‍රිස්ටල් බෝඩ් මත විවිධ හැඩ ලෙස තබා ඇලවීමට සිසුන්ට උපදෙස් දෙන්න. අලවන ලද ශාක පත්‍රයේ හෝ මල් මත සිට පිටපැත්තට (බ්‍රිස්ටල් බෝඩ් එක පැත්තට) ජ්ලේට් ක්‍රමයට වර්ණ කිරීමෙන් නිර්මාණ කිරීමට කණ්ඩායම් වශයෙන් සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 2

✠ පන්තියේ සිටින සිසුන් කුඩා කණ්ඩායම් (කණ්ඩායම් 4 හෝ 5ක් වන සේ) වලට බෙදන්න. එක් එක් කණ්ඩායම ලවා පාසල් වත්තේ ඉබේ වැඩී තිබෙන විවිධ වර්ගයේ පැළෑටි කිහිපයක් ගලවා ගෙන පන්තියට ගෙන ඒමට සලස්වන්න. උල් කළ ශක්තිමත් කෝටුවක් හෝ අත් මුල්ලුවක් හෝ යකඩ ඉන්නක් හෝ යොදා පැළය ගැලවීමෙන් මුල් නොකැඩී එය ගලවා ගත හැකි ය. පසුව පැළෑටියේ මුල්වලට හෙමින් තට්ටු කිරීම මගින් හෝ වතුරෙන් සේදීම මගින් හෝ ඊට බැඳී ඇති පස් ඉවත් කළ හැකි ය.

- පැළෑටි හොඳින් නිරීක්ෂණය කිරීමට කණ්ඩායම්වලට අවස්ථා ලබා දෙන්න.
එහි හඳුනා ගත හැකි ප්‍රධාන කොටස් නම් කිරීමටත්, කළුලෑල්ලෙහි/කඩදාසියක් මත විශාල කර අඳින ලද ශාකයක ප්‍රධාන කොටස් නම් කිරීමටත් අවස්ථාව සලසන්න. (මල්, ගෙඩි ආදිය ඇතුළත් කරන්න. ගෙඩිය ඵලය තුළ බීජ ඇතුළත් බව අවධාරණය කරන්න.)

- පන්තියට රැගෙන ආ පැළෑටි හා අඳින ලද ශාකය අතර වෙනස්කම් තිබේ ද යන්න සිසුන් සමඟ කතා බහ කර එම වෙනස්කම් ද සහිත ව සිසු අභ්‍යාස පොතෙහි ශාකයක ප්‍රධාන කොටස් යන මාතෘකාව යටතේ ඇඳ නම් කිරීමට යොමු කරන්න.




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

✠ සිමෙන්ති පොළොව මත පත්තර කඩදාසියක් එලා රැගෙන ආ පැළෑටි ඒ මත තබන්න. තව පත්තර කඩදාසියක් පැළෑටි මත තබන්න. ඊට උඩින් ලෑල්ලක් තබා ඒ මත බරක් තබන්න. දින දෙක තුනකට වරක් පත්තර කඩදාසි අලුත් කරන්න. (පුස්කෑම වැළකීම සඳහා) දින කිහිපයකට පසු මෙම පැළෑටි වියළී යනු ඇත. ඩිමයි කඩදාසියක් ගෙන එක් පැළෑටි වර්ගයකින් එක බැගින් ඩිමයි කඩදාසියේ අලවන්න. අවශ්‍ය පරිදි ඩිමයි කඩදාසි ප්‍රමාණය වැඩි කර ගත හැකි ය. පැළෑටි යටින් ඒවායේ නම් ලිවීමට යොමු කරන්න. පැළෑටියේ කඳ, අතු, පත්‍ර, මල් පොහොට්ටු, මල් , ගෙඩි හෝ කරල්, මුල්, වශයෙන් ප්‍රධාන කොටස් නම් කිරීමට සලස්වන්න. මෙම ඩිමයි කඩදාසි එකතු කොට පන්ති ප්‍රදර්ශනයක් පවත්වන්න.

✠ ශාක කොටස් යොදා තොප්පි, නලා, සත්තු වැනි විවිධ නිර්මාණ කිරීමට සිසුන් යොමු කරන්න. නිර්මාණ කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය කල්තබා රැගෙන ඒමට අදාළ උපදෙස් ලබා දෙන්න.

ක්‍රියාකාරකම 3

✠ ගස් ආශ්‍රිත ව සිදු කළ හැකි ක්‍රීඩාවක සිසුන් යොදවන්න.
උදාහරණ :- පන්තියේ සිසුන් සියලු දෙනාට ම දිවීමට ඉඩකඩ ඇති ස්ථානයකට කැටුව යන්න. තෝරා ගත් සෙල්ලම් පිටියේ සීමාවන් ලකුණු කරන්න. එක් සිසුවකු හැර අනික් අය දුවන්නෝ හැටියට හඳුන්වන්න. වෙන් කළ සිසුවා ඔවුන් සීමාව තුළ දුවන විට අල්ලන්නා හැටියට තෝරා ගන්න. සංඥාවක් කළ විට කණ්ඩායම දිවීමට සලස්වන්න. ඔවුන් පිටියේ ලකුණු කළ සීමාවෙන් ඔබ්බට නොයා යුතුයි. අල්ලන්නා යමකුගේ ඇඟට තට්ටු කළ විට ඔහු/ඇය ගසක් බවට පත්වේ. ගසක් බවට පත්වීමේ දී නිර්මාණාත්මක ව විවිධ අයුරින් නිශ්චල වීමට සිසුන් යොමු කරන්න. එක් අයකු හැර අනෙක් සියල්ලන් ගස් බවට පත් වන තුරු ක්‍රීඩාව පවත්වා ගෙන යා යුතුයි. ගසක් නිරූපණය කරන ආකාරය එකිනෙකට වෙනස් විය යුතු බව පවසන්න. මෙම ක්‍රියාකාරකම කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කරන්න.

ක්‍රියාකාරකම් 4

✠ පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසු කණ්ඩායම් නිරත කිරීමට සලස්වන්න. එක් කණ්ඩායමකට එක් ක්‍රියාකාරකම බැගින් යොමු කරන්න.

- ඩිමයි කඩදාසියක් ගෙන ඇඳුමක හැඩයක් කපා ගැනීමට සලස්වන්න. ශාකවල කොටස් යොදා ගනිමින් සාදා ගන්නා වර්ණ භාවිත කරමින් එම කඩදාසිය අලංකාර කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

✠ විවිධ හැඩයේ ශාක පත්‍ර භාවිත කරමින් තව දුරටත් පහත ආකාරයේ නිර්මාණවල නියැළීමට සිසුන් යොමු කරන්න.

- ගොරෝසු ශාක පත්‍රයක් ගෙන නාරටි පැත්ත උඩු අතට හරවා ඒ මත කඩදාසිය තබන්න. පැස්ටල් කූරක් පැත්ත පෙරලා ශාක පත්‍රය සහිත සීමාවේ අතුල්ලන්න.
මේ අයුරින් විවිධ මෝස්තර රටා නිර්මාණය කිරීමට යුගළ වශයෙන් හෝ කුඩා කණ්ඩායම් වශයෙන් හෝ ක්‍රියාකාරකම් සංවිධානය කරන්න. ක්‍රියාකාරකම අවසානයේ දී අනෙක් කණ්ඩායම්වල අත්දැකීම් ද ලබා ගැනීමට අවස්ථා සලසන්න.

- ශාක පත්‍රයක දිය සායම්/තීන්ත ආලේප කර කඩදාසියක් මත තබමින් විවිධ රටා ගොඩ නගමින් අලංකාර කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න. මෙම නිර්මාණ ප්‍රදර්ශනය කිරීමට යොමු කරන්න. සිසු නිර්මාණ අගය කරන්න.

ක්‍රියාකාරකම් 5

✠ පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම් පහකට බෙදන්න. සිසු කණ්ඩායම්වලට සෙන්ටිමීටර 10 x 5 ප්‍රමාණයේ කඩදාසි/බ්‍රිස්ටල් බෝඩ් කැබලි බෙදා දෙන්න.

- ආහාර පාන හා ඖෂධ වශයෙන් මිනිසුන් ගන්නා බීජ වර්ගවල නම් එක් එක් කඩදාසි/බෝඩ් කැබැල්ලේ ලිවීමට පළමුවෙනි කණ්ඩායම යොමු කරන්න. මේ ආකාරයට මිනිසුන්ට ප්‍රයෝජනවත් වන අල වර්ග, කොළ වර්ග, එළවළු හා පලතුරු වර්ග සහ මල් වර්ගවල නම් ලිවීමට අනෙක් කණ්ඩායම්වලට පවරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ඩිමයි හෝ පත්තර කඩදාසි පහක් බිත්තියේ එල්ලන්න. ඒ එක එකක් බීජ, අල, කොළ, ගෙඩි හා මල් වශයෙන් නම් කරන්න.
- එක් එක් කණ්ඩායම විසින් සකස් කළ කඩදාසි/බෝඩ් කැබලි අදාළ කඩදාසියේ ඇලවීමට සලස්වන්න.
- අප කන බොන හා ඖෂධ වශයෙන් ගන්නා දේවල් වැඩිපුර ලැබෙන්නේ ගස්වැල්වලින් බව සාකච්ඡාවක් තුළින් අවබෝධ කර ගැනීමට ඉඩ සලසන්න.
ගස්වැල්වල පැවැත්ම අපට ඉතා වැදගත් වන බව සාකච්ඡාවක් තුළින් මතු කරන්න.
- මේ සඳහා පාසල් විවේක කාලයේ දී පන්ති කාමරයෙන් ඉවතට යන සිසුන් වැඩිපුර ම රැස් වන ස්ථාන පිළිබඳ ව විමසන්න.

හිරු රැස් වැටෙන එළිමහනේ ද?
ගස් යට ද?

මීට හේතු සාකච්ඡා කරන්න. ගස් නිසා පරිසරයට ඇති වන සිසිල අගය කරවන්න. තද හිරු එළිය පවතින දහවල් කාලයේ දී එළිමහන් ප්‍රදේශයකට වඩා වන රොදක් හෝ වනාන්තරයක් හෝ සිසිල ඇති බව මේ පිළිබඳ අත්දැකීම් ඇති සිසුන්ගේ අදහස් විමසමින් පෙන්වා දෙන්න.

✠ පාසල් ගොඩනැගිල්ලේ ඇති ගෘහ භාණ්ඩ කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න. කළුලෑල්ල හා ආධාරකය, ගුරු මේසය හා පුටුව, සිසු මේස හා පුටු, කබඩ් ආදිය උදාහරණ වේ. මීට අමතර ව දොරවල් හා දොර රාමු, වහලය ආදී තැන් කෙරෙහි ද අවධානය යොමු කළ හැකි ය. මේවායින් වැඩි ප්‍රමාණයක් සාදා ඇත්තේ දැවවලින් බවත්, දැව ලබා ගන්නේ විවිධ ගස්වලින් බවත් පෙන්වා දෙන්න. සිසුන්ගේ පොත පත තනා ඇති කඩදාසි සාදන්නේ ද, ශාක කොටස්වලින් සාදා ගන්නා පල්ප්වලින් බව ද පෙන්වා දෙන්න.
- පාසලේ දක්නට ලැබෙන දේවලට අමතර ව නිවෙස්වල තිබෙන ශාකවලින් ලබා ගන්නා ද්‍රව්‍යවලින් තැනූ දේ ද සාකච්ඡාවට ගත හැකි ය. උදාහරණ :- මෙට්ට (කොහු) රෙදි (කපු පුළුන්) කොස්ස (කොහු හා ලී) ඉදල (ඉරටු හා ලී) ඇඳ (ලී) අල්මාරිය (ලී)
පැහැදිලි කිරීම් සඳහා ඡායාරූප, රූප, චිත්‍ර ආදිය යොදා ගන්න.

✠ සිසුන් සමඟ එළිමහනකට යන්න. මල් බාල්දියකට වතුර පුරවා ගන්න. වතු සුද්ද වැනි පඳුරක පත්‍රවලට ඉහළින් මල් බාල්දියෙන් වතුර වත් කරන්න. ඉහළ පත්‍රවලින් පහළ පත්‍රවලට වැටෙමින් වතුර වැටෙන ආකාරය නිරීක්ෂණය කරවන්න. පඳුර යට ඇති පස මතට වතුර වැටෙන්නේ සෙමින් බවත්, එමඟින් පස විසිරී යාම වැළකෙන බවත් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- එම මල් බාල්දියට නැවත වතුර පුරවන්න. එය පළමු උසට ම ඔසවා පඳුරු හෝ පැළෑටිවලින් හෝ තොර එළිමහන් බිමකට වතුර වත් කරන්න. වතුර බින්දු වේගයෙන් පස මත වැටී පස් විසුරුවන අයුරු නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- ගස්වැල් මඟින් වැසි බින්දු නිසා පස් විසිරීයාම වැළැක්වෙන ආකාරය පෙන්වා දෙන්න. මෙමඟින් පස් සේදී යාමේ හානිය අඩු කිරීමට ගස්වැල් දායක වන බව පෙන්වා දෙන්න.

✠ ඉහත ක්‍රියාකාරකම් ඇසුරෙන් ගස් වැල් අපේ යාළුවෝ මැයෙන් කුඩා කවි නිර්මාණය කිරීමට සිසු කණ්ඩායම් යොමු කරවන්න.
ගස්වැල්වල වැදගත්කම පිළිබඳ ව කියවෙන ගීත ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :- මොනවද මුත්තේ මොකද කරන්නේ
මොකටද ඔබ ඔය බිම හාරන්නේ

ඔඹටත් ළමයෝ නො පෙනෙති නො සිතමි
අඹ ඇටයක් සිටුවන්නට හාර මි

දුකසේ සිටුවා අඹ ඇටයක් අ ද
එක අඹයක් වත් කන්ට ලැබේවි ද

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මම ළමයෝ මින් අඹයක් නො පත   මි
යුතුකම පමණක් ඉටු කොට තබනෙ මි

තමන්ට නො ලැබෙන දෙයකින් ලෝකෙ ට
කරන්ට හැකි දේ නො ම තේරේ ම   ට

පුදුමයි ළමයෝ උඹෙ ඔය අදහ   ස
හැදුනොත් ඔහොමට උඹට ම වෙයි දො   ස

පෙර උන් අය සිටවූ අඹ ගස්ව   ල
පලයෙන් අපි කවුරුත් ලබනමු ප   ල

අපෙන් පසු ව එන අයටත් පල එ   ම
ලැබෙන්ට සැලසුම අපගේ යුතුක   ම

මේ යුතුකම හොඳ හැටි දැන ගත්තෙ   මි
ආයුබොවන් මුත්තේ! මම යන්නෙ   මි

(ගායනය - රෝහණ වීරසිංහ, අනුෂා නානායක්කාර)

ගහ කොළ, මල්, සතුන් සම්බන්ධ කර ගනිමින් නිර්මාණාත්මක කතාවක් රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න. මෙහි දී කතාවල වටිනාකම ඒවායේ සුන්දරත්වය මතු වන අදහස් ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන්න.

✠ තේමාව තුළින් සිසුන් ලැබූ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කුඩා පොත් පිංචක් සකස් කළ හැකි ය. තේමාව අවසානයේ දී කරන ලද විවිධ වැඩ ඇතුළත් පන්ති කාමර ප්‍රදර්ශනයක් සැලසුම් කර ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.2 අප අවට සත්තු

මෙම තේමාවේ දී අපට ආසන්න පරිසරවල ජීවත් වන සතුන් පිළිබඳ ව හැදෑරීමට අවස්ථා සලසා ඇත. විශේෂයෙන් නිවස හා නිවෙස් ආශ්‍රිත ව ඇති කරන සතුන් හා ඔවුන්ගේ සුවිශේෂී ලක්ෂණ, ප්‍රයෝජන හා සතුන් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත. එමෙන් ම ඔවුන්ගෙන් මිනිසාට සිදු විය හැකි හානි සහ ඒවා වළක්වා ගැනීමට අපට කළ හැකි දේ කුමක් ද යන්න අවධානයට ලක් වේ. සිසුන්ට ඍජු අත්දැකීම් ලබා ගැනීම සඳහා පාසල් වත්තේ හෝ ආසන්න පරිසරයක හෝ සතුන් නිරීක්ෂණයට අවස්ථාව සලසා දීම වැදගත් වේ.

නිපුණතා

★ නිවෙස හා නිවෙස් ආශ්‍රිත ව ඇති කරන සතුන් පිළිබඳ මූලික තොරතුරු විමර්ශනය කර වාර්තා කරයි.
★ සතුන්ගේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් නිරීක්ෂණය කර වාර්තා කරයි.
★ සතුන්ගෙන් මිනිසා ලබන ප්‍රයෝජන පිළිබඳ විමර්ශනය කර තොරතුරු වාර්තා කරයි.
★ ගෘහ ආශ්‍රිත සතුන්ගෙන් වන හානි හා අනතුරු පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
★ ගෘහ ආශ්‍රිත සතුන් රැක ගැනීම සහ ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම අගය කරයි.
★ විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් සත්ත්ව ආකෘති නිර්මාණය කරයි.
★ සත්ත්ව චර්යා විදහා දැක්වෙන රංගන හා ගායනවල නිරත වෙයි.
★ සත්ත්ව චර්යා නිරූපණය වන විනෝදාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ ඩිමයි කඩදාසි තුනක්, මැලියම් හෝ පාප්ප සහ සෙන්ටිමීටර 20 x 7 ප්‍රමාණයට කපා ගත් හිස් කඩදාසි හෝ කාඩ්බෝඩ් කැබලි සූදානම් කර ගන්න.

- ඩිමයි කඩදාසි තුනක පහත දැක්වෙන පරිදි මාතෘකා තුන සටහන් කර පන්ති කාමරයේ ස්ථාන තුනක එල්ලන්න/රඳවන්න.
  - නිවෙස ආශ්‍රිත ව ඇති කරන සතුන්
  - නිවෙස ආශ්‍රිත ව ගැවසෙන සතුන්
  - පරිසරයේ සිටින වෙනත් සතුන්
- සිසුන් කණ්ඩායම් කර කපා ගත් කඩදාසි /කාඩ්බෝඩ් කැබලි කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- සිය නිවෙස් ආශ්‍රිත ව ඇති කරන සතුන්ගේ (බල්ලා, පූසා, ගවයා, කුකුළා,) සහ නිවසේ ස්වභාවික ව දක්නට ලැබෙන සතුන්ගේ (කුහුඹුවා, හූණා, මීයා) සහ වෙනත් සතුන්ගේ (නරියා, සර්පයින්, මුවා) නම් එක් එක් කඩදාසි කාඩ්බෝඩ් කැබැල්ලේ ලියා අදාළ ඩිමයි කඩදාසිය මත ඇලවීමට සිසුන් යොමු කරන්න.
- ගෘහ ආශ්‍රිත ව සිටින සමහර සතුන් මිනිසාගේ අවශ්‍යතාවන්ට අනුව ඇති කරන නමුත් එහි වාසය කරන තවත් සමහර සතුන් එසේ නොවන බව පෙන්වා දෙන්න. එහෙත් මේ සියලු දෙනා පිළිබඳ ව දැන සිටීම වැදගත් බව ද පෙන්වා දෙන්න.

ක්‍රියාකාරකම 2

✠ සතුන් කිහිප දෙනකු නිරීක්ෂණයට යොමු කරන්න. මේ එක් එක් සතා අනෙක් සතුන්ගෙන් වෙන් කොට හඳුනා ගත හැකි සමානකම් හා අසමානකම් මොනවා දැ යි විමසන්න. සිසුන් දෙන පිළිතුරු ආශ්‍රය කර ගෙන සතකු හඳුනා ගත හැකි ලක්ෂණ පහත දැක්වෙන එක් එක් කරුණ යටතේ ඉස්මතු කරන්න.

සතුන්ගේ හඬ
ශරීරයේ හැඩය, වර්ණ හා වර්ණ රටා පිහිටීම
පාද/පියාපත්/වරල් ඇති බව හා ඒවා පිහිටන සංඛ්‍යාව
තැනින් තැනට ගමන් ගන්නා ආකාරය සහ ඒ සඳහා යොදා ගන්නා අවයව

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මුඛයේ ස්වභාවය (හොට/දත් සහිත කට)
ගන්නා ආහාර වර්ග හා ආහාර ගන්නා ආකාරය
තම වර්ගයා සමඟ හැසිරෙන ආකාර (තනිව/දෙදෙනා වශයෙන්/රංචු වශයෙන්)
මේවා පිළිබඳ සිසුන්ගේ අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
හඳුනා ගත් සතුන් කිහිප දෙනකු ඇඳ නම් කිරීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 3

✠ ආසන්නයේ පිහිටි සත්ත්ව ගොවිපළක් හෝ විසිතුරු මසුන් ඇති කරන ස්ථානයක් හෝ වැනි තැන් බැලීම සඳහා සිසුන් කැඳවා ගෙන යන්න. සතුන්ගේ විවිධ හැසිරීම්, සතුන්ට සාත්තු සප්පායම් කරන ආකාරය හා සතුන්ගෙන් ප්‍රයෝජන ලබා ගන්නා ආකාර ආදිය නිරීක්ෂණය කිරීමට සලස්වන්න. ඒ ඇසුරෙන් සතුන් අපට ප්‍රයෝජනවත් වන බව සහ අප ඔවුන් ආරක්ෂා කළ යුතු බව අවධාරණය කරන්න.

ක්‍රියාකාරකම 4

✠ සිසුන් එකිනෙකාගේ නිවෙස්වල හා අවට නිවෙස්වල ඇති කරන සතුන්ගේ නම් ලැයිස්තුවක් සකස් කිරීමට යොමු කරන්න.

- මෙහි දී සිසුන්ට පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි සතුන්ගේ චර්යාවන් පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට යොමු කරන්න. රැස් කළ තොරතුරු විවිධ අයුරින් වාර්තා කිරීමට සලස්වන්න.
- ගෘහ ආශ්‍රිත සතුන්ගෙන් තමන්ට, පවුලේ සාමාජිකයකුට හෝ අසල් වැසියකුට හෝ සිදු වූ අනතුරක්, හානියක් ගැන තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. මෙය කතන්දරයක ආකාරයට හෝ නාට්‍යමය ආකාරයට හෝ චිත්‍ර හෝ මඟින් ඉදිරිපත් කළ හැකි ය.

  උදාහරණ :- පූසා සමඟ සුරතලයට ගොස් හපා කෑමට භාජනය වී බෙහෙත් ගැනීමට සිදුවීම
  නිදහසේ සිටි ගවයකු අසලට ගිය විට ඇනීම නිසා තුවාල සිදුවීම
  මදුරුවන් විදීම නිසා අසනීපවීම
  වේයන්, කාවන්, මීයන් පොත් පත්වලට හානි කිරීම

- මෙබඳු අත්දැකීම් කිහිපයක් ඉදිරිපත් කිරීමෙන් පසු ගෘහ ආශ්‍රිත සතුන් සමඟ ක්‍රියා කිරීමේ දී ප්‍රවේසම් විය යුතු ආකාරයත්, නිවසට එන වෙනත් සතුන්ගෙන් වන හානි වළක්වා ගැනීමට ක්‍රියා කළ යුතු ආකාරයත් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ගෙමැස්සන්, මදුරුවන්, මැක්කන්, කාවුන්, කිනිතුල්ලන්, කැරපොත්තන් හා මීයන් ආදී හානිකර සතුන් බෝවීම වළක්වනු පිණිස ගත හැකි ක්‍රියා මාර්ග පිළිබඳ ම සිසුන් සමඟ සාකච්ඡා කරන්න. සාකච්ඡාවේ දී පහත සඳහන් කරුණු අවධාරණය කරවන්න.
  - කොට්ට මෙට්ට ආදිය වරින් වර අව්වට දමා හොඳින් වේලා ගැනීම
  - නිවෙස නිතර අස්පස් කර අතු ගා පිරිසිදු කිරීම
  - බිත්තිවල හා ගෙබිම ඇති සිදුරු වසා දැමීම
  - අනවශ්‍ය තැන්වල වතුර එකතු වීම වැළැක්වීමේ උපක්‍රම යෙදීම
  - ගෘහ ආශ්‍රිත ව ඇති කරන සතුන්ගේ පිරිසිදුකම පිළිබඳ සැලකිලිමත් වීම
  - ගෘහ ආශ්‍රිත ව ඇති කරන සතුන් නියමිත කාලයේ දී එන්නත් කිරීම

ක්‍රියාකාරකම 5

✠ ක්‍රියාකාරකම 3 දී නිරීක්ෂණය කළ සතුන් හා සිසුන් දන්නා වෙනත් සතුන්ගේ සත්ත්ව චර්යා රංගනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
  - සිසුන් රංගනය කළ සතුන්ගේ නම් කළුලෑල්ලේ ලියන්න.
  - සුවිශේෂී හැසිරීම් රටා හා ශාරීරික ලක්ෂණ මුල් කොට ගෙන සතුන් වර්ග කළ හැකි දැයි සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

- මිනිසුන් විසින් සතුන් ඇති කරනු ලබන්නේ කවර හේතූන් නිසා දැ යි විමසන්න. ඒ පිළිබඳ ව ගොවිපළ ඇසුරින් ලබා ගත් අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒ පිළිබඳ ව කතා බහ කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- භූරතලයට ඇති කරන සත්තු
- ආර්ථික හේතු නිසා ඇති කරන සත්තු
- වෙනත් ප්‍රයෝජන සඳහා ඇති කරන සත්තු(ආරක්ෂාවට......වැනි)

- මිනිසුන් විසින් ඇති කරනු ලබන සතුන්ගෙන් ලැබෙන ප්‍රයෝජන සොයා බැලීමටත්, ඒවා පහත දක්වෙන ආකාරයේ වගුවකඇතුළත් කිරීමටත් යොමු කරන්න.

උදාහරණ

| | සතා | ප්‍රයෝජන |
|---|---|---|
| i | ගවයා | කරත්තය ඇදීම<br>කුඹුරු වැඩ සඳහා යොදා ගැනීම<br>පොහොර ලබා දීම |
| ii | කිකිළිය | බිත්තර ලබා දීම |
| iii | මී මැස්සා | පැණි ලබා දීම |
| iv | ............. | |

නිවසේ ඇති කරන සතුන් රැක බලා ගැනීම කෙරෙහි සිසු අවධානය යොමු කරන්න. සතුනට අවශ්‍ය කෑම, ජලය, ආරක්ෂාව, නිදහස, වෙනත් පහසුකම් සැලසීම, අපෙන් ඉටුවිය යුතු වගකීම් බවත් සතුන් සිරකර තැබීමෙන් සතුන්ට වන හිංසනය පිළිබඳවත් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

උදාහරණ :-බල්ලන්, ගිරවුන්, ලේනුන් වැනි සතුන් කූඩු කර ඇති කිරීම පිළිබඳ ව සිසු අත්දැකීම් සම්බන්ධ කර ගනිමින් සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම 6

- මිනිසා හා සතුන් අතර පැවති සම්බන්ධතාව දැක්වෙන පැරණි සිද්ධි හා කතන්දර ඉදිරිපත් කර කතා බහ කරන්න.

  උදාහරණ :- විජය රජුට කුවේණිය හමු වීමට හේතු වූ බල්ලකු පිළිබඳ ව කතාව

✠ සතුන් සම්බන්ධ චරිතාරෝපිත දෙබස් හා රංගන ඉදිරිපත් කරන අවස්ථා ඇති කරන්න.

  උදාහරණ :- ස්වාමියාට වැඩියෙන් සේවය කරන්නේ මමයි


  මේ යටතේ තෝරා ගත් සතුන් දෙදෙනකු සම්බන්ධ දෙබස්, රූකඩ යොදා ගනිමින් ඉදිරිපත් කිරීමට යුගල කණ්ඩායම් යොමු කරන්න.

  උදාහරණ :- ගවයා - බල්ලා
  ගවයා - එළුවා
  පූසා - බල්ලා
  අලියා - ගවයා

- සත්ත්ව චරිත සහිත ළමා නාට්‍ය රඟ දැක්වීමට යොමු කරන්න.


ක්‍රියාකාරකම 7

✠ මැටි මාධ්‍යයෙන් හා ඔරිගාමි ක්‍රම ඇසුරින් සත්ත්ව ආකෘති නිර්මාණයට යොමු කරන්න.








Copyright © 2007 National Institute of Education - Sri Lanka.



A 4 කොළයෙන් ඉතිරි වූ කොටස රෝල් කර ගන්න.



එය රූපයේ දැක්වෙන ආකාරයට අලවා ගන්න



සාදා නිම කර ගත් සමනලයා වර්ණ ගන්වා අලංකාර කර ගන්න

✠ නිවෙස ආශ්‍රිත ව ඇති කරන සතුන්ගේ හැසිරීම් රටා ඇසුරෙන් සිත් ගත් අවස්ථා නිරූපණය කිරීමට සිසුන් යොමු කරවන්න. එම අවස්ථා චිත්‍රයට නැගීමට ද අවස්ථා ලබා දෙන්න.

උදාහරණ :- නිවසේ ඇති කරන බළලා මුව සෝදන අවස්ථාවක්
බැල්ලියක තම පැටවුන් සමඟ සෙල්ලම් කරමින් පසු වෙන අවස්ථාවක්
ජන කතාවල එන අවස්ථා

✠ සතුන් පිළිබඳ ගැයෙන ගීත සිසුන්ට ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :-

හිංචි පිංචි හාවා
යද්දි තනිවෙලා
විලේ උන්නු ඉබ්බා දැකලා වතුරෙ නැවිලා
ඉබ්බා දැකපු හාවා
ඉවුරෙ නැවතිලා
ඔට්ටු තියලා අපි දුවමු ද ඇහුවා ළං වෙලා //
දුවන්නට හැකී
තමුසෙ හපනෙකී
ඔච්චර ඔය කියනවනම් දුවලා බලමු ද
හැබැයි හාවො මට ඉස්සර වෙන්න දෙනව ද//
හාවා දුව එනා
නිදන්නට වුණා
ඉබ්බා හෙමින් හෙමින්
නියම තැනට ළං වුනා
නිදා උන්නු හාවා උඟට උඩින් පැරදුනා //

(ගායනය - ශිරෝමාලා ප්‍රනාන්දු)
(පද රචනය - කරුණාරත්න අබේසේකර)

පින්සිදු වන්නේ අනේ බාල ළමුන්නේ
මගේ කුඩා නිවස කඩා බිම නොදමන්නේ

වනේ පුරා සොයා ගොසින් කෝටු කඩාලා
කුඩා කුඩා කැබලි තුඩින් මෙහි ගෙනවිල්ලා
ගසේ මුදුන් අත්ත උඩින් කෝටු තබාලා
උදේ පටන් දවස පුරා කුඩු තනාලා

කොලේ කොලේ දමා කුඩා නිවස වසන්නේ
මගේ දයා බිරිඳ නිතර එය සරසන්නේ
රැලේ රැලේ පුළුන් දමා යහන සදන්නේ
අගේ මටයි ළදරුවනේ එය නොකඩන්නේ

මෙදා මගේ නිවස ඇතා සතුට වඩාලා
උදාර වූ කිරිල්ලගේ දරුවො පිරිලා
එදා අනේ අපට ගලෙන් ගැසුව සියල්ල
වැදා කියමි මගේ පුතුගේ හෙට නොමරල්ලා

දෙමාපියන් සෙනේ සිතේ තම දරුවන්ටා
ළමා ඔබෙන් අපට නැතේ මිහිපිට ඉන්ටා
සමාවෙලා මෙ අප වෙතේ දිවි රැක ගන්ටා
සමා යදිමි දෙන්න පුතේ මෙතන දෙන්ටා

(ගායනය - සී. ටී. ප්‍රනාන්දු)
(පද රචනය - ආර්. එන්. එච්. පෙරේරා)

ක්‍රියාකාරකම 8

✠ සත්තව චර්යා අනුකරණය ඇසුරෙන් නිර්මාණාත්මක ක්‍රීඩාවක නියැලීමට සිසුන්ට අවස්ථා ලබා දෙන්න. මේ සඳහා ශරීර සුවතා වැඩසටහන තුළින් ලද අත්දැකීම් ද ප්‍රයෝජනයට ගනිමින් ක්‍රීඩා නිර්මාණය කර ගැනීමට උනන්දු වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.3 අප පරිහරණය කරන දේ

අපට එදිනෙදා ජීවිතයේ විවිධ භාණ්ඩ හා උපකරණ පරිහරණය කිරීමට අවශ්‍ය වේ. ඒවා පෞද්ගලික මෙන් ම පොදු වශයෙන් ද පරිහරණය කෙරේ. එසේ පරිහරණය කිරීමේ දී ඒවායේ පිරිසිදුකම, ක්‍රමවත් බව, නිසි අයුරින් පරිහරණය සහ පවත්වා ගැනීම පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් ය. එසේ පරිහරණය කිරීම පිළිබඳ ව මූලික හුරුව ලබා දීමට කටයුතු කිරීම මෙම තේමාවෙන් අපේක්ෂා කෙරේ. ඒ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ඒ පිළිබඳ ව අත්දැකීම් ලබා දීම අවශ්‍ය වේ.

නිපුණතා

★ නිවසේ දී හා පන්ති කාමරයේ දී එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ නිවැරදි ව හා ක්‍රමානුකූල ව පරිහරණය කරයි.
★ යම් කාර්යයක් ඉටු කර ගැනීමේ දී ඊට සුවිශේෂී වූ භාණ්ඩ හා උපකරණ හඳුනා ගෙන භාවිත කරයි.
★ භාණ්ඩ හා උපකරණ පරිහරණයේ දී ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
★ එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ හා උපකරණවල පිරිසිදුකම පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
★ එදිනෙදා ඉවත ලන දේ ඇසුරින් විවිධ නිර්මාණ කරයි.
★ අදාළ කාර්යයට උචිත සරල මැහුම් හා ගෙතීම් කරයි.
★ නිර්මාණය කර ගන්නා ලද උපකරණයක්/භාණ්ඩයක් භාවිත කරමින් ක්‍රීඩාවන්හි නියැළෙයි.
★ එදිනෙදා පරිහරණය කරන දේ භාවිත කරමින් සාමූහික ව ගායන, රංගනවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ පන්ති කාමරයේ එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ මොනවා ද? භාණ්ඩ හා උපකරණවලින් ලබන ප්‍රයෝජන මොනවා ද? යන්න පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න.
  - ඒවා තනා ඇති දේ අනුව (උදාහරණ : ලී, කඩදාසි, ප්ලාස්ටික්, යකඩ .... ආදී වශයෙන්) වර්ග කිරීමට යොමු කරන්න.
  - සිසුන් වර්ග කළ ආකාරය (වගු සටහන) කළුලැල්ලේ සටහන් කරන්න.
  - එම වගුව පොතේ සටහන් කර ගැනීමට සිසුන්ට ඉඩ දෙන්න.
- පන්ති කාමරයේ පරිහරණය කරන දේ පිරිසිදු ව, ක්‍රමවත් ව හා නිසි තැන තැබීම හා එහි වැදගත්කම පිළිබඳ ව මෙහි දී සාකච්ඡා කරන්න. උපකරණ නිසි තැන තැබීමෙන් නැවත පරිහරණයට පහසුවීම, විනාශ වීම වැළැක්වීම, කාලය ඉතිරි වීම ... වැනි ප්‍රයෝජන ලබා ගත හැකි බව පෙන්වා දෙන්න.
- පන්තියේ ඇති උපකරණ හා භාණ්ඩ පරිහරණය කිරීමෙන් පසු පිරිසිදු කොට නියමිත තැන්වල තැබීමේ පුරුද්දට සිසුන් යොමු කරන්න. මෙය නිසි ආකාරයට ඉටුකරවීමේ වගකීම පන්ති නායකයින්ට පැවරිය හැකි ය. මෙම නායකත්වය සෑම සිසුවකුට ම ලැබෙන පරිද්දෙන් යොමු කිරීම ඉතා වැදගත් ය.
- උපකරණ හා භාණ්ඩ පරිහරණයෙන් පසු පිරිසිදු කොට නියමිත තැන්වල තැන්පත් කිරීමේ පුරුද්ද සිය නිවෙස්වල ද ක්‍රියාත්මක කිරීමට සිසුන් යොමු කරන්න. සිය අත්දැකීම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- එදිනෙදා භාවිත කරන පොත් පත් ආදිය අලංකාර ව හා පවිත්‍ර ව තබා ගැනීමට කළ හැකි දේ කුමක් දැයි සිසුන්ගෙන් විමසන්න.
  සිසුන්ගේ අභ්‍යාස පොතක්/පෙළ පොතක් බැගින් ගුරු මේසය මත හෝ සුදුසු ස්ථානයක හෝ තබන්නට සලස්වන්න. පොත් පරිහරණය කර ඇති ස්වභාවය අනුව ඒවා ගොඩවල් දෙකකට වෙන් කරන්නට යොමු කරන්න. නිසි ලෙස පරිහරණය කොට ඇති පොත්වල හා එසේ නොමැති පොත්වල දක්නට ලැබෙන යහපත් ලක්ෂණ හා අයහපත් ලක්ෂණ සාකච්ඡාවට යොමු කරන්න. පන්ති පොත් නිසි ලෙස පරිහරණය කිරීමේ වැදගත්කම ඉස්මතු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 2

✠ දිවා ආහාර ගැනීමේ අවස්ථාවක් පිළිබඳ ව විමසිලිමත් වීමට සිසුන් යොමු කරන්න. ඒ අවස්ථාවේ දී
  - ආහාර රැගෙන එන භාජනවල තත්ත්වය හා රැගෙන එන ආකාරය (පිරිසිදුකම, ගැළපෙන බව ... වැනි)
  - ජල බෝතල් පවත්වාගෙන යන ආකාරය

  පිළිබඳ අවධානය යොමු කිරීමට අවස්ථා සලසන්න. අදාළ භාජන පිරිසිදු ව තබා ගැනීම ඒවා ස්ථාන ගත කිරීම සහ අත් පිස්නා නිසි පරිදි භාවිත කිරීම අවධාරණය කරන්න.


- එදිනෙදා ලේන්සුවක් පරිහරණය කිරීමේ වැදගත්කම සිසුන්ට පහදා දෙන්න.
  උදාහරණ :- කට පිසදැමීම, අත පිසදැමීම ....
- මෙහි දී තමාගේ මෙන් ම අන් අයගේ ද ශරීර සෞඛ්‍ය රැක ගැනීම සඳහා ලේන්සුවක් භාවිත කිරීම ඉතාමත් යෝග්‍ය බව ද, කිවිසුමක්, ඇනුමක් යන අවස්ථාවල දී ලේන්සුවක් භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳ ව ද අවධාරණය කරන්න.
- තමාගේ එදිනෙදා භාවිත කරන ඇඳුම් දිනපතා සෝදා හොඳින් වේලා පරිහරණය කළ යුතු බව ද එදිනෙදා භාවිත කරන තුවාය, කොට්ට, පැදුරු, මෙට්ට ආදිය නිතර අව්වේ දමා වියළා ගත යුතු බව ද, ඒවා කිළිටි වී ඇත්නම් පිරිසිදු කර ගැනීමේ වැදගත්කම ද පහදා දෙන්න.
- මේවා ජීවන පුරුදු වශයෙන් පවත්වා ගත යුතු බව ද අවධාරණය කරන්න.

✠ ඇඳුමක් වඩාත් හොඳින් පිරිසිදු කර ගන්නේ කෙසේ ද යන්න පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවමින් අවධාරණය කරන්න. අපිරිසිදු රෙදි කඩක්/ලේන්සුවක් සබන් යොදා සේදීමට අවස්ථාව සලසන්න. සබන් ගා පිරිසිදු කිරීමේ දී වඩාත් හොඳින් කුණු ඉවත් වී යන ආකාරය නිරීක්ෂණයට සලස්වන්න.
- නිවසේ දී තමන් පරිහරණය කරන පිඟන්, කෝප්ප හා පනාව අපිරිසිදු වී ඇති දැ යි සොයා බැලීමට යොමු කරන්න. ඒවා වඩාත් හොඳින් පිරිසිදු කර ගැනීමට යොදා ගත හැකි ක්‍රම ගැන කතා බහ කරන්න. ඒවා පිරිසිදු කිරීමට යොමු කරන්න. එවැනි ක්‍රම කිහිපයක් අත්හදා බලන්න.
  උදාහරණ :- සබන් දමා, සබන් කුඩු දමා, අලු දමා මැදීම, කිරි බෝතල් උණු දියේ තැම්බීම ..
- පන්ති කාමරයේ එදිනෙදා පරිහරණයට ගනු ලබන සුදුසු උපකරණ කිහිපයක් සෝදා නිසි ලෙස පවිත්‍ර කිරීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම 3

✠ එදිනෙදා නිතර භාවිත කෙරෙන භාණ්ඩ හා උපකරණ කිහිපයක නම් සහිත රූප සටහන් අභ්‍යාස පොතේ ඇඳීමට අවස්ථාව දෙන්න. ඒවා නම් කරන්න. හැකිනම් එම උපකරණ කිහිපයක් පන්තියට ගෙන්වා ගන්න. උදා :- කතුර, පිහිය .....
- එම උපකරණ එකින් එක පෙන්වමින් ඒවා වඩාත් සුදුසු වන්නේ කුමන කාර්යයන් ඉටු කර ගැනීමට දැ යි සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එක් උපකරණයක් කාර්යයන් කිහිපයක් සඳහා යොදා ගත හැකි ද, එසේ නම් ඒ කුමන උපකරණ ද එම උපකරණ වඩාත් සුදුසු වන්නේ කුමන කාර්යයට ද වැනි ප්‍රශ්න සිසුන්ට යොමු කරන්න.
  (උදාහරණ :- කතුරේ මුදු දෙකට නිසි පරිදි ඇඟිලි දමන ආකාරය, කතුර අල්ලන ආකාරය)
- භාණ්ඩ හා උපකරණ පරිහරණයේ දී තමාගේ හා අන් අයගේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව ද පැහැදිලි කරන්න. එහි දී කතුරක්, පිහියක්, උල් ආයුධයක් ඉඳිකටුවක් හෝ වෙනත් මෙවැනි උපකරණයක් තවත් කෙනකුට දීමේ දී එය උල රහිත පැත්ත ලබා ගන්නාට යොමු කිරීම, එම උපකරණ නිවැරදි ව හසුරුවන ආකාරය වැනි කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.



✠ අප එදිනෙදා පරිහරණය කරන දෑ පිළිබඳ කියැවෙන කවි, ගී, රැස් කිරීමට සිසුන් යොමු කරන්න.

උදාහරණ :- කුළු නැටුම, කළගෙඩි නැටුම සඳහා ගායනා කරන කවි හා නිර්මාණාත්මක කවි

- එම කවි, ගීවල තාල අනුව නිදහස් චලන ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 4


✠ ආහාර පිළිගැන්වීමේ දී මේස දරණු, අත් පිස්නා, මේස රෙදි ... වැනි දේ භාවිත කරන බව ද එහි වැදගත්කම ද සිසුන්ට පහදා දෙන්න. එවැනි දේ ඉවත ලන ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණය කර ගත හැකි බව ද පහත දැක්වෙන උදාහරණ ඔස්සේ පැහැදිලි කරන්න.

- සරල මැහුම් හා ගෙතීමේ ක්‍රම ඇසුරෙන් මේස දරණු (ටේබල් මැට්ස්) නිර්මාණය කිරීමට සලස්වන්න.

උදාහරණ 1:
පියවර :

- බ්‍රිස්ටල් බෝඩ් වැනි ඝනකම් කඩදාසියකින් පීරිසියක ප්‍රමාණයේ වෘත්තයක් කපා ගැනීම
- කපා ගත් වෘත්තයේ රවුම වටා සම දුරින් පිහිටන සේ සිදුරු විද ගැනීම
- සිදුරු තුළින් බ්ලැන්කට් මැස්ම යොදා ගනිමින් එම වෘත්තය වටා අලංකාර කර ගැනීම (බ්ලැන්කට් මැස්ම මැසීම සඳහා අවශ්‍ය උපදෙස් සිසුන්ට ලබා දෙන්න. වූල් වැනි නූල් වර්ගයක් භාවිත කිරීමෙන් මෙය අලංකාර ලෙස සකස් කර ගත හැකි ය.)
- තව දුරටත් අලංකාර කර ගැනීමට අවශ්‍ය වේ නම් අවසානයේ වෘත්තයේ මැද අලංකාර කිරීම සඳහා චිත්‍රයක් ඇඳීම හෝ රූපයක් ඇලවීම

උදාහරණ :



උදාහරණ 2 :
පියවර :

- ඉවත ලන රෙදි පටි, ඉඳි කොළ, පොල් කොළ වැනි දෙයක් ගෙන තීරු ඉරීම
  තීරු තුනක් ගෙන කොණ්ඩය ගොතන ආකාරයෙන් ගෙතීම් කිරීම
  පළමු ක්‍රියාකාරකම් පරිදි කපා ගත් බ්‍රිස්ටල් බෝඩ් වෘත්තයක් මත ගෙතූ පටි තබමින් නූල් ඇදීම

- මේ දෙයාකාරයෙන් තනා ගත් අලංකාර මේස දරණු, වතුර වීදුරු හෝ පිඟන් හෝ වැනි දේ යම් තැනක තැබීමෙහි දී මේස දරණුවක් තබා ඒ මතින් භාජනය තැබීම සුදුසු බව පහදන්න. එසේ පරිහරණය කිරීමට සිසුන් යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 5

✠ භාණ්ඩ හා උපකරණ විවිධ අවශ්‍යතා සඳහා භාවිත කරන බව ද, ඒවා ශරීර සෞඛ්‍ය හා ශාරීරික වර්ධනයට ඉවහල් වන බව ද සිසුන්ට පැහැදිලි කරන්න.

උදාහරණ :

පනින ලණුව (Skipping Rope) උපයෝගී කර ගනිමින් සිසුන්ගේ හැකියාව අනුව වින්දනයක් ගෙන දෙන ක්‍රියාකාරකම්වල යෙදීමට අවස්ථාව සලසන්න.

පනින ලණුව සකස් කර ගැනීම සඳහා සිසුවාට ගැළපෙන දිගක් සහිත ලණුවක් (නයිලෝන්/ කොහු/ තෝන් ලණු ... ) තෝරා ගන්න. දෙකෙළවරට සවි කිරීම සඳහා සිසුන්ගේ අත්මිට මොලවා ගත හැකි ප්‍රමාණයෙන් 10 cm පමණ දිගැති උණ බට කැබලි දෙකක් හෝ ප්ලාස්ටික් බට කැබලි දෙකක් හෝ තරමක ලොකු නූල් කෝන් දෙකක් සකස් කර ගන්න. ලණුවේ දෙකෙළවර බට කැබලි අස්සෙන් යවා ගැටයක් බැගින් දමන්න. ලණුව හොඳින් බටයේ සවි කරන්න.




- මෙසේ සැදූ පනින ලණුව උපයෝගී කර ගනිමින් තනි තනි ව/යුගළ වී/කණ්ඩායම් වී නිදහස් ක්‍රියාකාරකම්වල යෙදීමට යොමු කරන්න.
- මෙම ක්‍රියාකාරකම් තුළින් සිසුන් ලබන වින්දනය, එය ශාරීරික වර්ධනයට රුකුලක් වන්නේ කෙසේ ද යන්න සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මෙවැනි ක්‍රියාකාරකම්වල යෙදීමේ අවශ්‍යතා ව සිසුන්ට පැහැදිලි කරන්න.

ක්‍රියාකාරකම 6

✠ බට ලී, උණ පතුරු, වේවැල්, ප්ලාස්ටික් බට, නැමිය හැකි වෙනත් ලී වර්ගයක් භාවිත කරමින් සිසුනට ප්‍රමාණවත් වළල්ලක් බැගින් සකස් කර ගැනීමට උපදෙස් දෙන්න. සකස් කරගත් වළලු භාවිත කරමින් ක්‍රීඩාවල නිරත වීමට අවස්ථාව සලස්වන්න.

උදාහරණ:- බිම දිගේ අතින් ඉදිරියට තල්ලු කරමින් වළලු යැවීම
වළලු ඉන වටා කැර කැවීම
වළලු අතරින් රිංගා යෑම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 2.4 අපේ ආහාර

ආහාර පාන අප ජීවිතයට අත්‍යවශ්‍ය වේ. අප ගනු ලබන ආහාරවල ප්‍රමාණය, ගුණාත්මක බව, නියමිත වේලාවට ගැනීම නිරෝගී දිවි පැවැත්මක් සඳහා හේතු වේ. මෙම තේමාවෙන් ඒ පිළිබඳ ව අවධාරණය කිරීම මෙන්ම ආහාර ගැනීමේ යහපුරුදු, සිරිත් විරිත් කෙරෙහි දැනුවත් කිරීමට අපේක්ෂා කෙරේ. ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම තුළින් එම අත්දැකීම් ලබා දීමට අවස්ථා සලසා ඇත.

නිපුණතා

★ ආහාර ගැනීමේ දී සිරිත් විරිත් හා යහපුරුදු පිළිපදියි.
★ ආහාර ගැනීමේ වැදගත්කම අගය කරමින් මිශ්‍ර ආහාර වේලක් ගනියි.
★ ආහාර ගැනීම කෙරෙහි සැලකිලිමත් වෙමින් ප්‍රධාන ආහාර වේල් නියමිත වේලාවට ගනියි.
★ පරිසරයෙන් සපයා ගත හැකි ගුණාත්මක බවින් උසස් ආහාර වර්ග තෝරා ගනියි.
★ ලෙඩ රෝගවලින් ආරක්ෂාවීම සඳහා පිරිසිදු හා නරක් නොවූ ආහාර තෝරා ගනියි.
★ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් ආහාර පුරුදු සහ සිරිත් විරිත් හා බැඳුණු විවිධ නිර්මාණ කරයි.
★ මිශ්‍ර ආහාරවල වැදගත්කම මතු වන ආකාරයෙන් කෙටි නාට්‍ය, රංගන හා ගායනවල නිරත වෙයි.
★ ආහාර ගැනීමේ වැදගත්කම මතු වෙන විනෝදාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ සිසුන් ආහාර ගන්නා ආකාරය පිළිබඳ ව අධ්‍යයනය කරමින් මෙම ක්‍රියාකාරකම කළ හැකි ය. මේ සඳහා ආහාර ගැනීමට පෙර පහත සඳහන් කරුණු කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරන්න.
  ▪ ආහාර ගැනීමේ දී අප විසින් පිළිපැදිය යුතු යැයි පිළිගත් සිරිත් විරිත් කිහිපයක් තිබෙන බව
  ▪ අද ආහාර ගන්නා විට එම සිරිත් විරිත් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන බව
  ▪ පන්තියේ අනෙක් සිසුන් ආහාර ගන්නා විට ඔවුන් අනුගමනය කරනු ලබන පෙනෙන්නට ඇති යහපුරුදු හා හොඳ සිරිත් මතක තබා ගත යුතු බව හා පසුව පන්තියේ ඒ පිළිබඳ ව සාකච්ඡා කරන බව

- සිසුන් ආහාර ගන්නා විට ඔවුන් අනුගමනය කරන පුරුදු නිරීක්ෂණය කරන්න. නිරීක්ෂණය කළ තොරතුරු අනුව එම කාලයෙන් පසු ව පහත දැක්වෙන පරිදි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- ආහාර ගැනීමට පෙර අනුගමනය කළ යහපුරුදු මොනවා දැයි පන්තියට ඉදිරිපත් කිරීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.

  උදාහරණ :-
  ▪ පිරිසිදු වතුරෙන් අත් දෙක හොඳින් සෝදා ගැනීම
    මේ සඳහා ළිඳ/වතුර පයිප්පය ළඟ පොර කන්නේ නැති ව සිය අවස්ථාව පැමිණෙන තුරු සන්සුන් ව පෝලිමේ සිටීම
  ▪ පිඟානකට හෝ වෙනත් බඳුනකට ආහාර බෙදා ගන්නේ නම් හෝ බඳුන කලින් සෝදා ගැනීම හා ප්‍රමාණවත් පරිදි ආහාර බෙදා ගැනීම
  ▪ වතුර බොන භාජනය හෝ කෝප්පයට හෝ පිරිසිදු වතුර පුරවා තමන් අසලින් තබා ගැනීම
  ▪ ආහාර ගත හැකි සුදුසු ස්ථානයක වාඩිවීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ආහාර ගන්නා අවස්ථාවේ අනුගමනය කළ යහපුරුදු මොනවා දැයි පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  උදාහරණ :-
    - ආහාර ගන්නා අවස්ථාවේ එහා මෙහා ඇවිදීමින් ආහාර ගැනීමෙන් වැළකීම
    - ආහාර ගන්නා විට අන් අය සමඟ අනවශ්‍ය ලෙස කතා කිරීම, ශබ්ද නගා සිනාසීම ආදියෙන් වැළකී සිටීම
    - අන් අයගේ ආහාර බඳුන්වලට එබී නොබැලීම
    - ආහාර ගන්නා අතර අනෙක් ක්‍රියාවල නියැළෙන්නේ නැති ව ආහාරය ගැන පමණක් අවධානය යොමු කිරීම
    - අතින් කෑම ගන්නේ නම්, ඇඟිලිවල පමණක් තැවරෙන සේ ආහාර මිශ්‍ර කිරීම
    - දෙතොල් වඩාත් විවර නොවන සේ ආහාර සැපීම
    - මුව වටා ආහාර තවරා නොගැනීම
    - ආහාර සැපීමේ දී තලු නොගැසීම
    - ආහාර ගිලීමට පෙර ප්‍රමාණවත් තරම් ඒවා සැපීම
    - අන් අයගේ භාජනවලට අත නොදැමීම
    - ඇඟිලි හෝ අත්ල ලෙව නොකෑම
    - ආහාර වශයෙන් නොගන්නා කොටස් (අමු මිරිස් කෑලි, ගොරකා කැබලි හා කුරුඳු කැබලි ආදිය ) බඳුනේ පැත්තකින් තැබීම, ඒවා මේසය මත හෝ බිම වැටීම වැළැක්වීම සඳහා ප්‍රවේසම් වීම
    - වතුර බොන විට මේසය මතට හෝ බිමට හෝ නොහැලීම
- ආහාර ගැනීමෙන් පසු ඔවුන් අනුගමනය කළ යහපුරුදු වශයෙන් තමන් නිරීක්ෂණය කළ කරුණු මොනවා දැයි පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  උදාහරණ : පිඟානේ හෝ බඳුනේ ඉතිරි වූ කොටස් කුණු දමන භාජනයට දැමීම
  හිස් ආහාර බඳුන/පිඟාන හොඳින් සේදීම සහ තෙත මාත්තු කිරීම
  පිඟාන ප්‍රවේසමෙන් ආපසු තැබීම
  අත හා මුව පිරිසිදු කර ගැනීම
  තමා වාඩි වූ පුටුව නිසි ලෙස සැකසීම
  ආහාර ගත් ස්ථානය පිරිසිදු කිරීම
- මෙබඳු යහපුරුදු අගය කරන්න. මින් පසු සෑම සිසුවෙක් ම පන්තියේ දී, නිවසේ දී හා වෙනත් ස්ථානවල දී ආහාර ගන්නා විට මෙබඳු හොඳ සිරිත් විරිත් අනුගමනය කිරීමට පුරුදුවීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- ඒ ඒ ජන වර්ග හා ප්‍රදේශ අනුව ආහාර ගැනීමේ පුරුදු මඳ වශයෙන් වෙනස් විය හැකි නිසා ඒ පිළිබඳ ව දැනුවත්කම් ඇති වැඩිහිටියකු පන්තියට කැඳවා ආහාර පුරුදු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවීම වැදගත් විය හැකි ය.
- ආහාර පුරුදු සහ සිරිත් විරිත් පවත්වා ගෙන යාමට අවශ්‍ය විවිධ දෑ පිළිබඳ ව කතා බහ කරන්න.

  එහි දී අත් පිස්නා, අත් සෝදන බඳුන්, ජල බඳුන්, මේස රෙදි, ආහාර වසා තබන කුඩ යනාදියේ වැදගත්කම මතු කරන්න.
- අලංකාර කෑම මේසයක් සඳහා මේවා ඉදිරිපත් කිරීමට ඇති හැකියාව පිළිබඳ ව අදහස් විමසන්න.

ක්‍රියාකාරකම 2

- අලංකාර අත් පිස්නාවක් සකස් කර ගැනීමට පහත ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න. සිසුන් සිවු දෙනා බැගින් කණ්ඩායම් කර එක් එක් කණ්ඩායමට සෙන්ටිමීටර 30 x 30 ප්‍රමාණයේ රෙදි කැබැල්ල බැගින් ලබා දෙන්න. (මේ සඳහා අමු රෙදි සපයා ගැනීම වඩාත් උචිත ය)
- මේසය මත ඊට මඳක් විශාල ඉටි කොළ කැබැල්ලක අතුරා ඇමුණුම් කටු උපයෝගී කර ගනිමින් රෙදි කැබැල්ල ඒ මත රඳවන්න. මෙහි දී රෙදි කැබැල්ලේ එක් එක් මුල්ලක සිට සෙන්ටිමීටර තුනක් පමණ ඇතුළට වන සේ ඇමුණුම් කටු රැඳවීම උචිත ය.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- රෙදි කැබැල්ලේ සෑම පැත්තකම සෙන්ටිමීටර දෙකක් පමණ ප්‍රමාණයක් වන සේ නූල් ගලවා ඉවත් කිරීමට උපදෙස් දෙන්න. ඉතිරි වී ඇති නූල්, කිහිපයක් එකට එක් කරමින් ගැට ගසන්න.
- රෙදි පින්තාරු කිරීම සඳහා භාවිත කරන තීන්ත හෝ ස්වාභාවික ද්‍රව්‍යවලින් සකසා ගත් වර්ණ ආශ්‍රයෙන් හෝ අත් පිස්නාව සුදුසු පරිදි අලංකාර කර ගන්න.

ක්‍රියාකාරකම 3

✠ පහත දැක්වෙන කාණ්ඩවලට අයත් වන අමු ආහාර ද්‍රව්‍ය කිහිපයකින් ස්වල්පය බැගින් පන්තියට ගෙන ඒමට සලස්වන්න.
හාල් හා අල වර්ග
එළවළු වර්ග
පළා වර්ග
කරවල, මාළු, බිත්තර හෝ ඒ වෙනුවට මෑ, පරිප්පු, ඇට වර්ග (සෝයා, බෝංචි ... වැනි)හෝ ආහාරයට ගන්නා බිම් මල්
ඉදුණු පලතුරු

- මෙම ආහාර වර්ග හඳුනා ගැනීමටත්, ඒවා පිළිබඳ ව කතා බහ කිරීමටත් අවස්ථාව ලබා දෙන්න. දිනපතා ගනු ලබන ප්‍රධාන ආහාර වේල් විවිධත්වයෙන් යුතු මිශ්‍ර ආහාර වේලක් ලෙස ගැනීම වඩාත් වැදගත් බව අවධාරණය කරන්න.
උදාහරණ :- බත්, පලා,
මේවායින් එක් කාණ්ඩයකට අයත් ආහාර දිගට ම ශරීරයට නොලැබුණ හොත් ශරීරයේ වර්ධනය නිසියාකාර සිදු නොවන බවත්, ලෙඩ රෝග ඇති විය හැකි බවත් පවසන්න. මේ නිසා සිසුන්ගේ දිනපතා ආහාර වේල විවිධ කාණ්ඩවලට අයත් වන පරිදි විවිධත්වයෙන් යුතු ව ආහාර ගැනීමේ වැදගත්කම කෙරෙහි සැලකිලිමත් වීම පිළිබඳ අවධාරණය කරන්න.

ක්‍රියාකාරකම 4

✠ දෙමාපියන්ගේ සහාය ඇති ව සිසුන්ට මිශ්‍ර ආහාර වේලක් සැපයීමට කටයුතු කරන්න.
බත් හෝ ඒ වෙනුවට කුරක්කන් පිට්ටු ආදී හෝ අල වර්ගයක් හෝ කොස්, දෙල් ආදිය ද යොදා ගත හැකි ය. හැකි තාක් දුරට ගෙවත්තෙන් හෝ ප්‍රදේශයෙන් හෝ ලබා ගත හැකි ආහාර ද්‍රව්‍ය ම මේ සඳහා යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්න.
(උදාහරණ : සහල්, එළවළු හා පලතුරු) මිශ්‍ර ආහාර වේල යන සංකල්පයට විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත් ය. එමෙන් ම ආහාර අමුවෙන් ගැනීම වැදගත් බව අවධාරණය කරන්න.
උදාහරණ :- තක්කාලි, කැරට්, ගොටුකොළ, පිපිඤ්ඤා, පතෝල ....
පිළියෙල කළ ආහාර වේල් සිසුන්ට ලබා දීමේ දී පෙර ඉගෙන ගත් පෝෂණ පුරුදු යළි සිහිපත් කොට, ඒවා අනුගමනය කිරීමට යොමු කරන්න. ඒ පිළිබඳ ව වරින් වර නිරීක්ෂණ කරන්න.
- සිසුන් ගත් මිශ්‍ර ආහාරයෙහි අඩංගු වූ ප්‍රධාන ආහාර වර්ගය හා සෙසු ආහාර වර්ග පිළිබඳ ව සාකච්ඡා කරන්න.
ආහාරවල පෝෂණ ගුණ මතු කෙරෙන කවි, ගී, දෙබස්, කථන ආදිය යොදා ගනිමින් ගායන සහ රංගන අවස්ථා මතු කිරීමට සිසුන් උනන්දු කරන්න. මේ සඳහා රූකඩ ද භාවිත කළ හැකි ය.
- සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ මිනිසුන් දිනපතා ගන්නා ප්‍රධාන ආහාර වේල් හා අතිරේක ආහාර වර්ග පිළිබඳ ව අවධානය යොමු කරවන්න. අතිරේක ආහාර වශයෙන් ගන්නා කෑම හා බීම වර්ග පිළිබඳ ව කතා බහ කරන්න. කැවුම්, ලැවරියා .. වැනි දේශීය සුළු කෑම වර්ග ගැන ද, තේ හා කෝපිවලට අමතර ව බෙලි මල්, රණවරා මල්, ඉරමුසු, දෙහි, නෙල්ලි, දිවුල්, වැනි පාන සහ අඹ, පැපොල් වැනි ස්වාභාවික පලතුරු යුෂ ගැන ද කතා බහ කර ඒවා භාවිතයේ වැදගත්කම අගය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ආහාර රසවත් කිරීම හා ඒවායේ ගුණය වඩාත් දියුණු කිරීමට ගන්නා දේවල් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. සීනි, පැණි, ලුණු, දෙහි, සියඹලා, විනාකිරි, කරපිංචා, රම්පේ, ගොරකා, කරාබුනැටි, ගම්මිරිස්, වියලි මිරිස්, අමු මිරිස්, ලූණු, එනසාල්, සාදික්කා හා වසාවාසි ආදිය උදාහරණ වේ. මේවායේ සාම්පල සිසුන්ට දැක බලා ගැනීමට සැලැස්වීම වැදගත් ය. මේවා යොදා ගන්නා අවස්ථා පිළිබඳ ව සිසුන්ගේ අත්දැකීම් ද එකතු කර ගනිමින් සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම 5

✠ අප ගන්නා ආහාර කුස තුළ දී ජීර්ණය වී, සමහර කොටස් ලේවලට උරා ගන්නා බව ද, ඉතිරි කොටස් මළ වශයෙන් ඉවත් වීම පෙන්වා දෙන්න. මේ නිසා අපේ කුස වරින් වර හිස් වෙයි. එවිට අපට කුසගින්න දැනෙයි. දිගු වේලාවක් කුසගින්නේ සිටීමෙන් ලෙඩ රෝග හට ගත හැකි ය. එනිසා දිනයේ නියමිත වේලාවන්හි දී නැවත ආහාර ගැනීම ඉතා වැදගත් බව පෙන්වා දෙන්න.

- ඕනෑ ම වයසක පසුවන අයකුගේ වැදගත් ම ආහාර වේල, උදේ ආහාර වේල බව පෙන්වා දෙන්න. මුලු රාත්‍රි කාලයේ ම ආහාරයක් නොගන්නා බැවින් උදේ ආහාර වේලත් නොලැබුණොත් අප ඉක්මනින් ලෙඩ විය හැකි ය. මේ නිසා දිනපතා පාසල් යාමට පෙර පෝෂ්‍යදායී ප්‍රමාණවත් පරිදි ආහාර ගත යුතු බව පවසන්න. එමෙන් ම උදේ ආහාරය මිශ්‍ර ආහාර වේලක් විය යුතු බව ද පෙන්වා දෙන්න. (හාල් මැස්සන් හොද්දක් හා එළවළුවක් සමඟ බත් කා ඉදුණු කෙසෙල් ගෙඩියක් ගැනීම උදාහරණ වේ)

  පිරිසිදු ජලය ද ප්‍රමාණවත් තරම් දිනපතා පානය කිරීමට යොමු කිරීම ඉතා වැදගත් වේ. (ජලය පානය කිරීමේ වැදගත්කම ද සිසුනට පහදා දෙන්න.)

- ගමේ කොරටු හා ගොවිපළ ආදියෙන් ලබා ගන්නා ආහාර ද්‍රව්‍ය වඩා අලුත් හා පිරිසිදු විය හැකි බැවින් ඒවා මිලට ගැනීමට වැඩි අවධානයක් යොමු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න. වඩා වැදගත් වන්නේ, තම ගෙවත්තේ එළවළු, අල, කුළුබඩු, පලතුරු ආදිය වවා ගැනීම බව අවධාරණය කරන්න. (උදාහරණ: මඤ්ඤොක්කා පඳුරු කිහිපයක්, බතල වැල් කිහිපයක්, මෑ හෝ බෝංචි වැල්, කෙසෙල් පඳුරක්, පැපොල් ගසක් හා කරපිංචා ගසක්) මෙබඳු ආහාර ද්‍රව්‍ය කෙරෙහි වඩාත් විශ්වාසයක් තැබිය හැකි ය. වත්තේ ප්‍රමාණවත් තරම් ඉඩ නැතිවිට මල් පෝච්චිවල ද සමහර ආහාර ද්‍රව්‍ය වැවිය හැකි ය. (උදාහරණ : මිරිස් පැළ, මාළු මිරිස් පැළ, බටු පැළ, කහ, ඉඟුරු ආදිය) ගෙවත්තේ වගා කිරීම වඩාත් වැදගත් යන ආකල්පය සිසුන් තුළ ගොඩ නගන්න.

ක්‍රියාකාරකම 6

✠ තව ද මනාව ආවරණය කළ භාජනයක් තුළ ඇති ආහාර වර්ගයක් හා එසේ ආවරණය නොකළ එම වර්ගයේ ම ආහාර සාම්පලයක් (උදාහරණ : පැකට් කළ රටඉඳි හා විවෘත ව තබා ඇති රටඉඳි ස්වල්පයක්) පන්තියට ගෙනවුත් මේසයක් මත තබන්න. ස්වල්ප වේලාවක් ගත වෙද්දී කුහුඹුවන් හා මැස්සන් ආදී සතුන් ආක්‍රමණය කරන්නේ මෙයින් කුමන සාම්පලයට දැයි සිසුන්ට නිරීක්ෂණය කළ හැකි වේ. මෙම සතුන් බොහොමයක් විෂ බීජ ගෙනවුත් ආහාර ද්‍රව්‍ය මත හෙලති. මීට අමතර ව විවෘත ව තබන ආහාරවලට දුම්, දූවිලි හා දිය බිංදු ආදිය ද මිශ්‍ර විය හැකි බව පෙන්වා දෙන්න. මේවායේ ද අපට ලෙඩ රෝග සාදන විෂ බීජ තිබීමට පුළුවන. ප්‍රයෝජනයට ගන්නා තෙක් ආහාර මැනෙවින් ආවරණය කර තැබීමේ වැදගත්කම අවධාරණය කරන්න. පාර දෙපස විවෘත ව තබා ගෙන අලෙවි කරන වෙරළු අච්චාරු ආදී කෑම ද, පලතුරු බීම ද ප්‍රයෝජනයට ගැනීමේ අවදානම සිසුන්ට පෙන්වා දෙන්න. මේ සඳහා සිසුනට කෙටි කාලීන ව්‍යාපෘති පැවරිය හැකි ය.

- නිෂ්පාදන දිනය හා කල් ඉකුත් වීමේ දිනය (මුද්‍රණය කොට ඇති ආහාර අඩංගු) බඳුනක් හෝ අසුරණයක් (උදාහරණ : බනිස් අඩංගු පොලිතීන් මල්ලක්) සිසුන්ට ඉදිරිපත් කරන්න. මෙසේ මුද්‍රණය කර ඇත්තේ ඇයි? කල් ඉකුත් වූ පසු ආහාර නරක් වන හෙයිනි. මේ නිසා ආහාර ද්‍රව්‍ය මිලට ගැනීමට පෙරත්, අනුභව කිරීමට පෙරත් ඒවා නිසි කාලය තුළ තිබේ දැ යි සැලකිලිමත් වීමේ වැදගත්කම පහදන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 7

✠ නරක් වූ ආහාර ද්‍රව්‍ය කිහිපයක් සිසුන්ට ඉදිරිපත් කරන්න.

උදාහරණ :- පුස් බැඳුණු පාන් කැබැල්ලක්/නරක් වූ පොල් බෑයක්/පණුවන් විදින ලද ඉදුණු පලතුරු

පිලුණු වූ කෑම ස්වල්පයක්, තැළී පොඩි වී ගිය පලතුරු වැනි

- පන්තියේ සිසුන්ට ඒවා නිරීක්ෂණය කිරීමට සලස්වන්න. නරක් වීමේ විවිධ ස්වභාව හඳුනා ගැනීමට සලස්වන්න.

උදාහරණ :- දුගඳ, ඇලෙන ගතිය, පාට වෙනස්වීම, පණුවන්, ගුල්ලන් වැනි සතුන් සිටීම.

- නරක් වූ ආහාර ද්‍රව්‍ය පිළිබඳ සිසුන් ලබා ඇති අත්දැකීම් කතා බහ කරන්න.
- නරක් වූ ආහාරවල ලක්ෂණ කණ්ඩායම් සටහනක් ලෙස කඩදාසියක ලියා ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න. මේ සඳහා පහත දැක්වෙන ආකාරයේ වගුවක් උදවු කර ගත හැකි ය. ඒවා එකිනෙක ගෙන පෙර කතා නොකළ කරුණු පිළිබඳ ව තව දුරටත් සාකච්ඡා කරමින් නරක් වූ ආහාර ගැනීම අහිත කර බව පැහැදිලි කර දෙන්න.

උදාහරණ :-

| ආහාර | ලක්ෂණ |
|---|---|
| පාන් | පුස් ඇල්ලීම |
| පොල් බෑය | කළු පුල්ලි සෑදීම<br>රතු පැහැයක් හා සෙවල ගතියක් ඇතිවීම |
| කිරිබත් | දුගඳ හැමීම |

- නරක් වූ පලතුරු කෑම නිසා ලෙඩ වූ ළමයකු මවක් හා දොස්තර මහතකු අළලා සංවාද නාටකයක අවස්ථාවක් ඉදිරිපත් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- නරක් වූ ආහාර ගැනීමෙන් ශරීරයට සිදු වන අහිතකර බලපෑම් හා ලෙඩ රෝග පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එවැනි අවස්ථා ගායනය, භූමිකා රංගන මඟින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම් 8

✠ ශරීර ශක්තිය අඩුවෙන් සහ වැඩියෙන් වැය වන ක්‍රීඩා පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

උදාහරණ :- ශක්තිය වැඩියෙන් වැය වන ක්‍රීඩා- කඹ ඇදීම, දිවීම, බර ඉසිලීම ... වැනි

ශක්තිය අඩුවෙන් වැය වන ක්‍රීඩා- දාං ඇදීම, කැරම් ගැසීම, පංච දැමීම .. වැනි

- මෙම සාකච්ඡාවේ දී විවිධ ක්‍රීඩා පිළිබඳ සිසුන්ගේ අත්දැකීම් හා ආකල්ප පිළිබඳ විමසන්න.
- ඔබ ප්‍රදේශයේ ප්‍රචලිත ක්‍රීඩාවක හෝ සිසුන් කැමති ක්‍රීඩාවක හෝ නිරත වීමට අවස්ථාව ලබා දෙන්න. කායික ශක්තිය වැය වන මෙන් ම මානසික ශක්තිය වැය වන ක්‍රීඩාවන් කිරීම කෙරෙහි අවධානය යොමු කරන්න. තේමාව ක්‍රියාත්මක වන කාලය තුළ දින කිහිපයක් ම ක්‍රීඩාවල නිරත වීම වඩාත් ඵලදායී වනු ඇත.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.5 අපි ලක්වැසියෝ

විවිධ ජන වර්ගවලට අයත් වුව ද ලක්වැසි අපි සියලු දෙනා ශ්‍රී ලාංකිකයෝ වෙමු. ජාති, ආගම්, උස් පහත් භේදයකින් තොර ව සැම අයකු ම සම මට්ටමෙහි ලා පූර්ණ ලක්වැසියකු ලෙස සැලකේ. විවිධ ජන කොටස්වල සංස්කෘතීන් අගය කරමින් හා ඒවාට ගරු කරමින් සහජීවනයෙන් කටයුතු කිරීම පිළිබඳ යහපත් ආකල්ප කුඩා කල සිට ම සිසුන් තුළ ඇති කළ යුතු වේ. ජාතික කොඩියට හා ජාතික ගීයට නිසි ගරු සරු දැක්වීම විවිධ ජාතික හා ආගමික උත්සවවල වැදගත්කම අවබෝධ කර ගනිමින් ඒවාට සහභාගි වීම පිළිබඳ මූලික හුරුවක් ලබා දීමට යොමු කිරීමත් මෙම තේමාව යටතේ එන ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල අරමුණ වේ.

නිපුණතා

- ★ ජාතික කොඩියට ගරු කරමින් ජාතික ගීය අභිමානයෙන් යුතු ව ගායනය කරයි.
- ★ ශ්‍රී ලංකාවේ වාසය කරන විවිධ ජන කොටස්වල සංස්කෘතීන් අගය කරමින් සහ ඒවාට ගරු කරමින් කටයුතු කරයි.
- ★ ජාතික හෝ ආගමික හෝ වැදගත්කම පිළිබිඹු වන විවිධ නිර්මාණ කරයි.
- ★ ජාතික අභිමානය දැක්වෙන කවි, ගී, ගායන හා රංගනවල යෙදෙයි.
- ★ ශ්‍රී ලාංකිකයන්ට අනන්‍ය වූ ක්‍රීඩාවල වින්දනාත්මක ව නියැළෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ සිසුන් එළිමහනට රැගෙන යන්න.

- ජාතික කොඩිය එසවීමට සුදුසු ස්ථානයක් සකස් කරන්න.
- ජාතික කොඩිය ඔසවන විට සිටිය යුතු ආකාරය හා ඊට ගෞරව කළ යුතු ආකාරය පිළිබඳ ව පැහැදිලි කරන්න.

ජාතික ගීය ගායනා කරන විට නිවැරදි ව සීරුවෙන් සිටින ආකාරය

- ▪ දෙපා හා දෑත් නිසි අයුරින් තබා ගැනීම
- ▪ විලුඹ දෙක ළංවන සේ පාද මදක් ඈත් කර V අකුරේ හැඩයට තබා ගැනීම.
- ▪ ශරීරිය ඍජුව තබා ගැනීම.
- ▪ හිස කෙළින් තබා ගෙන ඉදිරියේ ඇති එල්ලයක් කෙරෙහි දෙනෙත් විවෘත ව තබා ගැනීම. (ඇස් මට්ටමින් ඉදිරිය බැලීම)
- ▪ අත් දෙක පහළට ලිහිල් ව වැටෙන සේ අත මිට මොලවා මාපටගිල්ල පොළොව දෙසට යොමු වන සේ තබා ගැනීම.(ශරීරය සහ දෙඅත් අතර හිඩැසක් නොතිබිය යුතු ය.)

- ජාතික කොඩිය ඔසවන විට හා එය ලෙළ දෙන විට තමා අභිමානවත් ව සිටීමේ වැදගත්කම අවධාරණය කරන්න. සිසුන් දුටු ජාතික කොඩියට ගරු සරු නොකර අනිසි ලෙස භාවිත කරන අවස්ථා පිළිබඳ සාකච්ඡා කරමින් ජාතික කොඩියට සහ ගීයට නිසි ගෞරව දැක්වීමේ වැදගත්කම මතු කරන්න.
- අනතුරු ව ජාතික කොඩිය ඔසවා ජාතික ගීය ගායනය කරන්න.
- ජාතික ගීය ගැයීමේ දී නිවැරදි උච්චාරණයෙන් හා ස්වරයෙන් යුතු ව ගායනා කිරීමට යොමු කරවන්න.
- ජාතික කොඩිය එසවීම සඳහා ආරාධිතයකුගේ සහාය ද ගීතය ගායනා කිරීම සඳහා ඉහළ ශ්‍රේණිවල සිසුන්ගේ සහාය ද ලබා ගත හැකි ය.
- ජාතික ගීය අවසානයේ දී හිස නමා ආචාර කර අවසන් කිරීමට අවශ්‍ය උපදෙස් දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 2

✠ එමෙන් ම අපේ රටේ පැවැත්වෙන විවිධ ජාතික ආගමික උත්සව අවස්ථා දැක්වෙන චිත්‍ර, රූප එකතු කර පන්ති මට්ටමින් ප්‍රදර්ශනය කරන්න.
- පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම්වලට බෙදා ඉහත සඳහන් ප්‍රදර්ශනය කළ චිත්‍ර රූප ඡායාරූප නැරඹීමට අවස්ථාව දෙන්න.
- ඒවා ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ ජීවත් වන විවිධ ජන වර්ග හා ඔවුන්ට සුවිශේෂ වූ ලක්ෂණ හඳුනා ගැනීමට අවස්ථාව දෙන්න.
- ඒවායේ දැක්වෙන විවිධ ලක්ෂණ පහත සඳහන් පරිදි වෙන් කර දැක්වීමට හැකි දැ යි බලන්න.
  - ඇඳුම් පැළඳුම්
  - කෑම බීම
  - චාරිත්‍ර
  - සංස්කෘතික අංග
- කණ්ඩායම් විසින් රැස් කර ගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
  සිසුන් ඉදිරිපත් කළ කරුණු ගුරුවරයා මැදිහත් වීමෙන් පෝෂණය කරන්න.
  උදාහරණ :- චිත්‍රවලින් ඉස්මතු නොවුණු භාෂාව, සිරිත් විරිත් ....
- විවිධ ජනවර්ග හා ආගම්වලට අයත් වූව ද සියලු දෙනා ම ශ්‍රී ලාංකිකයන් බව ද එහි දී තහවුරු කරන්න.

ක්‍රියාකාරකම 3

✠ එක් එක් ජන කොටස භාවිත කරන ඇඳුම් පැළඳුම් නියෝජනය වන ආකාරයේ සංස්කෘතික අංග ඇතුළත් කෙටි සංදර්ශනයක් සැලසුම් කරන්න.
විවිධ ජන කොටස්වලට අයත් පහත දැක්වෙන ආකාරයේ ජාතික අභිමානය ඇති වන ගීත, කවි, ජන නැටුම් මෙම සංදර්ශනයට ඇතුළත් කරන්න.
ජාතික අභිමානය දැක්වෙන ගීයකට
උදාහරණ :

මේ රට මගෙ රට මා ඉපදුණ රට
හැදෙන වැඩෙන රට මගේ ම මව් රට
    සරු පස පොළොවෙන් වැහි බිඳු අහසෙන්
    මිණි කැට මුතු කැට මගේ සිරිලක ඇත
මේ රට මගෙ රට .....
    මගෙ සිරිලක ගැන ලොවට කියම් මම
    සුරපුරක් ලෙසින් වෙනත් රටක් නැත
මේ රට මගෙ රට .....
    එඩිතරකම ඇති කම්මැලිකම නැති
    ළමයි සිටින රට මගේ ම සිරිලක
මේ රට මගෙ රට .....

(ගායනය - මාලනී බුලත්සිංහල)
(පද මාලාව - මිරැන්ඩා හේමලතා)

ක්‍රියාකාරකම 4

✠ විවිධ ද්‍රව්‍ය රැස් කර ජාතික හෝ ආගමික උත්සවයක දී හෝ යොදා ගත හැකි සැරසිල්ලක් නිර්මාණය කිරීමට යොමු කරන්න.
උදාහරණ :- කඩදාසි ලන්තෑරුම්, කොඩි වැල් වර්ග, රැලි පටි, දම්වැල්, මල් අමුණා කරන ලද සැරසිලි . . . වැනි
- මෙමගින් ලැබෙන ප්‍රායෝගික අත්දැකීම් තුළින් පාසල් උත්සවයක දී හෝ නිවසේ උත්සව අවස්ථාවක දී හෝ සුදුසු සැරසිලි කිරීමට යොමු කරන්න. එම නිර්මාණ අගය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 5

✠ කණ්ඩායම් වශයෙන් හෝ තනි ව හෝ ජන ක්‍රීඩාවල වින්දනාත්මක ව යෙදීමට සිසුන්ට අවස්ථාව දෙන්න. මේ සඳහා ප්‍රාදේශීය වශයෙන් තිබෙන ජන ක්‍රීඩා කෙරෙහි වඩාත් අවධානය යොමු කරන්න. උදාහරණ :- එළුවන් කෑම, වළ කජු ගැසීම, කොටු පැනීම, පංච දැමීම .. ජන ක්‍රීඩාවල ඇති වැදගත්කම පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම 6

✠ සියලු ම ජන වාර්ගිකයන් එක් රැස් වී සමරන උත්සව පිළිබඳ සිසු අත්දැකීම් පදනම් කර ගෙන සාකච්ඡා කරන්න.

- දින දර්ශනය ආශ්‍රයෙන් එම උත්සව පැවැත්වෙන දින සොයා ගැනීමට යොමු කරන්න. එම දින සැමරීම පිණිස සංවිධානය කරන උත්සව ගැන සාකච්ඡා කරන්න. එක් එක් සිසුවාට තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න. පාසලේ ද එම දින වෙනුවෙන් සංවිධානය කරන උත්සව සඳහා ශිෂ්‍යයන් සහභාගි කරවන්න.
- විවිධ ජන කොටස්වලට අයත් උත්සව අතරින් තමන් සිත් ගත් ආගමික උත්සවයක් හෝ ජාතික උත්සවයක් හෝ චිත්‍රයට නගන්න.

උදාහරණ : ආගමික උත්සව - වෙසක් උත්සවය, පොසොන් උත්සවය, රාමසාන් උත්සවය, හජ්ජි උත්සවය, තෛපොන්ගල් උත්සවය, දීපවාලී උත්සවය, නත්තල් උත්සවය, පාස්කු මංගල්‍යය

ජාතික උත්සවය - නිදහස් දින උත්සවය, මැයි දින උත්සවය

ක්‍රියාකාරකම 7

✠ පාසලේ නිදහස් දින උත්සවයක් පැවැත්වෙන්නේ නම් එයට සිසුන් සහභාගී කරවන්න.

- නිදහස් දින හෝ එදිනට සමගාමී දිනයක සමාන්තර පන්ති එකතු වී පාසලේ නිදහස් දින උත්සවයක් සංවිධානය කරන්න.
- නිදහස් දින උත්සවයෙහි වැදගත්කම සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.6 ආරක්ෂාව හා පරිස්සම

ආරක්ෂාව හා පරිස්සම කෙරෙහි අවධානය යොමු විය යුතු බැවින් කාලීන අවශ්‍යතා මත ගොඩ නඟා ඇති තේමාවකි. සැලකිලිමත් බවෙන් තොර ව අනවධානයෙන් හා නිසි අවබෝධයකින් තොරව කටයුතු කිරීමෙන් භෞතික සම්පත් මෙන් ම මානව සම්පත් ද හානියට පැමිණෙන අවස්ථා ඇත. පරීක්ෂාවෙන් කටයුතු කළ යුතු අවස්ථාවල ඒ පිළිබඳ නිසි සැලකිල්ලක් නොදැක්වීම අනපේක්ෂිත ආපදාවලට ගොදුරු වීමට හේතු වේ. එහෙයින් ජීවිතයේ මුල් අවධියේ සිට ම ආපදාවලට අනතුරුවලට ලක් විය හැකි යයි සිතෙන කටයුතුවල දී නිසි අවධානයෙන් යුතු ව කටයුතු කිරීමට සිසුන් පෙළඹවීම හා දැනුවත් බවත් ලබා දීම ඉලක්ක කර මෙම තේමාව සැලසුම් කර ඇත.

නිපුණතා

- ★ තමාගේ හා අන් අයගේ ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ සැලකිලිමත් වෙමින් කටයුතු කරයි.
- ★ අනතුරු සිදුවිය හැකි අවස්ථා හා එවැනි අවස්ථාවක දී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.
- ★ අනතුරු හා ලෙඩ රෝගවලින් ආරක්ෂාවීම කෙරෙහි සැලකිලිමත් ව කටයුතු කරයි.
- ★ අනතුරු සිදුවන අවස්ථා සහ එවැනි අවස්ථාවල දී කටයුතු කළ යුතු ආකාරය නිරූපණය කෙරෙන ගායනා හා රංගනවලට දායක වෙයි.
- ★ අනතුරු පිළිබඳ ව අන් අය දැනුවත් කිරීම සඳහා විවිධ නිර්මාණ කරයි.
- ★ තමාගේ මෙන් ම අන් අයගේ ආරක්ෂාව පිළිබඳ අවධානයෙන් යුතු ව ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ එදිනෙදා සිදුවන අනතුරු පිළිබඳ ව සිසුන් සමඟ අත්දැකීම් ඇසුරින් සාකච්ඡා කරන්න. එහි දී පන්තියේ සිසුන් මුහුණ පෑ අනතුරු සිසුන් දන්නා හඳුනන අය මුහුණ පෑ අනතුරු තමා දුටු අනතුරු පිළිබඳ ව අදහස් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න. ඒ පිළිබඳ ව කතා බහ කරන්න.

- පාසලේ/පන්තියේ සිසුන් මුහුණ පෑ අනතුරු පහත සඳහන් සටහන යොදා ගනිමින් සම්පූර්ණ කිරීමට කණ්ඩායම් වශයෙන් සිසුන් යොමු කරන්න.

  උදාහරණ :-

| සිසුවා | අනතුරු වූ අයුරු | අනතුරු සිදු වූ ස්ථානය | හානිදායි ප්‍රතිඵලය |
|---|---|---|---|
| නිමල් | පය ලිස්සා වැටීම | ක්‍රීඩා පිටියේ දී | පාදය තුවාල වීම |
| සරත් | ගසකින් වැටීමෙන් | ගෙවත්තේ දී | අත කැඩීම |
| නිමාලි | රතිඤ්ඤා පත්තු කිරීමෙන් | නිවසේ දී | ඇස් තුවාලවීම |

ඉහත වගුව ඇසුරින් පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සාකච්ඡාවක් කරන්න.

1. වැඩියෙන් ම සිදු වී ඇති අනතුරු මොනවා ද?
2. අනතුරු සිදුවීම්වලට හේතු හා ස්ථාන
3. අනතුරුවලින් සිදුවිය හැකි ප්‍රතිඵල
4. අනතුරු විවිධ හේතු නිසා සිදු වන බව

ආදී කරුණු අවධාරණය කරමින් අනතුරු පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.

- පුවත්පත්වල පළ වූ විවිධ අනතුරු පිළිබඳ ව තොරතුරු පන්තියට රැගෙන ඒමට පවසන්න. සිසුන් සමඟ සාකච්ඡා කිරීමට යෝග්‍ය අනතුරු පිළිබඳ තොරතුරු පමණක් ඒ අතරෙන් තෝරා ගන්න. එම තොරතුරු පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. (අනතුරට හේතුව, අනතුර සිදුවී ඇති අයුරු, අනතුරින් ඇති වූ හානිය ආදී තොරතුරු මෙහි දී සාකච්ඡා කළ හැකි ය.) එම තොරතුරු යම් ක්‍රමයකට වර්ග කිරීමට යොමු කරන්න.

  උදාහරණ : මාර්ග අනතුරු
  සතුන් නිසා සිදු වූ අනතුරු



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 2

✠ පාසලේ දී විය හැකි අනතුරු පිළිබඳ ව කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව හෝ සිසුන් යොමු කර හඳුනා ගන්න. එම අනතුරු පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

උදාහරණ :- බෝතල් කටුවකට කකුල කැපීම

- මෑතක දී පාසලේ දී මෙවැනි අනතුරුවලට මුහුණ දුන් සිසුන් සිටී නම් ඔවුන් පන්තිය ඉදිරියට කැඳවා අනතුර සිදු වූ අයුරු හා ඊට සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. ඒ පිළිබඳ ව සිසුන්ට ප්‍රශ්න ඇසීමට ද අවස්ථාව දෙන්න. (අනතුරේ ස්වභාවය, එය සිදු වූ අයුරු ආදි විවිධ කරුණු) කතා කරන්න. එය කාගේ හෝ නොසැලකිල්ල හේතුවෙන් (පරිස්සමින් කටයුතු නොකිරීම) සිදු වූ අනතුරක් බව පෙන්වා දෙන්න.
- විශේෂයෙන් සිසුන් ක්‍රීඩා කිරීමේ දී විය හැකි අනතුරු පිළිබඳ කතා කරන්න. මෙහි දී සිසුන් යෙදෙන ක්‍රීඩා පිළිබඳ ව සිසු අවධානය යොමු කරමින් කතා බහ කරන්න. අනතුරු පිළිබඳ ව භූමිකා රංගන මඟින් තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න. ඒ අයුරින් පාසලේ දී විය හැකි අනතුරු පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.
- අනතුරු ව පාසලේ දී මෙන් ම නිවසේ දී ද අතර මගදී ද විය හැකි අනතුරු කෙරෙහි සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  උදාහරණ :- අතර මග දී විය හැකි අනතුරු

  I. පාරේ වතුර පිරුණු වළවල්වලට වැටී තුවාල වීම
  II. බෝතල් කටු, ඇණ ආදිය ඇනීම
  III. වාහනවල ගමන් කිරීමේ දී හිස, අත, ආදී ශරීර කොටස් වාහනවලින් පිටතට දමා ගෙන යාම නිසා අනතුරු වීම
  IV. පොත් පත්තර බලමින් යහළුවන් සමඟ කතා කරමින් පාරේ ගමන් කිරීම නිසා වාහනවල වැදීම
  V. සර්පයින් දෂ්ට කිරීම/බල්ලන් සපා කෑම
  VI ජංගම දුරකථන භාවිත කරමින් ගමන් කිරීම

නිවසේ දී විය හැකි අනතුරු

උදාහරණ :-

I. විදුලි සැර වැදීම
II. ගෑස් ලිපෙන් ගෑස් කාන්දු වීම නිසා ශරීරයට ගිනි ඇවිලීම
III. භූමිතෙල් කුප්පි ලාම්පු පෙරළීමෙන් ගිනි ඇවිලීම
IV. වැරදි අයුරින් හා නොසැලකිල්ලෙන් ආයුධ භාවිතය නිසා තුවාල සිදුවීම
V. දිය නෑමට යෑමේ දී හා ළිංවලින් ජලය ලබා ගැනීමේ දී ළිංවලට වැටී තුවාල වීම

- මේ පිළිබඳ සිසු අත්දැකීම් රංගන හා චිත්‍ර ආදිය මගින් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න. ඉහත සඳහන් අනතුරු අවධාරණය කරමින් තමාගේ හා අන් අයගේ ආරක්ෂාව සඳහා අනතුරු නොවන පරිදි පරිස්සමින් ක්‍රියා කළ යුතු බව සාකච්ඡා කරන්න.
- නොසැලකිල්ලෙන් ක්‍රියා කිරීම නිසා තමා හා අන් අයට විය හැකි අනතුරු උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න.

  උදාහරණ :- ක්‍රිකට් ක්‍රීඩාවේ දී පන්දුවට පිත්තෙන් පහර දීමේ දී පිත්ත අතින් ලිස්සා යෑම නිසා අසල අයකුට අනතුරක් විය හැකි බව (විනෝදයට, විහිළුවට සිදු කරන යම් යම් දේවල් නිසා සමහර අවස්ථාවල දී මිනිසුන් මිය යෑම දක්වා හානිදායි දෑ සිදු වන බව කරුණු සහිත ව කතා කරන්න.)
- තමා මෙන් ම අන් අයට ද, සතුන්ට ද, විය හැකි අනතුරුවලින් වැළකීම සඳහා ක්‍රියා කිරීම මනුෂ්‍යයකුගේ හොඳ ගුණ ධර්මයක් බව අවධාරණය කරන්න.
- අනතුරුවලින් වැළකීම සඳහා කළ යුතු දේවල් පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.
- සිසුන් කණ්ඩායම් කර අනතුරුවලින් වැළකීමට කළ යුතු දේවල් හඳුනා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ :-

| අනතුර | අනතුරට හේතුව | අනතුරු වැළැක්වීමට කළ හැකි දේවල් |
|---|---|---|
| කකුලේ ඇණයක් ඇනීම | පාසලේ ඇණ විසි කර තිබීම<br>නොසැලකිලිමත් ලෙස ඇවිදීම<br>ඇණ විසි කර තිබෙන බව දැක ඒවා නොසලකා හැරීම | ඒවා සොයා ඇහිඳ ආරක්ෂිත ස්ථානයකට දැමීම<br>පරිස්සමින් ගමන් කිරීමට සිතට ගැනීම<br>පාවහන් පැළඳීම |

- ඉහත වගුව ඇසුරු කරමින් පාසලේ, නිවසේ, අතර මගදී විය හැකි හදිසි අනතුරුවලින් වැළකීම පිළිබඳ සාකච්ඡා කරන්න. අනතුරු කුමන මොහොතක හෝ අනපෙක්ෂිතව සිදු විය හැකි නිසා තමන් සෑම අවස්ථාවක දී ම ඒ පිළිබඳ කල්පනාවෙන් සිටිමින් ක්‍රියා කිරීම අවශ්‍ය බව සිසුන්ට පහදා දෙන්න.
- අනවබෝධයෙන් කටයුතු කිරීමේ දී, මෙන් ම නොසැලකිල්ලෙන් ගමන් කිරීමේ දී විය හැකි අනතුරු සොයා බැලීමට සිසුන් යොමු කරන්න. මෙවැනි අවස්ථාවල දී තමා හා අන් අයගේ ආරක්ෂාව පතා ක්‍රියා කළ යුතු අයුරු සිසුන් සමඟ කතා කරන්න. අනතුරුවල ස්වභාවය අවස්ථාව අනුව වෙනස් වන අයුරු සොයා බලන්න. පාසලේ දී නිවසේ දී මහ මග දි වන අනතුරු උදාහරණයට ගනිමින් මේවා විමසීමට ලක් කරන්න.
- අනතුරක් සිදු වන අවස්ථාවක දී අනතුරේ ස්වභාවය අනුව අවස්ථාවට ගැළපෙන ලෙස කටයුතු කළ යුතු බව. මෙබඳු අවස්ථාවක දී කළ යුතු දෑ නොකළ යුතු දෑ ඇත. ඒවා සිසුන් සමඟ සාකච්ඡා කළ යුතු අතර කාලීන සිද්ධි උදාහරණයට ගනිමින් සිසු අවධානය යොමු කිරීම සුදුසු ය.
  උදාහරණ : නාය යාම් සිදු වන අවස්ථාවක, ගංවතුර අවස්ථාවක දී කළ යුතු නොකළ යුතු දෑ.
  මේ පිළිබඳ ව සිසුන් කණ්ඩායම් කර තොරතුරු රැස් කර, වගු සටහනක් සම්පූර්ණ කිරීමට යොමු කළ හැකි ය.

| අනතුර | කළ යුතු දෑ | නොකළ යුතු දෑ |
|---|---|---|
| ක්ලාන්තවීම | රෝගියාට හොඳින් ආශ්වාස ප්‍රශ්වාස කිරීමට හැකි වන සේ සුදුසු වාතාවරණය සැපයීම. | රෝගියා වටා රොක් වී සිටීම.<br><br>රෝගියාට වතුර පෙවීමට උත්සාහ කිරීම. |
| බල්ලෙක් සපා කෑම | ගලායන පිරිසිදු ජලයෙන් සබන් දමා හොඳින් සේදීම | සපා කෑ ස්ථානය රෙදි පටිවලින් ගැට ගැසීම. අත් බෙහෙත් දැමීම. |

ක්‍රියාකාරකම 3

✠ කාලීන වශයෙන් වැළඳිය හැකි රෝග පිළිබඳ සිසු අවධානය යොමු කරන්න.
උදාහරණ : මැලේරියා, ඩෙංගු, බරවා, චිකුන්ගුන්‍යා උණ හා වෙනත් රෝග ආදිය ශ්‍රී ලංකාවේ පැතිරී යන වසංගත රෝග පිළිබඳ ව සාකච්ඡා කරන්න.
අතීතයේ හා වර්තමානයේ පැතිරී යන මෙම රෝගවල කාලීන වෙනස්කම් (උදාහරණ : අතීතයේ දී බහුල ව මැලේරියාව, වර්තමානයේ දී ඩෙංගු) සාකච්ඡා කරන්න.
මෙම රෝග පැතිරී යාමට හේතු වන කරුණු මොනවා දැයි සොයා බැලීමට සිසුන් යොමු කරන්න.
උදාහරණ : ඩෙංගු රෝගය - මදුරුවා

- ජලය රැඳීම නිසා වෙන් මෙම මදුරුවන් බෝවන බව පැහැදිලි කරන්න. මිනිසුන්ගේ වැරදි ක්‍රියා හා නොසැලකිල්ල නිසා මෙම රෝග බෝවන අයුරු පැහැදිලි කරන්න. මෙම රෝග අවම කර සෞඛ්‍ය සම්පන්න ජනතාවක් රට තුළ ජීවත් වීමට ජනතාවගේ කැපවීම, දැඩි අවධානය අවශ්‍ය බව පහදා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 4

✠ බෝවන වසංගත රෝග වැළඳුන රෝගීන්ගේ චරිත අනුකරණයට අවස්ථා සලසා දෙන්න. වසංගත රෝග රට තුළ පැතිරෙන අවස්ථාවල දී ජනතාව ක්‍රියාකළ යුතු අයුරු සාකච්ඡා කරන්න.

උදාහරණ : රෝග වැළැක්වීමට කටයුතු කිරීම
රෝග වැළඳුන අයට උදවු උපකාර කිරීම

මේවා ආශ්‍රිත ජනකතා, රංගන ඉදිරිපත් කිරීමට සිසුන්ව යොමු කරවන්න. එහි දී කල් වේලා ඇති ව වැඩ සැලසුම් කිරීම.

- පන්තියේ සිසුන් ඉඩකඩ සහිත ස්ථානයකට ගෙන ගොස් සිසුන් එක් අයකු හෝ දෙදෙනකු මදුරුවන් ලෙසත් අන් අය සිසුන් ලෙසත් වෙන් කරන්න. ක්‍රීඩාවේ යෙදිය හැකි සීමාවක් පොළොවේ ලකුණු කරන්න. පහත සඳහන් පරිදි ක්‍රීඩාවේ යෙදිය යුතු අයුරු සිසුන්ට පැහැදිලි කරන්න. මදුරුවෝ සිසුන් පසු පස එළවමින් සිසුන්ට දෂ්ට කිරීමට ක්‍රියා කරති. සිසුහු මදුරුවන්ගෙන් බේරීම සඳහා දුවති. ලකුණු කළ සීමාව පැගීම ඉන් පිටතට යාම මදුරුවන් දෂ්ට කිරීම සමඟ එම සිසුන් මදුරුවන් වන බව ද පැහැදිලි කරන්න. මේ අයුරින් තරග අවසානය දක්වා සිදු කරන්න. නව දුරටත් මෙවැනි ක්‍රීඩා නිර්මාණය කර ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.7 ජලය

ජලය ස්වභාවික සම්පතකි. අපට ජලය ලැබෙන ක්‍රම රාශියක් ඇත. මිනිසා විසින් ජලය විවිධ ප්‍රයෝජන සඳහා යොදා ගනු ලැබේ. එදිනෙදා පරිහරණය කරන ජලය අපතේ යාම වැළැක්වීම, ජලය අපිරිසිදු නොකිරීමට වග බලා ගැනීම වැනි කරුණු පිළිබඳ අත්දැකීම් ලබාදීමටත්, ජලය ස්වභාවික සම්පතක් ලෙස අගයමින් එය සුරක්ෂිත ලෙස පරිහරණය කිරීමේ යහපත් ආකල්ප ගොඩනැගීමේ අපේක්ෂාවෙන් මෙම තේමාව සැලසුම් කර ඇත.

නිපුණතා

★ විවිධ දේ ජලය සමඟ ප්‍රතික්‍රියා කරන ආකාරය පිළිබඳ ව විමර්ශනය කර වාර්තා කරයි.
★ ජලය ස්වභාවික සම්පතක් ලෙස අගය කරමින් සුරක්ෂිත ලෙස පරිහරණය කරයි.
★ පාසලට හා නිවසට ජලය සැපයෙන ක්‍රම හා ජලය රැස් කර තබා ගන්නා අවස්ථා පිළිබඳ ව තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ ජලය තේමා කොට ගත් රංගන, ගායන, වාදන තනි ව හා සාමූහික ව ඉදිරිපත් කරයි.
★ ජලය සැපයෙන ක්‍රමවල ආකෘති සහ ජලය රැස් කර තබා ගන්නා උපකරණවල ආකෘති නිර්මාණය කරයි.
★ ජලය ආශ්‍රයෙන් කෙරෙන ක්‍රීඩාවල යෙදෙමින් ආශ්වාදයක් ලබයි.
★ ජලය උපයෝගි කර ගෙන විවිධ දේ නිර්මාණය කරමින් වින්දනයක් ලබයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ සිසුන් කුඩා කණ්ඩායම්වලට බෙදන්න. වටාපිටාවෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය (ජල බඳුනකට දැමිය හැකි) හැකි තරම් සපයා ගැනීමට උපදෙස් දෙන්න. උදාහරණ : ශාක පත්‍ර, ගල් කැට, රෙදි කැබලි, අඟුරු කැට, පාන් කැබලි, ඇණ...
- විනිවිද පෙනෙන බඳුනකට ද්‍රව්‍ය එකිනෙක දමා වතුර කලතමින්/සොලවමින් /හරවමින්/ පෙරළමින් සිදුවන දේ නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසන්න.
- ජලය සමඟ ද්‍රව්‍ය ක්‍රියා කරන ආකාරය අනුව ඒවා කාණ්ඩ කිරීමට යොමු කරන්න. නිරීක්ෂණ පහත දැක්වෙන අයුරින් වාර්තා කිරීමට සලස්වන්න.

| පා වෙන | ගිලෙන | ජලය උරා ගන්නා | දිය වෙන |
|---|---|---|---|
| | | | |

- ජලය ආශ්‍රිත ව භාවිත කරන ඇතැම් දේවල් නිර්මාණය කිරීමේ දී ඉහත ලක්ෂණ ප්‍රයෝජනයට ගෙන ඇති අවස්ථා සොයා බැලීමට යොමු කරන්න. සොයා ගෙන එන අත්දැකීම් පන්තියේ සාකච්ඡා කරන්න.

  උදාහරණ : බොහෝ ලී ජලයේ පාවේ. සමහර ලී යට ගිලේ, ලී කඳන්වල කුහරයක් සාදා ඔරු තනා ගනී, ඔරු දෙකක ලෑලි සවිකර පාරු සාදා ගනී.
- ජලයේ පාවෙන දේවල් කීපයක් (රිජිෆෝම් කැබැල්ලක්, ලී කැබැල්ලක් වැනි) එක් එක් කණ්ඩායමට ඉදිරිපත් කරන්න. ඒවා ජලයේ ගිල්වීමට කළ හැකි දේ සොයා බැලීමට යොමු කරන්න.
- ජලයේ පතුළට ම කිඳා බසින දේවල් කිහිපයක් (යකඩ ඇණයක්, ගල් කැටයක් ආදී) ඉහත අයුරින් කණ්ඩායම්වලට දී ඒවා පා කිරීමට කළ හැකි දේ සොයා බැලීමට ද යොමු කරන්න.
- ජලය උරා ගත් දේවල්වලින් ජලය ඉවත් කිරීමට කළ හැකි දේ සොයා බැලීමට යොමු කරන්න. ඒවා වාර්තා කිරීමට සලස්වන්න.

  උදාහරණ : රත් කිරීම, මිරිකීම, ගසා දැමීම, අව්වේ වියළා ගැනීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

✠ ජලයේ පා වෙන දෙයක් ආශ්‍රිත ව ජලයේ පා කළ හැකි සෙල්ලම් භාණ්ඩයක් නිර්මාණය කිරීමට යොමු කරන්න.
උදාහරණ : හිස් ප්ලාස්ටික් බෝතල් ඇසුරුම් යොදා ගෙන දියේ යන වාහන

ක්‍රියාකාරකම 2

✠ විවිධ ද්‍රව්‍ය ජලයේ දිය වන ආකාරය පැහැදිලි වන ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න. විනිවිද පෙනෙන ජල බඳුන් කිහිපයක් ගෙන එක් බඳුනකට එක් වර්ගයක් බැගින් පහත දැක්වෙන ද්‍රව්‍ය ස්වල්පයක් දමා හැන්දකින් කළවම් කරන්න. ටික වේලාවකින් පසු ප්‍රතිඵලය පරීක්ෂා කරවන්න.
උදාහරණ : පොල් තෙල්, ලාම්පු තෙල්, සීනි, ලුණු, පාන් පිටි, පුයර, සබන් හා පස් ස්වල්පයක් ... වැනි

- ප්‍රතිඵල වාර්තා කිරීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 3

✠ ජලයෙන් ලබා ගන්නා විවිධ ප්‍රයෝජන පිළිබඳ ව සාකච්ඡා කිරීමට අවස්ථාව දෙන්න.

- සිය නිවෙස්වල ජලයෙන් ලබා ගන්නා විවිධ ප්‍රයෝජන පිළිබඳ සිසු අත්දැකීම් ඇසුරු කර ගනිමින් මෙම සාකච්ඡාව මෙහෙය වන්න. පිපාසය සඳහා බීම, නෑම, මුහුණ හා ඇඟපත සේදීම, ආහාර ගැනීමට පෙර හා ආහාර ගැනීමෙන් පසු අත් සේදීම, පිහන්, ගෘහ භාණ්ඩ, ඇඳුම් හා වාහන ආදිය සේදීම, ආහාර පිළියෙල කිරීම, වැසිකිළි යාමෙන් පසු පවිත්‍ර කර ගැනීම, ගොවිතැන් කටයුතු කිරීම සතුන් නෑවීම, ගොඩනැගිලි තැනීම ආදී විවිධ පිළිතුරු සිසුන්ගෙන් ලබා ගන්න. සාකච්ඡාව අවසානයේ දී සාකච්ඡා කළ තොරතුරු සටහන් කර ගැනීමට අවස්ථාව දෙන්න.
- මීට අමතර ව, නොයෙකුත් කර්මාන්ත සඳහා ද ජල විදුලිය නිපදවීම සඳහා ද ජලය ප්‍රයෝජනයට ගන්නා බව ඡායාරූප, පෝස්ටර් හා රූප සටහන් ආදිය ආධාර කර ගෙන සිසුන් සමඟ කතා බහ කරන්න. ගමනාගමන කටයුතු හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ජලය උපයෝගී කර ගන්නා ආකාරය මුහුදු, ජලාශ හා ගංගාවල ගමන් කරන නැව් හා බෝට්ටු ආදියේ ඡායාරූප හා රූප සටහන් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දී ඒ පිළිබඳ තොරතුරු කතා බහ කරන්න. අදාළ තොරතුරු සටහන් කර ගැනීමටත්, ඒවා ඉදිරිපත් කිරීමටත් අවස්ථාව දෙන්න.
- පාසල පිහිටි ප්‍රදේශයේ ජලය ආශ්‍රිත කර්මාන්ත කෙරෙන ස්ථානයක් නිරීක්ෂණයට සිසුන් කැඳවා ගෙන යන්න. (උදාහරණ : පලතුරු හා එළවළු ටින් කිරීම, විසිතුරු මසුන් ඇති කිරීම, වතුර බෝතල් කිරීම හා ජල විදුලිය නිපදවන බලාගාර වැනි ස්ථාන) එමෙන් ම පහසුකම් තිබේ නම් ජල මාර්ග යොදා ගනිමින් ගමනා ගමනය හා භාණ්ඩ ප්‍රවාහනය කරන ආකාරය පෙන්වීම ද වඩාත් සුදුසු ය.

ක්‍රියාකාරකම 4

✠ ජලය අපතේ යාම වළක්වා ගැනීම සඳහා අපට කළ හැක්කේ කුමක් ද?
ජලය අපිරිසිදුවීම වැළැක්වීම සඳහා අපට ගත හැකි ක්‍රියා මාර්ග මොනවා ද?
අපිරිසිදු ජලය භාවිතයෙන් අපට සිදුවිය හැකි හානි මොනවා ද?

- ඉහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සිසුන්ගේ අත්දැකීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න. පාසලේ මෙවැනි අවස්ථා නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න. බීමට ගන්නා (පානීය ජලය) ජලය හොඳින් උණු කොට නිවා, පෙරා භාවිතයට ගැනීමේ වැදගත්කම පෙන්වා දෙන්න.
- ජලය අපේ ජීවිතවලට නැතිව ම බැරි වටිනා සම්පතක් බව අත්දැකීම් ඇසුරෙන් මතු කරන්න. ජලය නොමැති වුවහොත් ඉහත ආකාරයේ සියලු පහසුකම් අපට අහිමි වන බවත් මේ නිසා ජලය ආරක්ෂා කර ගැනීම අප සතු විශාල වගකීමක් බවත් පෙන්වා දෙන්න. මේ සඳහා ජලය අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කිරීමේ අවශ්‍යතාව මතු කර දක්වන්න. ගෙවී ගිය ජල කරාමයකින් ජලය අපතේ යෑම වැළැක්වීම, සෑම විට ම අවශ්‍යතාවට සරිලන ජල ප්‍රමාණයක් පරිහරණය කිරීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

එමෙන් ම අපවිත්‍ර ජලය අපට හානිකර බවත් ඒ මගින් ලෙඩ රෝග බෝ විය හැකි බවත් සිසුන්ට අවධාරණය කරන්න. මෙය වළක්වා ගත හැක්කේ ජලය අපිරිසිදුවීම වළක්වා ගැනීමෙන් සහ අපිරිසිදු ජලය භාවිතයෙන් වැළකී සිටීමෙන් බව සිසුන් සමඟ අත්දැකීම් ඇසුරින් සාකච්ඡා කරමින් එම කරුණු අවධාරණය කර ගැනීමට අවස්ථාව සලස්වන්න. පන්තියේ සිසුන් කණ්ඩායම්වලට බෙදා ඉහත සඳහන් කරුණුවලට අදාළ ව විවිධ පණිවුඩ රැගත් පෝස්ටර් නිර්මාණය කරවන්න.

ක්‍රියාකාරකම 5

✠ මිනිසුන් එදිනෙදා කටයුතුවලට අවශ්‍ය කරන ජලය සපයා ගන්නා ක්‍රම පිළිබඳ ඡායාරූප හෝ රූප සටහන් හෝ සිසුන්ට ඉදිරිපත් කරමින් ඒවා බහුල ව භාවිත කෙරෙන ප්‍රදේශ හඳුන්වා දෙන්න.

උදාහරණ : ළිඳ
ආඩියා ළිඳ
වැව/පතහ
ගලා යන ජලය (ගඟ/ඇළ/දොළ)
පීල්ල
ජල නලය

- මේ අතරින් පාසලේ භාවිත කෙරෙන ක්‍රමය/ක්‍රම මොනවා දැ යි සාකච්ඡා කරන්න. මෙම ජල සැපයුම පරීක්ෂා කිරීමට සිසුන් යොමු කරවන්න. එම ක්‍රමයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවා ද?
- ජලය ලැබෙන්නේ කොහොම ද? (උල්පත්වලින්/ගලන දොළ පහරක් හරස් කොට අමුණක් හෝ වේල්ලක් බැඳ/ටැංකියකින්)
- අප ජලය ලබා ගන්නේ කෙසේ ද? (කඹය සහිත බාල්දියකින්/කරාමය විවෘත කිරීමෙන්/ කළයෙන් ගෙන ඒම මගින්)
- ජලයට අපද්‍රව්‍ය (කුණු රොඩු) වැටීම වළක්වා තිබේ ද? (ළිඳට ඉහළින් දැලක් සවි කර තිබීම/ කොන්ක්‍රීට් ආවරණයකින් වසා තිබීම)
- අපේ ආරක්ෂාවට යොදා ඇති උපක්‍රම මොනවා ද? (ළිඳ වටා බැම්මක්/වතුර කරාමය පාමුල ලිස්සා යාම වැළැක්වීමේ ක්‍රමයක්)
- ජලය තැන්පත් කර තබා ගන්නා ක්‍රම පාසල/පන්තිය සතු ව තිබේ ද?(පාසලට කොන්ක්‍රීට්/ ප්ලාස්ටික් වතුර ටැංකියක්, පන්තියේ වතුර ගුරුලේත්තු, කළයක් හෝ බෝතල්)
- වැඩිපුර ජලය ඉවතට ගෙනයාමේ ක්‍රම තිබේ ද? (කාණු මගින්)
- මෙම ජලය නැවත ප්‍රයෝජනයට ගනී ද?
  ඡායාරූප, පින්තූර වැනි දේ භාවිත කර සංකල්ප ගොඩ නැගීමට උත්සහ කරන්න.
  මේ ආකාරයට ම, සිසුන්ගේ නිවෙස්වල අවශ්‍යතා සඳහා ජලය සපයා ගැනීම පිළිබඳ ව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. නිවසේ ජලය රැස් කර ගන්නා ක්‍රමය/ක්‍රම ද සාකච්ඡාවට ගන්න. වහලයෙන් වැටෙන වැසි ජලය එකතු කර පසු ව ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රමයක් තිබේ ද? තම අත්දැකීම් බෙදා හදා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- පාසලටත්, නිවසටත් ජලය ලබා ගැනීම දුෂ්කර වන ඇතැම් කාල තිබේ ද? ඒ දිනවල අප මුහුණ දෙන ගැටලු මොනවා ද?
- හැකි නම් ජල සම්පාදන මණ්ඩලය හෝ ප්‍රාදේශීය පාලන අධිකාරිය නිකුත් කළ ජල බිල්පත් කිහිපයක් පන්තියට ඉදිරිපත් කරන්න.
- පාසලටත් නිවෙස්වලටත් ජලය ලබා ගැනීමේ දී විශාල ශ්‍රමයක් හෝ ලොකු මුදලක් හෝ වැය වන බවත්, මේ නිසා ජලය අරපරිස්සමෙන් පාවිච්චි කිරීම අපේ බලවත් වගකීමක් බව වටහා ගැනීමට ඉඩ සලස්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- නියං කාලයේ දී ජල සම්පත හිඟ වන බවත්, එය ස්වභාවික සම්පතක් හෙයින් නැවත නිෂ්පාදනය කළ නොහැකි බවත්, එම නිසා සෑම අවස්ථාවක දී ම ජලය අරපිරිමැස්මෙන් යුතු ව භාවිත කළ යුතු බවත් අවධාරණය කරන්න. ළිංවල ජල මට්ටම කෙරෙහි වැස්ස බලපාන ආකාරය කැලෑ එළි පෙහෙළි කිරීම නිසා වර්ෂාව අඩුවන ආකාරය හා නියං කාල වැඩිවීම ආදිය ගැන අවධානය යොමු කරවන්න.
- ජල පරිහරණයේ දී අප විසින් සැලකිය යුතු ප්‍රධාන කරුණු දෙකකට සිසුන්ගේ අවධානය යොමු කරවන්න.

  ජලය අපතේ නොයවා පරෙස්සමෙන් පාවිච්චි කිරීම

  ජලය අපවිත්‍රවීම වැළැක්වීමට පියවර ගැනීම

  ඉහත කරුණු අවධාරණය කෙරෙන පරිදි කණ්ඩායම් වශයෙන් පෝස්ටර් නිර්මාණය කිරීමට යොමු කරවන්න. රංගන, ගායන, වාදන තනි ව හා සාමූහික ව ඉදිරිපත් කිරීමට ද සිසුන්ට අවස්ථා ලබා දෙන්න.

ක්‍රියාකාරකම 6

✠ පහත යෝජනා කෙරෙන ආකෘති අතුරෙන් ප්‍රදේශයට අදාළ වන ආකෘති කිහිපයක් මැටි, ක්ලේ, ලී කෝටු ආදිය උපයෝගී කර ගෙන සිසුන් සමඟ නිර්මාණය කරන්න.

උල්පතක් හෝ පීල්ලක්

ජල ටැංකියක් සහිත කුලුණක්

වැවක් හෝ පතහක්

කන්දකින් ගලා එන ජල පහරක් හා ඒ හරහා බැඳුණු අමුණක්/වේල්ලක්

ආඩියා ළිඳක්

මේවා යොදා ගෙන පන්ති ප්‍රදර්ශනයක් පවත්වන්න.

ක්‍රියාකාරකම 7

✠ ජලය පිරවීම හා හිස් කිරීම සම්බන්ධ ක්‍රීඩාවල යෙදීමට සලස්වන්න.

උදාහරණ :

සපයා ගත යුතු දේ : හිස් බීම බෝතල් 5ක්

වතුර දමන බාල්දි/බේසම් 5ක්

මේ සඳහා සිසුන් කණ්ඩායම් 5කට බෙදන්න. රේඛාවක් මත පෝලිම් ගැසීමට කණ්ඩායම්වලට කියන්න. එක් එක් කණ්ඩායම ඉදිරියේ හිස් බෝතලයක් බැගින් තබන්න. බෝතල් ඉදිරියෙන් මීටර 5ක් පමණ ඈතින් වතුර භාජන 5 තබන්න.

සංඥාවක් කළ විට ක්‍රීඩාව ඇරඹේ. කණ්ඩායම්වල පළමුවැන්නා තම කණ්ඩායමේ දිය බඳුන වෙත දුව ගොස් දෝතින් වතුර රැගෙන විත් බෝතලයට දැමිය යුතු ය.

නැවත තමා සිටි ස්ථානයට දුව විත් දෙවැන්නාට තට්ටු කළ යුතු ය. එවිට ඔහු ද/ඇය ද පළමු සේ දුව ගොස් බෝතලයට වතුර පුරවා දුව විත් තුන්වැන්නාට තට්ටු කරයි. මේ අයුරින් කණ්ඩායමේ සියලු දෙනා අවසන් වූ පසු වැඩි ජල ප්‍රමාණයක් ඇති බෝතලය අයත් කණ්ඩායම ජයග්‍රහණය කරයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.8 ගමනාගමනය

ගමනාගමනය අපගේ ජීවිතවල බෙහෙවින් අත්‍යාවශ්‍ය අංගයක් වී ඇත. ගමනාගමනය සඳහා ලොකු කුඩා වශයෙන් වෙනසක් නොමැති ව එක සේ සියල්ලන් ම සම්බන්ධ වේ. අතීතයේ සරල ව පැවැති ගමනාගමන කටයුතු වර්තමානය වන විට ඉතා සංකීර්ණ තත්ත්වයකට පත් ව තිබේ. පුද්ගලයකු පරිසරයට හොඳින් අනුගත වීමේ දී මේ පිළිබඳ ව නිපුණයකු වීම ද අවශ්‍යතාවකි. තව ද අද වන විට දිනකට වාහන අනතුරුවලින් මිය යන සංඛ්‍යාව ඉතා විශාල ය. මෙම අනතුරුවලට දරුවන් ද ගොදුරු වී ඇත. මෙම අනතුරු වළක්වා ගැනීම සහ ගමනාගමනය සම්බන්ධ පවතින තත්ත්වය පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීම සඳහා තොරතුරු කිහිපයක් මෙහි අඩංගු කර ඇත. මේ පිළිබඳ ව සිසුන්ට ප්‍රායෝගික ව අත්දැකීම් ලබා ගැනීමට අවස්ථා සලසා දීමෙන් අදාළ නිපුණතා කරා ළඟා වීම පිණිස මෙම තේමාව සැලසුම් කර ඇත.

### නිපුණතා

★ නිවසේ සිට පාසලට යන එන මං පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ තමා අවට ප්‍රදේශයේ ජනතාව ගමනාගමනය සඳහා භාවිත කරන ක්‍රම පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ පාරේ ගමන් කරන්නන් විසින් අනුගමනය කළ යුතු නීතිරීති දැන ගෙන ඒවාට අනුව කටයුතු කරයි.
★ වාහනවලින් ඉටු කර ගන්නා විවිධ කාර්යයන්/සේවාවන් අගය කරමින් ඒවා සුරැකෙන ආකාරයෙන් කටයුතු කරයි.
★ වාහන නිසා පරිසරයට වන අහිතකර බලපෑම් පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ වාහනවලින් සිදු වන අහිතකර බලපෑම් අවම කර ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කරයි.
★ ගමනාගමන අවස්ථා ගායන/වාදන/රංගන/අභිරූපණ/නාට්‍ය මඟින් ඉදිරිපත් කරයි.
★ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් වාහනවල ආකෘති නිර්මාණය කරයි.
★ ගමනාගමනය ආශ්‍රිත ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ පාසල සමීප පරිසරයේ ඇති ලොකු කුඩා පාරවල් පිළිබඳ ව සිසු අවධානය යොමු කරවන්න. සිසුන් සමඟ මේ පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් කරන්න. එම මාර්ග වැටී ඇති ආකාර පිළිබඳ කතා කරන්න. මේ එක් එක් පාරෙහි දක්නට ඇති වෙනස්කම් සහ ස්වභාවය පිළිබඳ ව තොරතුරු විමසන්න. (උදාහරණ :- තාර පාර, ගුරු පාර ආදිය)


- සිසුන් පාසලට එන්නේ කිනම් මාර්ගවලින් ද යන්න සොයා බලන්න. සාකච්ඡා කරන්න.
- පාසල මුල් කර ගෙන පාසලට ආසන්න පොදු ස්ථානයකට හෝ සිසුන් දන්නා නිවසකට හෝ යා හැකි මාර්ග දැක්වෙන දළ සැලැස්මක් ගොඩ නැඟීමට කණ්ඩායම්වලට අවස්ථාව සලසන්න. සකස් කරන ලද සැලැස්මවල් පිළිබඳ ව අදහස් ඉදිරිපත් කිරීමට සිසු කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් පාසලට එන අයුරු කතා බහ කරන්න. (උදාහරණ: පයින්, බස් රියෙන්, පාසල් වෑන් රථයෙන්, කෝච්චියෙන් බයිසිකලයෙන් ... වැනි) පන්තියේ සිසුන් පාසලට පැමිණෙන ආකාරය විවිධ අයුරින් වාර්තා කිරීමට සලස්වන්න. ඒ පිළිබඳ ව කතා බහ කරන්න.
- පයින් ගමන් කරන්නන් පිළිපැදිය යුතු නීති රීති පැහැදිලි කරන්න.

  උදාහරණ :- කහ ඉරි යොදා ගෙන ඇති තැන්වලින් පාර මාරු වීම

  පළමුව දකුණත්, දෙවනුව වමත් නැවත දකුණත් ආදී වශයෙන් පාර දෙපස හොඳින් පරීක්ෂා කර වාහන නොමැති නම් ඉක්මනින් පාර මාරු වීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- පයින් යන විට දකුණත පැත්තෙන් ගමන් කිරීමේ වැදගත්කම කතා බහ කරන්න.
  නිවැරදි අයුරින් මාර්ග භාවිත කරන ආකාර පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීමට සුදුසු පුද්ගලයකු කැඳවන්න. මහ මග ගමන් කිරීමේ නිවැරදි ක්‍රම පිළිබඳ ව ප්‍රායෝගික ව අත්දැකීම් ලබා දීමට කටයුතු සලසන්න. සිසුන් දැනුවත් කළ යුතු මාර්ග නීති රීති හා ගමනාගමනයේ දී අනුගමනය කළ යුතු දෑ පිළිබඳ ව සිසුන්ට උපදෙස් ලබා දීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න.
- අනතුරු සිදුවිය හැකි අවස්ථා පැහැදිලි කරන්න. උදාහරණ :- පාර මාරුවීමට කහ ඉර භාවිත කරන විට වුව ද පාර දෙපැත්ත ඉතා හොඳින් බැලිය යුතු බව විශේෂයෙන් සිසුන්ගේ උසට අනුව පෙනෙන මට්ටම සීමිත බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වන බව
- දුම්රිය මාර්ගයක ස්වභාවය හා මහා මාර්ගයක ඇති ස්වභාවයෙහි වෙනස්කම් මතු කර දක්වන්න. දුම්රිය මාර්ගයක දී විය හැකි අනතුරු, දුම්රිය සංඥා, නීති රීති ආදී තොරතුරු පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න. මහා මාර්ගයේ ගමන් කිරීමේ දී හෝ දුම්රිය මාර්ගයේ ගමන් කිරීමේ දී හෝ නොකළ යුතු දේවල් මොනවා ද යන්න ගමන් කරන්නන්ගේ වගකීම්, යුතුකම් කතා බහ කරන්න.
- වාහන ගමන් කරන මාර්ගයක් අසල සිට වාහනවලින් නිකුත් කරන සංඥා නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න. හැකිනම් නවත්වා ඇති වාහනයක (උදාහරණ :- ගුරුවරයකුගේ හෝ අසල්වැසියකුගේ වාහනයක්) ආලෝක සංඥා පද්ධති පරීක්ෂා කිරීමට අවස්ථාව ලබා දෙන්න. (උදාහරණ :- ප්‍රධාන ලාම්පු නවතා තැබීමේ දී පාවිච්චි කරන ලාම්පු, සංඥා ලාම්පු හා තිරිංග ලාම්පු)
  වාහනවලින් නිකුත් කරනු ලබන විවිධ ආලෝක සංඥා (වාහන නතර කිරීමේ දී, හැරවීමේ දී, පසු පසට ගැනීමේ දී)
  ආසන්න පරිසරයේ පාරවල්වල ඇති හා සංඥා සලකුණු, හඳුනා ගැනීමට යොමු කරන්න. හඳුනා ගත් එම සංඥා හා සලකුණුවල අරුත් සහ ඒවා දැන සිටීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.




- සිසුන් නිරීක්ෂණය කරන තොරතුරු විවිධ ලෙස වා

ක්‍රියාකාරකම 2

✠ වාහන පිළිබඳ සිසු අත්දැකීම් සාකච්ඡා කරන්න.
  ගොඩබිම අහසේ හා ජලයේ ගමන් කරන වාහන පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරමින් ඒවා වර්ග කිරීමට යොමු කරන්න. (පින්තූරවලින්/සෙල්ලම් වාහන ආකෘති ඇසුරින්)
  මෙම වාහන වෙන් වෙන් වශයෙන් ගෙන ඒවායින් වන සේවය පිළිබඳ ව සාකච්ඡා කරන්න. සේවය අගය කරන්න.
  උදාහරණ :-දුම්රිය - මගීන් ගෙන යාම, බඩු ගෙන යාම
  නැව් - බඩු ගෙන යාම, මගීන් ගෙන යාම
- ගොඩබිම, අහසේ හා ජලයේ ගමන් කරන වාහනවල වෙනස්කම් පිළිබඳ ව විමසා බලා වාර්තා කිරීමට යොමු කරන්න. ප්‍රායෝගික නිරීක්ෂණයට අපහසු වන වාහන සඳහා පින්තූර යොදා ගන්න. බස් රියේ ගමන් කිරීම, දුම්රියේ යෑම, ඔරු පැදීම ආදි විවිධ සංචලන ක්‍රියාකාරකම්වල සිසුන් කණ්ඩායම් ලෙස යොදවන්න. අවශ්‍ය අවස්ථාවල ගායනා ද යෙදා ගන්න.
  පරිසරයෙන් පහසුවෙන් සපයා ගත හැකි මැටි, ලී කෝටු, ලැලි, කාඩ්බෝඩ්, ටින් ආදි විවිධ ද්‍රව්‍ය යොදා ගෙන වාහන ආකෘති කිහිපයක් ගොඩ නැංවීමට යොමු කරන්න.
  කුඩා සෙල්ලම් වාහන කිහිපයක් පන්තියට ගෙනවා ඒවායේ විවිධ ක්‍රියාකාරිත්වයන් නිරීක්ෂණය කිරීමටත් එම නිරීක්ෂණ වාර්තා කිරීමටත් යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- විවිධ වාහන පිළිබඳ විස්තර ඇතුළත් පොත් පිංචක් පිළියෙල කිරීමට යොමු කරන්න. එම පොතේ එක් එක් වාහනය පිළිබඳ තොරතුරු රැස් කරන්න.

  උදාහරණ :- බස් රිය
  ගමන් කරන්නේ - ගොඩබිම
  රෝද සංඛ්‍යාව - 06
  සේවය - මගීන් ගෙන යෑම (හැකිනම් මීට වඩා වැඩි තොරතුරු වුව ද ඉදිරිපත් කිරීමට සිසුන්ට ඉඩ දෙන්න)
  පොදු වාහන නිසා මගීන්ට වන සේවය අගය කරන්න.

ක්‍රියාකාරකම 3

✠ බස් රිය, දුම්රිය ආදි පොදු වාහනවල ගමන් කරන විට වාහන ආරක්ෂා කිරීම සඳහා කළ යුතු හා නොකළ යුතු දේ පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න. පින්තූර හා ඡායාරූප ඉදිරිපත් කරමින් කණ්ඩායම් වශයෙන් මේවා සොයා බැලීමට ද යොමු කළ හැකි ය. පොදු වාහනවලට හානි කිරීම නිසා තමාට හා රටට වන හානිය, පාඩුව සාකච්ඡා කරන්න. රටේ දියුණුවට බාධා වන අයුරු සාකච්ඡා කරන්න.

- පොදු වාහන සම්බන්ධයෙන් නීති විරෝධී කටයුතු කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව අවධාරණය කරන්න. ටිකට් පත්‍රයක් ලබා නීත්‍යානුකූල ව ගමන් කිරීම නිසා තමන්ටත්, රටටත් වන යහපත අගය කරන්න. මෙවැනි කරුණු තව දුරටත් අවධාරණය සඳහා රංගන වැනි දෑ ද යොදා ගන්න.
- වාහන නිසා පරිසරයට සිදු වන අහිතකර බලපෑම් පිළිබඳ ව කතා කිරීම සඳහා වාහන ගමනාගමනය කරන මාර්ගයක් අසලට සිසුන් කැඳවා ගෙන යන්න. වාහන ධාවනය කරන විට දක්නට ලැබෙන පරිසරයට අහිතකර දේවල් ගැන සිසු අවධානය යොමු කරවන්න. එසේ දුටු දේවල් පහත ආකාරයට සටහනක පිළියෙල කරන්න.

| වාහනය | දුටු දේවල් |
|---|---|
| බසයක්<br>යතුරු පැදියක් | කළු දුම් දැමීම<br>අධික ශබ්දයක් නිකුත් කිරීම |

- දුවිලි හා දුම් නිසා මිනිසුන්ට හා සතුන්ට වන බලපෑම ගැන සිසුන්ගේ අවධානය යොමු කරන්න. විශේෂයෙන් මෙම ද්‍රව්‍ය අප ආශ්වාස ප්‍රශ්වාස කරන විට ශරීරය තුළට යන බවත් එයින් අපට විවිධ ලෙඩ රෝග (පෙනහලු රෝග හා වෙනත් රෝග) ඇති වන බවත් කතා කරන්න.
- ගමන් බිමන් යාමේ දී දුම් දුවිලි ආදියෙන් වැළකීමට කළ හැකි දේ කතා බහ කරන්න.
- නගරයක පරිසරය දූෂණය වන පරිදි එහි පාරවල ගමන් කරන වාහනවලින් දුම් පිටවීම සිදු වන අයුරු හා මිනිසුන් ඊට දක්වන ප්‍රතිචාර ආදිය දැක්වෙන සේ චිත්‍ර ඇඳීමට සලස්වන්න.
- ගමනාගමනය සම්බන්ධයෙන් සමාජයට පණිවිඩයක් දිය හැකි පෝස්ටර් නිර්මාණය කිරීමට සිසු කණ්ඩායම්වලට පවරන්න. අවසානයේ ඒවා ප්‍රදර්ශනය කරමින් අගය කරන්න. ඒ පිළිබඳ තොරතුරු කතා බහ කරන්න.

ක්‍රියාකාරකම 4

- ගමනාගමනයට භාවිත කරන වාහන සහ එහි අවස්ථා පිළිබඳ ව කියැවෙන ගීත, කවි, ගායනයට සිසුනට අවස්ථා සලසන්න.

  උදාහරණ :- උදෑසන ම අපි දිව යනවා
  කොහේ ද සැහවී එළියට එනවා
  උදේ පාන්දර පාසල් යන්නට
  බසයක් ඇවිදින් කතා කරනවා
  මේ පොඩි බස් රිය ඔබේ ය සිතලා
  කුරුටු ගෑම හොඳ නෑ ඉරි ඇඳලා
  අසුන් කඩා බිම දමා හොයන්නේ
  අපේ ය මේ බස් රිය රැක ගන්නේ

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

දෙබරමුලක් ගල් වැදී සැලෙන සේ
එපා පුංචි ළමයිනි පොරකන්නට
පේළි ගැසී බසයට නැග ගත්විට
මුතු ඇමුණුව වාගේ මුතු පොටකට
(පද රචනය: ගාමිණී විජේතුංග)

- පහත සඳහන් අවස්ථා සංචලනයන් මඟින් නිරූපණය කිරීමට සිසුන් යොමු කරන්න.
  (i) ඔරු පැදීම යුගල හා කණ්ඩායම් වශයෙන්
  (ii) දුම්රිය ගමනක්
  (iii) බසයක ගමනක්
  (iv) පා පැදි, යතුරු පැදි ගමන් කරන ආකාරය නිරූපණය
- සිසුන් කණ්ඩායම් කර ඉහත සඳහන් අවස්ථා නිර්මාණාත්මක අයුරින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.9 ගෙවත්ත

ගෙවතු වගාව පවුලක එදිනෙදා ජීවිතයේ සුබ සාධනයට වැදගත් දායකත්වයක් ලබා ගත හැකි මාර්ගයකි. ඒ නිසා ගෙවතු වගාවට සම්බන්ධ වීම තුළින් වින්දනයක් ලබා ගැනීමටත්, බෝග වගා කිරීම පිළිබඳ සරල අත්දැකීම් ලබා ගැනීමටත් මෙම තේමාව තුළින් අවස්ථාව සලසා ඇත. ශිෂ්‍යයා කුඩා කළ සිට ම ගෙවතු වගා කටයුතුවලට හුරු කරමින් එහි වැදගත්කම පිළිබඳ ව අවබෝධයක් ලබා දීම ද අපේක්ෂා කෙරේ.

නිපුණතා

- ★ ගෙවතු වගාවට දායක වීම තුළින් වින්දනයක් ලබයි.
- ★ බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම භාවිත කරයි.
- ★ විවිධ නිර්මාණ මගින් ගෙවත්තක සුන්දරත්වය මතු කර දක්වයි.
- ★ ගෙවතු වගාවේ වැදගත්කම අගය කරයි.
- ★ ගෙවත්තක සුන්දරත්වය මතු වන කවි, ගී, දෙබස් හා රංගනවල නිරත වෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

✠ මගේ ගෙවත්ත යන මාතෘකාව ඉදිරිපත් කරමින් සාකච්ඡාවකට පිවිසෙන්න.

- පන්තියේ සිසුන්ගේ ගෙවතුවල දක්නට ලැබෙන දේවල් පිළිබඳ ව විමසමින් ඒ එකිනෙක පිළිවෙළින් ලියන්න. උදාහරණ : ලොකු ගස් (කොහොඹ, අඹ) කුඩා ගස් (ජම්බු, පේර) පඳුරු (කෙසෙල්, අන්නාසි, ඉඟුරු) පැළෑටි (දාස්පෙතියා, ගොටු කොළ), ගේට්ටුව, අඩි පාර, වැට, පාත්ති, ළිඳ, වතුර ගලා යන කාණුව, ඔන්චිල්ලාව, රෙදි වැල, පොකුණ හා මල් පෝච්චි ආදී අංග ද සඳහන් කරන්න.
- ගෙවත්තක දක්නට ලැබෙන ඒ ඒ දේවල් අපට ප්‍රයෝජනවත් වන ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරමින් අදාළ අංගය ඉදිරියේ ලියන්න.

  උදාහරණ :- කොහොඹ ගස - සෙවන සපයයි, බෙහෙත් ලබා දෙයි.

  වතුසුද්ද පඳුර - ගෙවත්ත අලංකාර කරයි, ආගමික කටයුතු සඳහා මල් සපයයි.

  ගේට්ටුව - අනවශ්‍ය පරිදි සතුන් හා මිනිසුන් ගෙවත්තට ඇතුල්වීම වළකයි.
- ආරක්ෂාව, ගමන් පහසුව, ජලය, ආහාර, ඖෂධ, අලංකාරය හා සිසිල ආදී මේ සියල්ලක් ම අප ජීවිතයට වැදගත් බැවින් ගෙවත්තක මේවා පිහිටා තිබීම අගය කරන්න.
- ගෙවත්තක පිහිටා ඇති දේවල් අපට ප්‍රයෝජනවත් වනවා සේ ම ඒවා ක්‍රමානුකූල ව පිහිටා තිබීම ද වැදගත් බව පෙන්වා දෙන්න. එසේ පිහිටීම එම දේවලින් ප්‍රයෝජනය ගැනීමේ දී පහසු වනවා මෙන් ම අපේ ගතට හා සිතට සැනසීමක් ලබා දීමට ද උපකාරී වන බව පෙන්වා දෙන්න.

ක්‍රියාකාරකම් 2

✠ පාසල් වත්තේ කොටසක් ගෙවත්තක් සේ සලකා එම කොටස සකස් කිරීමට සිසු කණ්ඩායම්වලට පවරන්න. මං පෙත් හා පාත්ති ආදිය සකස් කළ යුතු තැන්, ලොකු ගස් හා පඳුරු සිට විය යුතු තැන්, කෙසේ විය යුතු දැ යි සිසුන්ගෙන් විමසන්න. මුලින් ඔබ විසින් හුණු ලෑල්ලේ ලියූ (උදාහරණ :- සෙවන ලබා දීම, අලංකාරය ලබා දීම) අනුකූල වන පරිදි ඒවා ස්ථානගත කළ යුතු වේ. මෙම ගෙවත්ත නිසා පාසලේ වෙනත් කටයුතුවලට බාධා සිදු නොවන පරිදි එය සකස් කළ යුතු බව පෙන්වා දෙන්න.

- මෙබඳු කරුණු සාකච්ඡා කරන්න.

  උදාහරණ :-

  ළිඳෙන් හෝ කරාමයෙන් හෝ යන වතුර එකතු වන තැන්වල වැවීමට සුදුසු ගස් හා පැළ මොනවා ද?

  වැටට වවන්නට සුදුසු පඳුරු මොනවා ද?

  මල් පාත්ති සෑදිය යුත්තේ පාසලේ කුමන දිශාවට වන්නට ද?

Copyright © 2007 National Institute of Education - Sri Lanka.


සෙවන ගස් අවශ්‍ය කොතැනට ද?
පාසල් පිට්ටනිය වටා සිටුවීමට තෝරා ගත යුත්තේ කුමන වර්ගවල ගස් ද?
ගෙඩි එළවළු හා කොළ එළවළු සිටුවීමට තෝරා ගන්නා ස්ථානය කෙසේ විය යුතු ද?
අප ප්‍රදේශයට ගැළපෙන පලතුරු වර්ග මොනවා ද? ඒවා සිටුවන ස්ථාන තෝරා ගන්නේ කෙසේ ද?

- මෙම ගෙවත්තේ වගා කිරීම සඳහා පැළ ලබා ගැනීමට පහත සඳහන් පරිදි විවිධ ක්‍රමවලින් කිහිපයක් භාවිත කොට සිසුන්ට අත්දැකීම් ලබා දෙන්න.

දොඩම්, අලිගැට පේර ආදී පලතුරුවල හොඳින් මේරූ ගෙඩි ගෙන බීජ (ඇට) ගලවා ජලයෙන් සෝදා තවානක පැළ කොට, පැළ වැඩුණු පසු ප්‍රමාණවත් තරම් ලොකු වළවල් සකසා ඒවායේ සිටුවන්න.
පිහිඹියා, කොට්ටම්බා ආදී සෙවන ශාක හා කතුරුමුරුංගා ආදියේ ද බීජ තවාන්වල පැළ කර පැළ ලබා ගන්න.
වම්බටු, බීට් ආදී එළවළුවල ද, දාස්පෙති ආදී මල් වර්ගවල ද බීජ තවාන්වල පැළ කර ගන්න.
ගොටු කොළ හා මුගුණුවැන්න ආදී කොළ එළවළු වර්ගවල මේරූ දඬු කපා පාත්තිවල සිටුවන්න.
රෝස හා ක්‍රෝටන් ආදී ශාකවල මේරූ අතු සෙන්ටිමීටර් 15ක් පමණ දිගට කපා තවානක මුල් අද්දවා ගෙන පසු ව වළවල්වල සිටුවන්න.
අරලිය ශාකයේ මේරූ අතුවලින් සෙන්ටිමීටර් 30ක පමණ කැබලි කපා වළවල්වල සිටුවන්න.
අඹ සහ සැපදිල්ලා ආදී පළතුරු වර්ගවල බද්ධ පැළ, පැළ තවානකින් ලබා ගෙන සිටුවන්න.
පැළය බද්ධ කර ඇති ආකාරය සිසුන් ලවා නිරීක්ෂණය කරවන්න. බද්ධ කළ ශාක ප්‍රමාණයෙන් කුඩාවට වැඩෙන බවත්, ඉක්මන් ඵලදාවක් ලබා දෙන බවත් පෙන්වා දෙන්න.


ක්‍රියාකාරකම් 3

✠ බීජ හෝ අතු හෝ පැළ කළ විට, ඒවායේ මුල් ඇදෙන ආකාරය බලා ගැනීමට සිසුන් බොහෝ කැමැති වනවා ඇත. මේ සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
පැහැදිලි ව පෙනෙන බිත්ති සහිත විනිවිද පෙනෙන කට ලොකු වීදුරු බෝතලයක් ගන්න. (හිස් ජෑම් බෝතලයක් මේ සඳහා සුදුසු ය.) එහි ඇතුළ් බිත්තිය වටා ඩිමයි කඩදාසි කැබැල්ලක් එලන්න. බෝතලය තුළට වැලි පුරවන්න. ඩිමයි කඩදාසියත්, වීදුරු බිත්තියත් අතර කොටසට බෝංචි හෝ මෑ බීජ දෙකක් හෝ තුනක් ඇතුළු කරන්න. වැලි තෙමෙන පරිදි ජලය ස්වල්පයක් ඒ මත ඉසින්න. සිසුන් ලවා දිනපතා මුල් ඇදෙන ආකාරය නිරීක්ෂණය කරවන්න. වැලි වියළෙන විට ජලය ඉසිය යුතු වේ.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

බෝංචි හෝ මෑ බීජ පැළවීමේ දී, දිනපතා දකින දේ රූප සටහන්වලට නැංවීමට සිසුන් යොමු කරන්න. ඔවුන් අඳින රූප සටහන්, පහත දැක්වෙන චිත්‍රවලට සමාන වේ දැ යි සැලකිලිමත් වන්න.




මෙම බීජ පැළවීමේ දී මුලින් ම දක්නට ලැබෙන කොටස, මුල් ඇදෙන ආකාරය, මුල් වැඩෙන දිශාව, කඳ දික්වන ආකාරය, කඳ වැඩෙන දිශාව, පත්‍ර හටගන්නා ආකාරය, එක් එක් කොටසේ පාට වෙනස් වන ආකාරය ආදිය නිරීක්ෂණය කරවන්න. නිරීක්ෂණය කරන ලද දේ වාචිකව හා ලිඛිතව වාර්තා කිරීමට සලස්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 4

✠ හිස් මල් පෝච්චියක් ගෙන එහි පතුළේ ඇති සිදුරු ජලය හොඳින් බැස යන ආකාරයට ශුද්ධ කර ගන්න. එහි පතුළේ කුඩා උළු හෝ ගඩොල් කැබලි හෝ කිහිපයක් අතුරන්න. ඒ මත පස් හා දිරාපත් වූ කොම්පෝස්ට් මිශ්‍රණයක් අතුරන්න. මෙම මිශ්‍රණය තුළ සෙන්ටිමීටර 6 - 8ක් පමණ දිගට කපා ගත් ඉක්මනින් පැළවෙන කෝලියා/කංකුං අතු කැබලි 5 - 6ක් සිටුවන්න. පස් මිශ්‍රණය ජලයෙන් තෙත් කොට තද හිරු එළිය නොවැටෙන සෙවන සහිත ස්ථානයක තැන්පත් කරන්න. මිශ්‍රණය වියළෙන්නට ඉඩ නොදිය යුතු ය.



- සෑම සතියකට ම වරක් සිටුවන ලද අතු කැබැල්ලක් අනෙක් අතු නොසෙල්වෙන පරිදි ප්‍රවේශමෙන් ගලවන්න. මෙමගින්, සතියෙන් සතිය ඒවායේ මුල් වර්ධනය වන ආකාරය සිසුන් ලවා නිරීක්ෂණය කරවන්න. රූප සටහන් අඳින්නට සලස්වන්න.
- බීජ පැළවෙන විටත්, අතු පැළවෙන විටත් දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ ව සාකච්ඡා කරන්න. බීජ අතු පැළවෙන ආකාර ගායන සමඟ රංගන දෙබස් සහිත රංගන මඟින් ද ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 5

✠ තවාන් දැමීම ද තවත් ක්‍රමයකි. පහසුකම් තිබෙන පරිදි තවාන්, භාජනයක හෝ බිමක හෝ සකස් කර ගත හැකි ය. මෙහි හොඳින් ජලය බැස යා යුතු වේ. හිරු එළිය ලැබිය යුතු ය. තවාන් සඳහා මතුපිට පස්, වැලි හා හොඳින් දිරාපත් වූ කාබනික පොහොර සමාන ප්‍රමාණවලින් ගෙන මිශ්‍ර කර ගත යුතු වේ.

- සකස් කළ ගෙවතු කොටස මනාව පවත්වා ගෙනයාමට ක්‍රමයක් සකස් කර දෙන්න. මෙහි දී වැට (ආරක්ෂාව), ජලය හා පොහොර සැපයීම, වල් පැළෑටි ඉවත් කිරීම හා සතුන්ගෙන් වන හානි වැළැක්වීම ආදිය දිගට ම කරගෙන යාම කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවිය යුතු වේ.
- මනාව පවත්වා ගෙන යන ගෙවත්තකින් නිවසට/පාසලට ඉටු වන සේවාවන් අගය කිරීමට සලස්වන්න. අලංකාරය ලැබීම, ආරක්ෂාව ලැබීම, සෙවන හා සිසිල ලැබීම, මල්, ආහාර පාන හා ඖෂධ ලබා ගැනීමට හැකිවීම, වාතය පිරිසිදුවීම, පරිසරයේ දුම් හා දූවිලි අඩුවීම, ශබ්දය අඩුවීම ආදිය උදාහරණ වේ.

ක්‍රියාකාරකම 6

✠ පාසලෙහි හෝ පාසලට ආසන්න ව පිහිටා තිබෙන ගෙවත්තක් සිසුන්ට නැරඹීමට අවස්ථාව සලස්වන්න. පාසලින් බාහිර ව යාමට සිදු වේ නම් කලින් දැනුවත් කිරීම අවශ්‍ය වේ. සිසුනට නැරඹීමට සුදුසු ස්ථානයක් ද විය යුතුයි. ගෙවත්තෙහි දක්නට ලැබෙන ශාක වර්ග සොයා බැලීමට යොමු කරන්න. ඒවායේ නම් ලැයිස්තු ගත කරන්න.

- කිසියම් ක්‍රමයකට එම ශාක වර්ග කිරීමට යොමු කරන්න.

උදාහරණ :- එළවළු, පලතුරු, පළා
ආහාර පැළෑටි, විසිතුරු පැළෑටි

ඒ ඇසුරෙන් ගෙවත්තකට අවශ්‍ය ශාක හා පැළෑටි කිහිපයක් ගැන කතා බහ කරන්න.

උදාහරණ :- පහසුවෙන් වගා කළ හැකි ධාන්‍ය, එළවළු, අල වර්ග හා පලතුරු
ව්‍යංජන රසවත් කිරීමට යොදන ශාක වර්ග
නිතර අවශ්‍ය වන ඖෂධ පැළෑටි කිහිපයක්
අලංකාරයට වවන මල් හා පැළෑටි

ක්‍රියාකාරකම 7

- ගෙවත්තක බෝග වර්ගවලින් අපට ලැබෙන ප්‍රයෝජන කතා බහ කරන්න. ප්‍රයෝජන කිහිපයක් අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට යොමු කරන්න.

උදාහරණ :- 1. අලුත් එළවළු ලබා ගත හැකි බව
2. වියදමක් නොමැති ව අවශ්‍ය දේ වෙලාවට ලබා ගත හැකි බව
3. විෂ සහිත රසායන ද්‍රව්‍යවලින් තොර බව

✠ ගෙවත්තක බෝග පිළිබඳ ව හෝ ගෙවතු වගාවේ වැදගත්කම කියවෙන කවි/ගී හෝ ගායනා කිරීමට අවස්ථාව සලස්වන්න. එම ගායනාවලට උචිත රංගන කණ්ඩායම් වශයෙන් මෙන් ම සාමූහික වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

උදාහරණ :

එළවළු අම්මා අපේ ගෙදර එන්නා
අපට කන්න හොඳ හොඳ දේ අරගෙන එන්නා
කැරට් බීට් බණ්ඩක්කා
ගෝවා බෝංචි වට්ටක්කා
ගහල බතල මඤ්ඤොක්කා
ගෙන එනවා මා දැක්කා
ජම්බු දොඩම් අන්නාසි
පේර දිවුල් ගෙඩි රාසි
කෑමට හොඳ රස ජාති
විකිණීමෙන් හරි වාසි

✠ දුටු ගෙවත්ත චිත්‍රයට නැගීමට හෝ කොලාජ් මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න. ඒවා පන්තියේ ප්‍රදර්ශනය කරමින් අගය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.10 වැඩ පහසු කිරීමේ මං

පිළිවෙළට හා ක්‍රමවත් ව වැඩ කිරීම තුළින් අපේ එදිනෙදා කාර්යයන් පහසු කර ගත හැකි ය. එමෙන් ම සාමූහික ව කටයුතු කිරීම වඩාත් ප්‍රතිඵල දායක ය. වැඩ පහසු කර ගැනීම සඳහා අතීතයේ මිනිසුන් විවිධ සරල ක්‍රම භාවිත කළ අතර වර්තමානයේ බොහෝ විට ඒ සඳහා නවීන ක්‍රම භාවිත කෙරේ. මේවා පිළිබඳ ව ගවේෂණාත්මක ව තොරතුරු හා අත්දැකීම් එකතු කිරීමටත්, විවිධ අයුරින් ඒවා වාර්තා කිරීමටත් මෙම තේමාව තුළින් සිසුන්ට අවස්ථාව සලසා ඇත.

නිපුණතා

- ★ පිළිවෙළට හා ක්‍රමවත් ව වැඩ කරමින් එදිනෙදා කරන වැඩ කටයුතු පහසුවෙන් හා ඉක්මනින් කර ගැනීම සඳහා අවබෝධයෙන් යුතු ව ක්‍රියා කරයි.
- ★ එක්ව කටයුතු කිරීමෙන් වැඩ පහසු වන බව අවබෝධ කරගෙන ක්‍රියා කරයි.
- ★ විවිධ සරල යන්ත්‍ර හා ක්‍රම ශිල්ප භාවිත කරමින් එදිනෙදා වැඩ පහසු කර ගනියි.
- ★ වැඩ පහසු කර ගැනීමට වර්තමානයේ මෙන් ම අතීතයේ ද යොදා ගත් ක්‍රම ශිල්ප ගවේෂණය කර වාර්තා කරයි.
- ★ වැඩ පහසු කර ගැනීමට යොදා ගන්නා සරල උපකරණවල ආකෘති විවිධ මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කරයි.
- ★ වැඩ පහසු කිරීම සඳහා යොදා ගන්නා උපකරණවලින් කෙරෙන කාර්යයන් නිරූපණය කෙරෙන ගායන/රංගනවල නිරත වෙයි.
- ★ සහයෝගී ක්‍රීඩාවල වින්දනාත්මක ව නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ එදිනෙදා වැඩ පහසු කර ගැනීමට සතුන් යොදා ගන්නා අවස්ථා පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න.

- සතුන් යොදා ගත් එවැනි අවස්ථා ඇතුළත් පින්තූර කණ්ඩායම් ලෙස එක් වී නිරීක්ෂණය කිරීමට හා ඒ පිළිබඳ කතා බහ කිරීමට ද සලස්වන්න. හැකි නම් පාසල සමීපයේ පිහිටා ඇති එවැනි එක් ස්ථානයක් නිරීක්ෂණය කරවන්න.

  උදාහරණ :- කුඹුරු වැඩට ගවයින් යොදා ගැනීම, ගවයින් අඳින කරත්ත, අශ්වයින් පිට යාම, කොටන් ඇදීමට අලි ඇතුන් යොදා ගැනීම ... ආදී වශයෙන්
- ඈත අතීතයේ මිනිසුන් වැඩ පහසු කිරීමට සතුන් යොදා ගත් අවස්ථා පිළිබඳ තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මෙහි දී, එදා වී ගොවිතැනට, ගමන් බිමන් යාමට, බර ඇදීමට බහුලව ම සතුන් යොදා ගත් බව හා ඒ ඇසුරින් වැඩ පහසු කර ගත් බව වැනි කරුණු මතු කරන්න.

  එපමණක් නොව යුද බිමේ සටන්වලට පවා අතීතයේ දී අශ්වයන්, ඇතුන් යොදා ගත් අවස්ථා මතක් කරන්න. සතුන් පණිවිඩ හුවමාරුවට ද යොදා ගෙන ඇති බව පෙන්වා දෙන්න.
- ඇතැම් ප්‍රදේශවල අතීතයේ සමහර කර්මාන්තවලටත් සතුන් යොදා ගෙන වැඩ පහසු කර ගත් බව පවසන්න.

  උදාහරණ :- තෙල් සිඳීම සඳහා සෙක්කුව යොදා ගැනීම
- අතීතයේ වැඩ පහසු කර ගැනීමේ දී සතුන් යොදා ගත් අවස්ථා නිරූපණය කරන රංගන, ගායන ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න. මේ අවස්ථාවල දී ඔබේ උදවු සිසුන්ට ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 2

✠ වැඩ පහසු කර ගැනීමට අප එදිනෙදා භාවිත කරන විවිධ උපකරණ පිළිබඳ ව කතා බහ කරන්න.

- වැඩිහිටියන් මෙන් ම සිසුන් වන අපටත් වැඩ පහසු කර ගැනීමේ දී වඩාත් ප්‍රයෝජනවත් වන එමෙන් ම බහුල ව භාවිත කරන උපකරණ කීපයක් පන්තියට ගෙන්වා ගන්න. ඒවා පිළිබඳ ව කතා බහ කරන්න. එවැනි උපකරණ යොදා ගෙන කරන කාර්යයන් කතා බහ කරන්න.
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න. එක් කණ්ඩායමකට එක් උපකරණයක් (ඉස්කුරුප්පු නියන, මිටිය, අඬුව ආදී) ඉදිරිපත් කර තම කණ්ඩායමේ ඇති උපකරණය නිරීක්ෂණය කිරීමට සහ ක්‍රියාකාරකම් සඳහා භාවිත කිරීමට යොමු කරන්න.

මිටිය භාවිතයේ දී

පන්තියේ සිසුන් ගෙනවිත් ඇති මිටිවල ස්වභාවය නිරීක්ෂණයට යොමු කරවන්න. මේ අනුව විවිධ වර්ගයේ මිටි ඇති බව පෙන්වා දෙන්න. මේ එක් එක් මිටියේ සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

උදාහරණ :- අඬු මිටිය : ඇණ ගැසීමට මෙන් ම ඇණ ගැලවීමට ද භාවිත කරයි.
ගල් මිටිය : කලුගල් කැඩීමට භාවිත කරයි.

අනතුරු ව වැඩවලට භාවිත කරන වඩු මේසයේ සාමාන්‍ය මිටියක් පෙන්වන්න. එය නිර්මාණය වී ඇති අයුරු නිරීක්ෂණය කිරීමට සලස්වන්න.



මිටියේ හැඩය නිර්මාණ වී ඇත්තේ කෙසේ දැ යි නිරීක්ෂණය කිරීමට සලස්වා එම හැඩය වැඩ පහසු කිරීමට හේතු වන ආකාරය පිළිබඳ ව කතා බහ කරන්න.

මිටිය ආශ්‍රිත ව කුසලතා ලබා දීම සඳහා වඩා තද නැති මොලොක් ලීයකට නිදහසේ ඇණයක් ගැසීමට එක් එක් සිසුවාට ඉඩ දෙන්න. ඇණය හා මිටිය අල්ලන නිවැරදි ආකාරය පෙන්වන්න.


මිටියේ මිට අල්ලන ආකාරය අනුව ඇණය පහසුවෙන් ලීයට වදින බව ක්‍රියාවෙන් ම අවබෝධ වීමට ඉඩ හරින්න.

තද ලීයකට ඇණයක් ගැසීමට යොමු කරන්න. ඇණයේ ඉහට සමීප ව සෙමින් තට්ටු කරන්න. ඇණය ඇද වී ඇත්නම් අතින් ඇණය කෙලින් කර දෙවෙනි වර මිටිය ඉහළට ඔසවා තදින් තට්ටු කරන්න. මෙසේ ඇණය අවශ්‍ය ප්‍රමාණයට ලීයට වද්දන තුරු මිටියෙන් ඇණයට ගසන්න. එසේ අවශ්‍ය කුසලතා ලබා දීමට උනන්දු කරවන්න.

ඇණයක් මිටිය ඇසුරෙන් ගලවා ගැනීම සඳහා ගත යුතු පියවර සඳහා අවශ්‍ය කුසලතා ලබා ගැනීමට ද සිසුවාට උදවු කරන්න. ඒ සඳහා අවශ්‍ය උපදෙස් නව දුරටත් ලබා දෙන්න.


Copyright © 2007 National Institute of Education - Sri Lanka.

අඬුව හ



පළමු ව අඬුව නිරීක්ෂණය කිරීමට සලස්වා දෙවනු ව අඬුවේ සැලැස්ම වැඩ පහසුවට හේතු වන ආකාරය තේරුම් ගැනීමට යොමු කරන්න. පසුව එය ප්‍රායෝගික ව භාවිතයට අවස්ථාව සපයා දෙන්න. අඬු වර්ග කිහිපයක් ඇති බව පෙන්වා දෙන්න. එක් එක් අඬුවෙන් ඉටු කර ගන්නා කාර්යයන් පැහැදිලි කරන්න.
අඬුව මගින් යමක් දැඩි ව අල්ලා ගැනීම. කම්බි වැනි දේවල් කපා ගැනීමට හැකි බව ක්‍රියාවෙන් ම හඳුනා ගැනීමට සලස්වන්න.
අඬුවේ ඒ ඒ කොටස් සැකසී ඇත්තේ විවිධ කාර්යයන් කිරීමට බව පෙන්වා දී එවැනි අවස්ථා ඉදිරිපත් කර අඬුවෙන් කළ හැකි විවිධ දේ හඳුනා ගැනීමට උනන්දු කරවන්න.

ඉස්කුරුප්පු නියන භාවිතයේ දී
ඉස්කුරුප්පු නියන් වර්ග ද කිහිපයක් ඇති බව පෙන්වා දෙන්න. මේවා එකිනෙකෙහි වෙනස්කම් අධ්‍යයනය කිරීමට සලස්වන්න.




සාමාන්‍ය ඉස්කුරුප්පු නියන, මල් ඉස්කුරුප්පු නියන, පරීක්ෂකය (ටෙස්ටරය) මේවායින් වැඩ ගන්නා ආකාරය සිසුන්ට පැහැදිලි කරන්න. සාමාන්‍ය ඉස්කුරුප්පු නියනෙන් සාමාන්‍ය ඉස්කුරුප්පු ඇණ ද, මල් ඉස්කුරුප්පු නියනෙන් හතරට බෙදුනු කානු සහිත ඉස්කුරුප්පු ඇණ ද සවි කරන බවත්, ගලවන බවත් පෙන්වා දෙන්න. යම් ස්ථානයක විදුලිය තිබේ ද යන්න පරීක්ෂා කිරීමට පරීක්ෂකය (ටෙස්ටරය) භාවිත කළ හැකි බව ද පහදන්න.


ක්‍රියාකාරකම 3

✠ පන්ති කාමරයේ හා පාසලේ සිසුන් හා ගුරුවරුන් වැඩ පහසු කර ගැනීම සඳහා භාවිත කරන යන්ත්‍ර උපකරණ සොයා බැලීමට කණ්ඩායම්වලට පවරන්න.


උදාහරණ :-

| යන්ත්‍රය/උපකරණය | සිදු කරන කාර්යය |
|---|---|
| පැන්සල් උල් කරණය | පැන්සල් උල් කිරීම |
| ස්ටෙප්ලර් මැෂිම | කටු ගැසීම |
| සිදුරු විදිනය (පන්චරය) | කඩදාසි කොළවල සිදුරු විදීම |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.



සිදුරු විදිනය (පන්චරය)



ස්ටෙප්ලර් මැෂිම

- එක් එක් කණ්ඩායම් නිරීක්ෂණය කරන ලද දේ පිළිබඳ සාකච්ඡා කරමින් කළුලැල්ලේ පොදු වගු සටහනක් ගොඩ නගන්න. එය සිසුන්ගේ පොත්වල සටහන් කර ගැනීමට යොමු කරන්න. සටහනේ ඇති යන්ත්‍ර/උපකරණ අතරින් කීපයක් ක්‍රියාකරන ආකාරය නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.

  උදාහරණ :- පැන්සල් උල්කරණය

  ක්‍රමයෙන් පැන්සල් තුඩ මතුවන ආකාරය ඇති වන සේ කැපෙන විට ලී ආවරණය කැපී ඉවත් වන ආකාරය නිරීක්ෂණය කරන්න. මෙම උපකරණය සකස් කර ඇති ආකාරය, තලය සවි කර ඇති ආකාරය හා එහි හැඩය නිරීක්ෂණය කරන්න. කැපීයන කොටස් නිරීක්ෂණය කරන්න. මේ තැන්වලින් ඉවත් ව යන කොටස්වලින් වෙනත් නිර්මාණයක් කළ හැකි ද? එසේ නම් එවැන්නක් නිර්මාණය කිරීමට කණ්ඩායම උනන්දු කරවන්න.

- මේ ආකාරයෙන් පාසලේ ඇති විවිධ සරල යන්ත්‍ර /උපකරණ කීපයක් නිරීක්ෂණය කිරීමට සිසු කණ්ඩායම්වලට පවරන්න. එහි ක්‍රියාකාරිත්වය සොයා බැලීමට ද යොමු කරවන්න. යන්ත්‍රයේ එක් එක් කොටසකින් සිදු වන දේ නිරීක්ෂණය කරවන්න. එසේ ම ඊට යොදා ගන්නා අමු ද්‍රව්‍යවලින් ඉවත් කෙරෙන දේ ඇසුරෙන් නිර්මාණ කිරීමට ද යොමු කරන්න.
- තම නිවසේ ඇති වැඩ පහසු කර ගැනීමට යොදා ගන්නා සරල යන්ත්‍රෝපකරණවල ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීමට පැවරුමක් දෙන්න. ඒ පිළිබඳ ව පන්තියේ සාකච්ඡා කරන්න.

  උදාහරණ :- රෙදි මහන මැෂිම ක්‍රියාකරන ආකාරය ....

✠ පාසලේ, නිවසේ හා විවිධ ස්ථානවල බහුල ව දක්නට ඇති වැඩ පහසු කිරීමේ යන්ත්‍රයක් තෝරා ගන්න. තෝරා ගත් යන්ත්‍රය කුඩා එකක් නම් පන්ති කාමරයට ගෙන ඒම හෝ එසේ නැතිනම් යන්ත්‍රය ඇති ස්ථානයට සිසුන් කැඳවා ගෙන ගොස් හෝ නිරීක්ෂණය කිරීමටත්, යන්ත්‍රය ක්‍රියාකරන ආකාරය සොයා බැලීමටත් සලස්වන්න. වැඩ පහසු කිරීමට යන්ත්‍රයේ ඇති කොටස්වලින් කෙරෙන කාර්යය පිළිබඳ ව කතා බහ කරන්න.

- පරිසරයෙන් සපයා ගත් කාඩ්බෝඩ්, මූඩි, කම්බි වැනි දෑ යොදා ගෙන වැඩ පහසු කර ගැනීමට භාවිත කරන යන්ත්‍රෝපකරණවල ආකෘති තැනීමට සිසුන් යොමු කරන්න.

  උදාහරණ :- ට්‍රැක්ටරය, විල්බැරෝව, දොඹකරය (ක්‍රේන්) ගල්රෝල ... ආදී

✠ සහයෝගී ක්‍රීඩාවල නිරත වීම සඳහා සිසුන්ට අවස්ථා සලසන්න.

- බ්‍රිස්ටල් බෝඩ් කිහිපයක් ගෙන විවිධ හැඩ (පලතුරු, සත්තු, එළවළු, විවිධ හැඩ තල ... වැනි) තරමක් විශාල ලෙස සකස් කර ගන්න. මේවා ක්‍රීඩාව සඳහා සිසුනට ප්‍රමාණවත් තරම් සකස් කර ගැනීම අවශ්‍ය ය.
- එම එක් එක් රූපයක් නැවත කොටස් කිහිපයකට වෙන් කරන්න. මේ ආකාරයෙන් අනෙක් රූප ද කොටස් කර ගන්න.
- සිසුන් එළිමහනට රැගෙන යන්න. සිසු සංඛ්‍යාව අනුව කණ්ඩායම් තුනකට බෙදන්න.
- කපා වෙන් කර ගත් විවිධ හැඩ මිශ්‍ර කර සියලු ම කණ්ඩායමවලට සමාන කැබලි ප්‍රමාණය බැගින් බෙදා දෙන්න.
- තරගය ආරම්භ කිරීමෙන් පසු කතා කිරීමෙන් වැළකිය යුතු ය.
- ඉඟි හා ඉරියව් මඟින් අදහස් ප්‍රකාශ කළ හැකි ය.
- තම කණ්ඩායමට ලැබුණු කොටස්වලට අනුව අදාළ රූප ගොඩ නැංවීමට උනන්දු විය යුතු ය.
- රූපය ගොඩ නැංවීමට තමාට අවශ්‍ය කොටස් අන් කණ්ඩායම්වලින් ද ලබා ගත හැකි ය.
- මේ ආකාරයෙන් තමාගේ කණ්ඩායමේ සියලු ම රූප ගොඩ නැංවීමට සිසුන් යොමු කරන්න. ඉක්මණින් අවසන් කළ කණ්ඩායමට ජය හිමි වේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.11 මිනිස් හැසිරීම්

වඩාත් යහපත් සමාජයක් සඳහා මානව ගරුත්වය හා අන්‍යෝන්‍ය සංවේදී භාවය වැදගත් වේ. එකිනෙකාට ගෞරවයෙන් සලකන අනෙක් අයට සවන් දෙන පුද්ගලයන් බහුල සමාජයක් පරිණත සාමකාමී සමාජයක් ම වේ. මෙම තේමාවේ දී තමා පිළිබඳ ව මෙන් ම අනුන් පිළිබඳ ව සංවේදීව කටයුතු කිරීමට යොමු කරනුයේ අනාගතයේ දී පරිණත සාමකාමී පුද්ගලයකු වීමට අවශ්‍ය නිපුණතාවන්හි පදනමක් ඇති කිරීම සඳහා ය.

නිපුණතා

★ තමා පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.
★ අන් අය පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.
★ අන් අය සමඟ ප්‍රියජනක ලෙස කතා බහ කරයි.
★ කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් ක්‍රීඩාවල නිරත වෙයි.
★ ගුණ යහපත්කම ගැන කියවෙන කවි, ගී ගායනා කරමින් එවැනි ගුණ යහපත්කම් තමා තුළ තිබේ දැයි විමසා බලයි.
★ ගුණ යහපත්කම් ප්‍රදර්ශනය කෙරෙන රංගනවල නිරත වෙයි.
★ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් යහපත් පැතුම් ඇතුළත් විවිධ නිර්මාණ කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ තමා කැමති දේ හා අකමැති දේ පිළිබඳ ව සිතා බැලීමට සිසුන්ට අවස්ථාව දෙන්න. අනෙක් අය තමා සමඟ කතා බහ කරන විට සහ හැසිරෙන විට සිදුවන දේ ගැන සිතීමට සිසුන් යොමු කරන්න. ඒවායින් තමා කැමති දේ සහ අකමැති දේ මොනවා දැයි සිතා බැලීමට යොමු කරන්න.

- එකිනෙකාට මුහුණලා යුගළ වශයෙන් ඉඳ ගැනීමට සලස්වන්න. තමා කැමති දේවල් සහ අකමැති දේවල් තමා ඉදිරියේ ඉඳ ගෙන සිටින තම මිතුරාට/මිතුරියට කීමට සිසුන් යොමු කරන්න. සිසුන්ට සිය සිතිවිලි නිදහසේ ප්‍රකාශ කිරීමට සහාය වන්න.

  උදාහරණ :-මම කැමතියි මට ..... කියා කතා කරනවාට
  (නමේ තමා කැමති ම කොටස කියයි)
  මම අකමැතියි පොතක් කියවන විට මට කතා කරනවාට.

- එක් අදහසක් පමණක් කියා නිහඬ වන සිසුන් වෙත අවධානය යොමු කරන්න. ඔවුන්ගේ සිතෙහි ඇති, කියා ගැනීමට අපහසු අදහස් ප්‍රකාශ කිරීමට සහාය වන්න. ඒවා පිළිබඳ ව හොඳින් සවන් දීමට මුහුණ ලා ඉඳ ගෙන සිටින සිසුවා යොමු කරන්න. කැමති නම් ලියා ගැනීමට වුව ද අවස්ථාව දෙන්න.

ක්‍රියාකාරකම 2

✠ තමා ඉදිරියෙන් වාඩි වී සිටි මිතුරා/මිතුරිය කැමති දේවල් හා අකමැති දේවල් පිළිබඳ ව මතකයේ තබා ගත් හෝ ලියා ගත් දේ හෝ පන්තියේ අනෙක් අයට ඇසෙන සේ ප්‍රකාශ කිරීමට හැමට ම අවස්ථාව දෙන්න. එම අදහස් එකිනෙකාට හොඳින් සවන් දීමට සලස්වා අන් අය කැමති දේවල් සහ අකමැති දේවල්වලට හොඳින් සංවේදී වීමේ වැදගත්කම අවස්ථානුකූල ව අවධාරණය කරන්න.

  උදාහරණ :-මගේ යහළුවා ප්‍රියනාත් කැමතියි එයාගේ නමේ අසංක කියන කොටසට. එයාට අසංක කියා කතා කරනවාට එයා කැමතියි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- මෙවැනි අවස්ථා උපයෝගී කර ගනිමින් අන් අයට සංවේදී ව අපට කළ හැකි දේ මතු කරන්න. ප්‍රියනාත් ඔහු වඩත් කැමති අසංක නමින් ඇමතීම අප හැමගේ ම යුතුකමක් බව අවධාරණය කරන්න. මේ ආකාරයට අකැමති දේවල් ප්‍රකාශ වූ විට ඒවා නොකීමත් නොකිරීමත් අපේ යුතුකමක් බව අවස්ථානුකූල ව අවධාරණය කරන්න. එය අන් අයට සංවේදී ව කටයුතු කරන අයකුගේ යහපත් ගුණාංගයක් බව පෙන්වා දෙන්න.
- මේ ක්‍රියාකාරකම කර ගෙන යන අතර අප කැමති දේ හා අප අකමැති දේ යනුවෙන් පොදු ලැයිස්තුවක් කළුලැල්ලේ ගොඩනගන්න.

  උදාහරණ :

| අප කැමති දේ | අප අකමැති දේ |
|---|---|
| කැමති නමින් අපට කතා කරනවාට | සැරෙන් කතා කරනවාට |

  මෙම සටහන පිටපත් කර ළඟ තබා ගන්න.
- සතියකට එක බැගින් මේවා ප්‍රදර්ශනය කරන්න. එක් එක් සතිය තුළ ප්‍රදර්ශනය කෙරෙන දේ අනුව අන් අයට සංවේදී වෙමින් කැමති දෑ කිරීමටත් අකමැති දෑ නොකිරීමටත් සිසුන් යොමු කරන්න. එක් එක් සතිය අවසානයේ සතියේ හැසිරීම් ගැන සිසුන් සමඟ කතා බහක යෙදෙන්න. ප්‍රියමනාප ලෙස කතා බහ කරමින් සිසුන්ගේ යහපත් භාවිත අගය කරන්න. දොස් පැවරීමකින් හෝ රළු වදන් හෝ භාවිතයකින් තොරව අනුමත කළ නොහැකි හැසිරීම් අධෛර්යමත් කරන්න. එහෙත් දරුවන්ට පෞද්ගලික ව සිත් රිදීමක් ඇති නොවන ලෙස වරද පෙන්වා දීම පිළිබඳ ව සැලකිලිමත් වන්න.

ක්‍රියාකාරකම 3

✠ තනිව ජය ගත නොහැකි එහෙත් කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් තරග කර ජය ගත යුතු ක්‍රීඩා සඳහා සිසුන් යොමු කරන්න.

උදාහරණ 1:-

එළිමහනට ගොස් පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව සමාන කණ්ඩායම් කිහිපයකට බෙදන්න. (කණ්ඩායමකට අටක් පමණ) සෑම කණ්ඩායමකට ම හැකි තරම් දිග සරල රේඛාවක් සෑදීමට යොමු කරන්න. තමාගේ අවයව හා ඇඳුම්වල කොටස් පමණක් උපයෝගී කර ගෙන දිග ම රේඛාව සැදිය යුතු ය.

දිගම රේඛාව සෑදීම පිළිබඳ ව නිර්මාණශීලී ව සිතා බැලීමට අවස්ථාව දෙන්න. සිය අවයව හා ඇඳුම්වල කොටස් උපයෝගී කර ගෙන එකිනෙකා සහ සම්බන්ධ වී දිග ම රේඛාව නිර්මාණය කරන කණ්ඩායම ජය ලබා දී අනෙක් අයට ද සහභාගී වීම පිළිබඳ අත්පොළසන් දීමට යොමු කරන්න. දිග ම සරල රේඛාව සෑදීම සඳහා කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියා කළ යුතු අන්දම අවධාරණය කරන්න.

උදාහරණ 2 :-

සිසුන් අට දෙනා පමණ වන සේ පන්තිය කණ්ඩායම්වලට බෙදන්න. කණ්ඩායමේ සෑම දෙනා ම ක්‍රියාකාරී වන ක්‍රීඩාවක් නිර්මාණය කර සිසුන් එයට යොමු කරන්න. වඩා සහයෝගයෙන් සැවොම ක්‍රියාශීලී ව සහභාගී වී ජය ගන්නා කණ්ඩායම අගය කරමින් සහයෝගී බවේ අගය අවධාරණය කරන්න. අනිකුත් කණ්ඩායම්වල සහභාගිත්වය ද අගය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 4

✠ මෙම තේමාව ආරම්භ කිරීමට පෙර සිසුනට සුදුසු ගුණ යහපත්කම් ගැන කියවෙන කවි ගී රැස් කරන්න. ඒ සඳහා සිරිත් මල් දම වැනි අපේ පැරණි කෘති මෙන් ම නූතන කවි ළමා ගී ආදිය උපයෝගී කර ගත හැකි ය.
එසේ රැස් කර ගත් කවි ගී සිසුන් සමඟ මිහිරි ලෙස ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :- සිරිමත් මගෙ සකි උදය ම නැගිටී යි
යහපත් ළමයෙකි ගේ දොර අමදි යි
වැඩටත් සමතෙකි මුහුණට දිය දී
නුවණත් ඇත්තෙකි කුල දෙවි නම දී

මෙවැනි කවි ගී ගැයූ පසු එම කවි ගීවලින් කියැවෙන ගුණ යහපත්කම් පිළිබඳ අවධාරණය කරමින් සිසුන් සමඟ කතා බහක නිරත වන්න.
සිසුන්ට දෑස් වසා ගෙන නිහඬ ව සවන් දීමට කියා ඒ එකිනෙක ගුණ අවධාරණය වන සේ සිසුන්ගෙන් ප්‍රශ්න අසන්න. ඒවාට පිළිතුරු තනි තනි ව සිතා බැලීමට යොමු කරන්න.
උදාහරණ :-
ඔබ උදෙන් ම නැගිටිනවා ද?
ඔබ ගේ දොර අමදිනවා ද?
ඒ ඒ ප්‍රශ්නයට පිළිතුරු සිතා බැලීමට නිහඬ පරිසරයක් තුළ ප්‍රමාණවත් කාලයක් දෙන්න. දෑස් විවෘත කරන්නට යොමු කර තමා තුළ ඇති ගුණ යහපත්කම් ගැන සතුටු වීමට ඉඩ දෙන්න. තමා තුළ නැති ගුණ යහපත්කම් හඳුනා ගැනීමට සහ ඒවා ඇති කර ගැනීමට සිසුන් දිරිමත් කරන්න.

ක්‍රියාකාරකම 5

✠ සිසුන් පන්තියේ වාඩි වී සිටින කණ්ඩායම් අනුව භූමිකා රංගනයක් බැගින් පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න. ඒ සඳහා මෙම තේමාව තුළ මෙතෙක් අවධාරණය කළ යහපත් හැසිරීම් මෙන් ම සිසුන්ට සුදුසු වෙනත් හැසිරීම් ද මතු කළ හැකියි. එවැනි හැසිරීම් මතු කෙරෙන ලෙස රංගනවල නිරත වීමට සිසු කණ්ඩායම්වලට මග පෙන්වන්න. රංගනය සැලසුම් කර ගැනීම සඳහා ප්‍රමාණවත් කාලයක් දෙන්න. ඒ පිළිබඳ සිසුන්ට පැන නැගෙන ගැටලු විසඳීමට සහාය වෙමින් කණ්ඩායමේ සියලු දෙනාගේ ම සහභාගිත්වයෙන් රංගනය ඉදිරිපත් කිරීමට මග පෙන්වන්න.

- එළිමහනක හෝ සුදුසු නිදහස් ස්ථානයක හෝ රංගන ඉදිරිපත් කිරීමට අවස්ථා සලසන්න. එක් එක් රංගනය අවසානයේ දී එමඟින් අවධාරණය වූ යහපත් හැසිරීම් මතු කර දක්වන්න. සෑම කණ්ඩායමකට ම අනෙක් අයගේ අත් පොළසන් ලබා දී දිරිමත් කරන්න. අවසානයේ පන්තියේ රංගනවලින් ඉදිරිපත් වූ යහපත් හැසිරීම් පෙළගස්වා සිසුන් සමඟ කතා බහක යෙදෙන්න.

ක්‍රියාකාරකම 6

✠ ප්‍රියජනක ලෙස කතා බහ කිරීමේ වැදගත්කම දැක්වෙන කතන්දර සිසුන්ට ඉදිරිපත් කරන්න. අවධානයෙන් යුතු ව මෙම කතන්දරවලට සවන් දීමට යොමු කරන්න.

උදාහරණ:- කරත්තයකට බඳින ගොනෙක් තම ස්වාමියාට ඉතාමත් ම ආදරයෙන් හිටියා. කරත්තය කොතරම් බර වුවත් එය අදින්නට මේ ගොනා පසුබට වුණේ නැහැ. දවසක් ස්වාමියා කරත්තයට බඩු පැටෙව්වා බර ටිකක් වැඩියි. අමාරුවෙන් අදින්න පටන් ගත්තා විට ම ස්වාමියා අමිහිරි වචනවලින් සැරෙන් කතා කර කරත්තය දක්කන්නට උත්සාහ කළා. ගොනා සෙළවුණේවත් නැහැ. කිසිදාක සිදු නොවූ මේ සිද්ධිය ගැන ස්වාමියා කල්පනා කළා. තමන් ගොනාට අණ කළ විදිය ගැන සිහිවුණා. ස්වාමියා ගොනාගේ හිස අත ගා කරුණාවෙන් කතා කර කරත්තය දැක්කුවා. එවිට ගොනා බර පටවා තිබූ කරත්තය ඇද්දා.

- සවන් දෙන ලද කතාවේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැගීමට සිසුන් යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- තමා අඳින ලද චිත්‍රය ගැන කතා කිරීමට සිසුන්ට අවස්ථා දෙන්න.
- සිසුන් සමඟ කතා බහ ඇසුරෙන් සතුන් පවා ප්‍රියජනක ලෙස කතා බහ කරනු ඇසීමට කැමති වන බව අවධාරණය කරන්න.

ක්‍රියාකාරකම 7

✠ එදිනෙදා කටයුතුවල දී ප්‍රියජනක ලෙස කතා බහ කිරීම අවධාරණය වන පරිදි භූමිකා රංගන කිහිපයක යෙදීමට සිසුන් යුගළ කිහිපයකට මග පෙන්වන්න. එළිමහනක දී භූමිකා රංගන සඳහා අවස්ථාව දෙන්න.

උදාහරණ :- උදෑසන එකිනෙකා හමු වූ විට
පන්තියට ඇතුළු වන විට
පාසල ඇරී සමු ගන්නා විට
තමාට උදවුවක් අවශ්‍ය වූ විට
අන් අයකුට උදවු කළ විට
යහළුවකුට/යෙහෙළියකට දුකක් කරදරයක් වූ අවස්ථාවක දී
ගෙදරට අමුත්තකු පැමිණි විට

- මෙසේ ප්‍රියජනක ලෙස එකිනෙකා සමඟ කතා බහ කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් සාකච්ඡාවක යෙදෙන්න.
මම පාසලේ දී ද ගෙදර දී ද හොඳ වචන කතා කරමි. අනුන්ගේ සිත් සතුටු වන විදියට කතා බහ කරමි. යනුවෙන් ලෑල්ලේ ලියන්න.
- නැගිට දකුණු අත ඉදිරියට දිගු කර එම වැකි තුන් වරක් කියවමින් ප්‍රතිඥාවක් දීමට අවස්ථාව සලසන්න.
- කලින් සූදානම් කර තිබූ
  අපි හොඳ වචන කතා කරමු
  අනුන්ගේ සිත් සතුටු වන ලෙස කතා කරමු
වැනි පුවරු පන්තියේ ප්‍රදර්ශනය වීම සඳහා සවි කරන්න.
- ගුරුවරයා ලෙස ඔබ ප්‍රියජනක කතා බහ පිළිබඳ භූමිකා දර්ශකයක් වන්න. පන්ති පරිසරයේ ප්‍රියජනක කතා බහ පිළිබඳ දිනපතා ස්ථම්භන ක්‍රියාවල යෙදෙන්න.

ක්‍රියාකාරකම 8

✠ සිසුන් හතර/හය දෙනාගේ කුඩා කණ්ඩායම් වශයෙන් එක්ව විශාල ප්‍රමාණයේ සුදුසු කඩදාසියක යහපත් ප්‍රාර්ථනාවලින් යුත් සාමූහික චිත්‍ර නිර්මාණය කිරීමට සිසුන්ට මග පෙන්වන්න. ප්‍රාර්ථනා වචන සිසුන්ට ඇගෙන්නට සලස්වන්න.

උදාහරණ :- අපේ විදුහල්පතිතුමාට සෙත් වේවා
අපේ ගුරුතුමීට/ගුරුතුමාට සෙත් වේවා
අපේ දෙමාපියන්ට යහපතක් ම වේවා

ක්‍රියාකාරකම 9

✠ ජීවිතයේ විවිධ අවස්ථා සඳහා සුබ පැතුම් පත් නිර්මාණය කිරීමට යොමු කරන්න.

උදාහරණ :-
- යහළුවන්ගේ උපන් දිනයට
- අසනීපයෙන් සිටින යහළුවා ඉක්මනින් සුව වීමට
- තමාට උදවු කළ අයකුට ස්තුති කිරීමට

(මෙවැනි සුබ පැතුම් පත් වියලි මල්, වර්ණවත් කඩදාසි, කොලාජ්, සීල් මුද්‍රණය වැනි මාධ්‍ය භාවිතයෙන් සකස් කළ හැකි බව සිසුන්ට පහදා දෙන්න)

- විවිධ හැඩයෙන් සහ විවිධ වර්ණයෙන් යුතු ස්වභාවික මල් සහ පත්‍ර වර්ග පොතක් තුළ තබා සතියක පමණ කාලයක් වේළෙන්නට තබන්න.
- වර්ණ කඩදාසියකින් සාමාන්‍ය සුබ පැතුම් පතක ප්‍රමාණයට කොටසක් කපා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- එය හරි මැද්දෙන් දෙකට නමා ඉදිරිපස කොටසෙහි වියලා ගත් පත්‍ර, මල් විවිධ මෝස්තර හෝ රටා අනුව හෝ ඇලවීමට සිසුන් යොමු කරන්න. අලංකාර නිර්මාණයන් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සකසා ගත් නිර්මාණ කඩදාසියේ ඇතුල් පැත්තේ සුදුසු සුබ පැතුමක් හෝ ප්‍රාර්ථනාවක් හෝ ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- මෙහි දී පැහැදිලි ව නිරවුල් ව හා කෙටියෙන් එම ප්‍රාර්ථනා ගොනු කරන්නේ කෙසේ දැයි සිසුන්ට පැහැදිලි කරන්න.
- එක් එක් සිසුවා විසින් සකස් කරන ලද නිර්මාණ ප්‍රදර්ශනය කරන්න. ඒවා අගය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 2.12 පොළොව හා අහස

අප වාසය කරන පොළොව මතු පිට විවිධ විෂමතාවන්ගෙන් යුක්ත ය. වැස්ස, සුළඟ වැනි ස්වභාවික සාධක හේතුවෙන් පොළොව මතු පිට වෙනස්වීම්වලට භාජනය වේ. එපමණක් නොව මිනිස් අවශ්‍යතා සඳහා ද භූමියේ මතු පිට වෙනස්කම් සිදු කරනු ලබයි. එමගින් අනිසි ප්‍රතිඵල ද විඳීමට සිදු වන අවස්ථා බොහෝ ය. මේ පිළිබඳ ව දැනුවත් වීම මෙන් ම නිරීක්ෂණ ඇසුරින් වැසි, සුළංවල ස්වභාවය වින්දනාත්මක ව අත්දැකීම් ලබා දීමටත්, සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අවස්ථා සලසා දීමටත් මෙම තේමාව සැලසුම් කර ඇත.

නිපුණතා

★ භූමියේ මතු පිට විවිධත්වය විමර්ශනය කර වාර්තා කරයි.
★ සුළඟින් පරිසරයේ සිදුවන වෙනස්කම් හඳුනා ගෙන වාර්තා කරයි.
★ සුළඟින් ක්‍රියාත්මක කළ හැකි නිර්මාණ කරයි.
★ සුළඟේ හා වැස්සේ විවිධ අවස්ථා විවිධ මාධ්‍ය භාවිත කරමින් ඉදිරිපත් කරයි.
★ වැස්සට පෙර, වැස්ස හා වැස්සට පසු අවස්ථාවල දී පරිසරයේ ස්වභාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
★ වැස්ස හා සුළං ආශ්‍රිත ගායන හා රංගනවල යෙදේ.
★ ශරීරය පොළෙවෙන් ඉහළට නික්මීමේ හා පොළොවට පතිත වීමේ වින්දනාත්මක ක්‍රීඩාවල නියැළෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ පාසල් වත්ත නිරීක්ෂණය කිරීමට සලස්වන්න. භූමියේ වෙනස්කම් පහසුවෙන් හඳුනා ගත හැකි ස්ථාන කිහිපයක් තෝරා ගන්න. (උදාහරණ :- උස් තැනක්, පහත් තැනක්, තැනිතලා, කඳු ගැට) පන්තියේ සිසුන් අවශ්‍ය පරිදි කණ්ඩායම් කරන්න. තෝරා ගත් ස්ථාන කරා යොමු කරන්න. එක් එක් කණ්ඩායම් සඳහා කළ යුතු දේ පැහැදිලි කරන්න. ඒ අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් ඇසුරින් අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසන්න.

තෝරා ගත් ස්ථානයේ බෝලයක් පෙරළා බැලීම
කඳු/උස් බිමක් සහිත වේ නම් කන්දට දිවීම හා කන්දේ සිට ආපසු දුවගෙන ඒම
රෝදයක් තල්ලු කර බැලීම
එම ස්ථානයට ජලය දමා ගලා යන ආකාරය නිරීක්ෂණය කිරීම
වැස්ස මගින් සෝදාපාළු වූ භූමියේ ස්ථාන කිහිපයක් නිරීක්ෂණය කිරීම

මෙවැනි ක්‍රියාකාරකම් කිහිපයක් කරමින් සිසුන්ට අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලස්වන්න. සිසුන් ලද අත්දැකීම් පිළිබඳ ව කතා කරන්න.

උදාහරණ :- බෝලය පෙරළී ගියේ කෙසේ ද?
කන්ද දෙසට දිවීමේ දී වෙහෙසක් දැනුණේ ද? ඒ ඇයි?
රෝදය තල්ලු කිරීමේ දී කුමක් සිදු වූයේ ද?
වතුර ගලා යාම සිදු වූයේ කෙසේ ද? ඒ ඇයි?

- භූමියෙහි විවිධත්වයක් ඇති වීමෙහි ලා බලපා ඇති පරිසර සාධක ඉහත සඳහන් නිරීක්ෂණ ඇසුරින් හඳුනා ගන්න.
  උදාහරණ :- වැස්ස නිසා පොළොවේ සෝදාපාළු වී ගිය තැන් හා හැරුණු වළවල්
- විවිධ අවශ්‍යතා මත භූමියෙහි වෙනස්වීම් සිදු කෙරෙන බව පෙන්වා දීම සඳහා පාසලේ සිදු කර ඇති එවැනි වෙනස්කම් කිහිපයක් පිළිබඳ ව විමසන්න.
  උදාහරණ :- ක්‍රීඩා කිරීමට පිට්ටනියක් (තැනිතලා සහිත භූමිය)
  කුණු දැමීම සඳහා කුණු වළක්
  ගොඩනැගිලි ඉදි කිරීම සඳහා බිම සැකසීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ගොවිතැන් කිරීම සඳහා ගොවි පොළවල් සකස් කිරීම
ජලය ලබා ගැනීමට වැව්, ළිං, පොකුණු සකස් කිරීම

සිසු අත්දැකීම් සහ යොදා ගත හැකි වෙනත් සිද්ධි ඇසුරින් ඉහත කරුණු පිළිබඳ ව කතා බහ කරන්න.

- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් පාසල් භූමියේ ප්‍රධාන වෙනස්කම් දැක්වෙන දළ ආකෘති ගොඩ නැගීමට සිසුනට උදවු කරන්න.
- පාසල් වත්ත හෝ පාසල් වත්තෙහි සිත් ගත් ස්ථානයක් චිත්‍රයට නැගීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 2

✠ පහත දැක්වෙන අන්දමේ ක්‍රියාකාරකම්වල සිසුන් යොදවා ප්‍රතිඵල නිරීක්ෂණය කරවන්න.


- එළිමහනේ ස්ථානයක එස වූ කොඩියකට සුළං හමන විට සිදු වන දේ, සුළං නැති විට සිදු වන දේ
  - සුළං හමන විට ගස්වල කොළ හා අතු සෙලවීම
  - සුළඟ අඩු වැඩිවීමේ දී එහි ඇති වන වෙනස
- සුළං ඇති විට, සුළඟේ වේගය වැඩි වන විට පරිසරයේ ඇති විවිධ දෑ ක්‍රියා කරන ආකාරය උදාහරණ:- වියළි ශාක පත්‍ර, කුණු රොඩු
- සුළං හමන විට වියළී ගිය කොළ, කුඩාවට ඉරා ගත් කඩදාසි කැබලි සුළඟ හමන දිශාවට වීසි කර සිදු වන දේ නිරූපණය කරන්න. වඩාත් හොඳ ප්‍රතිඵල ලැබීම සඳහා කඩදාසි කැබලි වෙනුවට පියාපත් පිහිටා ඇති හොර බීජ, කෙඳි පිහිටා ඇති මොනර කුඩුම්බිය බීජ, පුළුන් සහිත කපු බීජ ද පාවිච්චි කළ හැකි ය.



හොර බීජය
(හොර කුරුල්ලා)



මොනර කුඩුම්බිය බීජය



පුළුන් හා බීජ සහිත කපු ගෙඩිය

සුළං හමන විට දල්වන ලද හඳුන් කූරකින් නිකුත් වන දුමට සිදුවන දේ,
සුළඟ ඇති විට හා නැති විට දුම ගමන් ගන්නා ආකාරය
වේගවත් සුළඟක් ඇති විට ඉහලූ කුඩයකට සිදුවන දේ
තෙත් කළ රෙදි කඩක් එල්ලා තැබූ විට, සුළං හැමීමේ දී සිදුවන දේ (පහසුකම් තිබේ නම් තෙත රෙදිකඩක් විදුලි පංකාවක් ඉදිරිපිට තබා නිරීක්ෂණය කරවන්න)

- මෙබඳු ක්‍රියාකාරකම් මගින් සුළං නිසා සමහර දේවල් පිහිටා ඇති ස්ථානයේ ම සෙලවෙන්නටත්, සමහර දේවල් ගමන් දිශාව වෙනස් වන්නටත්, තවත් දේවල් පිහිටි ස්ථානයෙන් ගසා ගෙන යන්නටත්, තෙත් දේවල් වියළෙන්නටත් හැකි බව පෙන්වා දෙන්න.


- සිසුන් ලත් අත්දැකීම්වලින් තමා කැමති අත්දැකීමක් චිත්‍රයට නැගීමට සලස්වන්න. මෙය සාමූහික කාර්යයක් ලෙස සිසුන් සියලු දෙනා ම සහභාගී වී පාට හුණුකූරු භාවිත කරමින් හුණු ලැල්ලේ හෝ කණ්ඩායම් වශයෙන් ඩිමයි කඩදාසිවල හෝ නිර්මාණය කළ හැකි ය.
  මුහුද හෝ ලොකු ජලාශ සම්බන්ධ අත්දැකීම් ඇති සිසුන්ට රැවල් ඔරු සුළඟට දක්වන ප්‍රතිචාර ද අඳින්නට පුළුවන. මේ ආකාරයට, අඳින සිතුවම තමා ජීවත් වන පරිසරයට වඩාත් ගැළපෙන පරිදි ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 3


✠ සුළඟින් ක්‍රියාකරවිය හැකි සුළං පෙත්තක් නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා තරමක ඝනකම ඇති කඩදාසියක් ගෙන හතරැස් ව (පැත්තක් සෙන්ටිමීටර 15ක් දිග) කපා ගැනීමට සිසුන් යොමු කරවන්න. පහත දැක්වෙන ආකාරයට පියවරෙන් පියවර මේ සඳහා අනුමගනය කළ හැකි ය.

කඩ ඉදිරි දිගේ දෙකට නවන්න




දිග හරින්න

නැවත වරක් නවන්න





ලකුණු කළ ස්ථානයේ සිට සමාන දුරක් නැවත ලකුණු කර ගන්න


මුල්ලෙහි නැවුම් ලක්ෂයෙහි ලාංඡනයක් තබන්න




රූපයේ දැක්වෙන ආකාරයට තිත් සලකුණු හතරක් තබා ගන්න. කලින් ලකුණු කර ගත් සීමාව දක්වා කපා ගන්න.










තිත් සහිත මුළු හතර නවා තුඩු අලවා ගන්න



සුළං පෙත්ත

- ඇල වූ තැන කඩදාසි රවුමක් අලවා, අල්පෙනෙත්තකින් කෝටුවකට සවි කරන්න. නිර්මාණය කර අවසන් වූ පසු එය රැගෙන දුවමින් හුළං පෙත්ත කර කැවෙන අයුරු බලමින් වින්දනයක් ලැබීමට අවස්ථාව සලසන්න.
  පොල් කොළ භාවිත කරමින් ද සුළං පෙත්තක් සෑදිය හැකි ය. ඒ සඳහා ද අවස්ථාව ලබා දෙන්න.
- සුළඟ නිසා සිදුවන වෙනස්කම් දැකීම සඳහා සුළං පෙත්තක් සාදා අල්ලා සිටීම හෝ දිවීම හෝ යම් තැනක ගැට ගසා තැබීම හෝ කළ හැකි ය.
- වැස්ස හා සුළඟ පිළිබඳ ව කියවෙන පහත දැක්වෙන ආකාරයේ ගීත නිර්මාණය කර ගෙන අංග චලන සහිත ව ගායන කිරීමට සිසුන්ට අවස්ථා ලබා දෙන්න.

ගස්වල අතු සොලවාගෙන
සුළං හමනවා
හෝ හෝ හෝ ගාමින්
සුළං හමනවා
බිංදු බිංදු වැහි පොද පොද
බිමට වැටෙනවා
වැහි පොද පොද එකතු වෙලා
වතුර ගලනවා
සුළං හමනවා - වැස්ස වහිනවා

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පුංචි පුංචි කඩදහි ඔරු
මමත් හදනවා
ගලන වතුරේ ඔරු පා කර
අපි තුටු වෙනවා
අපි තුටු වෙනවා - අපි තුටු වෙනවා
(පද රචනය : සජීවා රඹුක්වැල්ල)

- සරුංගල් සාදා උඩ යැවීම ද කළ හැකි ය. තව ද අහස් යානයක් ගුවන් කුරුල්ලෙක් නිර්මාණය කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 4

✠ වැස්සට පෙර, වැසි වසින හා වැස්සට පසු පරිසරයේ ස්වභාව හඳුනා ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල නිරත වෙමින් සිසුන්ට අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව දෙන්න. මේ සඳහා වැසි සහිත කාලයක් යොදා ගැනීම ඵලදායී වනු ඇත.

වැස්සකට පෙර අවට පරිසරයේ දක්නට ලැබෙන ලක්ෂණ කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.

අහසේ හා වළාකුළුවල ස්වභාවය අහසේ හා වළාකුළුවල වර්ණය
පරිසරයේ ආලෝක තත්ත්වය වෙනස්වීම
අහස ගෙරවීමට සහ විදුලි කෙටීමට පටන් ගැනීම
ගස්වල අතු රිකිළි සෙළවීම
කුරුල්ලන් හා වෙනත් සතුන්ගේ හැසිරීම් රටා වෙනස්වීම
.......................................

වසින අවස්ථාවේ පරිසරයේ දක්නට ලැබෙන ලක්ෂණ කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.

වැස්ස පටන් ගන්නා ආකාරය
වැහි බිංදු වැටෙන ආකාරය
සුළඟ ඇති විට වැහි බිංදු වැටෙන ආකාරය
එකතු වන වැහි බිංදු ගලා යන ආකාරය (පන්ති කාමරයේ සිට නිරීක්ෂණය කරවන්න.)
වැසි වසින විට නැගෙන හඬ
........................................

වැස්සෙන් පසු පරිසරයේ දක්නට ලැබෙන ලක්ෂණ කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.

අහසේ ස්වභාවය
පරිසරයේ ආලෝක තත්ත්ව නැවත වෙනස්වීම
ගස් කොළන් ප්‍රාණවත්වීම
භූමියෙහි ජලය ගලා යාම නිසා පස් ඉවත් වී කුඩා කාණු ඇතිවීම
පාරවල් දෙපස පස සේදී ගොස් වැලි මතුවීම
ජලය ගලා ගිය පසු ගොඩනැගිල්ලේ කාණුවල සිදු වී ඇති වෙනස (උදා :- වැලි/පස්/ගල් රොඩු/පොලිතීන් රැඳීම, සමහර තැන්වල ජලය එකතුවීම)
භූමියේ හැරුණු වළවල් සහිත ස්ථාන ඇතිවීම, මේවායේ ජලය එකතු වීම
එළිමහනේ ඇවිදින විට පයට හා පාවහන්වලට දැනෙන වෙනස
ගස්වල කොළ වැටී ඇති ආකාරය
සතුන්ගේ දක්නට ලැබෙන ප්‍රතිචාර ආදිය
..........................................................

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

වැසි ලැබීම නිසා අපට සැලසෙන වාසි හා සිදුවිය හැකි අවාසි පිළිබඳ ව ද අවධානය යොමු කරන්න.

උදාහරණ :- වාසි

ගස් කොළ දලුලමින් නව පණක් ලැබීම

පරිසරයේ සිසිල් බව

ගොවිතැන් වැඩ සඳහා අවශ්‍ය ජලය ලැබීම

පරිසරයේ ඇති සමහර අපවිත්‍ර දේවල් (උදා :- දූවිලි, කුණු රොඩු පුළුස්සා ඇති තැන්වල අළු, ඇලි ආදිය) සේදීයාම

අවාසි

ගංවතුර ගැලීම

නායයාම

ගස් කොළන්වලට හානි සිදුවීම

මිනිසුන්ගේ ගෙවල් දොරවල් හා දේපල අහිමිවීම

පාරවල්වල ගමන් කිරීමට නොහැකිවීම

ආදී තොරතුරු කතා බහට ලක් කරන්න. මෙහි දී නිරීක්ෂණ තොරතුරුවලට අමතර ව පින්තූර, ඡායාරූප හා සිසු අත්දැකීම් ද සහාය කර ගන්න.

තමන් ඇසූ දේ හා දුටු දේ පිළිබඳ ව තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට හා ඒ ගැන කතා බහ කිරීමට සිසුන් ව යොමු කරන්න. මේ මගින් ඔවුන් ලැබූ අත්දැකීම්වල තොරතුරු හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 5

✠ සිසුන් කණ්ඩායම් කරන්න. වැස්සට පෙර, වැසි වසින අවස්ථාවේ හා වැස්සෙන් පසු අසන්නට, දකින්නට ලැබුණු දේ නිරූපණය කරමින් රංගන ඉදිරිපත් කිරීමට එම කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.

- පහත සඳහන් අවස්ථා ඇසුරෙන් ගායන හා රංගන යොදා ගන්න.

උදාහරණ :- සුළං හමා යන ආකාරය

වැසි වසින ආකාරය

කුරුල්ලන් කෑඳලිවලට පියාඹා යාම

වැසි අවස්ථාව සමූහ වාදනයකින් ඉදිරිපත් කරන්න.

ආදේශක භාණ්ඩ යොදා ගනිමින් මෙම අවස්ථා සිසුනට වින්දනයක් ලැබෙන පරිදි ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

- පහත අවස්ථා නිරූපණය කළ හැකි ය.

ජලය රැඳුණු තැනක ඇවිදීමෙන් එගොඩ වන ආකාරය

මඩ හා දිය සෙවල සහිත තැනක ඇවිදීම

ගංවතුර ගැලූ අවස්ථාවක හැසිරීම

- සිසුන්ට කවි ගී ගායනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

සට සට ගා වහින වැස්ස
කළු කර කර ඇදෙන වැස්ස
ගං ඇළ දොළ පිරෙන වැස්ස
ගමට ඇවිත් බිනර වැස්ස

(ගංහාවෙන් මහ මුහුදට - සුනිල් සරත් පෙරේරා)

පුලුන් වගේ වලාකුළක්
අහසෙ ඇත පා වෙනවා
තටු විහිදා කුරුලු පැටව්
නිල් අහසේ පියඹනවා

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිලට නිලේ නිල් අහසේ
උදේට හිරු පායනවා
සුදට සුදේ වටකුරුවට
හඳ හාමිත් පායනවා

පිච්ච පොකුරු පිපිල වගේ
තරු මල් බිම හිනැහෙනවා
මාසෙ පෝය දා ට අපොයි
කළු පාටට බුම්මනවා

(පරිසර ගී - සුනිල් සිරිවර්ධන)

අක්කෙ අක්කෙ අර බලන්නකෝ - වැස්සක් නොවැ එන්නේ //
හෝ හෝ හෝ ගා ගෙන එන්නේ //
ගස් ගල් පෙරළෙන්නේ
සුළං තදයි
විදුලිය ද කොටයි
හෙණ හඬ පැතිරෙයි
මහ වලාකුළක් නොවැ එන්නේ

අක්කේ දර ටික ගෙට ගනිමු
වැහි පොද වැටෙන වගේ
වතුරත් ඉවරයි කළ ගෙඩියේ//
හනික ළිඳට යමුකෝ//

නංගි සුදෝ මගෙ හඬන්නෙපා
අම්ම හනික දැන් එයි
බිල්ලො නොවෙයි ඔය ගොරවන්නේ
අහසේ හෙණ නාදෙයි

සුළං තදයි විදුලිය ද කොටයි
හෙණ හඬ පැතිරෙයි
මහ වලාකුළක් නොවැ එන්නේ

අක්කේ වී පැදුරත් එළියේ
හනිකට ගෙට ගනිමු
අම්මත් අර නාගෙන එන්නේ
මල්ලි තව ම කුඹුරේ

(පද මාලාව - ආනන්ද සමරකෝන්)

සිසුන්ට වින්දනාත්මක ක්‍රීඩාවල නිරත වීමට අවස්ථා සලසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 2.13 අපට කළ හැකි වෙනස්කම්

ලෝකය ද, ලෝකවාසීන්ගේ සමාජය ද වඩාත් යහපත් ජීවන ගුණාංග සහිත තැනක් බවට පත් වී ඇත්තේ දිගින් දිගට ම සිදු වූ යහපත් වෙනස්කම් සහ එම වෙනස්කම් කෙරෙහි කැප වූ විපර්ය කාරයකයන් ද නිසාමය. අදාළ ලෝකය වඩාත් යහපත් වෙනස්කම්වලට භාජනය විය යුතු ය. එමෙන් ම ලෝකයේ දැනට සිදු වී ඇති අයහපත් වෙනස්කම් නැවතත් යහපත් වෙනස්කම් බවට පත් විය යුතු ය. ඒ අභියෝගයට මුහුණ දිය හැක්කේ නිර්මාණශීලී විපර්යකාරකයන්ට පමණ ය.
එසේ නම් මතු පරපුර වඩාත් පුළුල් දෘෂ්ටියකින් යුත් අධිෂ්ඨානශීලී නිර්මාණශීලී විපර්ය කාරකයන් බවට පත් විය යුතු ය. එය ආරම්භ විය යුත්තේ තමා වෙතිනි. තමා තම පන්තිය හා සමීප පරිසරයෙන් මෙම යහපත් වෙනස්කම් ආරම්භ විය යුතු ය. ඒ සඳහා තමා මෙන් ම මිතුරු මිතුරියන් සමඟ එක් ව කටයුතු කළ යුතු ය. එක් ව කරන ලද යහපත් වෙනස්කම්වලින් වින්දනයක් ලැබිය යුතු ය.
මෙම තේමාවෙන් පෙර කී අනාගත ලෝකයේ වෙනස්කම් සඳහා නිර්මාණශීලී ව දායක වන විපර්ය කාරකයන්ට අවශ්‍ය ආකල්ප හා නිපුණතාවල පදනමක් ඇති වෙතැයි අපේක්ෂා කෙරේ.

නිපුණතා

★ තම පන්තියේ හා පන්තියට සමීප පරිසරයේ සිදු කළ හැකි යහපත් වෙනස්කම් අධ්‍යයනය කරයි.
★ යහපත් වෙනස්කම් සඳහා පන්තියේ මිතුරු මිතුරියන් සමඟ එක් ව කටයුතු කරයි.
★ සිදු කරන ලද යහපත් ක්‍රියාවල අත්දැකීම් බෙදා හදා ගනියි
★ එකිනෙකාගේ දායකත්වය අගය කිරීම හා සාමූහික ව කටයුතු කිරීමේ වටිනාකම අගය කරයි.
★ වෙනස්කම්වලට පෙර තත්ත්වය හා පසු තත්ත්වය සංසන්දනාත්මක ව අගය කරයි.
★ යහපත් වෙනස්කම් පිළිබඳ ව නිර්මාණාත්මක කවි, ගී, ගායනය කරයි. රංගනය කරයි. විවිධ නිර්මාණවල යෙදෙයි.
★ යහපත් ස්ථානයක් ලෙස ක්‍රීඩා පිටිය හඳුනා ගනිමින්, නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

✠ පන්ති කාමරයේ හා ඒ අවට පරිසරයේ සිදු කළ හැකි යහපත් වෙනස්කම් මොනවා දැයි හඳුනා ගැනීමට සලස්වන්න.
- මේ සඳහා දැනට පන්ති කාමරයේ හා අවට ආසන්න පරිසරයේ පවත්නා තත්ත්වය අධ්‍යයනයට යොමු කරන්න.

  උදාහරණ :-
  - පන්තියේ ඩෙස් පුටු, මේස තබා ඇති ආකාරය
  - එදිනෙදා පරිහරණයට ගනු ලබන ඉගෙනුම් ද්‍රව්‍ය හා ඒවා තබා ඇති ආකාර
  - ප්‍රදර්ශනය කර ඇති පුවරු, පින්තූර, රූප
  - ආදර්ශ පාඨ හා වෙනත් . . . ඒවායේ යෝග්‍යතාව
  - දෛනික ව සිදු කරන වතාවත් හා ඒ සඳහා වෙන් කර ඇති ස්ථාන
  - පන්ති කාමර ප්‍රතිපත්ති

  ඉහත කරුණු එකිනෙක ගෙන විමසමින් පන්ති කාමරයේ ඒ ආකාරයෙන් ම පවත්වා ගත යුතු හා වඩාත් යහපත් ප්‍රතිඵල ලැබෙන අයුරින් වෙනස් කළ යුතු දේ හඳුනා ගැනීමට සිසුනට අවස්ථාව දෙන්න.
- හඳුනා ගත් දෑ සඳහා කළ යුතු කාර්යයන් පෙළගස්වන්න.
- සාමූහික අදහස් අනුව හඳුනා ගත් කාර්යයන් සඳහා පහත දැක්වෙන කරුණු ඔස්සේ විස්තර සිසුන් සමඟ සාකච්ජා කරන්න.
  - හඳුනා ගත් කාර්යයන් මොනවා ද?
  - කළ යුතු වෙනස්කම් මොනවා ද?
  - වෙනස් කළ හැක්කේ කෙසේ ද?
  - සහභාගී වන්නෝ කවු ද?



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- මෙම කරුණු සඳහා වගුවක් ගොඩ නගන්න. එය ඩිමයි කඩදාසියක ගොනු කළ හැකි ය.
- වගුව පිරවීමේ දී ඔවුන් කරන යෝජනාවලට ප්‍රමුඛතාව දෙමින් අවශ්‍ය විට පමණක් ගුරුවරයාගේ මග පෙන්වීම් කිරීම වැදගත් වේ.
- වගුව සම්පූර්ණ කිරීමෙන් පසුව පන්තියේ ඉක්මනින් කළ යුතු කාර්යයන් කෙරෙහි අවධානය යොමු කර කණ්ඩායම් වශයෙන් කළ යුතු වැඩ කොටස් හඳුනා ගැනීමට ඉඩ සලසන්න. (ගොඩනගා ගත් සැලැස්මෙහි වැඩ සියල්ලම අවසන් කිරීම අනිවාර්ය නැත) කණ්ඩායම් වැඩ ආරම්භයට පෙර තම කණ්ඩායමට හිමි කාර්යයේ පවත්නා තත්ත්වය චිත්‍ර මඟින් හෝ ලිඛිත ව හෝ තබා ගැනීමට උපදෙස් දෙන්න.
- මෙම කටයුතුවල දී දෙමාපිය සහාය පාසලේ වැඩිහිටි සිසුන්ගේ සහාය ගුරුවරුන්ගේ හා අදාළ වෙනත් පුද්ගලයන්ගේ සහාය ලබා ගත හැකි ය.
- මේ අනුව පන්ති කාමරයේ විවිධ නිර්මාණ, නව වැඩසටහන්, නව පන්ති කාමර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සිදු විය හැකි ය. ඒවා හැකි පමණින් සුදුසු පරිදි පන්තියේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ගන්න. අදාළ සැලසුම් හැකි අයුරින් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව සලසන්න.
- ගුරුවරයාගේ මැදිහත් වීමෙන් එක් කණ්ඩායමක් කරන වැඩ අගය කිරීමට අනෙක් කණ්ඩායම්වල සිසුන්ට අවස්ථාව දෙන්න.
- එක් එක් කණ්ඩායමක් විසින් කරන ලද කාර්යයන් පන්තියේ ප්‍රකාශ කිරීමට ඉඩ සලසන්න. සිදු කරන ලද යහපත් ක්‍රියාවලින් අගය කිරීම හා ඒ සඳහා දායකත්වය ලබා දුන් සැම අගය කිරීම හා සාමූහික ව කටයුතු කිරීමේ වටිනාකම් මතු කිරීම අවශ්‍ය ය.
- සාමූහික ව කටයුතු කිරීමේ වටිනාකම අගයන කවි, ගී, රංගනය කරමින් ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  උදාහරණ :- පායනා කාලෙ දී රෑ දවල් මහන්සි වී
  කන්න දේ රැස් කරයි කුඹියෝ . . . . වැනි ගීත

- සාමූහික ව කටයුතු කිරීමේ අගය මතු කෙරෙන කතන්දර ඉදිරිපත් කිරීමට ද සිසුනට අවස්ථාව දෙන්න.

ක්‍රියාකාරකම 2

✠ සිදු කරන ලද වෙනස්කම් ඇතුළත් කරමින් නව චිත්‍රයක් ඇඳීමට හෝ ලිවීමට හෝ සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- පෙර තත්ත්වය පිළිබඳ අඳින ලද චිත්‍රය හෝ විස්තරය හෝ පසු තත්ත්වය පිළිබඳ අඳින ලද චිත්‍රය හෝ විස්තරය හෝ සමඟ සැසඳීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ අනුව කරන ලද වෙනස්කම් පිළිබඳ අභිමානවත් විය හැකි බවත් පන්ති කාමරයේ පමණක් නොව පාසලේ දියුණුව සඳහා තමා ද කොටස් කරුවකු වන බවත් එය තමාගේ යුතුකමක් බවත් පෙන්වා දෙමින් කරන ලද සේවය අගය කරන්න.
- කරන ලද වෙනස්කම් පිළිබඳ කවි ගී කතන්දර චරිතාරෝපිත කතා නිර්මාණය කර රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 3

✠ සිසුනට නිවසේ දී කළ හැකි යහපත් වෙනස්කම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
සති අන්තයක/නිවාඩු කාලයේ දී නිවසේ දී කළ හැකි වෙනස්කම් පිළිබඳ ව සිතා බැලීමට මග පෙන්වන්න.

උදාහරණ:- මිදුලේ මල් වැවීම
ගෙවත්තේ එළවළු පාත්තියක් සිටුවීම
රුක් කලාවක් සැකසීම
නිවසේ බිත්ති සැරසිල්ලක් සකස් කිරීම
සෝදා පාලුවට ලක් වූ ගසක් වටා ආවරණය කර පස් පිරවීම ... වැනි

නිවසේ දී කළ හැකි වෙනස්කම් පිළිබඳ බුද්ධි කලම්භනයක් මගින් ලැයිස්තුවක් පෙළ ගස්වන්න.

- තේමාව ක්‍රියාත්මක වන කාලය තුළ සති අන්තයක දී ප්‍රායෝගික ව තව නිවසේ දී කළ හැකි ක්‍රියාකාරකමක් තෝරා ගැනීමට මග පෙන්වන්න.

සති අන්තයේ නිවසේ දී කරනු ලබන යහපත් වෙනස්කම්වලට සහයෝගය දෙන ලෙස නිවැසියන්ට දන්වන්න.

සති අන්තයෙන් පසු පාසල් පැමිණි මුල් දිනයේ දී සිසුන් කරන ලද යහපත් වෙනස්කම් පිළිබඳ කතා බහ කරන්න.

ඒවා පිළිබඳ කවි ගී නිර්මාණය කිරීමට සිසුන්ට මග පෙන්වන්න. සිසුන් නිර්මාණය කරන ලද යහපත් වෙනස්කම් පිළිබඳ කවි ගී සාමූහික ව ගායනා කිරීමට සහය වන්න.

ක්‍රියාකාරකම 4

✠ පාසලේ තිබෙන ඉතා වැදගත් ස්ථානයක් ලෙස ක්‍රීඩා පිටිය හඳුන්වා දෙන්න.

- ක්‍රීඩා පිටියේ ආරක්ෂාව හෝ එය පවත්වා ගැනීමට කළ හැකි කාර්යයන් හෝ මොනවා දැයි සාකච්ඡා කරන්න.

උදාහරණ :- වල් බිහිවී තිබේ නම් ඒවා පවිත්‍ර කිරීම අනාරක්ෂිත ස්ථාන තිබේ නම් ඒවා සුදුසු පරිදි සකස් කිරීම.

- ක්‍රීඩා පිටියේ පැවැත්ම සඳහා තම දායකත්වය ලබා දීමේ වැදගත්කම මතු කරන්න.
- සිසුන් විසින් නිර්මාණය කර ගන්නා ලද ක්‍රීඩා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :- දිවීම්, පැනීම් ආශ්‍රිත ක්‍රීඩාවක් පන්දු හෝ වෙනත් උපකරණ හෝ ආශ්‍රිත ක්‍රීඩාවක්

- ක්‍රීඩාවල සිසුන් නිරත කර වීමේ දී දින කිහිපයක් සඳහා ක්‍රීඩා කිහිපයක් යොදා ගැනීම වඩාත් ඵලදායී වේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.14 මිනිසා හා තොරතුරු

සමාජයේ ජීවත් වන පුද්ගලයකු ලෙස අවට ලෝකයේ තොරතුරු පිළිබඳ දැනුවත් ව සිටීම වැදගත් වේ. සමාජ, දේශපාලන, ආර්ථික හා ආගමික තොරතුරු පිළිබඳ යාවත්කාලීන දැනුමකින් යුතු ව සිටීම ද වැදගත් ය. වර්තමානයේ තෙරතුරු ලබා ගත හැකි මාධ්‍ය බොහෝ ය. විද්‍යුත් මාධ්‍ය හා ලිඛිත මාධ්‍ය සන්නිවේදන මාධ්‍ය අතර ප්‍රධාන ය. මෙවැනි මාධ්‍ය භාවිතයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමේ අවස්ථා ප්‍රායෝගික ව අත් විඳීමට සිසුන්ට අවස්ථා සැලසීම මෙම තේමාවෙන් අපේක්ෂිතය.

නිපුණතා

★ තම අවශ්‍යතා සඳහා විවිධ ක්‍රම භාවිත කරමින් තොරතුරු හුවමාරු කර ගනියි.

★ යම් දෙයක් හෝ තැනක් හෝ පුද්ගලයෙක් හෝ පිළිබඳ තොරතුරු දැන ගත හැකි මාර්ග විමසා බලා වාර්තා කරයි.

★ තොරතුරු ලබා ගැනීමේ දී අන් අයට හිරිහැර නොවන චර්යා පවත්වා ගනියි.

★ විවිධ ක්‍රම ශිල්ප භාවිත කරමින් තොරතුරු ලබා ගනියි.

★ විවිධ ක්‍රම අනුගමනය කරමින් තොරතුරු වාර්තා කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අප භාවිත කරන විවිධ ක්‍රම මොනවා දැ යි සිසුන්ගෙන් විමසන්න. මේ සඳහා පන්තියේ සිසුවකු ලවා හෝ පාසලේ වැඩිහිටි සිසුවකු ලවා හෝ වැදගත් පණිවිඩ ඇතුළත් ප්‍රකාශන කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථා ව දෙන්න.
හැකි නම් පණිවිඩ පටිගත කර ගෙන සිසුන්ට සවන් දීමට සලස්වන්න.
උදාහරණ:- පාසල් වැට සකස් කිරීමේ ශ්‍රමදානයක් මෙම මස තුන්වන ඉරිදා පෙ.ව. 9.00ට ආරම්භ වේ. මේ සඳහා දෙමාපිය සියලු දෙනාගේ ම සහභාගිත්වය අපේක්ෂා කෙරේ. විදුහල්පති

✠ පණිවිඩ ලැබෙන වෙනත් ක්‍රම පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
මෙලෙස විවිධ ක්‍රමවලින් ලැබෙන තොරතුරු ඇසීමෙන් හා දැකීමෙන් ආදී වශයෙන් වෙන් කළ හැකි දැ යි බලන්න.
පුද්ගලයන්ගෙන් තොරතුරු දැන ගැනීම සඳහා යොදා ගත හැකි විවිධ ක්‍රම සැලසුම් කර ගන්න.
උදාහරණ :-
ඉඟි භාවිතයෙන් අදහස් ප්‍රකාශය
මේ සඳහා ගුරුවරයා විසින් විවිධ ඉන්ද්‍රියයන් භාවිත කරමින් අදහස් ප්‍රකාශ කිරීම.
මෙහි දී ගුරුවරයා විසින් අදහස් ඉදිරිපත් කරන විට සිසුන්ට ඊට අදාළ ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව ලබා දෙන්න. නිවැරදි ප්‍රතිචාර දක්වන සිසුන් අගයන්න. අනෙක් සිසුන් ද දිරිමත් කරන්න.
මේ ආකාරයට ඉඟි භාවිත කරමින් අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට ද අවස්ථාව ලබා දෙන්න.
රහසින් පණිවිඩ යැවීම
සිසුන් රවුමක් ලෙස හෝ පේළියකට සිටුවන්න. ගුරුවරයා විසින් රවුමේ සිටින එක් සිසුවකුට හෝ පේළියේ සිටින පළමුවන සිසුවාට හෝ දෙන පණිවිඩය අවසන් සිසුවා දක්වා රහසින් එකිනෙකා හට පවසන ලෙස උපදෙස් දෙන්න.
අවසන් සිසුවාගෙන් ඔහුට/ඇයට ලැබුණු පණිවිඩය කුමක් දැ යි විමසන්න.
මුලින් දෙන ලද පණිවිඩය හා අවසානයේ ලැබුණු පණිවිඩය අතර වෙනසක් තිබේ දැයි බලන්න.
පණිවිඩ නිවැරදි ව ලබා දීමේ වැදගත්කම පිළිබඳ අවධාරණය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- මෙම ක්‍රම ඇසුරෙන් තොරතුරු ලැබීම පමණක් නොව තොරතුරු යැවීම ද කළ හැකි බව අත්දැකීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න.
- මේ සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

  සිසුන් කණ්ඩායම් කර දුරකථන, ගුවන් විදුලි, රූපවාහිනී යනාදියෙහි ආකෘති සකස් කිරීමට යොමු කරන්න. එම ආකෘති භාවිත කරමින් සිසුන්ගේ තොරතුරු කිහිපයක් හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

  මෙහි දී විද්‍යුත් මාධ්‍ය (ගුවන් විදුලිය, රූපවාහිනිය) මගින් තොරතුරු හුවමාරු කර ගැනීම පිළිබඳ ව ද අවධානය යොමු කරන්න.

  මිතුරාගේ සුවදුක් දැන ගැනීම.

  මාමලා බැලීමට ලබන පාසල් නිවාඩුවට එන බව

  උත්සවයට හෙට දින පැමිණිය නොහැකි බව

  මෙවැනි තොරතුරු හුවමාරු කර ගැනීමේ වඩාත් සුදුසු මාධ්‍ය කුමක් දැ යි සාකච්ඡා කරන්න. එවැනි ක්‍රම පිළිබඳ ව තව දුරටත් අත්දැකීම් ලැබීමට පහත ආකාරයේ ක්‍රියාකාරකම්වල සිසුන්ට නිරත වීමට අවස්ථාව ලබා දීම වඩාත් වැදගත් වේ.

  තොරතුරු අන් අයට ලබා දිය හැකි වඩාත් සුදුසු ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කිරීම පමණක් ප්‍රමාණවත් ය.

  උදාහරණ :- ගංවතුර නිසා රත්නපුර ප්‍රධාන මාර්ගය අවහිර වී ඇති හෙයින් ඒ වෙනුවට විකල්ප මාර්ග භාවිත කරන ලෙස ලබා දෙන නිවේදනයක්

  නිදහස් උළෙල වෙනුවෙන් පැවැති චිත්‍ර ප්‍රදර්ශනයේ ජයග්‍රාහී චිත්‍ර පිළිබඳ ව කෙරෙන විස්තරයක්

  සංචාරක කුරුල්ලන් පිළිබඳ ව විස්තර දැක්වෙන ලිපි පෙළක්

  ගුවන් විදුලියෙන් රූපවාහිනියෙන් ප්‍රචාරය වන ආකාරයට සරල ප්‍රවෘත්ති කිහිපයක් ප්‍රකාශ කිරීමට සිසුන් කිහිප දෙනකුට අවස්ථාව දෙන්න.

මේ හැරෙන්නට පන්ති මට්ටමෙන් සිසුන් දැනුවත් කිරීම සඳහා පණිවිඩ නිවේදන හෝ වෙනත් ප්‍රකාශන හෝ කිරීමට ද සිසුන්ට අවස්ථා ලබා දිය හැකි ය.

උදාහරණ :- පන්තිය පිරිසිදු කළේ .....

හෙට පන්තිය පිරිසිදු කරන්නේ .......

ආගමික වතාවත් සඳහා පන්තියෙන් උදවු කළේ

වෙනත් විශේෂ පණිවිඩ තිබේ නම් ඇතුළත් කර ගන්න.

මෙසේ දවසේ කාර්යයන් ඇතුළත් තොරතුරු නිවේදන/පණිවිඩ පන්තියේ දී ඉදිරිපත් කිරීමට සෑම සිසුවකුට ම අවස්ථාව ලැබෙන සේ දෛනික ව කාර්යයන් බෙදා දෙන්න.

ක්‍රියාකාරකම 2

✠ තැපැල් පතක සුබ පැතුම් පණිවිඩයක් නිර්මාණාත්මක ව සකස් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

✠ යහළුවකුගේ උපන් දිනයට වෙසක්, නත්තල් හෝ අලුත් අවුරුද්ද සඳහා හෝ යැවිය හැකි සුබ පැතුම් පතක් සැකසීමට යොමු කරන්න.

- ඝන කඩදාසියක් ගෙන අවශ්‍ය ප්‍රමාණයට කපා සුබ පැතුම් කාඩ්පත සකසා ගන්න. ගැළපෙන චිත්‍ර ඇඳ පාට කර සුබ පැතුම ලියා කාඩ්පත සකසා ගන්න.
- ලියුම් කවරයක් සාදා ගැනීමට යොමු කරන්න. පරණ ලියුම් කවරයක් ගළවා එය සුදු කොළයක් මත තබා ඇඳ ගෙන කපා ගැනීමටත්, අවශ්‍ය පැති ගම් ගා අලවා ගැනීමටත් යොමු කරන්න. සුබ පැතුම් පත කවරයේ දමා අලවා මුද්දර ගසා යහළුවාගේ ලිපිනයට තැපැල් කිරීමට යොමු කරන්න.

✠ සකස් කරන ලද දුරකථන භාවිත කරමින් තම යහළුවකුට පණිවිඩයක් ලබා දෙන අයුරු රඟ පෑමට යොමු කරන්න. සුවදුක් විචාරීමට හා ආචාරශීලී ව හැසීම් දනවන ලෙස දෙබස් උච්චාරණය කරමින් පණිවිඩයක් ලබා දීම කෙරෙහි සැලකිලිමත් වීමට උපදෙස් දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ටෙලිෆෝනයක ආකෘතියක් ඇති තවත් ශිෂ්‍යයකුට එම ඇමතුමට ආචාරශීලී ව පිළිතුරු දීම නිරූපණයට අවස්ථාව ලබා දෙන්න.
- හැකිනම් හැබෑ දුරකථනයක් භාවිත කරන අන්දම පිළිබඳ ව අත්දැකීම් ලබා දෙන්න.

ක්‍රියාකාරකම 3

✠ සතියක කාලයක් තුළ නිකුත් වූ ජාතික පුවත්පත් කිහිපයක් ගෙන්වා ගන්න. සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. පුවත්පත්වල ඇති, සිසුනට යෝග්‍ය වූ ප්‍රවෘත්ති කපා ඝන කඩදාසි/ බ්‍රිස්ටල්බෝඩ් කැබලිවල ඇලවීමට යොමු කරන්න. එසේ ඇල වූ පුවත් කියවා වර්ග කිරීමට පවරන්න.

උදාහරණ :- ආගමික තොරතුරු, විවිධ රටවල තොරතුරු, බඩු මිල ගැන තොරතුරු, යුද්ධය ගැන තොරතුරු, අනතුරු ගැන තොරතුරු ආදී ලෙස

- ඉන් පසු කණ්ඩායම්වල එක ම මාතෘකාවක තොරතුරු එක ගොඩකට දැමීමට උපදෙස් දෙන්න.
- මේ ලෙස වර්ග කළ විට එක කණ්ඩායමකට එක් වර්ගයක ප්‍රවෘත්ති පමණක් ලැබෙන ලෙස වෙන් කර ගත හැකි ය.
- එම කණ්ඩායමට ලැබුණු ප්‍රවෘත්ති දින අනුව අනුපිළිවෙළට තැබීමට උපදෙස් දෙන්න. ඒවා කියවා එම සතිය තුළ වූ සිදුවීම්, තොරතුරු ලෙස ගත හැකි බව හඳුන්වා දෙන්න.
- කණ්ඩායම්වල එදිනෙදා තොරතුරු වාර්තා එක් කොට සතියේ පුවත් නමින් පොතක් හෝ බිත්ති පුවත් පතක් හෝ ලෙස සකසා කියවීමට පහසු තැනක තබන්න.

  විවේක වේලාවන්හි දී එම නිර්මාණය කියවීමට, පරිහරණය කිරීමට, අගය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 4

✠ පන්ති පුස්තකාලයට හෝ පාසල් ප්‍රධාන පුස්තකාලයට හෝ ගොස් තොරතුරු ලබා ගන්නා අන්දම කියා දෙන්න.

- පුස්තකාලයක දී අනුන්ට කරදර නොවන ලෙස හැසිරිය යුතු අන්දම විස්තර කර දෙන්න.
- නිශ්ශබ්ද කියවීම පුස්තකාලයේ දී වැදගත් බව පහදා දෙන්න.
- පැන්සල්/පෑන් හා සටහන් කොළ ගෙන පුස්තකාලයට ගොස් සිසුන් කැමති දෙයක් ගැන කියවා ඒ පිළිබඳ ව කෙටි විස්තරයක් මඟින් හෝ වෙනත් නිර්මාණයකින් හෝ තොරතුරු ඉදිරිපත් කිරීමට පැවරුමක් දෙන්න.
- පන්තියේ සැම දෙනාගේ ම අදහස් එක්කොට පුංචි අපේ පොත නමින් පොතක් ප්‍රකාශයට පත් කිරීමට සිසුන් යොමු කරන්න. එහි නිමාව කෙරෙහි ද අවධානය යොමු කරවන්න. පොත කියවීමට සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 5

✠ පාසල පිළිබඳ හොඳින් දන්නා වැඩිහිටි පුද්ගලයකු පන්තියට කැඳවීම හෝ පන්තියේ සිසුන් වැඩිහිටි පුද්ගලයා වෙත යාම හෝ යන කරුණු දෙකින් වඩා සුදුසු යැ යි තෝරා ගත් ක්‍රමය ක්‍රියාත්මක කරන්න.

- එහි දී වැඩිහිටි පුද්ගලයා පිළිගැනීම පිණිස බුලත් හුරුල්ලක් සුදානම් කර තබන්න.
- වැඩිහිටි පුද්ගලයාගෙන් අසන ප්‍රශ්න මොනවා දැ යි කලින් සාකච්ඡා කර නියම කර ගන්න. ඒ ප්‍රශ්න ඇසීමට හුරුව ලබා දෙන්න.

  උදාහරණ :- අපේ පාසල ගැන ඔබතුමා මොනවද දන්නේ?
  මෙය ආරම්භ වුණේ කොයි කාලයේ ද?
  අපේ පාසලට පැමිණ ඉගෙන ගෙන දියුණු වූ අය ඉන්නවා ද?
  ඒ අය කවු ද?
  අපේ පාසලේ දියුණුවට උදවු දෙන ආයතන තිබෙනවා ද? ඒ මොනවා ද?
  අපේ පාසලේ දියුණුවට උදවු දෙන පුද්ගලයන් ඉන්නවා ද? ඒ අය කවු ද?



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- පාසලේ දියුණුවට අපට යමක් කළ නොහැකි ද? ආදී ලෙස ප්‍රශ්න අසන්න හුරු කරවන්න.
- පටිගත කළ හැකි කැසට් යන්ත්‍රයක් ගෙන්වා ගෙන අමුත්තා හා සිසුන් අසන ප්‍රශ්න හා පිළිතුරු වාර්තා කර ගැනීමට හැකිනම් වඩාත් හොඳ ය.
- නැත්නම් වැඩිහිටි ශිෂ්‍යයකු යොදා දෙබස ලියවිල්ලකින් වාර්තා කරන්න.
- පන්තියේ සිසුන්ට එම දෙබස පිළිබඳ වාර්තා චිත්‍ර සහිත ව ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- දෙබස අවසානයේ වැඩිහිටියාට ස්තුති කිරීමට ශිෂ්‍යයකු හුරු කරවන්න.
- සුළු තේ පැන් සංග්‍රහයක් අමුත්තාට පිළිගැන්වීමට යොමු කළ හැකි නම් වඩාත් හොඳ ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.15 අපේ අතීත විත්ති

අපේ අතීතය පිළිබඳ අවබෝධයක් තිබීම අනාගතය ගොඩ නංවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වෙයි. එම නිසා කුඩා කාලයේ සිට ම සිසුන්ට අපගේ අතීතය පිළිබඳ තොරතුරු ක්‍රමානුකූල ලෙස අධ්‍යයනය කිරීමටත් අගය කළ යුතු දෑ අගය කිරීමටත් මග පෙන්විය යුතු ය. මෙම තේමාව යටතේ තමා ඉගෙන ගන්නා පාසලත්, අවට පරිසරයත් ඇසුරු කර ගෙන අතීත තොරතුරු හැදෑරීමටත් අගය කළ යුතු දෑ හඳුනා ගෙන අගය කිරීමටත් සිසුන් යොමු කිරීම අපේක්ෂා කෙරේ. එසේ ම සිසුන්ගේ හැකියා මට්ටමට අනුව නිරීක්ෂණය ගවේෂණය වැනි ක්‍රම මගින් තොරතුරු හඳුනා ගැනීමට හා සුදුසු පරිදි වාර්තා කිරීමට යොමු කිරීමත් අපේක්ෂා කෙරේ.

නිපුණතා

★ පාසලේ මෑත අතීතයේ සිදු වූ වැදගත් සිදුවීම් පිළිබඳ තොරතුරු විමර්ශනය කර වාර්තා කරයි.
★ අතීතයේ තම පාසල පැවති තත්ත්වය පිළිබඳ තොරතුරු වාර්තා කරයි.
★ පාසලේ අද පවතින තත්ත්වය හා එදා පැවති තත්ත්වය අතර පැවති වෙනස්කම් සංසන්දනාත්මක ව ප්‍රකාශ කරයි.
★ තම ප්‍රදේශයේ පවතින ජන කලා ඇසුරෙන් විවිධ නිර්මාණවල යෙදෙයි.
★ ප්‍රදේශයේ අතීත පුවත් හා සම්බන්ධ කවි, ගී, ගායන, රංගන, කතන්දර ඉදිරිපත් කරයි.
★ අතීතයේ සිට පැවත එන ජන ක්‍රීඩාවක සාමූහික ව නියැලෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ පාසලේ අතීතය පිළිබඳ ව තොරතුරු වැඩිහිටියන්ගෙන් අසා ගෙන ඒමට සිසුන්ට පවසන්න. එම තොරතුරු අවශ්‍ය අවස්ථාවන්හි දී ප්‍රයෝජනයට ගැනීමට තබා ගන්න. පාසලේ අතීතය පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීමට සුදුසු පුද්ගලයකු කැඳවා ගන්න.
- සිසුන්ට ගැළපෙන ආකාරයෙන් තොරතුරු ඉදිරිපත් කළ යුතු ආකාරය පිළිබඳ ව ඔහුව/ඇයව දැනුවත් කරන්න.
- සිසුන්ගේ උනන්දුව වැඩි කිරීම සඳහා හැකි නම් එදා තත්ත්වය පෙන්නුම් කරන ඡායාරූප, පින්තූර, වෙනත් මූලාශ්‍ර ආදිය යොදා ගන්න.
- අමුත්තා පන්තියට පැමිණි පසු පිළිගැනීම, සාකච්ඡාවෙන් පසු ස්තුති කිරීම, වැනි යහගුණ පවත්වා ගැනීමට උත්සාහ කිරීම සුදුසු ය.

සාකච්ඡාව කරන අතරතුර සිසුන් නිදහස් මනසකින් යුතුව ප්‍රශ්න අසමින් තොරතුරු ලබා ගැනීමටත්, නිදහසේ කතා කිරීමටත් සුදුසු වාතාවරණයක් ඇති කිරීම වැදගත් ය. මෙහි දී සිසුන් රැස් කළ තොරතුරු ද ප්‍රයෝජනයට ගැනීමට පුළුවන. මෙම සාකච්ඡාවේ දී ක්‍රියාශීලී ව සවන් දීමටත් (වාචික ව/අවාචික ව) අපේ පාසල යන හැඟීම වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන්න.

සාකච්ඡාවෙන් පසුව කෙටි සටහනක් සකස් කිරීමටත් චිත්‍ර ආශ්‍රයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමටත් සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 2

✠ පාසලේ ආරම්භක අතීතය පිළිබඳ ව වැදගත් වන මූලාශ්‍ර සිහිවටන පුවරු හඳුනා ගන්න

උදාහරණ :- ඡායාරූප, ගොඩනැගිලි, ගස්වැල්, ලේඛන

සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා එම මූලාශ්‍ර එකක් හෝ දෙකක් හෝ අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න. ගොඩනැගිල්ලක් විවෘත කිරීමේ දී සකස් කර ඇති පුවරු මගින් වර්ෂය, විවෘත කළ පුද්ගලයා, උදවු කළ අය, පාසලේ ඇති විදුහල්පතිවරුන්ගේ නාම ලේඛන වැනි දෑ තුළින් අතීතය පිළිබඳ ව ලබා ගත හැකි තොරතුරු හඳුනා ගැනීමට යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මෙම ක්‍රියාකාරකමේ දී ලබා ගන්නා තොරතුරු මෙන් ම, තොරතුරු ලබා ගන්නා සිසුන්ගේ විවිධ හැකියා සංවර්ධනයට ඉඩ ලබා දෙමින් කටයුතු කිරීම වැදගත් ය. මේ හැරෙන්නට පාසලේ අතීතය පිළිබඳ ව දන්නා පුද්ගලයන් හමුවී හෝ පන්තියට කැඳවා හෝ තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන්න.

ක්‍රියාකාරකම 3

✠ පාසලේ එදා පැවැති තත්ත්වය හා අද පවතින තත්ත්වය පිළිබඳ ව සංසන්දනය කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න. මේ සඳහා පාසල එදා පැවති තත්ත්වය පිළිබඳ ව තමා තුළ ගොඩ නැගුණු අදහස් අනුව චිත්‍රයකින් ඉදිරිපත් කිරීමට යොමු කරන්න. අඳින ලද චිත්‍ර ප්‍රදර්ශනය කරමින් ඒ පිළිබඳ තොරතුරු කතා බහ කරන්න.

පාසලේ අද පවත්නා තත්ත්වය

ගොඩනැගිලි

ගුරුවරු සංඛ්‍යාව

ශිෂ්‍ය සංඛ්‍යාව

පාසලේ පවත්නා පහසුකම්

පිළිබඳ ව කතා බහ කරන්න.

එම තොරතුරු ඇසුරු කර ගනිමින් පාසලේ එදා සහ අද තත්ත්වය පිළිබඳ ව සටහන් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න. මේ සඳහා එදා සහ අද තත්ත්වය පිළිබඳ ව පහත සඳහන් ප්‍රධාන කරුණු ඇතුළත් කරන්න.

- ගොඩනැගිලි හා වෙනත් සම්පත්
- ක්‍රීඩා පිටිය
- ප්‍රජාව - ගුරුවරු
- සිසුන්

එම තොරතුරු පිළිබඳ ව කතා බහ කරන්න. තොරතුරු සසඳමින් වෙනස්කම් හඳුනා ගැනීමට සහාය වන්න.

පාසලේ එදා පැවති තත්ත්වය හා අද පවතින තත්ත්වය ආකෘති මඟින් ද ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

මෙහි දී සිසුන් කරන වැඩවල අවසාන ඵලය ම පමණක් නොව සිසුන්ගේ ක්‍රියාවලිය හඳුනා ගැනීමට උත්සාහ කිරීම වැදගත් ය.

ක්‍රියාකාරකම 4

✠ ප්‍රදේශයේ ඇති කලාත්මක නිර්මාණ කිහිපයක් හඳුනා ගැනීම සඳහා චාරිකාවක් සැලසුම් කරන්න. උදාහරණ : අත්කම් භාණ්ඩ, මැටි භාණ්ඩ, ලී කැටයම්, ගල් කැටයම්, පිත්තල වැඩ .... වැනි. සිසුන්ගේ හැකියාවන්ට ගැළපෙන ආකාරයෙන් ඒ පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට යොමු කරන්න. ආදර්ශන චිත්‍ර පින්තූර ද හැකි නම් එකතු කර ගැනීමට යොමු කරන්න.

ඒවා ආශ්‍රයෙන් ආකෘති චිත්‍ර සකස් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :- කැමැති ම දෙයක් පිළිබඳ චිත්‍රයක් ඇඳීම

කැමති ම දෙයක් පිළිබඳ මැටි මාධ්‍යයෙන් ආකෘතියක් සැකසීම

සිසුන්ගේ නිර්මාණවල අවසානය වනුයේ දර්ශනීය බව නොව සිසුන් ඒ සඳහා දරන උත්සාහය අගය කිරීමය. මෙහි දී සිසුන්ගේ නිර්මාණ ඇසුරෙන් ප්‍රදර්ශනයක් පවත්වන්න.

සෑම සිසුවකුගේ ම ක්‍රියාකාරී සහභාගිත්වය අගය කිරීම වැදගත් ය. ක්‍රියාකාරකම් තුළින් සිසුන්ට පරාජිත බව අත්විඳීමට ඉඩ ප්‍රස්තා නොතබන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 5

- ප්‍රදේශයේ පවත්නා ප්‍රදේශයට ආවේනික ජන කතා, ජන ගී, රංගන කිහිපයක් සිසුන්ගේ ද සහභාගිත්වය ඇතිව සොයා ගැනීම.
  සොයා ගනු ලබන ජන කවි, ජන කතා, රංගන කිහිපයක් සිසුන් ලවා පන්තියට ඉදිරිපත් කරවීම.
  මෙහි දී සිසුන්ගේ ලැදියාවන් හඳුනා ගෙන ඒ ඒ සිසුන්ගේ විවිධත්වය අනුව ඒවා ඉදිරිපත් කිරීමට අවස්ථාව දීම වඩාත් සුදුසු ය.

ක්‍රියාකාරකම 6

- ප්‍රදේශයේ ඇති ජන ක්‍රීඩා කිහිපයක් හඳුනා ගැනීමට සලස්වන්න.
  මෙම ජන ක්‍රීඩාවල සිසුන්ට වින්දනාත්මක ලෙස යෙදීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  ඒවා අගය කිරීමට ද යොමු කරන්න.
  සිසුන්ගේ පෞද්ගලික විවිධත්වයන් හා රුචිකම් හඳුනා ගෙන ඒ අනුව ක්‍රියාකාරම්වල යෙදීමට උනන්දු කළ හැකි ය.
  පන්තියේ සෑම සිසුවකු ගැන ම අවධානය යොමු කර සෑම දෙනාට ම ඉගෙනුම් අවස්ථා සඳහා සහභාගී කර ගැනීම කෙරෙහි සැලකිලිමත් වීම වැදගත් ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.16 අපේ යහපැවැත්ම

පුරවැසියන්ගේ යහපැවතුම් වඩාත් අර්ථවත් සමාජ ජීවිතයකට හේතු වන බව නිසැක ය. කුඩා කල සිට ම තමා කෙරෙහි ද, අන් අය කෙරෙහි ද සංවේදී ව යහපත් පැවතුම් ඇති කර ගැනීම අනාගතයෙහි වඩාත් යහපත් පැවතුම් ඇති කර ගැනීමට පාදක වෙයි. මෙම තේමාවේ දී තමාට සංවේදී ව යහපැවතුම් ඇති කර ගැනීමෙන් ආරම්භ කර, අන් අය කෙරෙහි සංවේදී ව යහපත් පැවැතුම් ඇති කර ගැනීමට යොමු කෙරේ.

නිපුණතා

★ තමාගේ හා පන්තියේ අනෙක් අයගේ යහපැවැත්ම කෙරෙහි සංවේදී ව කටයුතු කරයි.
★ පාසලට සම්බන්ධ පොදු කාර්යයන්හි දී නිවැරදි චර්යා ප්‍රදර්ශනය කරයි.
★ තමාගේ හා අනෙක් අයගේ යහපැවැත්මට අදාළ පුරුදු අනුගමනය කරයි.
★ තමාගේ හා අන් අයගේ යහපැවැත්මට තුඩු දෙන නිර්මාණවල යෙදෙයි.
★ යහපැවැත්මෙහි අගය අවධාරණය කෙරෙන කවි, ගී ගායන හා රංගනවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ සිසුන් පරිහරණය කරන දේවල් පිළිබඳ ව අවධානය යොමු කිරීමට සලස්වන්න. තමා පරිහරණය කරන දෑ අපිරිසිදු වීමට සහ අශෝභන වීමට හේතු වන පැවැතුම් ගැන සිතා බැලීමට යොමු වන පරිදි සුදුසු ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන්න.
උදාහරණ :-
සිසුන්ගේ පෙළ පොත් තමන් ඉදිරියේ වෙන වෙන ම තබා ගෙන ඒවා දෙස විමසිලිමත් ව බැලීමට සලස්වන්න.

- තමාගේ පෙළ පොත් පිළිබඳ ප්‍රකාශයක් කිරීමට සෑම සිසුවකුට ම අවස්ථාව ලබා දෙන්න.

මගේ පොත් හරි ම ලස්සනට තිබෙනවා.
මගේ පොත්වල කොන් ඇතුළට නැවිලා.
මගේ පොත්වල අයින් කිළිටි වෙලා.
මගේ පොත්වල පිට කවර ගැලවිලා.
මගේ පොත්වල පිට කවරවල එක එක දේවල් ලියලා.

තමන්ගේ පොත්වල අඩුපාඩු කීමට සිසුන් මැලිවන්නට පිළිවන. එහෙත් අවංක ව පොත් ගැන කතා කිරීම අගය කරන්න. තමාගේ පෙළ පොතේ පිරිසිදුකම ගැන කියන සිසුන් සේ ම තමාගේ පොත්වල අඩුපාඩු අවංකව කියන සිසුන් ද ඔවුන්ගේ සැබෑ ප්‍රකාශයන් පිළිබඳ ව එක ලෙස අගය කරන්න. පන්තියේ අපිළිවෙළට ම පොත් භාවිත කරන සිසුවාට වුව ද සිතට අසහනයක් නොවන පරිදි ඔබේ වචන සහ ඉදිරිපත් කිරීම හසුරුවා ගන්න. සිසුන්ගේ ප්‍රකාශ ඇසුරෙන් පොත්වල දැකිය හැකි අයහපත් ලක්ෂණ පිළිබඳ ව පොදු ලැයිස්තුවක් ලෑල්ලේ ගොඩ නගන්න.

අපේ පොත්වල පිටු ගැළ වී ඇත.
අපේ පොත්වල කොන් නැවී ඇත.
අපේ පොත්වල පිටුවල අනවශ්‍ය දේ ලියා ඇත.
අපේ පොත්වල කුණු ගෑ වී ඇත.

- පොත්වල මෙවැනි අයහපත් ලක්ෂණ දැකීමට හේතු වන සිසුන්ගේ අයහපත් පැවතුම් මොනවා දැ යි ප්‍රශ්න කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තම තමන්ගේ එවැනි අයහපත් පැවතුම් පිළිබඳ ව සිතා බැලීමට අවස්ථාව දෙන්න.
තමන්ගේ එවැනි අයහපත් පැවතුම් අවංක ව ඉදිරිපත් කරන සිසුන් අගය කරන්න. ඉතා ම පහසුවෙන් තම අදහස් ඉදිරිපත් කිරීමට පොළඹවන්න.
උදාහරණ :-

මම කලබලයෙන් බෑගයට පොත් දමන නිසා කොන් නැමෙනවා.
මම පිට කොළ ගැළ වූ විට අලුත් පිට කොළයක් දමන්නේ නැති නිසා පොතේ මුල් පිටු ඉරිලා.
මම කිළිටි අත්වලින් පොත් අල්ලන නිසා පොත් කිළුටු වෙලා.
මම පොතේ එක එක දේවල් ලියනවා.
මම පොතේ හැම තැන ම කුරුටු ගාලා.
. . . . . . . . . . . . . . . . . .

- මේ අදහස් ඇසුරෙන් පොත් භාවිතයේ දී අනුගමනය කළ යුතු යහපත් පැවතුම් පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡාවක නිරත වන්න. සිසුන් සියලු දෙනාට අදහස් දැක්වීමට ඉඩ දෙන්න. මෙහි දී පොත් ඉතා ම පිරිසිදු ව සහ සිත් ඇද ගන්නා අයුරින් භාවිත කරන සිසුන් අදහස් දක්වන විට ඔවුන් ද අගය කළ හැකි වේ. සිසුන් දක්වන අදහස් ඇසුරෙන් පොත් භාවිතයේ දී අනුගමනය කළ යුතු යහ පැවතුම් පිළිබඳ පොදු සටහනක් ගොඩ නගන්න.
  උදාහරණ :-
  අපි බෑගයට පොත් දමන විට සැලකිල්ලෙන් දමමු. කොන් නොනැවෙන සේ බෑගයට දමමු.
  අත් අපිරිසිදු වී ඇති අවස්ථාවල දී අත් පිරිසිදු කර ගෙන පොත් භාවිත කරමු.
  පිටකොළය ගැළවී ඇත්නම් වෙනත් පිට කොළයක් දමමු.
  පොත් දෙකට නමා පාවිච්චි නොකරමු.
  පෙළ පොතේ කිසිවක් නොලියමු.
- මෙම සටහන පැහැදිලි ලොකු අකුරෙන් කඩදාසියක ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න. තේමාව ක්‍රියාත්මක වන කාලයේ සති අන්තයක තමාගේ සියලු ම පොත් පිළිබඳ ව විමසා බලා අවශ්‍ය නම් අලුතෙන් පිටකවර දමා හැකි තරම් පිරිසිදු ව අලංකාර ලෙස සකස් කර ගැනීමට සෑම සිසුවෙක් ම යොමු කරන්න. එම සති අන්තයෙන් පසු පාසලේ මුල් ම දිනයේ නැවත සකස් කරන ලද අලංකාර වූ පෙළ පොත් අගය කරන්න. තමන්ගේ පෙළ පොත්වල අඩුපාඩු අවංක ව දැක් වූ නැවත පිටකවර දමා අලංකාර ලෙස සැක සූ සිසුන් විශේෂයෙන් අගය කරන්න.
- තේමාව ක්‍රියාත්මක වූ පසු ද පන්තියේ ප්‍රදර්ශනය වන සටහනට විටින් විට අවධානය යොමු කරමින් පොත් භාවිතයේ යහපැවතුම් පිළිබඳ ව දිරිමත් කරන්න. පෙළ පොත් අපට සපයා දීමට අපේ රටේ සියලු දෙනා දායක වන බවත් ඒවා රැක ගැනීම අපේ යුතුකමක් බවත් අවධාරණය කරන්න.

ක්‍රියාකාරකම 2

✠ ඔබේ උපදෙස් අනුව සැලසුම් කළ භූමිකා රංගන කිහිපයක් සඳහා කල් තබා සූදානම් වීම පිණිස රංගනයට විශේෂ කුසලතා ඇති දරුවන් කිහිප දෙනෙක් යොමු කරන්න.
  උදාහරණ :-
  පාසලට පැමිණීමේ දී හා පාසලෙන් බැහැර ව ගෙදර යාමේ දී අයහපත් පැවතුම් නිසා සිදු වන අනතුරු
  පාසලේ ක්‍රීඩා කරන විට දක්වන අයහපත් පැවතුම් නිසා සිදු වන පීඩා
  පාසලේ/පන්තියේ කසල බැහැර කරන විට සිදු වන අයහපත් පැවතුම් නිසා ඇති විය හැකි අසහනකාරී තත්ත්ව
  එළිමහනකට සිසුන් කැඳවා කල් තබා සැලසුම් කරන ලද භූමිකා රංගන නැරඹීමට අවස්ථා සලසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මෙම භූමිකා රංගන නැරඹීමෙන් පසු පාසලේ පොදු කාර්යයන්හි දී දක්වන වැරදි චර්යා පිළිබඳ කතා බහකට සිසුන් යොමු කරන්න. ඒ සඳහා නිදහස් අදහස් දැක්වීමට අවස්ථාව දෙන්න.

උදාහරණ :-

පාසලට එන විට පාරේ රංචු වශයෙන් ඒම

පාසලේ උදය රැස්වීමේ දී පේළි ඇදට සිටීම

පාසල් ගීය/ජාතික ගීය ගායනා කරන විට සීරුවෙන් නොසිටීම

පාසල අවසාන වන විට ගායනා කරන ආගමික පාඨ නිසි පරිදි ගායනා නොකිරීම හා ඒවාට ගරු සරු වන සේ නොහැසිරීම

පාසලේ කසළ නිසි පරිදි බැහැර නොකිරීම

- මෙම අදහස් පෙළ ගැස්වීමෙන් පසු ඒ ඒ වැරදි චර්යා නිවැරදි කර ගැනීම පිණිස පවත්වා ගත යුතු යහපත් චර්යා පිළිබඳ කතා බහක යෙදෙමින් යෝජනා ලැයිස්තුවක් ගොඩ නගන්න.

  උදාහරණ :-

  අපි දකුණු පසින් එකිනෙකා පසු පස පාරේ ගමන් කරමු.

  පාසල් උදය රැස්වීමේ දී නිවැරදි ව පෙළට සිට ගනිමු.

  ජාතික ගීය හා පාසල් ගීය නිවැරදි ව හැඟීමෙන් ගායනා කරමු.

  පන්තියේ කසළ නිසි තැන, නිසි ලෙස බැහැර කරමු.

  තේමාව ක්‍රියාත්මක වන කාලයෙන් පසුව ද මෙවැනි වැකි සතියට එක බැගින් ප්‍රදර්ශනය කරන්න.

  එම වැකි තුළ ප්‍රදර්ශනය වන චර්යා අනුගමනය කරන්නේ දැයි විමසිලිමත් වන්න. එදිනෙදා ප්‍රදර්ශනය වන නිවැරදි චර්යා ස්ථම්භනය කිරීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම 3

✠ සිය ඇඳුම් පැළඳුම් දෙස විමසිලිමත් ව බැලීමට සිසුන් යොමු කරන්න.

තමාගේ කමිසයේ/ගවුමේ කිලිටි වී අපිරිසිදු වී ඇති තැන් පිළිබඳ ව ප්‍රකාශ කිරීමට සිසුන් යොමු කරන්න.

ඇඳුම්වල එවැනි තැන් වැඩිපුර කිලිටි වී ඇත්තේ ඇයි?

ඒවාට හේතු වී ඇති ඔබේ අයහපත් පුරුදු හඳුනා ගන්නට පුළුවන් ද?

මේ ගැන සිතා බලා අදහස් දැක්වීමට යොමු කරන්න.

මගේ කොලරයේ කෙලවර අපිරිසිදු වී ඇත්තේ මා සමහර වෙලාවට ඒ කෙළවර සපන නිසයි.

මගේ කමිස අතේ තිබෙන පැල්ලම, මම කමිස අතින් නහය පිසදමන නිසයි.

මගේ ගවුමේ පහත පැල්ලමක් ඇත්තේ සෙල්ලම් කර මුහුණ සෝදා ගවුමෙන් පිහින නිසයි.

මේ ආකාරයට ඇඳුම් පැළඳුම් පිරිසිදු ව තබා ගැනීම සඳහා අත්හළ යුතු වැරදි පුරුදු පිළිබඳ ව කතා බහක යෙදෙන්න.

- තමා පරිහරණය කරන අනෙකුත් ඇඳුම් පැළඳුම් ගැන විමසිලිමත් වී ඒවා නිසි ලෙස පවත්වා ගැනීම සඳහා අත් හළ යුතු වැරදි පුරුදු පිළිබඳ ව සංවාදයක යෙදෙන්න.
- තේමාව ක්‍රියාත්මක වන කාලයේ සති අන්තයක තමාගේ ඇඳුම් සෝදා ගැනීමට යොමු කරන්න.

  මේ පිළිබඳ දෙමාපියන් දැනුවත් කර දරුවන්ට ඇඳුම් සෝදා ගැනීමට නිසි අවස්ථා සලස්වන්න.

  මෙසේ සේදීමේ දී තමාගේ වැරදි පුරුදු නිසා අපිරිසිදු වූ ස්ථාන පිරිසිදු කර ගැනීමට අවශ්‍ය බව අවධාරණය කරන්න.

  ඇඳුම් සේදූ සති අන්තයෙන් පසුව ඇඳුම් සෝදා ගැනීමේ අත්දැකීම් ප්‍රකාශ කිරීමට සෑම සිසුවකුට ම අවස්ථාව දෙන්න. විශේෂයෙන් අපිරිසිදු වූ තැන් පිරිසිදු කිරීමේ අත්දැකීම් මතු කිරීමට යොමුවන්න. අවසානයේ මේ පිළිබඳ කතා බහක යෙදෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- කතා බහේ දී මතු කළ යුතු කරුණු :
  අපේ ඇඳුම් පැළඳුම් විශේෂයෙන් අපිරිසිදු වීමට අපේ වැරදි පුරුදු හේතු වේ.
  වැඩියෙන් කිලිටි වූ තැන් පහසුවෙන් පිරිසිදු කර ගත නොහැක.
  අපට නිල ඇඳුම් ලබාදීමට රටේ සෑම පුරවැසියකුගේ ම දායකත්වය ලැබේ.
  පාසල් නිල ඇඳුම පිරිසිදු ව ක්‍රමානුකූල ව ඇඳීම අපේ යුතු යුතුකමකි. නොමිලේ ලැබෙන අපට නිල ඇඳුම් ලබා දුන් අයගේ සතුට සඳහා එය අපෙන් ඉටු විය යුතු යුතුකමකි.
- අවසානයේ ඉහත කතා බහට ලක් වූ වැරදි පුරුදු ඉවත් කර ගෙන, අනුගමනය කළ යුතු නිවැරදි පුරුදු පිළිබඳ සාකච්ඡාවකට යොමු කරන්න. ඒ සඳහා යෝජනා පෙළ ගස්වන්න. පාසලේ දී පමණක් නොව ගෙදර දී ද අනුගමනය කළ යුතු නිවැරදි පුරුදු යෝජනා කිරීමට මග පෙන්වන්න. ඒවා ලැල්ලේ ලියා පෙළ ගස්වන්න.
  උදාහරණ :-
  අපි අත්, පා, කර, නාසය, මුඛය ආදිය පිසදා ගැනීමට අත් ලේන්සුවක් භාවිත කරමු.
  කෑම ගැනීමට පෙර අත් සෝදා ගනිමු.
  කිවිසුම් යන විට අතේ ලේන්සුවකින් නාසය ආවරණය කරමු.
  දුවිලි තිබෙන තැන් පිරිසිදු කරන විට නාසයට වැස්මක් යොදා ගනිමු.
  තේමාවෙන් පසුව ද යහපත් පුරුදු පවත්වා ගැනීම අගය කරන්න. ස්ථම්භනය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 4

✠ යහපැවැත්මට තුඩු දෙන නිර්මාණ පිළිබඳ ව සාකච්ඡා කරමින් එවැනි නිර්මාණ සඳහා සිසුන් පොළඹවන්න.
  උදාහරණ :-
  තමන්ගේ ද අනුන්ගේ ද යහපැවැත්ම සඳහා කරනු ලබන කටයුතු ලිවීමට භාවිත කෙරෙන හොඳ වැඩ පොත අලංකාර කිරීම සඳහා සුදුසු පිටකවරයක් නිර්මාණය
  යහපැවැත්මට තුඩු දෙන යෝජනා සහිත බිත්ති සැරසිල්ලක් සැකසීම
  තමාට උපකාරයක්/පිහිටක් වූ අන් අයකුගේ යහපැවැත්ම අගය කිරීම සඳහා ස්තුති කිරීමේ කාඩ්පත් සැකසීම.
  යහපැවැත්මට තුඩු දෙන නිවැරදි චර්යා සහ යහපුරුදු අවධාරණය කෙරෙන පෝස්ටරයක් සැකසීම.
  පන්තියේ කුණු නොදිරන හා දිරන ලෙස වෙන් කර බැහැර කිරීම සඳහා වර්ණ දෙකක් භාවිත කරමින් කසල බැහැර කිරීමේ බඳුන් නිර්මාණය කිරීම ඒවා පළමුවන හා දෙවන ශ්‍රේණියේ පන්තිවලට ත්‍යාග වශයෙන් දීම.

ක්‍රියාකාරකම 5

✠ යහපැවැත්ම අවධාරණය කෙරෙන සරල පද්‍ය කිහිපයක් නිර්මාණය කිරීමට යොමු කරන්න. ඒවා විරිතකට අනුව ගායන කිරීමට සිසුන්ට මග පෙන්වන්න.
  උදාහරණ :-

  පාර දිගේ පරිස්සමෙන් පාසල් යන්නයි
  පමා නොවී උදෙන් ම පන්තිය අමදින්නයි
  යහළු යෙහෙළි හැම දෙනා ම උදවු කරන්නයි
  මගෙ පාසල් මෑණියන්ට පහනක් වන්නයි

  යහපැවැතුම්වල අගය දැක්වෙන භූමිකා රංගන කිහිපයක් යෙදීමට කණ්ඩායම් වශයෙන් පන්තියේ සිසුන් යොමු කරන්න.
  උදාහරණ :-

  පාසලට එන සිසුන් විසින් මග දී වියපත් අයකුට පාර හරහා යාමට උදවු වීම සහ එයට තුති ලැබීම.

ක්‍රීඩා කරන විට ආබාධයකට ලක් වන අයෙකු ඔසවා ගෙන ප්‍රථමාධාර ලබාදීම සහ සුවපත් වූ පසු උදවු කළ අයට ස්තුති කිරීම.
කණ්ඩායමක් ගමනක් යන විට ආහාර ඇති අය විසින් ආහාර නැති අයට කොටසක් දී ආහාර ගැනීම හා ආහාරයෙන් පසු ව ආහාර දුන් අයට ස්තුති කිරීම.
දිරන හා නොදිරන කසල මිශ්‍ර කර විසි කිරීමේ විපාක සහ එය නිවැරදි කර දිරන හා නොදිරන වශයෙන් බෙදා බැහැර කිරීම ඇගයීම.
වැරදි පුරුදු තිබීම නිසා තම කමිසයේ ගවුමේ විශේෂයෙන් අපිරිසිදු වන තැන් ඇති අයකු සහ එය නිවැරදි කර ගැනීම පිණිස මිතුරන් විසින් මග පෙන්වීම.

- සිසුන්ගේ එදිනෙදා ජීවිතයට සම්බන්ධ යහපැවැත්ම අවධාරණය කෙරෙන රංගනවලට කණ්ඩායම් වශයෙන් යොමු කර සෑම රංගනයකින් ම මතු වූ යහපැවතුම් අවධාරණය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව - තුන්වන ශ්‍රේණිය

සිසුන්ගේ නම

තක්සේරු කිරීමේ පරිමාණය
සාර්ථකව කරයි ✓
දුෂ්කරතා පෙන්නුම් කරයි/
තව දුරටත් උදවු අවශ්‍යයි •

| | | |
|---|---|---|
| 1. | පරිසරයේ ඇති පැළෑටි හා ගස්වැල් කිහිපයක් නම් කරයි. | පැළෑටි හා ගස්වැල් |
| 2. | ශාක පත්‍රයක ඇති සුවිශේෂ ලක්ෂණ ගවේෂණය කර වාර්තා කරයි. | |
| 3. | ශාකයක කොටස් නිරීක්ෂණය කර විස්තර කරයි. | |
| 4. | ගස්වැල්වල පැවැත්මෙහි ඇති වැදගත්කම අගය කරයි. | |
| 5. | ගෙදර ඇති කරන සතකුගේ හැසිරීම් රටාවක් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | අප අවට සිටින සත්තු |
| 6. | සතුන්ගෙන් මිනිසා ලබන ප්‍රයෝජන විමර්ශනය කර වාර්තා කරයි. | |
| 7. | නිවසේ ඇති කරන සතුන් රැක බලා ගැනීමට කළ යුතු දේ මොනවා දැයි ප්‍රකාශ කරයි. | |
| 8. | සත්ත්ව චර්යා විදහා දැක්වෙන ගායනා හා රංගන ඉදිරිපත් කරයි. | |
| 9. | එදිනෙදා පරිහරණයට සුදුසු සරල භාණ්ඩයක් නිර්මාණය කරයි. | අප පරිහරණය කරන දේ |
| 10. | අදාළ කාර්යයට උචිත සරල මැහුම් හා ගෙතීම් කරයි. | |
| 11. | මිශ්‍ර ආහාර වේලක අඩංගු විය යුතු දේ මොනවා දැයි ප්‍රකාශ කරයි. | අපේ ආහාර |
| 12. | ආහාර තෝරා ගැනීමේ දී ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම සඳහා කළ යුතු දේ ප්‍රකාශ කරයි. | |
| 13. | මිශ්‍ර ආහාර වේලක් ගැනීමේ ඇති වැදගත්කම ප්‍රකාශ කරයි. | |
| 14. | ආහාර ගැනීමේ දී අනුගමනය කළ යුතු පුරුදු හා සිරිත් විරිත් පිළිපදියි. | |
| 15. | ශ්‍රී ලංකාවේ සිටින විවිධ ජන කොටස් නම් කරයි. | අපි ලක්වැසියෝ |
| 16. | ශ්‍රී ලාංකික ජන කොටස්වලට අයත් උත්සව පිළිබඳ මූලික තොරතුරු ප්‍රකාශ කරයි. | |
| 17. | නිවසේ දී/පාසලේ දී සිදු විය හැකි අනතුරු හා ඒවායින් වැළකීමට කළ යුතු දේ ප්‍රකාශ කරයි. | ආරක්ෂාව හා පරිස්සම |
| 18. | බෝවන රෝගවලින් වැළකී සිටීමට තමාට කළ හැකි දේ ප්‍රකාශ කරයි. | |
| 19. | විවිධ දේ ජලයේ ක්‍රියාකරන ආකාරය නිරීක්ෂණය කර අත්දැකීම් ප්‍රකාශ කරයි. | ජලය |
| 20. | තමාගේ පාසලට ජලය ලැබෙන ආකාරය විස්තර කරයි. | |
| 21. | ජලය ස්වභාවික සම්පතක් ලෙස අගය කරමින් එහි ප්‍රයෝජන විස්තර කරයි. | |
| 22. | සිසුන් පාසලට එන ආකාරය විස්තර කරයි. | ගමනාගමනය |
| 23. | ගමන් බිමන් යාමට මිනිසුන් යොදා ගන්නා ක්‍රම ප්‍රකාශ කරයි. | |
| 24 | පාරේ ගමන් කරන්නන් විසින් අනුගමනය කළ යුතු නීති රීති පැහැදිලි කරයි. | |
| 25. | වාහනවලින් පරිසරයට වන හානි මොනවා දැයි ප්‍රකාශ කර ඉන් එක් අහිත කර බලපෑමක් අවම කර ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කරයි. | |
| 26. | කණ්ඩායම් වශයෙන් පාසල් ගෙවත්තේ බෝගයක් සිටුවා හොඳින් රැක බලා ගනියි. | ගෙවත්ත |
| 27. | ඇට සිටුවීම මගින් දඬු සිටුවීම මගින් පැළ ලබා ගත හැකි ආකාරය විස්තර කරයි. | |
| 28. | බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම ඉදිරිපත් කර ගෙවතු වගාවේ ඇති වැදගත්කම කරුණු වශයෙන් ප්‍රකාශ කරයි. | |
| 29. | එදිනෙදා වැඩ පහසුවෙන් කර ගැනීමට උදවු වන උපකරණ නම් කරයි. | වැඩ පහසු කිරීමේ මං |
| 30. | වැඩ පහසු කර ගැනීම සඳහා අතීතයේ භාවිත කළ ක්‍රම හා වර්තමානයේ භාවිත කරන ක්‍රම සසඳමින් වෙනස්කම් ප්‍රකාශකරයි. | |
| 31. | අන් අය සමඟ ප්‍රියජනක ලෙස කතා බහ කරයි. | මිනිස් හැසිරීම් |
| 32. | සුළඟ නිසා පරිසරයේ සිදුවන වෙනස්කම් කිහිපයක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | පොළොව හා අහස |
| 33. | වැස්සට පෙර, වැසි වසින හා වැස්සට පසු පරිසරයේ දැකිය හැකි ලක්ෂණ කිහිපයක් විස්තර කරයි. | |
| 34. | පාසල් භූමිය නිරීක්ෂණය කර භූමියේ ස්වභාවය විස්තර කරයි. | අපට කළ හැකි වෙනස්කම් |
| 35. | පන්තියේ/පාසලේ සිදු කරන යහපත් වෙනස්කම් සඳහා මිතුරු/මිතුරියන් එක් ව කටයුතු කරයි. | |
| 36. | තොරතුරු හුවමාරු කර ගැනීමේ විවිධ ක්‍රම මොනවා දැයි ප්‍රකාශ කරයි. | මිනිසා හා තොරතුරු |
| 37. | තොරතුරු හුවමාරු කර ගැනීමේ දී අන් අයට හිරිහැර නොවන චර්යා පවත්වා ගනියි. | |
| 38. | පාසලේ අතීතයේ පැවති තත්ත්වය හා වර්ථමාන තත්ත්වය සසඳමින් වෙනස්කම් කිහිපයක් ප්‍රකාශ කරයි. | අපේ අතීත විත්ති |
| 39. | පාසලට සම්බන්ධ ව පොදු කාර්යයන්හි දී නිවැරදි චර්යා ප්‍රදර්ශනය කරයි. | අපේ යහපැවැත්ම |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 3.0 ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

හැඳින්වීම

පළමුවන ප්‍රධාන අවධියේ දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි භාවිත කිරීම පිළිබඳ ව සරල අත්දැකීම් ලබා ඇති සිසුන් තව දුරටත් ඒ ඔස්සේ යොමු කරමින් සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි භාෂාව යොදා ගන්නා ආකාරය පිළිබඳ අත්දැකීම් ලබා දීම දෙවන ප්‍රධාන අවධියෙහි දී ද අපේක්ෂා කෙරේ. පළමුවන හා දෙවන ශ්‍රේණිවල දී තනි වචන, වචන යුගල, විධාන, ආශීර්වාද, වාක්‍යාංශ හා ඉතා කෙටි වාක්‍ය භාවිතයට හුරු වූ ඔවුහු තුන්වන හා හතරවන ශ්‍රේණිවල දී ඉංග්‍රීසි වාක්‍ය භාවිත කරන හා තේරුම් ගන්නා ආකාරය පිළිබඳ ව වැඩිදුරටත් හුරුවක් ලබති.

මෙම කාර්යය පළමුවන හා දෙවන ශ්‍රේණිවල දී කරන ලද ක්‍රියාකාරකම්වලට වඩා තරමක් සංකීර්ණ ක්‍රියාවලියක් බව පෙනී යයි. මේ අවධිය වන විට තුන්වන ශ්‍රේණියේ දී ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයකු පැමිණ ක්‍රමවත් ව ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට පටන් ගෙන ඇත.

තුන්වන ශ්‍රේණියේ සිට ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩසටහන ක්‍රියාත්මක වන්නේ, ඉංග්‍රීසි භාෂාව විෂය නිර්දේශයකට අනුව ඉගැන්වීමට සමගාමීව ය. මේ නිසා ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩ සටහන සඳහා ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාගේ සහාය වඩාත් පුළුල් ව ලබා ගැනීමේ අවශ්‍යතාවක් පන්තිය භාර ගුරුවරයාට ඇති වනු ඇත. එනිසා ගුරුවරුන් දෙදෙනා අතර ඇති වන අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගය මත මෙම වැඩ සටහනේ සාර්ථකත්වය රඳා පවතී.

තනි සරල වාක්‍ය වශයෙන් අසන්නට ලැබෙන ඉංග්‍රීසි තේරුම් ගැනීමටත්, ඒ ආකාරයට ම තම අදහස් සරල ඉංග්‍රීසි වාක්‍යවලින් ප්‍රකාශ කිරීමටත් හැකියාව සිසුන්ට ලබා දීම මෙම අවධියේ දී අපේක්ෂා කෙරේ.

මේ සඳහා අවස්ථා තුනක දී සිදු කරනු ලබන ක්‍රියාකාරකම් යොදා ගත යුතු වේ.

1. පන්තියට පැමිණෙන ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා විසින් ඉංග්‍රීසි භාෂාව සඳහා වෙන් කොට ඇති කාල පරිච්ඡේදවල දී විෂය නිර්දේශයට අනුව ඉංග්‍රීසි භාෂාව උගන්වනු ලැබේ.

2. පළමුවන ප්‍රධාන අවධියේ දී මෙන් ම පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ගණිත විෂයට අදාළ කාලය හා විවේක කාලය ප්‍රයෝජනයට ගනිමින් පන්තිය භාර ගුරුවරයා විසින් සිසුන්ට ඉංග්‍රීසි කතා කරන්නටත්, අසන්නටත් අවස්ථාව ලබා දෙයි.

3. මේ සියල්ලට ම අමතර ව සිසුන්, පන්තිය භාර ගුරුවරයා සහ ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා සහභාගී වෙමින් සතියකට වරක් පවත්වනු ලබන සංවාද වැඩසටහන තුන්වන ශ්‍රේණියේ දී හඳුන්වා දෙනු ලබන අලුත් අංගයකි.

- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් පාඩම ආශ්‍රයෙන් ගොඩ නඟා ගනු ලබන ක්‍රියාකාරකමක් මත සංවාදය පැවැත්වේ. සම්පූර්ණයෙන් ඉංග්‍රීසි භාෂාව භාවිත කරමින් ද, ක්‍රියාකාරකම් හා විනෝදජනක ක්‍රීඩා යොදා ගනිමින් ද මෙම අංගය ගොඩ නැඟිය යුතු වේ. මේ සඳහා සතියකට වරක් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයට අයත් කාල පරිච්ඡේදවලින් එකක් වෙන් කර ගත යුතු වේ.

- ඉහත සඳහන් සංවාද වැඩසටහන සඳහා තෝරා ගන්නා කාල පරිච්ඡේදය පන්තිය භාර ගුරුවරයාටත් ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාටත් එක විට සහභාගී විය හැකි එකක් විය යුතු ය. කාල සටහන් පිළියෙල කිරීමේ දී විදුහල්පතිවරයාගේ විශේෂ අවධානය මේ සඳහා යොමු විය යුතු ය.




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- මෙම වැඩසටහනේ දී ලිවීම කියවීම පාඩම් කරවීම ආදිය නොකළ යුතු ය. ඒ වෙනුවට කිසියම් ක්‍රියාකාරකමක් ආශ්‍රයෙන් ශිෂ්‍යයන් හා ගුරුවරුන් දෙදෙනා අතර සරල සංවාද ගොඩ නැගිය යුතු ය. එක වාක්‍යයක් කිහිපවරක් පුනරුච්චාරණය කරවීම මගින් සිසුන්ගේ හැකියා තහවුරු කර වන පරිදි සංවාද සැලසුම් කිරීම ඉතා වැදගත් ය. මෙහි අන්තර්ගත වන වචන සහ වාක්‍ය ඛණ්ඩ සියල්ලක් ම භාවිත කිරීම අවශ්‍ය නොවේ. සුදුසු අවස්ථාවන්හි දී ඊට අදාළ වචන හා වාක්‍ය ඛණ්ඩ යොදා ගැනීමට නිදහස ඇත.

- මෙහි දී යොදා ගන්නා වාග්මාලාව, තුන්වන ශ්‍රේණියේ සිසුන්ට තේරුම් ගත හැකි පරිදි හා කතා බහ කළ හැකි පරිදි සරල වචන තෝරා ගෙන සකස් කර ගත යුතු වේ. පළමුවන හා දෙවන ශ්‍රේණි ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල අඩංගු ඉංග්‍රීසි වාක්‍යාංශ, වාක්‍ය, විධාන, ඉල්ලීම් හා සුබ පැතුම් ආදිය මෙහි දී යොදා ගත හැකි ය. හඳුනා ගත් ඉංග්‍රීසි වාක්‍ය රටාවක් පන්තියේ දී හා පන්තියෙන් පිටත දී නැවත නැවත භාවිත කිරීම සඳහා දිරි ගැන්වීම ගුරුවරුන් විසින් කළ යුතු ය.

- මෙබඳු ක්‍රියාකාරකමකට සහභාගී වීමට පෙර ඒ සඳහා හොඳින් සූදානම් වී සිටීම අවශ්‍ය වේ. විදුහල්පතිවරයාගෙන් ලැබෙන උපදෙස් අනුව, තුන්වන ශ්‍රේණියේ පන්තිය භාර ගුරුවරයාත්, ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාත් එක් ව පෙර සූදානමෙහි නිරත විය යුතු බවට නිර්දේශ කෙරේ.




නිපුණතා

දෙවන ප්‍රධාන අවධියට පැමිණෙන ශිෂ්‍යයකු සඳහා ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන නිපුණතා සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- සරල වචන ඉංග්‍රීසි වගන්ති භාවිත කරමින් එදිනෙදා ජීවිතයේ සංනිවේදන කටයුතුවල නියැලෙයි.
- එදිනෙදා සංනිවේදන කටයුතුවල දී සරල ඉංග්‍රීසි වචන හා වගන්ති භාවිත කිරීමට කැමැත්තක් දක්වයි.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# ACTIVITY BASED ORAL ENGLISH
# THE VOCABULARY

## Objects in the classroom

chair, cupboard, desk, black board, chalk, bags, books, bottles, register, record book, table, table cloth, duster, posters, eraser, pen, pencil, gum, glue, clay, pictures,calendar ruler, lunch box

## Persons in the school

principal, monitor, captain, security guard, peon, vice principal, teacher, group leader, watcher

## Common places inside the school

art-room, classroom, canteen, dental clinic, corridor, garden, well, gate, fence, dancing-room, shrine, library, office, toilet, playground, music-room, sickroom, staffroom

## Common places outside the school

home, house, market, dispensary, hospital, airport, post office, bus sop, shop, fair, bakery mosque, pharmacy, police station, railway station, temple

## Persons outside the school

brother, sister, father, aunt, doctor, driver, policeman, postman, priest, mother, grandfather, grandmother, nurse, uncle,

## Names of toys

ball, bat, doll, building block, balloon, kite, whistle

## Common food items and drinks

bread, buns, dhal,cakes, beans, butter, cheese, ice cream, chocolate, hoppers, rice and curry, brinjal, potatoes, toffees, biscuits, cabbage, carrot, orange juice, milk, tea, coffee

## Parts of body

eyes, ears, face, nose, arms, hands, legs, fingers, feet, toes, thumb, mouth

## Fruits

mango, pineapple, plantain, papaw, wood apple, lemon, orange, grapes, apple

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

### Vehicles

| |
|---|
| bus, bicycle, car, lorry, train, tractor, aeroplane, helicopter, ship, boat<br>motor cycle, van, cart, jet plane, |

### Common animals , birds and insects

| |
|---|
| dog, cat, crow, hen, elephant, horse, parrot, peacock, ant, spider, bee, goat, crow<br>pigeon, butterfly, mosquito |

### Common flowers

| |
|---|
| rose, sunflower ,shoe-flower, carnation |

### Colours

| |
|---|
| red, blue, white, green, yellow, pink, black, brown, orange, maroon ,violet, purple, gold,silver |

### Numbers

| |
|---|
| one, two, three, four, five, six, seven, eight, nine, ten |

### Natural environment

| |
|---|
| sky, sun, moon, rainbow, wind, river, water falls, trees, flowers, stars, clouds, rain, thunder,<br>sea, beach, lake, animals, lightening, mist, tanks |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

| Theme No | Theme | Suggested Vocabulary |
|---|---|---|
| 01 | Plants Trees and Creepers | plant(s), tree(s), creeper(s),flower(s), leaf(leaves), root(s), trunk(s), branch(branches), bud(s), stalk(s),fruit(s), seed(s) |
| 02 | Animals around us | cat, dog, crow, bird, cow, goat, fish, horn, beak, fin, leg, tail, ears, whiskers, nose, mouth, tongue, antennas |
| 03 | What we use | table, chair, desk, broom, needle, knife, spoon, vase, mammoty, books, pencil, clothes, pocket, hankey, cup, comb, soap, thread |
| 04 | Our Food | rice, coconut, yam, green leaves, carrots, ice cream, brinjals, chocolates, toffees, beans, cabbage, hoppers, bread, buns, cake, butter, cheese, potatoes, breakfast, lunch, dinner, tea, dhal, biscuits |
| 05 | We are Sri Lankans' | national anthem, national flag, Sinhalese, Muslims, Burghers, national dress, shirt, trouser, cap, hat, uniform, motherland, festival |
| 06 | Safety and Protection | accident, fall, climb, slip, wound, scratch, split, break, crack, careful, hand, eye, electricute, malaria, dengue, mosquito |
| 07 | Water | water, wash, bathe, tank, well, pool, pond, tap, water fall, soak, float, dissolve, sink, mix |
| 08 | Transport | bus, three wheeler, mortar cycle, bicycle, van, car, traffic lights, road, road rules, walk, right side, left side, signals, train, dust, nose, colour lights |
| 09 | Home Garden | garden, home garden, curry leaves, small, big, yam, green, sweet potatoes, fruits, gotukola, grow, spinach, mangoes, papaw, seeds, nursery, fresh, pots, tomato, banana |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

| | | |
|---|---|---|
| 10 | Ways of making work easy | animals, hammer, screwdriver, player, cart, hole puncher, stapler machine, pencil sharpener, tool, sharpen, make holes, fix, cut, hold, wire, nails, plough, pull |
| 11 | Human Behaviors | think, like, dislike, thank you, please, let's, shall we…., good, beautiful, disturb, listen, kind, scold, hurt |
| 12 | Earth and Sky | hill, mountain, wind, blow, flat, land, rain-drops, cloud, light, water, floods |
| 13 | Changes we can do | change, decorate, saying, unite, pictures, paint, display board, playground, clean, weed |
| 14 | Man and Information | letter, whisper, telephone, papers,card, mime, radio, television, post, christmas, call, birthday |
| 15 | Our Past | history, building(s), teacher(s), old, few, new, many, now, students, number, playground, welcome, society, (stone carvings, timber carvings) |
| 16 | Our Good Behavior | beautiful, careful, bend, roll, torn, dirty, clean, care, bag, book(s), write, line, litter, right, cover, card, thank you |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

**CLOSSROOM LANGUAGE**

## Greetings and wishes

Good morning
Good afternoon
Good evening
Good bye
Good luck
All the best
Happy birthday
Happy new year
Merry Christmas

## Requests

May I come in/go out/go home?
May I go to the toilet/canteen?
Silence please
Listen to me please
Hurry up please
Be quiet
Be careful
Please do your home work
Please come to school every day
Tell your parents…
Go home straight
Don't shout please
Please try to be clean/be good
Please think about others
Please sit down/open your book

## Simple commands

Hands up/down,
Run, jump, start, stop,
clap your hands
look at me
form a line/circle
don't go out
Get ready
Come here
Go there (out)
Bring (your book)

## Praising

good
very good
well done
That's right
I like it
Good work
Excellent
Keep it up
Very well

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## Polite forms

Thank you
Please excuse me
I am sorry
Can I help you
Could you please/bring me the duster/ some chalk
Please take this to the office/to your parents
Be good to bring me the register
Please give me a pencil/ruler/pencil sharpner
How are you?
Take care
Look after your self
Do me a favor please
Please sit down/stand up/go out/come here/be silent

## Simple question forms

Who is shouting?
What's this?
What's that?
What's it?
Are you ready?
Is this yours?
Is it a ………..?
What do you like?
Where are you going?

### Simple answer forms

This is my…..
I have got a …/ I've got a …
It's….
I am going to the….
At night I….
Here it is.

I am hungry.
I am thirsty.
I am reading a book.
I am drinking water.
I am going out/coming to the class

I will come tomorrow.
I will bring flowers.
I will sweep the class room/clean the blackboard

I want to write.
I want to sing.
I want to dance.
I want to play

### Simple suggetions

Let us go home.
Let us go out.
Let us sing a song.
Let us go to the playground

Shall we get ready?
Shall we go to the playground?
Shall we start the game?
Shall we wash our hands?
Shall we sing a song?
Shall we pluck flowers?
Shall we stop now?

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

Big
Clock
Coin
Compare
Count
Eight
Equal
Finish
Five
Four
Game
High
Little
Mathematics
Nine
Number
One
Order
Red
Ruler
Seven
Short
Six
Size
Small
Tall
Ten
Three
Two

Order
Ordering
Pattern
Add
Digit
Two Digits
Subtract
Multiply
Divide
Balance
Time
Hour
Minutes
Clock
Date
Day
Month
Year
Ruler
Length
Meter
Weight
Kilogram
Gram
Volume
Litre
Millilitre

හැඳින්වීම

තුන්වන ශ්‍රේණියේ සිසුන් සඳහා අවස්ථා තුනක දී ඉංග්‍රීසි භාෂාව ඉදිරිපත් කෙරේ. එම අවස්ථා වන්නේ,

1. පළමුවන හා දෙවන ශ්‍රේණිවල දී මෙන් පන්තිය භාර ගුරුවරයා විසින් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිත විෂයයේ දී පාඩම් සමඟ වාචික ඉංග්‍රීසි භාවිත කිරීම.
2. මෙම ශ්‍රේණියේ සිට ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයකු විසින් ඉංග්‍රීසි විධිමත් ව ඉගැන්වීම.
3. පන්තිය භාර ගුරුවරයා, ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා සහ සිසුන්ගේ සහභාගිත්වයෙන් කෙරෙන සංවාදාත්මක ඉංග්‍රීසි වැඩසටහන යනුවෙනි.

සතියකට වරක් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය සඳහා වෙන් වූ වේලාවෙන් තෝරා ගත් කාල පරිච්ඡේදයක් සංවාදාත්මක වැඩසටහන සඳහා යොදවා ගැනීමට යෝජනා කර තිබේ. මේ සඳහා විදුහල්පතිවරයාගේ සහයෝගය ද ලබා ගෙන ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාට මේ වැඩසටහන සඳහා සතියකට වරක් පන්තියට පැමිණීමට හැකි වන පරිදි කාල සටහන සකස් කර ගැනීම අපේක්ෂිත ය. සිසුන් සමඟ මිත්‍රශීලී ව කටයුතු කරමින් මේ කාලය තුළ ඔවුන්ගේ ඉංග්‍රීසි භාවිතය පිළිබඳ නිපුණතාව වැඩි දියුණු කිරීමට ගුරුවරුන් දෙදෙනා කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

* සිසුන් ඉංග්‍රීසි භාෂාව වාචික ව භාවිත කරන විට ඊට සවන් දීමටත්, තමන් ද එම භාෂාව යොදා ගෙන කතා කිරීමටත් යොමු වීම මෙම වැඩසටහනේ අරමුණයි.
* අදාළ සතියේ හෝ ඊට පෙර සතියේ හෝ උගන්වන ලද පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තේමා අනුසාරයෙන් මෙම සංවාදය ගොඩ නඟා ගැනීම අපේක්ෂා කෙරේ.
* අදාළ සතියේ තමන් විසින් උගන්වන ලද තේමාව පිළිබඳ ව පන්තිය භාර ගුරුවරයා තුළ ඇති අවබෝධය පදනම් කර ගෙන ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා සමඟ එකතුව සංවාද වැඩසටහන සැලසුම් කළ යුතු ය.
* ගුරුවරුන් දෙදෙනාගේ ම දෛනික පාඩම් සැලසුමට එය ඇතුළත් වී තිබීම මෙම වැඩසටහන් සාර්ථක කර ගැනීමට හේතු වේ.
* වැඩසටහන මෙහෙය වන කාලය තුළ පන්තිය භාර ගුරුවරයා ද ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා ද සිසුන් ද යන පාර්ශව තුන ම සංවාදයට සහභාගි වීම අවශ්‍ය වේ.
* තුන්වන ශ්‍රේණිය වන විට පින්තූර භාවිතයට ගත හැකි ය. පින්තූර ඉදිරිපත් කිරීමේ දී ඒවා යටින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් නම් කර තිබීම පහසුවක් විය හැකි ය.

තේමා කිහිපයකට අදාළ ආදර්ශ ඉංග්‍රීසි සංවාද වැඩසටහන් කිහිපයක් ඉදිරි පිටුවලින් ඉදිරිපත් කර ඇත. මෙම වැඩසටහන් ආශ්‍රිත කර ගෙන තවත් එබඳු වැඩසටහන් නිර්මාණය කර ගැනීමට උනන්දු වන්න. කෙසේ වෙතත් සෑම සතියකම මෙබඳු වැඩසටහනක් පැවැත්වීම මඟින් සිසුන්ගේ ඉංග්‍රීසි භාවිතය පිළිබඳ නිපුණතාව වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව සැලකිය යුතු ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තේමාව 01 පැළැටි හා ගස්වැල්

හඳුන්වා දෙන වාක්‍යාංශ

What's | You are
That's | They are
What are

ක්‍රියාකාරකම 1

පන්තියේ ගුරු මේසය මත අතු, කොළ, මල් සහිත මල් පැළයක් පාඩම පටන් ගන්නා අවස්ථාවේ තිබිය යුතුයි.

ඉංග්‍රීසි ගුරුවරයා පැළය පෙන්වා පන්ති භාර ගුරුවරයාගෙන්
Teacher, What is this? කියා අසයි.
පන්ති භාර ගුරුවරයා පැළැටිය අතට ගෙන This's a plant කියයි.
ඉංග්‍රීසි ගුරුවරයා Yes, It's a plant කියයි.
අනතුරු ව ඉංග්‍රීසි ගුරුවරයා පන්ති භාර ගුරුවරයා අත ඇති පැළැටියේ කොළ පෙන්වමින්
Teacher, What are these? කියා අසයි.
පන්ති භාර ගුරුවරයා They are leaves
ඉංග්‍රීසි ගුරුවරයා Yes, they are leaves
ඉංග්‍රීසි ගුරුවරයා They are leaves යන්න කීප වරක් කියයි.

සිසුන් දෙසට හැරී Children, What are these? කියා අසයි.
සිසුන් They are leaves කියයි.

අවශ්‍ය නම් මෙම ප්‍රශ්නය ම කණ්ඩායම්වලින් හා සිසුන්ගෙන් වෙන වෙන ම ඇසිය හැකි ය.

මේ ආකාරයෙන් ම ප්‍රශ්න අසමින්
They are roots
They are branches යන්න භාවිත කළ හැකියි.
තව දුරටත් මෙය, මල්, ගෙඩි ආදිය සඳහා ද භාවිත කළ හැකි ය.
ඊළඟට පන්තියේ එක් එක් කණ්ඩායමට එක් එක් පැළැටිය බැගින් ලබා දී
පළමු ව ඉංග්‍රීසි ගුරුවරයා පැළැටියක කොළ පෙන්වමින්
What are these කියා අසයි.
පන්ති භාර ගුරුවරයා They are leaves කියා අසයි.
අනතුරු ව පන්ති භාර ගුරුවරයා සිසුන්ගෙන්
Chiildren, What are these? කියා අසයි.
සිසුන් They are leaves කියා කියයි.

අනතුරු ව ඒ ඒ කණ්ඩායම්වල එක් ශිෂ්‍යයෙක් කණ්ඩායමේ අනිත් අයට පැළැටියේ අනෙක් කොටස් පෙන්වා ප්‍රශ්න ඇසීමට දිරි ගැන්වීම අවශ්‍ය ය.

පළමු සිසුවා What are these?
කණ්ඩායමේ අනිත් සිසුන් They are flowers
මේ ආකාරයෙන් කණ්ඩායමේ සියලු ම සිසුන්ට ප්‍රශ්නය ඇසීමට හා පිළිතුරු දීමට අවස්ථාව ලබා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 2

ඉංග්‍රීසි ගුරුවරයා Lets draw a plant කියා
චිත්‍රයක් ඇඳීම සඳහා සිසුන් දිරි ගැන්වීම අවශ්‍ය ය.
චිත්‍රය ඇඳීමේ දී Draw the trunk, Then draw branches, Now, draw leaves ආදී වශයෙන් කියන්න.
ඒ සමඟ ම ඒ ඒ පින්තූර පාට කිරීමට සිසුන් යොමු කරන්න.

අනතුරු ව ඉංග්‍රීසි ගුරුවරයා හා පන්ති භාර ගුරුවරයා ඔවුන්ගේ චිත්‍ර පෙන්වා සංවාදය ඇරඹිය යුතු ය.

පළමු ව ඉංග්‍රීසි ගුරුවරයා තම චිත්‍රය පෙන්වයි.
පන්ති භාර ගුරුවරයා What are these කියා අසයි.
ඉංග්‍රීසි ගුරුවරය They are leaves
They are green කියා කියයි.

මේ ආකාරයෙන් ගුරුවරුන් දෙදෙනා තම තමන්ගේ චිත්‍රය ගැන විස්තර කරයි. (මේ ආකාරයට පැළෑටියේ වෙනත් කොටස් හා අදාළ වර්ණ දැක්විය හැකි ය)

අනතුරු ව සිසුන්ට තම තමන්ගේ චිත්‍ර ගැන ඒ ආකාරයෙන් ම ප්‍රශ්න අසන්නටත් පිළිතුරු දෙන්නටත් උනන්දු කරවන්න.

තේමාව 6 ආරක්ෂාව හා පරිස්සම

හඳුන්වා දෙන වාක්‍ය හා වාක්‍යාංශ
Don’t cross
Is coming
Look to the right, look to the left
Now cross
Thank you

ක්‍රියාකාරකම 1 පාර මාරුවීම
පෙර සූදානම
එළිමහන් ස්ථානයක මෙම ක්‍රියාකාරකම සඳහා වඩාත් යෝග්‍ය වේ. තරමක් පළලක් සහිත ව මහා මාර්ගයක් ලකුණු කර ගන්න.
සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. එක් කණ්ඩායමක් විවිධ වාහන හා අනෙක් කණ්ඩායම පාර මාරුවන අදහසින් පාරේ එක් පැත්තක සිට ගෙන සිටිති. පන්තිය භාර ගුරුවරයා ද ඔවුන් සමඟ වෙයි.
ඉංග්‍රීසි ගුරුවරයා පොලිස් නිලධාරියකුගේ භූමිකාව අනුකරණය කරමින් වාහන හසුරුවයි.
පන්තිය භාර ගුරුවරයා සිසුන් හසුරුවයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 2
වාහන වරකට එක බැගින් පාරේ වේගයෙන් යයි.
ඉංග්‍රීසි ගුරුවරයා (පොලිස් නිලධාරියා)
Stop, stop Don't cross
A car is coming
පන්තිය භාර ගුරුවරයා (මගීන් හසුරුවන්නා)
Stop, stop Don't cross
A car is coming

වාහනය ගිය පසු ඉංග්‍රීසි ගුරුවරයා (පොලිස් නිලධාරියා)
Look to the right, look to the left
Look right again
Now cross the road

සිසුහු Thank you කියමින් පාර මාරුවෙයි.

පසු ව ගුරුවරුන් දැක් වූ භූමිකා සඳහා සිසුන් මාරුවෙන් මාරුවට යොදවමින් මෙම රංගනය ඉදිරියට කර ගෙන යන්න.

ක්‍රියාකාරකම 3 ගීත ගායනය
ගුරුවරුන් දෙදෙනා ද ශිෂ්‍යයන් ද සහභාගි වෙමින් සමූහ ගායනයක් ලෙස පහත දැක්වෙන ගීතය ඉදිරිපත් කරන්න. ගායනා කරන අතර අභිනයෙන් දැක්විමට යොමු කරන්න. වර්ණ තුන රතු, කහ, කොළ දැක්වෙන පුවරු සුදානම් කර ගන්නේ නම් පහසු ය.

Stop, says the red light
Go, says the Green
Wait, says the amber one
blinking in hetween
That's what they say
That's what they do
We all must obey them
even the queen

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තේමාව 8 ගමනාගමනය

හඳුන්වා දෙන වාක්‍යාංශ

What's Can I go around

That's You can't

ක්‍රියාකාරකම 1 වාහන හඳුනා ගැනීම

පෙර සූදානම

පන්ති කාමරය තුළ ඉඩ තිබේ නම් එහි හෝ එළිමහන් ස්ථානයක හෝ මෙම ක්‍රියාකාරකමේ යෙදිය හැකිය. සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.

එක් කණ්ඩායමක් වාහන නිරූපණය කරන අතර අනෙක් කණ්ඩායම නිරීක්ෂකයන් වෙයි.

මුල්ම දෙබස ගුරුවරුන් දෙපළ සිදු කරන්න. වාහන නිරූපණය කරන එක් එක් ශිෂ්‍යයා පෙන්වමින්

ඉංග්‍රීසි ගුරුවරයා What's this?

පන්තිය භාර ගුරුවරයා That's /bus/ a lorry

ආදී වශයෙන් කියයි.

වාහන නිරූපණය කරන කණ්ඩායම එක් එක් වාහන වර්ගයේ හඬ අනුකරණය කරමින් ඉදිරියෙන් ගමන් කරයි. එවිට නිරීක්ෂණ කණ්ඩායමේ ශිෂ්‍යයෙක්

What's this? යනුවෙන් අසයි.

අනෙක් සිසුහු

That's train

That's a bus

That's a lorry

ආදී වශයෙන් පිළිතුරු දෙති.

මේ ආකාරයට සැම ශිෂ්‍යයකුට ම ප්‍රශ්න ඇසීමටත්, පිළිතුරු දීමටත් අවස්ථාව සලසන්න.

පසුව කණ්ඩායම් දෙකේ සිසුන් මාරු කර නැවත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

ක්‍රියාකාරකම 2 බසයට ගොඩවීම

පෙර සූදානම

පන්ති කාමරය තුළ ඉඩ තිබේ නම් එහි හෝ එළිමහන් ස්ථානයක මෙම ක්‍රියාකාරකම කළ හැකි ය. සිසුන් කොටස් දෙකකට බෙදන්න. එක් කණ්ඩායමක් බස් රථය. අනෙක් කණ්ඩායම මගීන්ය. බස් රථ කණ්ඩායමේ සිසුන් වෙන ම කැඳවා රහසිගත ව තමන්ගේ ගමනාන්තය දැනුම් දෙයි. You are going to Colombo/Kandy/Matara/Jaffna ආදී වශයෙනි. මගීන් කණ්ඩායමේ සිසුහු බස් රථ බලාපොරොත්තු වෙන් බස් නැවතුම් පොළෙහි ස්ථාන කිහිපයක රොක් වී සිටිති.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

එක් එක් බස් රථය බස් නැවතුමට පැමිණෙයි.
මඟින් අත දිගු කොට බස් රථය නවත්වති.
එක් එක් ශිෂ්‍යයා මෙසේ අසයි.
Can I go to Colombo
Can I go to Kandy?
ආදී වශයෙන් වාහනය අදාළ පරිදි උත්තර දෙයි.
(නිවැරදි ගමනාන්තය සහිත වාහනය නම්)
Yes, get in Plcase යනුවෙන්
(ගමනාන්තය වැරදි නම්)
Sorry, you can't යනුවෙන් ද
ආදී වශයෙනි.

Yes, get in plcase යනුවෙන් පිළිතුරු ලැබුණු විට මගියා වාහනය පදවන ශිෂ්‍යයාගේ කර අල්ලාගෙන ඒ පිටුපසින් ගමන් අරඹයි. මේ ආකාරයට දම්වැලක් සෑදීමට ඉඩ ඇත. සියලු ශිෂ්‍යයන් බස්වලට ගොඩ වන තුරු ක්‍රීඩාව පවත්වා ගෙන යා හැකි ය.
පසුව වාහන කණ්ඩායම හා මගී කණ්ඩායම මාරු කර මෙම ක්‍රියාකාරකමෙහි නැවත යොදවන්න.

ආදර්ශ ක්‍රියාකාරකම 3 ගීත ගායනය
ගුරුවරුන් දෙදෙනා ද ශිෂ්‍යයන් ද සහභාගි වෙමින් සමූහ ගායනයක් ලෙස පහත දැක්වෙන ගීතය ඉදිරිපත් කරන්න. ගායනා කරන අතර අභිනයෙන් දැක්වීමට යොමු කරවන්න.
ගීතය
The wheels on the bus
The wheels on the bus go round
and round
round and round //

The wheels on the bus go round
and round

All day iong

(සම්පූර්ණ ගීතය සඳහා Developing Resources for primary - Amanda Cant, 29 පිටුව බලන්න)

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 4.0 දෙවන ජාතික භාෂාව (දෙමළ) - විෂය නිර්දේශය

නිපුණතාව

* තම පාසලේ පිහිටීම අන් අයට නිවැරදි ව ප්‍රකාශ කරයි.

    பாடசாலையின் பெயர்
    පාඩසාලෛයින් පෙයර්
    பாடசாலையின் இடம்
    පාඩසාලෛයින් අමෛයින්දුල්ල ඉඩම්

නිපුණතාව

* නිතර සම්බන්ධතා පවත්වන පොදු ස්ථානවල නම් ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| பாடசாலை | පාඩසාලෛ |
| கடை | කඩෛ |
| வைத்தியசாலை | වෛත්තියසාලෛ |

නිපුණතාව

* එදිනෙදා පන්ති කාමරයේ දී ලැබෙන විධානවලට ප්‍රතිචාර දක්වයි.

| | |
|---|---|
| எல்லோரும் உட்காருங்கள் | එල්ලෝරුම් උට්කාරුංගල් |
| அமைதியாக இருங்கள் | අමෛදියාහ ඉරුංගල් |
| வாசியுங்கள் | වාසියුංගල් |
| வரையுங்கள் | වරෛයුංගල් |
| அழியுங்கள் | අලියුංගල් |

නිපුණතාව

* පාසලේ දී තම අවශ්‍යතා සඳහා වූ සුහද ඉල්ලීම් කරයි.

| | |
|---|---|
| எனக்கு ஒரு பேனை தாருங்கள் | එනක්කු ඔරු පේනෛ තාරුංගල් |
| நான் வெளியே போகலாமா? | නාන් වෙලියේ පෝහලාමා? |
| உங்களது புத்தகத்தைத் தருவீர்களா? | උංගලදු පුත්තහත්තෛත් තරුවීර්හලා? |

නිපුණතාව

* පාසලේ දී අමුත්තන් පිළිගෙන සුහද කතා බහේ යෙදෙයි.

| | |
|---|---|
| உள்ளே வாருங்கள் | උල්ලේ වාරුංගල් |
| அமருங்கள் | අමරුංගල් |

නිපුණතාව

* ප්‍රධාන ආහාරවේල් සඳහා ගනු ලබන ආහාරවල නම් භාවිත කරයි.

| | |
|---|---|
| சோறு | සෝරු |
| பாண் | පාන් |
| ரொட்டி | රොට්ටි |
| அப்பம் | අප්පම් |
| இடியப்பம் | ඉඩියප්පම් |
| பிட்டு | පිට්ටු |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව

* තම සමීප පරිසරයේ වැඩෙන මල්වල නම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| செவ்வரத்தை | සෙව්වරත්තෛ |
| மல்லிகை | මල්ලිහෛ |
| சூரியகாந்தி | සූරියකාන්ති |
| அல்லிப்பூ | අළරිප්පූ |

නිපුණතාව

* නිවස ආශ්‍රිත ව දකින සතුන් නිවැරදි ව හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| நாய் | නාය් |
| பூனை | පූනෛ |
| கிளி | කිළි |
| அணில் | අණිල් |
| காகம் | කාහම් |

නිපුණතාව

* ශරීරයේ ප්‍රධාන අවයව නිවැරදි ව ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| தலை | තලෛ |
| கை | කෛ |
| கால் | කාල් |

නිපුණතාව

* පාසලේ එදිනෙදා භාවිත කරන භාණ්ඩ/උපකරණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| மேசை | මේසෛ |
| கதிரை | කදිරෛ |
| பென்சில் | පෙන්සිල් |
| அடிமட்டம் | අඩිමට්ටම් |
| புத்தகம் | පුත්තහම් |

නිපුණතාව

* පවුලේ සාමාජිකයන්ගේ ඥාතීත්වය හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| அம்மா | අම්මා |
| அப்பா | අප්පා |
| அண்ணா | අණ්ණා |
| அக்கா | අක්කා |
| தம்பி | තම්බි |
| தங்கை | තංගෛ |

නිපුණතාව

* අකුරුවල හැඩ රටා හඳුනාගෙන ලියයි.

| | | | |
|---|---|---|---|
| மரம் | මරම් | பல் | පල් |
| படம் | පඩම් | மணல் | මණල් |
| உரல் | උරල් | | |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව

* 11 - 15 දක්වා අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.

பதினொன்று පදිනොන්රු
பன்னிரண்டு පන්නිරණ්ඩු
பதின்மூன்று පදින්මූන්රු
பதினான்கு පදිනාන්ගු
பதினைந்து පදිනෛන්දු

නිපුණතාව

* තම අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට පොදු ස්ථාන සම්බන්ධ තොරතුරු විමසයි.

அடுத்த பேருந்து எத்தனை மணிக்கு?
අඩුත්ත පේරුන්දු එත්තනෛ මණික්කු ?
இதன் விலை என்ன?
ඉදන් විලෛ එන්න?
வைத்தியசாலை எங்கே உள்ளது?
වෛත්තියසාලෛ එංගේ උල්ලදු?

නිපුණතාව

* සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

නිපුණතාව

* පන්තියේ මිතුරන් සමඟ මූලික තොරතුරු පිළිබඳ සංවාදයක යෙදෙයි.

உங்களின் பெயர் என்ன?
උංගලින් පෙයර් එන්න?
உங்களது ஊர் எது?
උංගලදු ඌර් එදු?
உங்கள் அப்பாவின் பெயர் என்ன?
උංගල් අප්පාවින් පෙයර් එන්න?
உங்கள் அம்மாவின் பெயர் என்ன?
උංගල් අම්මාවින් පෙයර් එන්න?
உங்களது வீட்டில் யார் இருக்கிறார்கள்?
උංගලදු වීට්ටිල් යාර් ඉරුක්කිරාර්හල්?

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

පළමුවන ප්‍රධාන අවධියේ සිට දෙවන ජාතික භාෂාවක් හැදෑරීමට සිසුනට අවස්ථා සැලසී ඇත. සැලසුම් ගත සෙල්ලම් විනෝදජනක වැඩ සහ ක්‍රියාකාරකම් ප්‍රධාන කොට ගනිමින් පෙළගස්වා ඇති මෙම විෂයේ අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා සාක්ෂාත් කර ගත හැකි පරිද්දෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ඇත.

වචන හා සරල වගන්ති කිහිපයක් ඉගෙනීමටත් සරල අකුරු රටා හඳුනා ගනිමින් ලිවීමේ දක්ෂතා වර්ධනය කර ගැනීමටත් අවස්ථා ලබා දීම මෙම අවධියේ සුවිශේෂත්වයයි. ඒ සඳහා සිසුනට අවශ්‍ය ඉගෙනුම් උදවු ලබා දීම මෙහි දී ගුරුවරයාගේ මූලික වගකීම වේ.

දෙවන ජාතික භාෂාවක් හැදෑරීමෙන් අපේක්ෂිත වූ නිපුණතා සාක්ෂාත් වන අයුරින් නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු වේ. තව ද යෝජිත ක්‍රියාකාරකම් වෙනුවට නව ක්‍රියාකාරකම් යොදා ගැනීමට ද ඔබට නිදහස ඇත.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## හැඳින්වීම

ශ්‍රී ලාංකිකයකු වශයෙන් තමා සමඟ ජීවත් වන සහෝදර ජනතාවගේ භාෂාව ඉගෙනීම තුළින් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීමේ හැකියාවන් සිසුන් තුළ වර්ධනය කිරීම දෙවන ජාතික භාෂාවක් හැදෑරීමෙන් බලාපොරොත්තු වේ.

දෙවන ජාතික භාෂාව ඉගැන්වීම තුළින් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් බලාපොරොත්තු නොවන අතර, යම් ප්‍රමාණයක සන්නිවේදන හැකියාවක් වර්ධනය කර ගැනීමත්, අක්ෂර රටා හඳුනා ගැනීමත්, එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කර ගැනීමත් අපේක්ෂා කෙරේ.

2007 වසරේ දී හඳුන්වා දෙන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නවීකරණයන්ට අනුව සිංහල මාධ්‍යයේ සිසුන් සඳහා දෙමළ භාෂාවත්, දෙමළ සිසුන් සඳහා සිංහල භාෂාවත් දෙවන ජාතික භාෂාව වශයෙන් පළමුවන ශ්‍රේණියේ සිට හැදෑරීමට අවස්ථාව සලසා ඇත. මෙසේ දෙවන භාෂාවක් ලෙස හැදෑරීමට අවශ්‍ය මග පෙන්වීම් සවිස්තරාත්මක ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් කර ඇත.

ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීමට ජාතික සමගිය ඇති කිරීමේ මූලික අඩිතාලමක් දැමීමට දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වෙතැයි ද අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව දෙවන ප්‍රධාන අවධිය තුළ දී දෙවන ජාතික භාෂාව යටතේ පහත සඳහන් නිපුණතා ඉටු කර ගැනීමට මෙම විෂය නිර්දේශය සකසා ඇත.

## ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

* එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමේ දී අදාළ වචන හා වගන්ති යොදා කතා කරයි.
* භාෂාවකට සවන් දී අර්ථාන්විත ව ප්‍රතිචාර දක්වයි.
* භාෂාවක් හැසිරවීමේ යහපුරුදු ප්‍රදර්ශනය කරයි.
* අන් අය ඉදිරියේ තම අදහස් ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වෙයි.
* ද්‍රව්‍ය හා පුද්ගලයින් නම් කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි. එය අර්ථාන්විත ව භාවිත කරයි.
* කවි, ගී අසමින් ගයමින් රස විඳියි.
* දෙමළ භාෂාව හැසිරවීම තුළින් වින්දනයක් ලබයි.
* දෙමළ භාෂාව හැසිරවීමට ඇති හැකියාව අගයයි.

## දෙවන ප්‍රධාන අවධියේ අපේක්ෂිත නිපුණතා

* සුවිශේෂී ස්ථානයක් අන් අයට නිවැරදි ව ප්‍රකාශ කරයි.
* තම අවශ්‍යතා සඳහා වූ පොදු ස්ථාන නම් කරයි.
* එදිනෙදා කාර්යයන්වල දී අදාළ සරල විධානවලට ප්‍රතිචාර දක්වයි.
* එදිනෙදා තම අවශ්‍යතා සඳහා සුහද ව ඉල්ලීම් කරයි.
* අමුත්තන් පිළිගෙන සුහද කතා බහේ යෙදෙයි.
* තම සමීප පරිසරයේ ඇති ගස්වැල්, මල්වල නම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* තම සමීප පරිසරයේ දකින සතුන් නිවැරදි ව හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* තම ශරීරයේ අවයව නිවැරදි ව ප්‍රකාශ කරයි.
* එදිනෙදා භාවිත කරන භාණ්ඩ හා උපකරණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* නිවසේ සාමාජිකයන්ගේ ඥාති සබඳතාවය තම සමීපතමයන්ට හඳුන්වා දෙයි.
* සරල අකුරු යෙදුණු වචන ලියයි.
* සංඛ්‍යාංක හඳුනා ගෙන නිවැරදි ව හා පැහැදිලි උච්චාරණය සහිත ව කියයි.
* පොදු ස්ථානවල දී තම අවශ්‍යතා ඉටු කර ගැනීමට තොරතුරු විමසයි.
* සරල කවි ගී අංග චලනය සහිත ව ගායනා කරයි.
* තම සමීපතමයන් සමඟ මූලික තොරතුරු සම්බන්ධව සංවාදයක යෙදෙයි.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## තුන්වන ශ්‍රේණිය සඳහා අපේක්ෂිත නිපුණතා

* තම පාසලේ පිහිටීම අන් අයට නිවැරදි ව ප්‍රකාශ කරයි.
* නිතර සම්බන්ධතා පවත්වන පොදු ස්ථානවල නම් ප්‍රකාශ කරයි.
* එදිනෙදා පන්ති කාමරයේ දී ලැබෙන විධානවලට ප්‍රතිචාර දක්වයි.
* පාසලේ දී තම අවශ්‍යතා සඳහා වූ සුහද ඉල්ලීම් කරයි.
* පාසලේ දී අමුත්තන් පිළිගෙන සුහද කතා බහේ යෙදෙයි.
* තම සමීප පරිසරයේ වැඩෙන මල්වල නම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* ප්‍රධාන ආහාරවේල් සඳහා ගනු ලබන ආහාරවල නම් ප්‍රකාශ කරයි.
* නිවස ආශ්‍රිත ව දකින සතුන් නිවැරදි ව හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* ශරීරයේ ප්‍රධාන අවයව නිවැරදි ව ප්‍රකාශ කරයි.
* පාසලේ එදිනෙදා භාවිත කරන භාණ්ඩ/උපකරණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* පවුලේ සාමාජිකයන්ගේ ඥාතීත්වය හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* අකුරුවල හැඩ රටා හඳුනාගෙන ලියයි.
* 11 - 15 දක්වා අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
* තම අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට පොදු ස්ථාන සම්බන්ධ තොරතුරු විමසයි.
* සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.
* පන්තියේ මිතුරන් සමඟ මූලික තොරතුරු පිළිබඳ සංවාදයක යෙදෙයි.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

දෙවන ජාතික භාෂාව භාවිත කරන අවස්ථා පාසල් ප්‍රතිපත්තිය තුළ ඇති කිරීමට විදුහල්පතිවරුන්ගේ අවධානය යොමු විය යුතු ය. මෙයට අමතර ව තුන්වන ශ්‍රේණියේ පන්තිය තුළ දෙවන ජාතික භාෂාව භාවිත වන පන්ති ප්‍රතිපත්ති ඇති කිරීමට පන්ති භාර ගුරු මහත්ම මහත්මීන්ගේ අවධානය යොමු විය යුතු ය. මෙහි දී සුබ පැතීම්, ස්තුති කිරීම්, ඇතැම් අවස්ථාවල දෙවන ජාතික භාෂාවෙන් ද පැවසීම වැනි භාෂා ප්‍රතිපත්ති ඇති කර ගත හැකි ය. තව ද දෙවන ජාතික භාෂාව සඳහා දිනයක් වෙන් කර පන්ති මට්ටමෙන් සුවිශේෂ වැඩසටහන් සංවිධානය කළ හැකි ය.


## සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

අවස්ථානුකූල ව දෙමළ වචන භාවිත කරන ආකාරය පිළිබඳ ව තොරතුරු රැස් කරන්න. එම තොරතුරු සිසුන්ගේ ප්‍රබලතා හඳුනා ගැනීමටත් දුෂ්කරතා සඳහා උදවු දීම සඳහාත් යොදා ගන්න. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පොදු තක්සේරු පත්‍රිකාවේ දෙවන ජාතික භාෂාව තක්සේරු කිරීම සඳහා අදාළ නිර්ණායකයන් ඇතුළත් කර ඇත.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
තම පාසලේ පිහිටීම අන් අයට නිවැරදි ව ප්‍රකාශ කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
සෑම ශිෂ්‍යයකුට ම තමන්ගේ පාසලේ නම නිවැරදි ව උච්චාරණය කිරීමට මග පෙන්වීමට යොමු කරන්න.
තමන්ගේ පාසල පිහිටි ස්ථානය හඳුනා ගෙන නිවැරදි ව ප්‍රකාශ කිරීමට අවශ්‍ය මග පෙන්වීම කරන්න. මේ සඳහා සිසුන් සියලු දෙනා ම රවුමකට සිටුවා තබා තමන් එහි මැදින් සිටගන්න. ඊට පසු සිසුන් දන්නා කුඩා ගීතයක් ඔවුන් හා එකතුව ගායනා කරන්න.
ඉන් පසු සියලු ම සිසුන්ට ඇසෙන සේ **எனது பாடசாலையின் பெயர்** ........ එනදු පාඩසාලෛයින් පෙයර් (මගේ පාසලේ නම) යනුවෙන් තමන්ගේ පාසලේ නමත් අගට එකතු කර කියන්න. ඉන් පසු අතරින් පතර ගුරුවරයා පෙන්වන සිසුන් ලවා ඒ ආකාරයට කියවන්න.
මෙසේ සියලු ම සිසුන්ට තම පාසලේ නම දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීමට ඉඩ ලබා දෙන්න.
උදාහරණ :




ක්‍රියාකාරකම 2
ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කණ්ඩායම් කර ගන්න.

සෑම කණ්ඩායමක ම සමාන ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටිය යුතු ය. සෑම කණ්ඩායමකින් ම නායකයෙක් තෝරා ගන්න. කණ්ඩායම් හතර පේළි හතරකට සිටුවා කණ්ඩායමේ නායකයා ඉදිරියට ගෙන්වා තම කණ්ඩායමට මුහුණ ලා සිටින පරිදි මදක් ඉදිරියෙන් සිට ගැනීමට උපදෙස් දෙන්න. ඉන් පසු කණ්ඩායම් නායකයන්ට බෝලයක් බැගින් ලබා දෙන්න. නලාව නාද කළ වහාම කණ්ඩායම් නායකයා කණ්ඩායම ඉදිරියෙන් ම සිටින ශිෂ්‍යයාට බෝලය විසි කළ යුතුයි. බෝලය විසි කරන අතරතුර **எனது பாடசாலை அமைந்துள்ள இடம்** .... එනදු පාඩසාලෛ අමෛන්දුල්ල ඉඩම් .. (මගේ පාසල තිබෙන්නේ ..) යනුවෙන් තම පාසල පිහිටි ස්ථානයක් එකතු කර කියවන්න.

ඉන් පසු බෝලය විසි කළ නායකයා තම කණ්ඩායමේ අගට ගොස් වාඩි විය යුතු ය. නායකයාගෙන් බෝලය ලබා ගත් ශිෂ්‍යයා නායකයා සිටි තැනට විත් තමා ඉදිරියේ සිටින සාමාජිකයාට නායකයා ප්‍රකාශ කළ පරිදි ම කියමින් බෝලය විසි කළ යුතුයි. ඉන් පසු තම කණ්ඩායමේ අගට ගොස් ඉඳගත යුතුයි. මෙසේ කණ්ඩායමේ සියලු ම සාමාජිකයන් මෙම ක්‍රියාකාරකමෙහි නිරත විය යුතු ය.

මෙසේ නිවැරදි ව උච්චාරණය කරමින් මුලින් ම ක්‍රියාකාරකම අවසන් කළ කණ්ඩායමට සියලු ම කණ්ඩායම් අගය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
නිතර සම්බන්ධතා පවත්වන පොදු ස්ථානවල නම් ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම
එදිනෙදා කටයුතුවලට සම්බන්ධ පොදු වූ ස්ථාන හඳුනා ගෙන තම මව්බසින් ප්‍රකාශ කිරීමට සලස්වන්න.
පාසල, කඩය, රෝහල යන ස්ථානවල නම් දෙමළ බසින් ප්‍රකාශ කළ හැකි ද යන්න විමසන්න.
දෙමළ බසින් හඳුන්වා දුන් එම වචන සිසුන් ලවා නිවැරදි ව උච්චාරණය කරවීමට යොමු කරන්න.

පාසල, කඩය, රෝහල යනාදි ස්ථානවල විශාල ප්‍රමාණයේ චිත්‍ර කළුලෑල්ලේ ප්‍රදර්ශනය කරන්න. ඉන් පසු එක් එක් චිත්‍රය පෙන්වමින් ඒවායේ නම් பாடசாலை, கடை, வைத்தியசாலை යනුවෙන් පාඩසාලෙ කඩෙ වෛත්තියසාලෙ දෙමළ බසින් උච්චාරණය කරන්න.
ඉන් පසු සෑම සිසුවකු ලවා ම එම චිත්‍ර 3හි නම් නිවැරදි ව උච්චාරණය කිරීමට යොමු කරන්න. (නිවැරදි ව උච්චාරණය කිරීමට අපහසු සිසුන්ට විශේෂ අභ්‍යාස ලබා දීම කෙරෙහි අවධානය යොමු කරන්න.)

නිපුණතාව
එදිනෙදා පන්ති කාමරයේ දී ලැබෙන විධානවලට ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
පළමුවන අවධියේ දී හඳුන්වා දුන් පහත දැක්වෙන විධාන සිහිපත් කර දෙමළ බසින් ප්‍රකාශ කිරීමට සලස්වන්න.

| | |
|---|---|
| එළුම්බුංගල් | නැගිටින්න |
| ඉරුංගල් | වාඩිවෙන්න |
| කෛ තට්ටුංගල් | අත්පොඩි ගසන්න |
| සිරියුංගල් | සිනාවෙන්න |

පන්ති කාමරයේ එදිනෙදා ප්‍රකාශ කරනු ලබන විධානයන් සිසුන්ගේ මව්බසින් කීමට අවස්ථාව ලබා දෙන්න.
පන්ති කාමරයේ ප්‍රකාශ කරනු ලබන විධාන දෙමළ බසින් සිසුන්ට හඳුන්වා දී නිවැරදි උච්චාරණයට යොමු කරන්න.

ගුරුවරයා පන්තියට පැමිණෙන විට සිසුන් සියලු දෙනා නැගිට ගුරුවරයාට ආයුබෝවන් යයි ප්‍රකාශ කිරීමට යොමු කරන්න. ගුරුවරයා එයට ප්‍රතිචාර දක්වා සිසුන් සියලු දෙනාට ම වාඩි වන්නැයි උපදෙස් ලබා දෙන්න. එම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන
எல்லோரும் உட்காருங்கள். එල්ලෝරුම් උට්කාරුංගල් (හැමෝම වාඩිවෙන්න) යනුවෙන් දෙමළ බසින් ප්‍රකාශ කරන්න. (ලැබෙන අවස්ථාව සුදුසු පරිදි ප්‍රයෝජනයට ගන්න)

ක්‍රියාකාරකම 2
ගුරුවරයා පන්ති කාමරයේ ඉගැන්වීමේ යෙදෙන විට නිශ්ශබ්ද වෙන්න යනුවෙන් ප්‍රකාශ කළ යුතු අවස්ථා එළඹිය හැක. එවැනි අවස්ථාවල அமைதியாக இருங்கள் අමෛදියාහ ඉරුංගල් (නිශ්ශබ්ද වෙන්න) යනුවෙන් දෙමළ බසින් ප්‍රකාශ කර සිසුන් නිහඬ කරවන්න. අවස්ථාව ලැබෙන විට සුදුසු පරිදි මෙම වචන හඳුන්වා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 3
මුලින් ම ගුරුවරයා සිසුන්ට வரையுங்கள் වරෛයුංගල් (අඳින්න)
அழியுங்கள் අලියුංගල් (මකන්න) යන වචන අර්ථය පැහැදිලි වන සේ හඳුන්වා දීම අවශ්‍ය ය.. ඉන් පසු එක් එක් සිසුවා කැඳවා කළුලෑල්ලේ வட்டம் வரையுங்கள் වට්ටම් වරෛයුංගල් (රවුමක් අඳින්න) යනුවෙන් දෙමළ බසින් ප්‍රකාශ කිරීමට අවස්ථා ලබා දෙන්න.
(වට්ටම් රවුම යන වචන පළමු අවදියේ දී හඳුන්වා දී ඇති බව මතක තබා ගන්න)
සිසුවා රවුම ඇන්ද පසු තවත් සිසුවකු කැඳවා කළුලෑල්ලේ ඇඳී රවුම පෙන්වා அழியுங்கள் අලියුංගල් (මකන්න) යනුවෙන් දෙමළ බසින් කීමට අවස්ථාව දෙන්න.
මෙම ක්‍රියාකාරකම සිසුන්ට ගුරුවරුන් හා සිසුන් ලෙස රඟපාමින් ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන්න.

ක්‍රියාකාරකම 4
සිසුන් පෙළ පොත කියවන අවස්ථාවක வாசியுங்கள் වාසියුංගල් (කියවන්න) යන වචනය දෙමළ භාෂාවෙන් හඳුන්වා දෙන්න. (කියවීමේ පාඩමේ දී සුදුසු පරිදි මෙම වචනය හඳුන්වා දෙන්න)

සැලකිය යුතුයි
- මෙසේ හඳුන්වා දෙන වචන ගුරුවරුන්ට තම හැකියාව අනුව ක්‍රියාකාරකම දෙකකට හෝ තුනකට යොදා ගත හැකි ය.
- මෙම වචන පුනරුච්චාරණය කළ යුතු බව මතක තබා ගන්න.

නිපුණතාව
පාසලේ දී තම අවශ්‍යතා සඳහා වූ සුහද ඉල්ලීම් කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
සිසුන්ට පාසලේ දී තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ඉල්ලීම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
එම ඉල්ලීම් සමහරක් දෙමළ බසින් ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දෙන්න.
ඉල්ලීම් ඉදිරිපත් කරන විට ඔවුන්ට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

මේ සඳහා සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න. එක් සිසුවකු අනෙක් ශිෂ්‍යයාගෙන් எனக்குப் பேனா தாருங்கள் එනක්කු පේනා තාරුංගල් (මට පෑන දෙන්න) යනුවෙන් ඉල්ලීම කළ යුතුයි. අනෙක් සිසුවා පෑන දිය යුතුයි. (මෙහි දී ප්‍රතිචාර දැක්විය යුතුයි) ඉන් පසු පෑන දුන් සිසුවා අනෙක් ශිෂ්‍යයාගෙන් உங்கள் புத்தகத்தைத் தர முடியுமா? (උංගල් පුත්තහත්තෛ තර මුඩියුමා ?) ඔයාගේ පොත දෙන්න පුලුවන් ද? යනුවෙන් ඇසිය යුතුයි. ඉන් පසු දෙදෙනාගෙන් එක් අයෙක් நான் வெளியே போகலாமா? නාන්වෙලියේ පෝහලාමා (මම එළියට යන්න ද?) යනුවෙන් කාරුණික ව ඉල්ලා සිටිය යුතුය.

මෙසේ සියලු ම සිසුන්ට සිය ඉල්ලීම් තුනම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඉල්ලීම් ඉදිරිපත් කරන විට නිවැරදි ව උච්චාරණය කරන්නේ ද යන්න සැලකිලිමත් වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
පාසලේ දී අමුත්තන් පිළිගෙන සුහද කතා බහේ යෙදෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම
නිවසට එන අමුත්තන් පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
නිවසට අමුත්තන් පැමිණෙන විට ඔවුන් පිළිගන්නා ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
පාසලේ දී අමුත්තන් පිළිගෙන ඔවුන් සමග සුහද ව කතා බහට යොමු කරන්න.

මේ සඳහා සිසුන් සමාන වන සේ කණ්ඩායම්වලට බෙදන්න. එක් කණ්ඩායමකින් එක් සිසුවකු අමුත්තා ලෙසත් අනිකුත් අයට පිළිගන්නන් ලෙසත් ක්‍රියාත්මක වීමට ඉඩ සලසන්න. අමුත්තා ඇතුළට පැමිණෙන විට **உள்ளே வாருங்கள்** උල්ලේ වාරුංගල් (ඇතුළට එන්න) යනුවෙන් දෙමළ බසින් පිළිගැනීමට යොමු කරන්න. ඇතුළට පැමිණි වහා කණ්ඩායමේ තව කෙනෙක් **அமருங்கள்** අමරුංගල් (වාඩිවන්න) යනුවෙන් දෙමළෙන් පැවසිය යුතුයි. මෙසේ සියලු ම කණ්ඩායම් ක්‍රියාත්මක විය යුතුයි. කණ්ඩායමේ සිටින සියලු ම සිසුන්ට හඳුන්වා දුන් වචන උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය.

නිපුණතාව
ප්‍රධාන ආහාර වේල් සඳහා ගනු ලබන ආහාරවල නම් ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
සිසුන්ගෙන් ඔවුන් ගත් උදේ ආහාර පිළිබඳ විමසන්න.
පාසල් විවේකයේ දී ගැනීමට ගෙනා ආහාරවල නම් කීමට අවස්ථාවක් ලබා දෙන්න.
සිසුන් ඉතාමත් ප්‍රියකරන ආහාර පිළිබඳ විමසා ඒවා කළුලැල්ලේ ලැයිස්තු ගත කරන්න.
ලැයිස්තු ගත කළ ආහාර වර්ග අතරින් බත්, පාන්, රොටි, පිට්ටු, ආප්ප, ඉඳිආප්ප යනාදියෙන් නම් වෙනම සටහන් කරන්න.
ඉහත කී ආහාර වර්ගවල පින්තූර ප්‍රදර්ශනය කරන්න.
එම ආහාර වර්ගවල නම් දෙමළ බසින් කියවීමට සලස්වන්න.

මව්බස, දෙවන බස දෙකේ දීම පිට්ටු, ආප්ප, ඉඳිආප්ප, පාන් යනාදියේ නම්වල උච්චාරණය බොහෝ දුරට සමාන බව පෙන්වා දෙන්න. (අප්පම්- ආප්ප, පිට්ටු - පිට්ටු, ඉඩියප්පම් - ඉඳිආප්ප)ආහාර වර්ගවල නම් හඳුනා ගැනීමෙහි ලා මෙම ක්‍රියාකාරකමෙහි නිරත විමට සලස්වන්න. කුඩා පෙට්ටියක බත්, පාන්, රොටි, පිට්ටු, ආප්ප, ඉඳිආප්ප ආදියෙහි පින්තූර දමන්න. එම පෙට්ටිය පන්තියේ සිටින සියලු ම සිසුන් වෙත ගෙන යන්න. එයින් එක් පින්තූරයක් තෝරා ගෙන දෙමළ බසින් නිවැරදි ව කීමට ඉඩ ලබා දෙන්න.

ක්‍රියාකාරකම 2

| | | |
|---|---|---|
| **சோறு** | සෝරු | බත් |
| **ரொட்டி** | රොට්ටි | රොටි |
| **பிட்டு** | පිට්ටු | පිට්ටු |
| **பாண்** | පාන් | පාන් |
| **அப்பம்** | අප්පම් | ආප්ප |
| **இடியப்பம்** | ඉඩියප්පම් | ඉඳිආප්ප |

ඉහත සඳහන් දෙමළ වචන ලියන ලද කාඩ්පත් එක පෙට්ටයකට දමන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

සිසුන් හයදෙනා බැගින් වූ කණ්ඩායම්වලට මෙම කාඩ්පත බැගින් බෙදන්න. සෑම සිසුවකුට ම හඳුන්වා දුන් ආහාර වර්ගවල නම්වලින් 1ක් තෝරා ගැනීමට උපදෙස් දෙන්න. ඔවුන් තෝරා ගත් ආහාර වර්ගයේ නම දෙවන බසින් ප්‍රකාශ කළ යුතු බව පවසන්න. ඉන් පසු මාරුවෙන් මාරුවට කාඩ්පතේ ඇති අනෙක් ආහාර වර්ගවල නම් ද ප්‍රකාශ කළ යුතුයි. (සෑම කෙනෙක් ම ආහාර වර්ග හයේ ම නම් ප්‍රකාශ කළ යුතුයි.)


නිපුණතාව
තම සමීප පරිසරයේ වැඩෙන මල්වල නම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
මේ සඳහා සිසුන් දන්නා මල්වල නම් විමසන්න. එමෙන් ම තම නිවස/ආශ්‍රිත පරිසරයේ ඇති මල් වර්ගවල නම් මොනවා දැයි විමසන්න. තව ද සිසුන් ප්‍රියකරන මල්වල නම් හා සිසුන්ට පිච්ච, අරලිය, වද මල්, සූරියකාන්ත යනාදි මල්වල පින්තූර පෙන්වා ඒවායේ නම් දෙමළෙන් ප්‍රකාශ කිරීමටත් අවස්ථාව ලබා දීම අවශ්‍ය වේ.
ඉහත කී මල්වල නම් දෙමළ බසින් හඳුන්වා දී කීප වතාවක් උච්චාරණය කර සිසුන් ලවා ඒවා උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

| | | |
|---|---|---|
| **மல்லிகை** | මල්ලිගෛ | පිච්ච |
| **அலரி** | අලරි | අරලිය |
| **செவ்வரத்தை** | සෙව්වරත්තෛ | වද |
| **சூரியகாந்தி** | සූරියකාන්ති | සූරියකාන්ති |

මෙසේ හඳුන්වා දීමේ දී සිසුන් හතර දෙනා බැගින් කණ්ඩායම්වලට බෙදා ඔවුන්ට මල් වර්ග හතරේ පින්තූර ලබා දී ඒවා ඉරටුවක අලවා කුඩා මල් පෝච්චියක සිටුවීමට උපදෙස් දෙන්න. ඉන් පසු කණ්ඩායමේ සිටින එක් එක් අය නැගිට මල් එකිනෙක පෙන්වා දෙමළ බසින් නිවැරදි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න. (ගුරුවරයා සිසුන් නිවැරදි ව උච්චාරණය කරන්නේ ද යන්න ගැන අවධානය යොමු කළ යුතු ය)

1. මල්ලිගෛ (පිච්ච)
2. අලරි (අරලිය)
3. සෙව්වරත්ති (වද)
4. සූරියකාන්ති (සූරියකාන්ති)




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
නිවස ආශ්‍රිත ව දකින සතුන් නිවැරදි ව හඳුනාගෙන ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
නිවස ආශ්‍රිත ව දැකිය හැකි සතුන් කිප දෙනකුගේ නම් නිවැරදි ව උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
බල්ලා, පූසා, ගිරවා, ලේනා, කපුටා යන සතුන්ගේ පින්තූර ප්‍රදර්ශනය කරන්න. එම සතුන් එකිනෙකාගේ නම්, දෙමළෙන් උච්චාරණය කර පෙන්වන්න.
උදාහරණ :


| | | |
|---|---|---|
| நாய் | නායි | බල්ලා |
| பூனை | පූනෛ | පූසා |
| கிளி | කිළි | ගිරවා |
| அணில் | අනිල් | ලේනා |
| காகம் | කාහම් | කපුටා |

ප්‍රදර්ශනය කළ පින්තූරවලට අදාළ සතුන්ගේ නම් සෑම ශිෂ්‍යයකුට ම නිවැරදි ව උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
පෙන්නුම් කරන රූපයේ සිටින සතාගේ නම නිවැරදි ව උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 2
සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා දෙපැත්තේ රඳවන්න. එක කණ්ඩායමක සිටින සිසුන් සතකුගේ නාදය ඉදිරිපත් කළ විට ඊළඟ කණ්ඩායමේ සිටින කෙනෙක් එම සතාගේ නම නිවැරදි ව දෙමළ බසින් කිව යුතුයි.
මෙසේ සෑම සතකුගේ ම හඬ නගන විට අනෙක් කණ්ඩායමේ අය එම සතාගේ නම කිව යුතුයි. පසුව අනෙක් කණ්ඩායමට ද මෙම ක්‍රියාකාරකම මාරු කර කරවිය යුතුය.

නිපුණතාව
ශරීරයේ ප්‍රධාන අවයව නිවැරදි ව ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
ශරීරයේ ප්‍රධාන අවයව කිපයක නම් විමසන්න.
එම අවයවවල දෙමළ නම් නිවැරදි ව උච්චාරණයට ඉඩ සලස්වන්න.
සෑම සිසුවකුට ම හොඳින් පෙනෙන පරිදි මිනිස් රූපයක් ප්‍රදර්ශනය කරන්න. නැතහොත් සිසුවකු ඉදිරියට කැඳවා එම සිසුවාගේ අවයව පෙන්වා ඒවා හඳුන්වා දෙන්න



| | | |
|---|---|---|
| தலை | තලෛ | හිස |
| கை | කෛ | අත |
| கால் | කාල් | කකුල |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ශිෂ්‍යයාගේ හිස ස්පර්ශ කොට තලෛ යනුවෙන් ප්‍රකාශ කරන්න. සිසුවාට ද ඊට සවන් දී, ප්‍රකාශ කිරීමට ඉඩ සලසන්න. මේ ආකාරයට කෛ **கை** , කාල් **கால்** ආදිය ද හඳුන්වා දී සිසුන්ට උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 2

සිසුන් රවුමක ආකාරයට සිටුවන්න. රවුමේ මැද ගුරුවරයා හෝ මෙම වචන හොඳින් උච්චාරණය කළ හැකි සිසුවකු හෝ රඳවන්න. රවුම මැද සිටින පුද්ගලයා කියන වචනවලට සවන් දී රවුමේ සිටින අය තම සිරුරේ අදාළ අවයවය ස්පර්ශ කොට දැක්විය යුතු ය. මෙම වචන මාරුවෙන් මාරුවටත් වේගයෙන් ද ප්‍රකාශ කළ යුතු ය. වැරදි අවයව ස්පර්ශ කරන සිසුන් බිම වාඩි කරවන්න. සිසුන් සියලු දෙනාට ම මෙම වචන නිවැරදි ව උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. මෙම තරගය කණ්ඩායම් දෙකක් වශයෙන් වෙන් වීද කළ හැකි ය.

නිපුණතාව

පාසලේ එදිනෙදා භාවිත කරන භාණ්ඩ/උපකරණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

ක්‍රියාකාරකම 1

පාසලේ භාවිත කරන උපකරණ/භාණ්ඩවලින් කීපයක නම් නිවැරදි ව උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පාසලේ එදිනෙදා භාවිත කරන උපකරණ/භාණ්ඩ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. ඒවා අතරින් පොත, පැන්සල, මේසය, පුටුව, අඩිකෝදුව යන භාණ්ඩ/උපකරණ උපුටා දක්වන්න. ඒවායේ දෙමළ නාමය උච්චාරණය කරන්න.

| | | |
|---|---|---|
| **புத்தகம்** | පුත්තහම් | පොත |
| **பென்சில்** | පෙන්සිල් | පැන්සල |
| **மேசை** | මේසෛ | මේසය |
| **கதிரை** | කදිරෛ | පුටුව |
| **அடிமட்டம்** | අඩිමට්ටම් | අඩිකෝදුව |

ඉහත කී සෑම දෙයක් ම එකිනෙක පෙන්වා ඊට අදාළ දෙමළ නාමය නිවැරදි ව උච්චාරණය කිරීමට සෑම සිසුවකුට ම අවස්ථාව ලබා දෙන්න.

කීපවතාවක් එම නාම ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දී ඒවායේ උච්චාරණය හොඳින් ප්‍රගුණ කරවන්න.

ක්‍රියාකාරකම 2

එක් සිසුවකු මෙම භාණ්ඩ/උපකරණවලින් එකක් පෙන්වන විට තවත් සිසුවකුට එහි නම දෙමළ බසින් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න. දෙවනුව නම කී සිසුවා භාණ්ඩය/උපකරණය පෙන්වන විට තවත් සිසුවකු ලවා එහි දෙමළ නාමය කීමට අවස්ථාව දෙන්න.

මුලින්, මෙම වචන හොඳින් ප්‍රගුණ කළ සිසුන් මේ සඳහා යොදා ගන්න.

සෑම සිසුවකුට ම එම භාණ්ඩ/උපකරණවල නම් උච්චාරණය කිරීමේ අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
පවුලේ සාමාජිකයන්ගේ ඥාතිත්වය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
පවුලේ සාමාජිකයන්ගේ නෑකම් පිළිබඳ ව මව්බසින් විමසන්න.
පවුලේ සාමාජිකයන්ගේ පින්තූර ප්‍රදර්ශනය කරන්න.
නෑකම් හඳුන්වන නම් විමසන්න.
පසුව දෙමළ බසින් විමසන්න. එම නෑකම් දෙමළ බසින් දන්නේ දැයි සිසුන්ගෙන් විමසන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| අම්මා | තාත්තා | අක්කා | අය්යා | නංගී | මල්ලී |
| **அம்மா,** | **அப்பா,** | **அக்கா,** | **அண்ணா,** | **தங்கை,** | **தம்பி** |
| අම්මා | අප්පා | අක්කා | අණ්ණා | තංගෛ | තම්බි |

එම වචන නිවැරදි ව උච්චාරණය කරන්න.
සිසුන්ට ද ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න.
සිසුන් හය දෙනා බැගින් වූ කුඩා කණ්ඩායම්වලට බෙදන්න. ඒ හැම කෙනාට ම එක් එක් චරිතය බැගින් පවරන්න.
එක් එක් කණ්ඩායම ඉදිරියට ගෙන්වා තමාව පහත දැක්වෙන ආකාරයට හඳුන්වා දීමට අවස්ථාව සලසා දෙන්න.
උදාහරණ :-

| | |
|---|---|
| නාන් අම්මා | මම අම්මා |
| නාන් අප්පා | මම අප්පා |
| නාන් අක්කා | මම අක්කා |
| නාන් අයියා | මම අයියා |
| නාන් තංගෛ | මම නංගී |
| නාන් තම්බි | මම මල්ලී |

මේ ආකාරයට සෑම කණ්ඩායමකට ම මෙම අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 2
කණ්ඩායමේ අය ඉදිරියට විත්, කණ්ඩායමෙන් කෙනෙක් නාන් අම්මා යයි පවසා තමන් අසල සිටින අය ඉවර් අප්පා, ඉවර් අක්කා, ඉවර් අණ්ණා, ඉවර් තංගෛ, ඉවර් තම්බි යනුවෙන් සෙසු අයට හඳුන්වා දීමට යොමු කරන්න. (ඉවර් යන්නෙන් මොහු යන්න අදහස් කෙරේ) මේ ආකාරයට අනිකුත් සිසුන්ට ද මෙම ක්‍රියාකාරකමට අවස්ථාව ලබා දෙන්න.
මෙම ක්‍රියාකාරකම තරගයක් ආකාරයට ද කණ්ඩායම් අතරේ ක්‍රියාත්මක කළ හැක.

නිපුණතාව
අකුරුවල හැඩ රටා හඳුනා ගෙන ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
දී ඇති වචනවල භාවිත කර ඇති අකුරුවල හැඩ රටා වෙන වෙන ම ලියා ප්‍රදර්ශනය කරන්න.
දී ඇති ආකාරයට කුඩා වචන කාඩ්පත්වල ලියා හෝ අලවා ශිෂ්‍ය කණ්ඩායම්වලට බෙදන්න. (ප්‍රමාණය, හැඩය, ආරම්භය යන කරුණු ගැන විශේෂ අවධානය යොමු කරන්න)
අකුරු ආරම්භ කර ලියන දිශාව පිළිබඳ සිසුන්ගේ අවධානය හොඳින් යොමු කරවන්න.
සිසුන් ලවා, තමන්ට දී ඇති කාඩ්පතෙහි අකුරු ලිවීමට යොමු කරවන්න.
පන්තියේ සිටින සිසු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන සිසුන් සමාන වන සේ කුඩා කණ්ඩායම්වලට බෙදන්න.
සෑම කණ්ඩායමකට ම අකුරු ලියන ලද කාඩ්පතක් බෙදා දෙන්න. ඉන් පසු එම කාඩ්පත බලා එම අකුරු පොතේ ලියා ගැනීමට උපදෙස් දෙන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

සිසුන් සියලු දෙනා ලවා කාඩ්පතේ දෙනු ලැබූ අකුරු ලිවීමට සලස්වන්න.
පහත අකුරු රූපවලින් දැක්වෙන පරිදි සිසුන්ට අකුරු ලිවීම හුරු කරවන්න.


மரம்

படம்

உரல்

பல்

மணல்



නිපුණතාව
11 සිට 15 දක්වා ඉලක්කම් නිවැරදි උච්චාරණය සහිත ව කියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
11, 12, 13, 14, 15 යන ඉලක්කම්වල නාමය දෙමළෙන් නිවැරදි ව උච්චාරණය කිරීමට සලස්වන්න.

මේ සඳහා රූපයේ දැක්වෙන පරිදි අංක පුවරු සූදානම් කර ගන්න.

11 12 13 14 15

සිසුන් අඩකවයක් ලෙස සිට ගැනීමට සලස්වන්න. එක් එක් අංක පුවරුව පෙන්වමින් සිංහලෙන් එම අංක විමසන්න.
එක් එක් අංක පුවරුව පෙන්වමින් එම ඉලක්කම දෙමළ බසින් උච්චාරණය කරන්න.
උදාහරණ :

| | | | |
|---|---|---|---|
| 11 | பதினொன்று | පදිනොන්රු | එකොළහ |
| 12 | பன்னிரண்டு | පන්නිරණ්ඩු | දොළහ |
| 13 | பதின்மூன்று | පදින්මූන්රු | දහතුන |
| 14 | பதினான்கு | පදිනාන්ගු | දහහතර |
| 15 | பதினைந்து | පදිනෛන්දු | පහළොව |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මෙසේ අංක පුවරු ප්‍රදර්ශනය කරමින් එම ඉලක්කම්වල නම් දෙමළ බසින් සිසුන් ලවා උච්චාරණය කිරීමට සලස්වන්න.
කීපවතාවක් උච්චාරණය කරමින් ප්‍රගුණ කරවන්න.

ක්‍රියාකාරකම 2
සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා කණ්ඩායම් දෙක එකිනෙකට මුහුණලා සිට ගැනීමට සලස්වන්න.
මෙම ක්‍රියාකාරකම තරගයක් ආකාරයට ක්‍රියාත්මක කරවන්න.
ඔබ පෙන්වන අංක පුවරුවේ දැක්වෙන අංකය අදාළ කණ්ඩායමේ අය නිවැරදි ව ප්‍රකාශ කළ යුතුයි. අදාළ කණ්ඩායමට නිවැරදි ව කීමට බැරි වූ විට ප්‍රතිවිරුද්ධ කණ්ඩායමට පිළිතුරු දීමට අවස්ථාව දෙන්න. නිවැරදි පිළිතුරට ලකුණක් ප්‍රදානය කරන්න.
ජයග්‍රාහී කණ්ඩායමට ප්‍රශංසා කරන්න.

නිපුණතාව
තම අවශ්‍යතා ඉටු කර ගැනීමට පොදු ස්ථාන සම්බන්ධ තොරතුරු විමසයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
එදිනෙදා තම අවශ්‍යතා ඉටුකර ගැනීමට උපකාර වන පොදු ස්ථාන හා එම ස්ථානවලට සම්බන්ධ තොරතුරු විමසන්න.
සමහර තොරතුරු විමසීමේ දී පහත දැක්වෙන දෙමළ වාක්‍ය රටා හඳුන්වා දෙන්න.
උදාහරණ :-

> **அடுத்த பஸ் எத்தனை மணிக்கு வரும்** අඩුත්ත පේරුත්දු එත්තනෛ මණික්කු වරුම්
> ඊළඟ බස් එක එන්නේ කීයට ද?
>
> **இதன் விலை என்ன?** ඉදන් විලෛ යාදු
> මේකෙ මිල කීය ද?
>
> **வைத்தியசாலை எங்கே அமைந்துள்ளது** වෛත්තියසාලෛ එංගේ උල්ලදු
> රෝහල තිබෙන්නේ කොහේ ද?

සිසුන් ලවා මෙම වාක්‍ය නිවැරදි උච්චාරණයට යොමු කරන්න. සෑම කෙනකුට ම අවස්ථාව ලබා දෙන්න.
බස් නැවතුම්පොළ, පොළ, රෝහල යන ස්ථාන දැක්වෙන පුවරු/සංකේත සූදානම් කර ගන්න.
පන්තිය තුළ හෝ පන්තියෙන් බැහැර හෝ ගොස් ඉහත කී පුවරු/සංකේත එකිනෙකට ඈතින් තුන්පොළක ප්‍රදර්ශනය කරන්න. මෙම එක් එක් ස්ථානවල එක් එක් සිසුවා බැගින් රඳවන්න. පසුව බස් නැවතුම් පොළ අසල සිටින සිසුවා වෙත තවත් සිසුවකු ගොස්
අඩුත්ත බස් එත්තනෙයි මනික්කු වරුම් යනුවෙන් ප්‍රශ්න කිරීමට සලස්වන්න. එවිට අනෙක් සිසුවා තමන්ට හැකි ආකාරයට සුදුසු පිළිතුරක් දිය යුතුයි.
මුලින් ප්‍රශ්නය ඇසූ සිසුවා පොළ තිබෙන ස්ථානයට ගොස් එහි ඇති දෙයක් පෙන්වා
ඉදන් විලෛ එන්න යනුවෙන් විමසිය යුතුයි.
එතැන සිටින සිසුවාට ඊට සුදුසු පිළිතුරක් ප්‍රකාශ කළ හැක.
ඉන්පසු ප්‍රශ්නය ඇසූ සිසුවා රෝහල ඇති ස්ථානයට ගොස් එහි සිටින සිසුවාගෙන්
වෛයිත්තියසාලෛ එංගේ අමෛයින්තුල්ලදු යනුවෙන් විමසිය යුතුයි.
එහි සිටින සිසුවාට ඊට සුදුසු පිළිතුරක් ප්‍රකාශ කළ හැක.
මේ ආකාරයට සිසුන් සියලු දෙනාට ම මෙම ප්‍රශ්න 3 විමසීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
සිසුන්ට හුරු පුරුදු සරල දෙමළ ගීත සිසුන් සමඟ ගායනා කරන්න.
එම ගීත ආදේශ භාණ්ඩ සමඟ ගායනා කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
පහත සඳහන් ගීතවල එක් එක් පේළි නිවැරදි උච්චාරණය සහිත ව ගායනා කිරීමට සිසුන් හුරු කරවන්න.
ආදේශ භාණ්ඩ රහිත ව සිසුන්ට තනිව හා කණ්ඩායම් වශයෙන් ගායනා කිරීමට ද අවස්ථා ලබා දෙන්න.

இனிப்பு முட்டாய் ඉනිප්පු මුට්ටායි

| | |
|---|---|
| இனிப்பு முட்டாய் இனிப்பு முட்டாய் | ඉනිප්පු මුට්ටායි ඉනිප්පු මුට්ටායි |
| இதோ பாருங்கள் இங்கே | ඉදෝ පාරුංගල් ඉංගේ |
| இருப்பவற்றை எடுத்துக் கொள்ள | ඉරුප්පවට්රෛයි එඩුත්තුක් කොල්ල |
| இங்கே வாருங்கள் | ඉංගේ වාරුංගල් |
| இல்லை என்னும் நிலைமை இங்கே | ඉල්ලෛ එන්නුම් නිලෛමෛ ඉංගේ |
| இல்லவே இல்லை - இங்கே | ඉල්ලා වේ ඉල්ලෛ ඉංගේ |
| இருப்பதை நாம் பகிர்ந்து கொண்டால் | ඉරුප්පදෛ නාම් පහිර්න්දු කොණ්ඩාල් |
| இல்லையே தொல்லை | ඉල්ලෛයේ තොල්ලෛ |

- இரா.பொன்ராசன்-

සීනි බෝල

සීනිබෝල සීනිබෝල
මෙන්න බලන්න
තිබෙන ඒවා බෙදා ගන්න
මෙහාට එන්න

නැකියලා දෙයක් මෙහේ
ඇත්තෙම නැතේ
තිබෙන තරම බෙදා ගමුකො
කරදර නැතේ

வாத்து වාත්තු

| | |
|---|---|
| குள்ளக் குள்ள வாத்து | කුල්ලක් කුල්ල වාත්තු |
| குவா குவா வாத்து | කුවා කුවා වාත්තු |
| பள்ளத் தண்ணீர் கண்டால் | පල්ලත් තණ්ණීර් කණ්ඩාල් |
| பாய்ந்து நீந்தும் வாத்து | පායින්දු නීන්දුම් වාත්තු |
| மெல்ல உடலைச் சாய்த்து | මෙල්ල උඩලෛච් චායිත්තු |
| மேலும் கீழும் பார்த்து | මේලුව් කීලුම් පාර්ත්තු |
| செல்லமாக நடக்கும் | සෙල්ලමාහ නඩක්කුම් |
| சின்ன மணி வாத்து | චින්න මණි වාත්තු |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තාරාවා

කොටයි කොටයි තාරාවා
ක්වැක් නද දෙන තාරාවා
දියපාරක් දැක්කාම
පැනලා පීනන තාරාවා

හෙමින් හෙමින් ඇඟ පද්දාලා
ඉහළ පහළ බල බලා
සුරතල් ගමනින් යනවා
පුංචි පැටිය තාරාවා

சேவல் සේවල්

சேவல் எங்கள் சேவலாம் සේවල් එංගල් සේවලාම්
சிவப்புக் கொண்டை சேவலாம் සිවප්පුක් කොණ්ඩෛ සේවලාම්
கூவி எழுப்பும் சேவலாம் කූවි එලුප්පුම් සේවලාම්
குப்பை கிளரும் சேவலாம் කුප්පෛ කිලරුම් සේවලාම්

தத்திப் பாயும் சேவலாம் තත්තිප් පායුම් සේවලාම්
தாவி ஓடும் சேவலாம் තාවි ඕඩුම් සේවලාම්
கொத்தித் தின்னும் சேவலாம் කොත්තිත් තින්නුම් සේවලාම්
கொக்கரக்கோ சேவலாம் කොක්කරකෝ සේවලාම්

කුකුළු හාමි

අපේ ගෙදර කුකුළුහාමි
රතු කොණ්ඩැති කුකුළුහාමි
හඬලාලා අවදිකරයි
කුණු ගොඩවල කෑම සොයයි

ඇවිද පනින කුකුළුහාමි
දුවන පනින කුකුළුහාමි
අහුලන් කන කුකුළුහාමි
කෙකර කෙකර කුකුළුහාමි

ක්‍රියාකාරකම 2

සිසුන් කණ්ඩායම් තුනකට බෙදන්න. එක් එක් කණ්ඩායමට එක් එක් ගීතය බැගින් ගායනා කිරීමට අවස්ථා ලබා දෙන්න. පසුව ගීත කණ්ඩායම් අතර මාරු කර සියලු ම කණ්ඩායම්වලට සියලු ම ගීත ගායනා කිරීමට අවස්ථා ලබා දෙන්න. නොඑසේ නම් එක් දිනකට එක් ගීතයක් බැගින් ගායනා කිරීමට වුව ද අවස්ථාව ලබා ගත හැකිය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
පන්තියේ මිතුරන් සමඟ මූලික තොරතුරු පිළිබඳ ව සංවාදයේ යෙදෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
යහලුවාගේ නම, ගම, ඔහුගේ/ඇයගේ දෙමව්පියන්ගේ නම් ඔහුගේ/ඇයගේ ගෙදර සිටින අයගේ තොරතුරු ආදිය පිළිබඳ ව දෙමළ බසින් විමසන්න. ඒවා පිළිතුරු දීමට අවස්ථාව ලබා දීම.
සිසුන් දෙදෙනා බැගින් වාඩි කරවන්න.
ප්‍රථමයෙන් තමා හඳුන්වා දීමට යොමු කරන්න.

| | | | |
|---|---|---|---|
| උදාහරණ :- කෙනෙක් | நான் குமார | නාන් කුමාර | මම කුමාර |
| ඊළඟ ශිෂ්‍යයා | நான் சரத் | නාන් සරත් | මම සරත් |

මෙසේ සෑම කණ්ඩායමකම මෙම ක්‍රියාකාරකමේ යොදවන්න.
නම ඇසීමටත් ඊට පිළිතුරු දීමටත් ඉඩ ලබා දෙන්න.

| | | | |
|---|---|---|---|
| උදාහරණ :- | உங்கள் பெயர் என்ன? | උංගල් පෙයර් එන්න | ඔබේ නම කුමක් ද? |
| | எனது பெயர் ...... | එනදු පෙයර් ...... | මගේ නම ....... |

මුලින් ප්‍රශ්නය පුහුණු කර පසුව පිළිතුර දීම පුහුණු කරන්න. ඉන් පසු දෙදෙනා බැගින් වූ ළමුන් කණ්ඩායම් මෙම සංවාදයේ නිරත කරවන්න.

ක්‍රියාකාරකම 2
මිතුරා වෙසෙන ගමේ නම විමසීමටත් ඊට පිළිතුරු දීමටත් අවස්ථාව ලබා දෙන්න.

| | | | |
|---|---|---|---|
| උදාහරණ :- | உங்கள் ஊர் எது? | උංගල් ඌර් එදු | ඔබේ ගම කොහේ ද? |
| | எனது ஊர் ....... | එනදු ඌර් .... | මගේ ගම ....... |

මුලින් ප්‍රශ්නය පුහුණු කර පසුව පිළිතුරු දීමට පුහුණු කරන්න. සෑම දෙනාටම අවස්ථාව ලබා දෙන්න. මෙම ක්‍රියාකාරකම කණ්ඩායම් අතර ද කරවන්න.

ක්‍රියාකාරකම 3
ඉහත කී ආකාරයට ම තාත්තාගේ නම, අම්මාගේ නම විමසීමටත් ඊට පිළිතුරු දීමටත් පුහුණුව ලබා දෙන්න. කණ්ඩායම් අතර ද එම ක්‍රියාකාරකම කරවන්න.
උදාහරණ :-
உங்கள் அப்பாவின் பெயர் என்ன? උංගල් අප්පාවින් පෙයර් එන්න
ඔබේ තාත්තාගේ නම කුමක් ද
පිළිතුර : என் அப்பாவின் பெயர் එන් අප්පාවින් පෙයර්
මගේ තාත්තාගේ නම
உங்கள் அம்மாவின் பெயர் என்ன උංගල් අම්මාවින් පෙයර් එන්න
ඔබේ අම්මාගේ නම කුමක් ද
පිළිතුර : என் அம்மாவின் பெயர் එන් අම්මාවින් පෙයර්
මගේ අම්මාගේ නම

ක්‍රියාකාරකම 4
මෙම ක්‍රියාකාරකමේ දී ඔබේ ගෙදර සිටින්නේ කවුරුන් ද යන්න ප්‍රශ්න කිරීමටත් ඊට පිළිතුරු දීමටත් පුහුණු කරවන්න.
උදාහරණ :- உங்கள் வீட்டில் யார் இருக்கிறார்கள்?
උංගල් වීට්ටිල් යාර් ඉරුක්කිරාර්හල්?
ඔබේ ගෙදර ඉන්නේ කවුරුන් ද?

පිළිතුර
என் வீட்டில் அப்பாவும் அம்மாவும் நானும் இருக்கிறோம் එන් වීට්ටිල් අප්පාවුම්, අම්මාවුම්, නානුම් ඉරුක්කිරෝම්
මගේ ගෙදර තාත්තායි, අම්මායි, මමයි ඉන්නෙ
ප්‍රශ්නය හා පිළිතුර කීපවතාවක් උච්චාරණය කර ප්‍රගුණ කරවන්න. කණ්ඩායම් අතර ද මෙම සංවාදය ක්‍රියාත්මක කරන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තක්සේරු කිරීමේ පරිමාණය
සාර්ථකව කරයි ✓
දුෂ්කරතා පෙන්නුම් කරයි/
තව දුරටත් උදවු අවශ්‍යයි •

සිසුන්ගේ නම

1. වැඩිහිටියන්ගෙන් හා වෙනත් අදාළ පුද්ගලයන්ගෙන් කරුණු විමසමින් තොරතුරු රැස් කිරීමට උනන්දු වෙයි.
2. අත්හදා බැලීම්වලට හා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට උනන්දුවෙන් සහභාගී වෙයි.
3. පන්ති කාමරයේ පාවිච්චි කරන භාණ්ඩ උපකරණ ආරක්ෂාකාරී ව පාවිච්චි කරයි. නිසිතැන්වල තබයි.
4. අන්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.
5. පෞද්ගලික පිරිසිදුකම ගැන සැලකිලිමත් වෙයි.
6. වටාපිටාවේ පිරිසිදුකම ගැන සැලකිලිමත් වෙයි.
7. විවිධ අවස්ථා භූමිකා රංගනයෙන් ඉදිරිපත් කරයි.
8. කවි ගී ගායනා හා රංගන ඉදිරිපත් කරයි.
9. විවිධ අවස්ථා චිත්‍ර මගින් ප්‍රකාශ කරයි.
10. පරිසරයේ ඇති විවිධ ද්‍රව්‍ය උපයෝගී කර ගෙන නිර්මාණ කරයි.
11. තොරතුරු ක්‍රමානුකූල ව වාර්තා කරයි.
12. සරල අත්හදා බැලීම් කරයි.
13. කරන වැඩක් නිමාවක් දකින තෙක් උනන්දුවෙන් කරයි.
14. ස්වයං ඉගෙනුමට පෙළඹෙයි.
15. අන්‍යයන්ට උදවු කිරීමට කැමැත්තක් දක්වයි.
16. එදිනෙදා පන්ති කාමරයේ ලැබෙන විධානවලට ප්‍රතිචාර දක්වයි.
17. පාසලේ දී තම අවශ්‍යතාවල දී දෙමළ බසින් සුහද ඉල්ලීම් කරයි.
18. සරල කවියක් අංග චලන සහිත ව දෙමළ බසින් ගායනා කරයි.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 5.0 සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

## 5.1 හැඳින්වීම

ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුන් සඳහා ඵලදායී වූ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ගුරුවරුන්ට, සිසුන් ඉගෙනීමේ දී පෙන්නුම් කරන දුෂ්කරතාවයන් හා දක්ෂතා පිළිබඳ ව සුවිශේෂී අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය ය. ඒ අනුව පන්තියේ සිටින සියලු ම සිසුන්ට ගැළපෙන ආකාරයට ඉගෙනුම් ක්‍රම සංවිධානය කළ හැකි ය. මේ පුළුල් අරමුණෙන් යුතුව පන්ති කාමරය තුළ සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ ව නිරන්තරයෙන් තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම වශයෙන් හඳුන්වා දිය හැකි ය. සිසුන් තක්සේරු කිරීමේ විවිධ පරමාර්ථ තිබේ. ස්ථාපන කාර්යයන්, අනාවරණ කාර්යයන්, උපදේශන කාර්යයන්, සහතික පත් ප්‍රදානය කිරීම හා පර්යේෂණ කාර්යයන් මෙහි දී ප්‍රධාන වේ. එහෙත් ප්‍රාථමික ශ්‍රේණිවල දී තක්සේරු කිරීම ප්‍රධාන වශයෙන් ම අනාවරණය හා උපදේශනය යන කරුණු මුල් කර ගෙන ක්‍රියාත්මක වේ. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් ඉගෙනීමේ දී බොහෝ ගැටලු පෙන්නුම් කරයි. ගුරුවරුන් උගන්වන අතරතුර ඒවා හොඳින් හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම අවශ්‍ය ය. තම පන්තියේ සිටින එක් එක් සිසුවා සුවිශේෂී ලෙස මුහුණපාන ගැටලු හඳුනාගෙන ඒ එක් එක් සිසුවාට ගැළපෙන ආකාරයට ඉගෙනුම් කටයුතු සංවිධානය කිරීම මෙමඟින් පහසුවනු ඇත. ඒ මගින් සෑම සිසුවකුම විෂයමාලාවෙන් අපේක්ෂිත නිපුණතා කරා කැටුව යාමට ගුරුවරුනට පුලුවන. සිසුන් පළමුවැනියා දෙවැනියා වශයෙන් තරා කිරීම හෝ දක්ෂ සිසුන් හා දුර්වල සිසුන් වශයෙන් වර්ග කිරීම හෝ වැනි කරුණු ප්‍රාථමික ශ්‍රේණිවල දී තක්සේරු කිරීමේ පරමාර්ථ නොවේ.

## 5.2 සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමශිල්ප

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමශිල්ප ප්‍රධාන කරුණු දෙකක් යටතේ හඳුන්වා දිය හැකි ය.

### 5.2.1 සිසු ප්‍රගතිය විධිමත් ලෙස තක්සේරු කිරීම

ඉගැන්වීමේ ක්‍රියාවලිය තාවකාලික ව නතර කොට පූර්ව සූදානමකින් හා සැලසුමකින් යුතු ව මුළු අවධානයම ඒ කෙරෙහි යොමු කොට කරනු ලබන තක්සේරු කිරීම විධිමත් තක්සේරු කිරීම වශයෙන් හැඳින්විය හැකි ය. ඒ යටතේ විධිමත් පරීක්ෂණ හා ක්‍රියාකාරකම් සකස් කර භාවිත කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ප්‍රාථමික ශ්‍රේණිවල උගන්වන ගුරුවරුන්ගේ ප්‍රයෝජනය පිණිස සකසා ඇති විධිමත් පරීක්ෂණ සකස් කිරීම පිළිබඳ උපදෙස් සංග්‍රහය භාවිතයට ගත හැකි ය.

### 5.2.2 සිසු ප්‍රගතිය අවිධිමත් ලෙස තක්සේරු කිරීම.

සිසුන් ඉගෙනීමේ යෙදී සිටින අතරතුරම ඊට බාධා නොවන ආකාරයෙන් තොරතුරු රැස් කිරීම මෙහි දී සිදු කෙරේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්න කිරීම, සිසුන් සමඟ තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ සාකච්ඡා කිරීම, සිසුන් වැඩෙහි නිරත ව සිටින අතරතුර ඔවුන්ගේ වැඩ නිරීක්ෂණය කර තොරතුරු ලබාගැනීම, සිසුන්ගේ ගෙදර වැඩ ඇගයීමට ලක් කිරීම වැනි ක්‍රමශිල්ප භාවිත කරනු ලැබේ. මෙහි දී ගුරුවරයාගේ වෘත්තියභාවය අතිශයෙන් වැදගත් වේ. ගුරුවරයා ගනු ලබන විනිශ්චයන් වඩාත් නිවැරදි ව ගැනීම සඳහා සැලකිල්ලෙන් යුතු ව කටයුතු කිරීම අවශ්‍ය ය. අවිධිමත් ක්‍රමශිල්ප මගින් සිසුන් පිළිබඳ ව විස්තරාත්මක වූත් ගුණාත්මක වූත් තොරතුරු ලැබෙන හෙයින් ඒවා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා වඩාත් ඵලදායී ලෙස යොදා ගත හැකි වනු ඇත.

සිසුන් පිළිබඳ ව ගුරුවරුන් අවිධිමත් ලෙස ගන්නා තීරණවල වලංගුතාවය ද ඉතා ඉහළ බව බොහෝ පර්යේෂණ මගින් අනාවරණය වී ඇත.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 5.3 තක්සේරු කිරීමේ විවිධ ස්වරූපයන්

තක්සේරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල දී සිදු කළ හැකි ය. ඒ අනුව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සම්පිණ්ඩිත තක්සේරු කිරීම හා සම්භවන තක්සේරු කිරීම යනුවෙන් වර්ග කළ හැකි ය.

සම්පිණ්ඩිත තක්සේරු කිරීම :-

ඉගෙනුම් අදියරක් අවසානයේ යම් ඉගෙනුම් කොටසක් කොතෙක් දුරට සාධනය කර ගෙන ඇත් ද යන්න පරීක්ෂා කිරීම සම්පිණ්ඩිත තක්සේරු කිරීම යනුවෙන් අදහස් කෙරේ. ඒ අනුව අවුරුද්දක්/වාරයක්/ඒකකයක් අවසානයේ එම අවුරුද්ද/වාරය/ඒකකය තුළ උගන්වන ලද විෂය කරුණු පාදක කර ගෙන සකස් කළ තක්සේරු උපකරණයක් මගින් සිසුන් ලබා ඇති ප්‍රගතිය තක්සේරු කළ හැකි ය. නමුත් මෙවැනි තක්සේරු කිරීමක් ප්‍රාථමික ශ්‍රේණි සඳහා වඩාත් යෝග්‍ය යැයි නිර්දේශ කිරීම අපහසු ය.

සම්භවන තක්සේරු කිරීම :-

යම් ඉගෙනුම් අදියරක් අතරතුර දී නිරන්තරයෙන් සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ ව සොයා බැලීම සම්භවන තක්සේරු කිරීම යනුවෙන් අදහස් කෙරේ. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්, ඉගෙනීමේ දී මුහුණ දෙන ගැටලුවලට ඉතාමත් ප්‍රායෝගික විසඳුම් ලබා දීම අත්‍යවශ්‍ය ය. එසේ නැතහොත් සිසුන් ලබන අසාර්ථකත්වයන් ඔවුන් තව දුරටත් පසුබටට සිසුන් බවට පත් කිරීමට හේතු වේ. එහෙයින් සිසුන් පිළිබඳ නිරන්තරයෙන් සොයා බැලීම ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් සැලකිය යුතු ය.

ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක වනුයේ නිර්ණායක මූලික තක්සේරු කිරීම් වේ. මෙහි දී ගුරුවරයා විසින් භාවිත කරනු ලබන අවිධිමත් ක්‍රමවේදයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

විෂයමාලාවේ අන්තර්ගතය හා නිපුණතා අනුව සකස් කරගත් නිර්ණායක කරා සිසුන් ළඟා වී තිබේ ද යන්න පරීක්ෂා කිරීම නිර්ණායක මූලික තක්සේරු කිරීමයි. මේ සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස නිර්ණායක මූලික ව සකස් කර ඇති තක්සේරු පත්‍රිකා ප්‍රාථමික අවධිය සඳහා යෝජිත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි අන්තර් ගත කර ඇත. මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි මව්බස සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයන් සඳහා තක්සේරු පත්‍රිකා ඒ ඒ විෂය කොටස් අවසානයේ ඇතුළත් කර ඇති අතර පොදු තක්සේරු කිරීමේ පත්‍රිකාවක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ ඉදිරිපත් කර ඇත. තව ද ගණිතය විෂය සඳහා සකස් කර ඇති තක්සේරු පත්‍රිකාව ගණිතය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අවසානයේ ඇතුළත් කර ඇත.

පහත දක්වා ඇත්තේ ගණිතය, මව්බස හා පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයන්ට අදාළ ව සකස් කළ තක්සේරු කිරීමේ නිර්ණායක සඳහා නිදසුන් කිහිපයකි.

ගණිතය - දවසේ සිද්ධි සම්බන්ධ කර වේලාව ප්‍රකාශ කරයි.

මව්බස - පෙළ පොතෙන් උපුටාගත් වාක්‍ය කිහිපයක් අසා ලියයි.

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - මිශ්‍ර ආහාර වේලක් ගැනීමේ ඇති වැදගත්කම ප්‍රකාශ කරයි.

## 5.4 කාර්ය සාධන ගොනුව

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ඉතාම ඵලදායී ක්‍රමයක් ලෙස කාර්ය සාධන ගොනු සලකනු ලැබේ. සිසුන් ඉගෙනීමේ දී මුහුණු දෙන ගැටලු ඔවුන් තුළ තිබෙන දක්ෂතා අඛණ්ඩව ඇගයීමේ ක්‍රමයක් වශයෙන් මෙය වැදගත් වේ. ප්‍රාථමික ශ්‍රේණිවල බොහෝ ගුරුවරු එක් එක් සිසුවාගේ වැඩ වෙන වෙන ම ගොනුවල එකතු කිරීම පුරුද්දක් වශයෙන් කරනු ලැබේ. නමුත් කාර්ය සාධන

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ගොනුව මෙයට වඩා ඉදිරියට ගිය ක්‍රියාවලියක් සේ සලකනු ලැබේ. ඒ අනුව කාර්ය සාධන ගොනුව සිසුවාගේ දක්ෂතා මෙන් ම ඔහු ඉගෙනීමේ දී මුහුණපාන ගැටලු නිරූපණය වන ආකාරයට ඉතා අර්ථාන්විත ලෙස සකස් කළ සිසුවාගේ වැඩ එකතුවක් ලෙස සලකනු ලැබේ. එය සිසුවා පිළිබඳ ව පැහැදිලි අදහසක් දක්වන දෙයක් විය යුතු ය. කාර්ය සාධන ගොනු පිළියෙල කිරීම ගුරුවරයාගෙන් ගුරුවරයාට වෙනස් විය හැකි ය. නිශ්චිත ක්‍රමයක් දැක්වීම අසීරුය. නිර්මාණාත්මක ගුරුවරයකුට තමාගේ ම ක්‍රමයක් අනුගමනය කරමින් ඉතා උසස් මට්ටමේ කාර්ය සාධන ගොනුවක් සකස් කළ හැකි ය. කාර්ය සාධන ගොනුවකට ඇතුළත් කළ හැකි දේ මොනවා ද? බොහෝ දුරට ඒවා සිසුන්ගේ වැඩවල නියැදි, ලියූ ලේඛන, විසඳන ලද ගණිත ගැටලු, අඳින ලද චිත්‍ර, කරන ලද නිර්මාණ විය හැකි ය. එසේ ම ගුරුවරයා විසින් ලියන ලද කෙටි සටහන් ද එයට ඇතුළත් කළ හැකි ය.

## 5.5 කෙටි සටහන් ලිවීම හා පිරික්සුම් ලැයිස්තු භාවිත කිරීම

සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනීමේ ගැටලු හඳුනා ගැනීමේ දී එක් එක් සිසුවා පිළිබඳ ව ගුරුවරයාට ප්‍රයෝජනවත් වන තොරතුරු කෙටි සටහන් වශයෙන් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වේ. පන්තියේ උගන්වන අතරතුර දී සිසුන් පිළිබඳ ව තොරතුරු සමුදායක් ගුරුවරුන්ට ලැබේ. නමුත් මෙම තොරතුරු අර්ථාන්විත ලෙස ප්‍රයෝජනයට ගැනීමක් බොහෝ විට සිදු නොකෙරේ. එම නිසා සිසුන් පිළිබඳ ව අනාවරණය කරගන්නා තොරතුරු පොතක කෙටි සටහන් වශයෙන් තබාගෙන ඒවා අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.

පිරික්සුම් ලැයිස්තු භාවිතය ද එසේ ම ප්‍රයෝජනවත් වන තවත් ක්‍රමයකි. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇති තක්සේරු පත්‍රිකාවල ඉදිරිපත් කර ඇති නිර්ණායක කරා සිසුන් ළඟා වී තිබේ දැයි තීරණය කිරීම සඳහා එවැනි පිරික්සුම් ලැයිස්තු ද උපයෝගී කර ගත හැකි ය.

## 5.6 තක්සේරු කිරීමේ පත්‍රිකා හා ඒවා ප්‍රයෝජනයට ගැනීම

රැස් කරනු ලබන තොරතුරු වාර්තා කිරීම සඳහා යොදා ගත හැකි පත්‍රිකාවල ආකෘති හතරක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි ඇතුලත් කර ඇත. ඒවා මව්බස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ පොදු තක්සේරු පත්‍රිකා ලෙස නම් කර ඇත.

ඒවායේ එක් එක් සිසුවාගේ නම ඉදිරියෙන් එක් එක් ඉගෙනුම් ඵලය සඳහා එක් කොටුව බැගින් වෙන් කර ඇත. සිසුන් ඒ ඒ ඉගෙනුම් ඵලය කරා ළඟා වී තිබේ ද නැති ද යන්න, පරීක්ෂා කිරීමෙන් අනතුරු ව සටහන් කළ යුතු ය. පොදු තක්සේරු පත්‍රිකාවේ තක්සේරු කිරීමට භාජනය කළ යුතු බොහෝ "ඉගෙනුම් ඵල" වසර පුරාම සොයා බැලිය යුතු අයුරින් විහි දී ඇත. එක් ඉගෙනුම් ඵලයක් වාර තුනෙහි ම පරීක්ෂා කිරීම සඳහා දී ඇති කොටුව වෙන් කර භාවිතයට ගන්න.

එක් එක් සිසුවා සම්බන්ධයෙන් එක් එක් ඉගෙනුම් ඵලය යටතේ ඔබ රැස් කළ තොරතුරු ඇසුරෙන් පහත සඳහන් ආකාරයට සංකේත යෙදීමෙන් වාර්තා කළ හැකි ය.

| තීරණය | සංකේතය |
|---|---|
| සාර්ථක ව කරයි | √ |
| දුෂ්කරතා පෙන්නුම් කරයි/තව දුරටත් උදවු අවශ්‍යයි | . |

යම් ඉගෙනුම් ඵලයක් සම්බන්ධයෙන් සිසුවෙක් සාර්ථකත්වය පෙන්නුම් කරන්නේ ද යන්න ගුරුවරයකු විසින් තීරණය කරනු ලැබීම සඳහා අදාළ ඉගෙනුම් ඵලයට ගැළපෙන පරිදි තමා ම සකස් කර ගත් නිර්ණායක උපයෝගී කර ගත යුතු ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 5.7 අනාවරණය හා ප්‍රතිකාර්ය

අවිධිමත්-සම්භවන තක්සේරු කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රධාන අරමුණක් වන්නේ අනාවරණයයි.

යම් සිසුවකු සඳහා තක්සේරු පත්‍රයේ " · " සලකුණ යොදා ඇති සෑම අවස්ථාවක් කෙරෙහි ම ගුරුවරයාගේ විශේෂ අවධානය යොමු විය යුතු ය. සිසුවා මුහුණ දෙන දුෂ්කරතා හඳුනා ගෙන ඒවාට පිළියම් යොදා නැවත තක්සේරු කිරීමට කටයුතු කළ යුතු ය. එම " · " සංකේතය " √" සංකේතයක් බවට වෙනස් කිරීමට හැකි වන තෙක් මෙම ක්‍රියාවලිය දිගට ම සිදු කිරීම ගුරුවරුන්ගේ වගවීමයි.

හඳුනා ගනු ලබන ඉගෙනුම් දුෂ්කරතා මග හැර වීම පිණිස එක් එක් අවස්ථාවට ගැළපෙන පරිදි සුවිශේෂ ප්‍රතිකාර්ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සම්පාදනය කිරීම ද වැදගත් ය. මේවා එක් එක් සිසුවා පෙන්නුම් කරන ඉගෙනුම් දුෂ්කරතා අනුව තීරණය විය හැකි ය.

එමෙන් ම යම් ඉගෙනුම් අභිමතාර්ථයක් කෙරෙහි පන්තියේ සිසුන් වැඩි දෙනකු "·" සලකුණු ලබා ඇත්නම් එසේ වීමට බලපෑ හේතු රාශියක් තිබිය හැකි ය. ඒවා හඳුනා ගෙන සුදුසු ක්‍රියාමාර්ග ඇසුරින් සිසුන් අවශ්‍ය ඉගෙනුම් ඵල කරා ගෙන ඒම ගුරුවරයාගේ වගකීමකි.

## 5.8 වෙනත් කරුණු

- එක් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය තවත් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය සමඟ සැසඳීමෙන් අධ්‍යාපනික වශයෙන් වැදගත් වූ තීරණ ලබා ගැනීම අසීරුය. එම නිසා සිසු-සිසු සාධන සැසඳීමෙන් වැළකිය යුතු ය.
- එක් සිසුවකුගේ වර්තමාන සාධන මට්ටම එම සිසුවාගේ ම පූර්ව සාධන මට්ටම් සමඟ සැසඳීමෙන් සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි හෙයින් ඒ පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය. එසේ ම විෂයමාලාවේ අපේක්ෂණ කරා කොතරම් ළඟා වී ඇත්දැයි සොයා බැලිය යුතු ය.
- තමාගේ පන්තියේ සිටින සිසුන්ට ගැළපෙන ආකාරයට පන්තිය භාර ගුරුවරයාම තක්සේරු උපකරණ සකස් කිරීමට සමත් විය යුතු ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 6.0 අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා

## 6.1 හැඳින්වීම

නිපුණතාවක් යනුවෙන් මෙහි අදහස් කෙරෙනුයේ දැනුම, කුසලතා, ආකල්ප හා වටිනාකම්වල සංකීර්ණ සංකලනයකට ය. විවිධ ආකාරයේ නිපුණතා තිබිය හැකි ය. සමහර නිපුණතා කුසලතා දිශාවට වැඩියෙන් බර වූ ඒවා වන අතර තවත් සමහරක් දැනුම හෝ ආකල්ප දිශාවන්ට වැඩියෙන් බර වූ ඒවා වීමට ඉඩ ඇත.

දෙවන ප්‍රධාන අවධිය අවසන් කරනු ලබන සිසුන් ඒ අවධිය සඳහා නිර්දේශිත අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණත්වය ලබා ගෙන ඇතැයි තහවුරු කිරීමක් කළ යුතු බව ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා සැලැස්මෙහි සඳහන් කර ඇත. පැහැදිලි ව අවබෝධ කර ගත යුතු කරුණු කිහිපයක් මෙම ප්‍රකාශයේ ඇතුළත් ව ඇත.

එනම්

- අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
- පළමුවන ප්‍රධාන අවධිය සඳහා අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනවා ද?
- ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
- නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

මේ එක එකක් පිළිබඳ ව විස්තර වශයෙන් විමසා බලමු.

## 6.2 අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

විෂයමාලාවක් සංවර්ධනය කිරීමේ දී එහි අන්තර්ගතය තීරණය කිරීමට වැදගත් ස්ථානයක් හිමි වේ. විවිධ හැකියා මට්ටම්වල සිටින සිසුන්ට ගැළපෙන පරිදි සරල මෙන් ම සංකීර්ණ නිපුණතා, විෂයමාලාවක් තුළ සාමාන්‍යයෙන් ඇතුළත් කරනු ලැබේ.

එක් එක් ප්‍රධාන අවධිය අවසන් කිරීමට ප්‍රථම අදාළ ශ්‍රේණිවල සෑම සිසුවකු ම පාහේ අනිවාර්යයෙන් ම ඉහළ මට්ටමක දක්ෂතා ප්‍රදර්ශනය කළ යුතු නිපුණතා සමූහයක් විෂයමාලා අන්තර්ගත තුළ අඩංගුව ඇත. සෑම සිසුවකුම විසින් ප්‍රගුණ කළ යුතු යැයි අපේක්ෂා කරන මෙම නිපුණතා අප අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා ලෙස හඳුන්වනු ලැබේ.

මේ අනුව අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා ගණයට අයත් වනුයේ

- ඉගෙනුම තව තදුරටත් ගොඩ නැගීමට හා පවත්වා ගෙන යෑමටත්,
- යහපත් පුරවැසියකු ලෙස සාර්ථක ව ජීවත් වීමටත් අනිවාර්යයෙන් ම ප්‍රවීණ කළ යුතු නිපුණතා වේ.

සැමට අධ්‍යාපනය ලබා දීමේ සම්මුතිය යටතේ සියලු ම සිසුන් තුළ අඩුම වශයෙන් අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා වර්ධනය කරවීමට අප බැඳී ඇත.

පන්තියේ සියලු ම සිසුන් ගෙන ආ යුතු ඉහළතම ප්‍රාප්ති මට්ටම ලෙස අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා කිසි විටෙකත් සැලකිය යුතු නොවේ. වඩා දක්ෂ සිසුන් විසින් වර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කරන එහෙත්, සියලු ම සිසුන් සඳහා අභියෝගාත්මක විය හැකි ඉහළ මට්ටමේ නිපුණතා සමූහයක් ද විෂයමාලා අන්තර්ගතයන් තුළ ඇත. ඒවා අභිමත ඉගෙනුම් නිපුණතා ලෙස හැඳින්වේ.

ගුරුවරයාගේ අරමුණ විය යුත්තේ පන්තියේ සෑම සිසුවකු තුළ ම අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා ඉහළ මට්ටමකට වර්ධනය කරන අතර, සිසුන් වැඩිදෙනකු තුළ අභිමත ඉගෙනුම් නිපුණතා වර්ධනය කිරීමට පියවර ගැනීම ය.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 6.3 දෙවන ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනවා ද?

දෙවන ප්‍රධාන අවධිය අවසන් කරන සිසුන් විසින් ඉහළ මට්ටමක හැකියාවන් ප්‍රදර්ශනය කළ යුතු යැ යි අපේක්ෂා කරන අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහයක් හඳුනා ගෙන ඇත. මේවා හඳුනා ගැනීමේ දී තුන්වන හා හතරවන ශ්‍රේණිවල විෂය නිර්දේශ සහ අනිකුත් විෂයමාලා ද්‍රව්‍ය ගැඹුරින් අධ්‍යයනය කරන ලද අතර, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, කථිකාචාර්යවරුන්, විෂයමාලා සංවර්ධකයන් සහ ප්‍රවීණ අධ්‍යාපනඥයින් රැසකගේ අදහස් සැලකිල්ලට භාජන කරන ලදී. එමෙන් ම, වෙනත් රටවල ප්‍රකාශයට පත් කර ඇති මෙවැනි අත්‍යවශ්‍ය ප්‍රාප්ති මට්ටම් ද අධ්‍යයනය කරන ලදී.

හඳුනා ගෙන ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහය විෂයයන් වශයෙන් වෙන් වෙන් ව නොව, පොදු නිපුණතා සමූහයක් වශයෙන් සකස් කර ඇත. එම නිපුණතා සමූහය තුළ සන්නිවේදනයට, පෞරුෂත්වයට, පරිසරයට, වැඩ ලෝකයට සූදානම් වීමට, ආචාර ධර්ම හා ආගමට, ක්‍රීඩා විවේකයට සහ ඉගෙනුමට ඉගෙනීමට අදාළ නිපුණතා අන්තර්ගත ය.

## 6.4 ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

යම් නිපුණතාවකට අදාළ දැනුම, කුසලතා හා ආකල්ප පිළිබඳ ව උසස් මට්ටමේ හැකියාවන් ප්‍රදර්ශනය කරනු ලබන සිසුවකු එම නිපුණතාවයේ ප්‍රවීණයකු ලෙස මෙහි දී පිළිගැනෙනු ඇත. උසස් මට්ටමක හැකියාවක් ලබා තිබේ දැ යි තීරණය කිරීමට තක්සේරු කිරීම් තුළින් රැස් කළ විවිධ ආකාරයේ තොරතුරු සහ අදාළ නිර්ණායක එක් එක් නිපුණතාවට අදාළ ව සලකා බැලීමට සිදු වෙනු ඇත.

යම් නිපුණතාවක් සම්බන්ධව ප්‍රවීණ මට්ටමට පැමිණි සිසුවකු තුළ දක්නට ලැබිය හැකි ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- එම නිපුණතාවට අදාළ ඊළඟ ඉහළ මට්ටමට යොමු වීමට සූදානම් බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව තමා තුළ ආත්ම විශ්වාසයක් ඇති බව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට සම්බන්ධ දැනුම හෝ කුසලතා හෝ තවත් අයකුට පැහැදිලි කර දීමට හෝ ඉගැන්වීමට හැකියාවක් පෙන්නුම් කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව විශේෂ උනන්දුවක් හෝ ආශාවක් හෝ දක්වන බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව සම්බන්ධ ගැටලුවකට මුහුණ පෑ විට එය ස්වාධීන ව විසඳා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට අදාළ කාර්යයන් බොහෝ දුරට නිවැරදි ව කරයි.
- ආකල්පවලට අදාළ නිපුණතාවන් සම්බන්ධ චර්යා නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරයි.

## 6.5 නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම සිදු කළ යුත්තකි. ඒ සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්‍රම දෙකක් හඳුනා ගෙන ඇත.

(අ) අවිධිමත් තක්සේරු ක්‍රම මගින් අඛණ්ඩව රැස් කර වාර්තා කර ඇති තොරතුරු පමණක් ඇසුරෙන් තීරණ ගැනීම. (සම්භවන තක්සේරු තොරතුරු පමණි)

(ආ) ඉහත (අ) හි සඳහන් තොරතුරුවලට අමතර ව සම්පිණ්ඩිත තක්සේරු කිරීමක් හෝ වැඩි ගණනක් හෝ ඇසුරෙන් තීරණ ගැනීම.

ඉහත සඳහන් ක්‍රම භාවිත කර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලට ළඟා වී තිබේ ද යන්න පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය මග පෙන්වීම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සම්බන්ධයෙන් පිළියෙල කර ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අන්තර්ගතව ඇත.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.